පාලි හුරුව කියවීම් පොත

කඩිනම් පාලි පාඨමාලාවට සහභාගීවන ශිෂ්‍යයනට නොමිලේ බෙදාදීම සදහාය.

මෙම පරිවර්ථනය "පාලි හුරුව" පාඨමාලාවට අදාල ලෙස, පාලි භාෂාව පිලිබඳ සරල හුරුවක් ලබාදීම සදහා සිදුකර ඇත. මෙහි සන්ධි සමාස පදයන් වෙන්කිරීම පාලි ව්‍යාකරනානුකූලව සිදුකර නොමැත. එමනිසා මෙම පරිවර්ථනය කිසිදු විභාගයකට භාවිතාකල නොහැක. මෙය ශ්‍රාස්ත්‍රීය නිබන්ධනයක් ලෙස නොසලකන්න

පාඨමාලාව පොත් තුනකින් සැකසීඇත.

1. පාලි හුරුව පොත
2. පාලි හුරුව කියවීම් පොත
3. පාලිහුරුව වන්දනා පොත

\# පටිගත පාඩම් මාලාව

පූජ්‍ය බළංගොඩ ඤාණවිහාරි හිමි.

පිං කැමතියෝ මෙම පොත් තුන මුද්‍රණයකර නොමිලේ බෙදා දෙත්වා !!!

01	සුන්දරී පරිබ්බාජිකාවගේ කථාව	05
02	කුම්භඝෝසක සිටුගේ කථාව	13
03	මහධන සිටුපුතාගේ කථාව	30
04	ගංඟාරෝහන පූජාව	39
05	ඝෝෂක සිටුපුතාගේ කථාව	64
06	ජාතක අට්ඨකථා නිධානය (ගාථා කියවීමේ හුරුවසඳහා)	105
07	නිධාන කථාව (ගාථා කියවීමේ හුරුවසඳහා)	109
08	දූරේනිධාන කථාව (ගාථා කියවීමේ හුරුවසඳහා)	111
09	සුමේධ තාපස කථාව (ගාථා කියවීමේ හුරුවසඳහා)	114
10	මහබෝසතුන් බුදුවරුහමුවේ විවරණ ගැනීම	210
11	අවිදූරේ නිධාන කථාව	250
12	චූල සීහනාද සූත්‍රය	352
13	මිලිඳු නාගසේන පැනවිසඳුම්	372

මෙම පරිවර්ථනය කියවීමේ දී . . .

1. **පාලි හරුව පොත** දෙතුන්පාරක්වත් කියවා තිබීම වැදගත්ය
2. සන්ධි විසන්ධිකරඇති තැන්වලදී අවධානයෙන් කියවන්න
3. පාලි එක්වචනයකට සිංහල අර්ථ කිහිපයක් යොදාඇති තැන්වලදී අවධානයෙන් කියවන්න (. . . / ... /.)
4. තද කලු අකුරින් හා ඉරි ඇඳි පාලි වචන හා අකුරු වල සිංහල අර්ථ ඊටගැලපෙන තැන කලු අකුරින් හා ඉරි ඇඳ දක්වා ඇත
5. පාලි ප්‍රකෘති කථනයන් සිංහලයට හැරවීමේ දී කියවන භාෂාවෙන් හෝ ලියන භාෂාවෙන් හෝ ඒ දෙකෙන්ම හෝ සිදුකර ඇත
6. සමහර පාලි වචනයන්ට අර්ථවශයෙන් ගැලපෙන සිංහල වචන නොමැත, එවැනි තැනිවලදී අර්ථයට ගැලපෙනසේ පරිවර්ථනය සිදුකරඇත
7. සම්ප්‍රධායික පාලි වාක්‍යය රටාවලට ගැලපෙන සිංහල වාක්‍යය රටා යොදා ඇත, එවැනි තැන්වලදී වචනයෙන් වචනය පාලි සිංහලයට හැරවිය නොහැක.
8. ආදුනිකයන්ගේ පහසුව පිණිස, සිංහල අර්ථ (භාවාර්ථ) සැපයීමේදී බොහෝදුරට පාලි වචනයෙන් වචනයට ගැලපෙනසේ අර්ථදීමට උත්සහකරඇත, විස්තරවශයෙන් හෝ සිංහල භාෂාවට ගැලපෙන රසවත් ආකාරයට හෝ අර්ථදීමට උත්ගහකර නොමහැත.

9.පාලි උච්චාරණය

පාලියේදී යන අකුර "ඔ" "එ"ු දෙක සිංහල භාෂාවේ මෙන් "ඕ" "ඒ"<u>දීර්ඝව ඇද කියනු ලැබේ</u>යන අකුර "ඔ" "එ" නමුත් .ු දෙක බැඳි අකුරකට හෝ අල් අකුරකට හෝ මුලින් ඇති විට <u>නොඇද කියනු ලැබේ</u>මෙම ප) .ොත්ේ බොහෝ අවස්ථාවල දීර්ඝව කියයුතු තැන්වල අල් අකුරු දක්වා ඇතඑස .ෙ නොමැති තැන්වලදී මෙම නීතිය භාවිතා කලයුතුය(.

10.බැඳි අකුරකට මුලින් ඇති කොම්බුව "ෙ"බැඳි අකුරේ දෙවන අකුර සදහාය.

ධමෙමා → ධම්මෝ අසෙසා → අස්සෝ

1. සුන්දරීපරිබ්බාජිකාවත්ථු (සුන්දරී පරිබ්බාජිකාවගේ කථාව)

• තස්මිං සමයේ භගවතො කිර භික්ඛුසඞ්ඝස්ස ච පඤ්චන්නං මහානදීනං මහොඝසදිසෙ ලාභසක්කාරෙ උප්පන්නෙ හතලාභසක්කාරා අඤ්ඤතිත්ථියා [සූරිය+උග්ගමනකාලෙ] සූරියුග්ගමනකාලෙ ඛජ්ජොපනකා විය නිප්පභා හුත්වා එකතො සන්නිපතිත්වා මන්තයිංසු.

★ තස්මිං සමයේ භගවතො කිර (එසමයේ භාග්‍යවතුන් වහන්සේට වනාහි) භික්ඛුසඞ්ඝස්ස ච (භික්ෂු සංඝයාට ද) පඤ්චන්නං මහානදීනං (පඤ්ච මහා ගංඟාවන්ගේ) මහොඝ-සදිසෙ (මහා සැඩපහර මෙන්) ලාභසක්කාරෙ උප්පන්නෙ (ලාභසත්කාර උපන්කල්හි) හත-ලාභසක්කාරා (නැසුනු ලාභසත්කාර ඇති) අඤ්ඤ-තිත්ථියා (අන්‍යය ආගමිකයන්) [සූරිය+උග්ගමනකාලෙ] සූරියුග්ගමනකාලෙ (හිරු උදාවන කල) ඛජ්ජොපනකා විය (කණාමැදිරියන් මෙන්) නිප්පභා හුත්වා (නිෂ්ප්‍රභා වී/ බලබිඳී) එකතො සන්නිපතිත්වා මන්තයිංසු (එකට රැස්වී සාකච්ඡාකලහ)

☞ එසමයේ භාග්‍යවතුන් වහන්සේට ද භික්ෂු සංඝයාට ද පඤ්ච මහා ගංඟාවන්ගේ මහා සැඩපහර මෙන් ලාභසත්කාර උපන්කල්හි, නැසුනු ලාභසත්කාර ඇති අන්‍යය ආගමිකයන්, හිරු උදාවන කල කණාමැදිරියන් මෙන් නිෂ්ප්‍රභා වී- බලබිඳී එකට රැස්වී සාකච්ඡාකලහ.

• ‘‘මයං සමණස්ස ගොතමස්ස උප්පන්නකාලතො පට්ඨාය හතලාභසක්කාරා, න නො කොචි [අත්ථිභාවං+අපි] අත්ථිභාවම්පි ජානාති, කෙන නු ඛො සද්ධිං එකතො හුත්වා සමණස්ස ගොතමස්ස අවණ්ණං උප්පාදෙත්වා [ලාභසක්කාරං+අස්ස] ලාභසක්කාරමස්ස අන්තරධාපෙය්‍යාමා’’ති.

★ ‘‘මයං සමණස්ස ගොතමස්ස (අපි ශ්‍රමණ ගෞතමයන්) උප්පන්න-කාලතො පට්ඨාය (උපන් කාලයේ පටන්) හතලාභසක්කාරා (නැසුනු ලාභසත්කාර ඇත්තෝය) <u>න</u> නො (අපව) කොචි (කිසිවෙක්) [අත්ථිභාවං+අපි] අත්ථිභාවම්පි (ඇතිබව වත්) ජානාති (<u>නො</u> දනියි), කෙන නු ඛො සද්ධිං (කාත් සමග) එකතො හුත්වා (එකතුවී) සමණස්ස ගොතමස්ස (ශ්‍රමණ ගෞතමයන්ගේ) අවණ්ණං උප්පාදෙත්වා (අගුණ උපදවා) [ලාභසක්කාරං+අස්ස] ලාභසක්කාරමස්ස (ලාභසත්කාර ඔහුගේ) අන්තරධාපෙය්‍යාමා’’ති (අතුරුදහන් කරවන්නෙමුද යැයි)

☞ ‘‘අපි ශ්‍රමණ ගෞතමයන් උපන් කාලයේ පටන් නැසුනු ලාභසත්කාර ඇත්තෝය. කිසිවෙක් අපව ඇතිබව වත් නො දනියි. කාත් සමග එකතුවී ශ්‍රමණ ගෞතමයන්ගේ අගුණ උපදවා ඔහුගේ ලාභසත්කාර අතුරුදහන් කරවන්නෙමු ද’’ යැයි

• අථ නෙසං එතදහොසි – ‘‘සුන්දරියා සද්ධිං එකතො හුත්වා සක්කුණිස්සාමා’’ති. තෙ එකදිවසං සුන්දරිං තිත්ථියාරාමං පවිසිත්වා වන්දිත්වා ඨිතං [න+ආලපිංසු] නාලපිංසු. සා පුනප්පුනං [සල්ලපන්ති+අපි] සල්ලපන්තීපි පටිවචනං අලභිත්වා ‘‘අපි [පන+අය්‍යා] පනය්‍යා, කෙනචි විහෙඨිතත්ථා’’ති පුච්ඡි.

★ අථ නෙසං එතදහොසි (ඉක්බිත් ඔවුන්ට මෙසේ සිතිනි) ‘‘සුන්දරියා සද්ධිං එකතො හුත්වා (සුන්දරී සමග එක්වී) සක්කුණිස්සාමා’’ති (හැකිවන්නෙමු/ පුලුවන්වෙයි) තෙ එකදිවසං (ඔවුන් එක්දිනක්) සුන්දරිං තිත්ථියාරාමං පවිසිත්වා (සුන්දරියට තීර්තාරාමයට ඇතුලුව) වන්දිත්වා ඨිතං (වැඳ සිටින) [න+ආලපිංසු] නාලපිංසු (කථා නොකලාහ.) සා පුනප්පුනං (ඇය නැවත නැවත) [සල්ලපන්ති+අපි] සල්ලපන්තීපි (කථාකරද්දී ත්) පටිවචනං අලභිත්වා (ප්‍රතිවදන් / පිලිතුරු නොලැබී) ‘‘අපි [පන+අය්‍යා] පනය්‍යා (ආර්යන් වහන්සේලා) කෙනචි (කිසිවෙකු විසින්) විහෙඨිතත්ථා’’ති (වෙහෙසට පත්කලේද යැයි) පුච්ඡි (ඇසීය)

☞ ඉක්බිත් ඔවුන්ට මෙසේ සිතිනි "සුන්දරී සමග එක්වී පුලුවන්වෙයි" ඔවුන් එක්දිනක් තීර්තාරාමයට ඇතුලුව වැඳ සිටින සුන්දරියට කථා නොකලාහ. ඇය නැවත නැවත කථාකරද්දීත් පිලිතුරු නොලැබී "කිසිවෙකු විසින් ආර්යන් වහන්සේලාව වෙහෙසට පත්කලාද" යැයි ඇසීය.

• ''කිං, භගිනි, සමණං ගොතමං අම්හෙ විහෙඨෙත්වා හතලාභසක්කාරෙ කත්වා විචරන්තං න පස්සසී''ති? ''මයා එත්ථ කිං කාතුං වට්ටතී''ති? ''ත්වං [ඛො+අසි] ඛොසි, භගිනි, අභිරූපා සොභග්ගප්පත්තා, සමණස්ස ගොතමස්ස අයසං ආරොපෙත්වා මහාජනං තව කථං ගාහාපෙත්වා හතලාභසක්කාරං කරොහී''ති.

★ ''කිං, භගිනි, (කිමෙක්ද නැගනිය) සමණං ගොතමං අම්හෙ විහෙඨෙත්වා (ශ්‍රමණ ගෞතමයන් අපව වෙහෙසවා) හතලාභසක්කාරෙ කත්වා (නැසුනු ලාභසත්කාර ඇත්තන්කර/ ලාභසත්කාර නැතිකර) විචරන්තං (සැරිසරන) න පස්සසී''ති? (නො දක්නේද ?/ ජේනනැද්ද?) ''මයා එත්ථ (මා විසින් මෙහි) කිං කාතුං වට්ටතී''ති? (කුමක් කිරීම සුදුසු ද?) ''ත්වං [ඛො+අසි] ඛොසි (ඔබ වෙයි), භගිනි (නැගනිය), අභිරූපා (මනාරූඇති) සොභග්ගප්පත්තා (සෝභාවෙන් අගතැන්පත්ය) [රූපසෝභාවෙන් අග්‍ර තැනැත්තියක්] සමණස්ස ගොතමස්ස (ශ්‍රමණ ගෞතමයන්ගේ) අයසං ආරොපෙත්වා (අගුණ පතුරුවා) මහාජනං (මහජනයාට) තව කථං ගාහාපෙත්වා (ඔබේ කථාව පිළිගන්නවා) හතලාභසක්කාරං (නැසුනු ලාභසත්කාර ඇත්තෙක්/ ලාභසත්කාර නැත්තෙක්) කරොහී''ති (කරන්න යැයි)

☞ "කිමෙක්ද නැගනිය අපව වෙහෙසවා ලාභසත්කාර නැතිකර සැරිසරන ශ්‍රමණ ගෞතමයන්ව ජේනනැද්ද?" "මම මෙහි කුමක් කිරීම සුදුසු ද?" "නැගනිය ඔබ රූපසෝභාවෙන් අග්‍ර තැනැත්තියක් වෙයි. ශ්‍රමණ ගෞතමයන්ගේ අගුණ පතුරුවා මහජනයාට ඔබේ කථාව පිළිගන්නවා ලාභසත්කාර නැත්තෙක් කරන්න" යැයි කීය.

• සා තං සුත්වා ''සාධූ''ති සම්පටිච්ඡිත්වා පක්කන්තා තතො පට්ඨාය මාලාගන්ධවිලෙපනකප්පූරකටුකඵලාදීනි ගහෙත්වා සායං මහාජනස්ස සත්ථු ධම්මදෙසනං සුත්වා නගරං පවිසනකාලෙ [ජෙතවන+අභිමුඛී] ජෙතවනාභිමුඛී ගච්ඡති, ''කහං ගච්ඡසී''ති ච පුට්ඨා ''සමණස්ස ගොතමස්ස සන්තිකං ගමිස්සාමි, [අහං+හි] අහඤ්හි තෙන සද්ධිං එකගන්ධකුටියං වසාමී''ති වත්වා

★ සා තං සුත්වා (ඈ එය අසා) ''සාධූ''ති සම්පටිච්ඡිත්වා (හොදයි යැයි පිළිගෙන) පක්කන්තා (ගියාය) තතො පට්ඨාය (එතැන් පටන්) මාලා-ගන්ධ-විලෙපන-කප්පූර-කටුකඵලාදීනි (මල් සුවඳ විලවුන් කපුරු සුවඳකුඩු) ගහෙත්වා (ගෙන) සායං මහාජනස්ස (සවස මහජනයා) සත්ථු ධම්මදෙසනං සුත්වා (ශාස්තෘන් වහන්සේගේ දහම්දෙසුම අසා) නගරං පවිසනකාලෙ (නගරයට ඇතුලුවන වේලාවේ) [ජෙතවන+අභිමුඛී] ජෙතවනාභිමුඛී ගච්ඡති (ජේතවනාරාමයට මුහුණලා යයි) ''කහං ගච්ඡසී''ති (කොහෙද යන්නෙ යැයි) ච පුට්ඨා (ඇසූකල ද) ''සමණස්ස ගොතමස්ස සන්තිකං ගමිස්සාමි (ශ්‍රමණ ගෞතමයන් ලගට යන්නෙමි), [අහං+හි] අහඤ්හි (මම වනාහි) තෙන සද්ධිං (ඔහු සමග) එකගන්ධකුටියං (එක සඳුන්කුටියෙ) වසාමී''ති වත්වා (වසමි යැයි කියා)

☞ ඈ එය අසා "හොදයි" යැයි පිළිගෙන ගියාය. එතැන් පටන් සුවඳමල්, විලවුන්, කපුරු, සුවඳකුඩු ගෙන, සවස මහජනයා ශාස්තෘන් වහන්සේගේ දහම්දෙසුම අසා නගරයට ඇතුලුවන වේලාවේ ජේතවනාරාමයට මුහුණලා යයි. "කොහෙද යන්නෙ" යැයි ඇසූකල ද "ශ්‍රමණ ගෞතමයන් ලගට යනව. මම ඔහු සමග එක සඳුන්කුටියෙ වසමි" යැයි කියා

• අඤ්ඤතරස්මිං තිත්ථියාරාමෙ වසිත්වා පාතොව ජෙතවනමග්ගං ඔතරිත්වා [නගර+අභිමුඛී] නගරාභිමුඛී ආගච්ඡන්තී ''කිං, සුන්දරි, කහං [ගතෝ+අසි+ඉති] ගතාසී''ති පුට්ඨා ''සමණෙන ගොතමෙන සද්ධිං එකගන්ධකුටියං වසිත්වා තං කිලෙසරතියා රමාපෙත්වා ආගතාම්හී''ති වදති.

★ අඤ්ඤතරස්මිං තිත්ථියාරාමෙ වසිත්වා (එක්තරා තීර්ථාරාමයක වාසයකර/ සිට) පාතොව (උදෑසනම) ජෙතවනමග්ගං (ජේතවන මාර්ගයට) ඔතරිත්වා (බැස/ පිවිස) [නගර+අභිමුඛී] නගරාභිමුඛී (නගරයට මුහුණලා) ආගච්ඡන්තී (එමින්) ''කිං, සුන්දරි, (මොකද සුන්දරි) කහං (කොහේ) [ගතෝ+අසි+ඉති] ගතාසී''ති (ගියේද යැයි) පුට්ඨා (ඇසූකල) ''සමණෙන ගොතමෙන සද්ධිං (ශ්‍රමණ ගෞතමයන් සමග) එකගන්ධකුටියං වසිත්වා (එක සඳුන්කුටියෙ වාසයකර/ සිට) තං (ඔහු) කිලෙස-රතියා (කෙලෙස් ක්‍රීඩාවෙන්) රමාපෙත්වා (සතුටුකරවා) ආගතාම්හී''ති වදති (ආවෙමි යැයි කියයි)

☞ එක්තරා තීර්ථාරාමයක වාසයකර ජේතවන මාර්ගයට උදෑසනම පිවිස නගරයට මුහුණලා එමින් ''මොකද සුන්දරි, කොහේ ගියේද'' යැයි ඇසූකල ''ශ්‍රමණ ගෞතමයන් සමග එක සඳුන්කුටියෙ වවාසයකර, ඔහුව කෙලෙස් ක්‍රීඩාවෙන් සතුටුකරවා ආවෙමි'' යැයි කියයි.

• අථ තෙ [කතිප+අහං+අච්චයෙන] කතිපාහච්චයෙන ධුත්තානං කහාපණෙ දත්වා ''ගච්ඡථ සුන්දරිං මාරෙත්වා සමණස්ස ගොතමස්ස ගන්ධකුටියා සමීපෙ [මාලා-කචවර+අන්තරෙ] මාලාකචවරන්තරෙ නික්ඛිපිත්වා එථා''ති වදිංසු. තෙ තථා අකංසු.

★ අථ තෙ (ඉක්බිති ඔවුන්) [කතිප+අහං+අච්චයෙන] කතිපාහච්චයෙන (කිහිප දිනක් ඇවෑමෙන්) ධුත්තානං කහාපණෙ දත්වා (ධූර්තයන්ට කහවනු දී) ''ගච්ඡථ සුන්දරිං මාරෙත්වා (යව සුන්දරිය මරා) සමණස්ස ගොතමස්ස (ශ්‍රමණ ගෞතමයන්ගේ) ගන්ධකුටියා සමීපෙ (සඳුන්කුටිය සමීගයේ/ ලග) [මාලා-කචවර+අන්තරෙ] මාලාකචවරන්තරෙ (පරමල් අතරේ) නික්ඛිපිත්වා (දමා) එථා''ති වදිංසු (එවයි කීහ) තෙ තථා අකංසු (ඔවුන් එසේ කලහ)

☞ ඉක්බිති ඔවුන් කිහිප දිනක් ඇවෑමෙන් ධූර්තයන්ට කහවනු දී ''යව සුන්දරිය මරා ශ්‍රමණ ගෞතමයන්ගේ සඳුන්කුටිය ලග පරමල් අතරේ දමා එව''යි කීහ. ඔවුන් එසේ කලහ.

• තතො තිත්ථියා ''සුන්දරිං න පස්සාමා''ති කොලාහලං කත්වා රඤ්ඤො ආරොචෙත්වා ''කහං වො ආසඩ්කා''ති වුත්තා ''ඉමෙසු දිවසෙසු ජෙතවනෙ වසති, [තත්ථ+අස්සා] තත්ථස්සා පවත්තිං න ජානාමා''ති වත්වා

★ තතො තිත්ථියා (ඉක්බිති තීර්තකයෝ) ''සුන්දරිං න පස්සාමා''ති (සුන්දරිය නො දක්නෙමු/ පේන්ඩනෑ යැයි) කොලාහලං කත්වා (කෝලාහල කර) රඤ්ඤො ආරොචෙත්වා (රජුට දන්වා) ''කහං (කොහේ) වො (නුඹලාට) ආසඩ්කා''ති වුත්තා (සැකදැයි ඇසූකල) ''ඉමෙසු දිවසෙසු (මේ දවස්වල) ජෙතවනෙ වසති (ජේතවනයෙහි වාසයකරයි / වාසයකරේ) [තත්ථ+අස්සා] තත්ථස්සා (එහි ඇගේ) පවත්තිං (තොරතුරු) න ජානාමා''ති වත්වා (නො දන්නෙමු යැයි කියා)

☞ ඉක්බිති තීර්තකයෝ ''සුන්දරිය පේන්ඩනෑ'' යැයි කෝලාහල කර රජුට දන්වා ''නුඹලාට කොහේ සැකද'' යැයි ඇසූකල ''මේ දවස්වල ජේතවනයෙහි වාසයකරේ, එහි ඇගේ තොරතුරු නො දන්නෙමු'' යැයි කියා

• ''තෙන හි ගච්ඡථ, නං විචිනථා''ති රඤ්ඤා අනුඤ්ඤාතා අත්තනො උපට්ඨාකෙ ගහෙත්වා ජෙතවනං ගන්ත්වා විචිනන්තා මාලාකචවරන්තරෙ තං දිස්වා මඤ්චකං ආරොපෙත්වා නගරං පවෙසෙත්වා

★ ''තෙන හි ගච්ඡථ (එහෙනම් යන්න), නං විචිනථා''ති (ඇය සොයාබලන්න යැයි) රඤ්ඤා අනුඤ්ඤාතා (රජුගෙන් අවසරයලැබ) අත්තනො උපට්ඨාකෙ ගහෙත්වා (තමන්ගේ උපස්ථායකයන් ගෙන) ජෙතවනං ගන්ත්වා (ජේතවනයට ගොස්) විචිනන්තා (සොයමින්) මාලාකචවරන්තරෙ (පරමල් අතරේ) තං දිස්වා (ඇය දැක) මඤ්චකං ආරොපෙත්වා (ඇඳක තබාගෙන) නගරං පවෙසෙත්වා (නගරයට ඇතුලුකරවා / ගෙනවිත්)

☞ ''එහෙනම් යන්න ඇය සොයාබලන්න'' යැයි රජුගෙන් අවසරයලැබ තමන්ගේ උපස්ථායකයන් සමග ජේතවනයට ගොස් ඈ සොයමින් පරමල් අතරේ ඇය දැක ඇඳක තබාගෙන නගරයට ගෙනවිත්

• ''සමණස්ස ගොතමස්ස සාවකා 'සත්ථාරා කතං පාපකම්මං පටිච්ඡාදෙස්සාමා'ති සුන්දරිං මාරෙත්වා මාලාකචවරන්තරෙ නික්ඛිපිංසූ''ති රඤ්ඤො ආරොචයිංසු.

★ ''සමණස්ස ගොතමස්ස සාවකා (ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ) 'සත්ථාරා (ශාස්තෘන්/ ගැරුවරයා) කතං පාපකම්මං (කරනලද පව/ පාප ක්‍රියාව) පටිච්ඡාදෙස්සාමා'ති (වසන්නෙමු යැයි) සුන්දරිං මාරෙත්වා (සුන්දරිය මරා) මාලාකචවරන්තරෙ (පරමල් අතරේ) නික්ඛිපිංසූ''ති (දැමුවෝයැයි) රඤ්ඤො ආරොචයිංසු (රජුට දැනුම්දුන්නාහ)

☞ '' ශ්‍රමණ ගෞතමයන්ගේ ශ්‍රාවකයෝ, ශාස්තෘන් කරනලද පව වසන්නෙමු යැයි, සුන්දරිය මරා පරමල් අතරේ දැමුවෝය'' යැයි රජුට දැනුම්දුන්නාහ.

• රාජා ''තෙන හි ගච්ඡථ, නගරං ආහිණ්ඩථා''ති ආහ. තෙ නගරවීථීසු ''පස්සථ සමණානං සක්‍යපුත්තියානං කම්ම''න්තිආදීනි වත්වා පුන රඤ්ඤො නිවෙසනද්වාරං ආගමිංසු.

★ රාජා (රජු) ''තෙන හි ගච්ඡථ (එහෙනම් යන්න) නගරං ආහිණ්ඩථා''ති ආහ (නගරයෙහි ඇවිදින්න යැයි කීය) තෙ නගර-වීථීසු (ඔවුන් නගරයේ පාරවල්වල) ''පස්සථ (බලව්) සමණානං සක්‍යපුත්තියානං (ශ්‍රමණ සක්‍යපුත්ත්‍රයන්ගේ) [කම්මං+ඉති] කම්ම''න්ති (ක්‍රියා යැයි/ වැඩ යැයි) ආදීනි වත්වා (ආදීදේ කියා) පුන රඤ්ඤො (නැවත රජුගේ) නිවෙසන-ද්වාරං ආගමිංසු (ගේ දොරට ගියාහ)

☞ රජු ''එහෙනම් යන්න, නගරයෙහි ඇවිදින්න'' යැයි කීය. ඔවුන් නගරයේ පාරවල්වල ''බලව් ශ්‍රමණ සක්‍යපුත්ත්‍රයන්ගේ වැඩ'' යැයි ආදීදේ කියා, නැවත රජුගේ ගේ දොරට ගියාහ.

• රාජා සුන්දරියා සරීරං ආමකසුසානෙ අට්ටකං ආරොපෙත්වා රක්ඛාපෙසි. සාවත්ථීවාසිනො ඨපෙත්වා අරියසාවකෙ සෙසා යෙභුය්‍යෙන ''පස්සථ සමණානං සක්‍යපුත්තියානං කම්ම''න්තිආදීනි වත්වා අන්තොනගරෙපි බහිනගරෙපි භික්ඛූ අක්කොසන්තා විචරන්ති.

★ රාජා සුන්දරියා සරීරං (රජු සුන්දරියගේ සිරුර) ආමක-සුසානෙ (අමු සොහොනෙහි) අට්ටකං ආරොපෙත්වා (මැස්සක දමා / මැස්සක තබා) රක්ඛාපෙසි (රැක්කවිය) සාවත්ථී-වාසිනො (සැවත්නුවර වැසියෝ) ඨපෙත්වා (හැර) අරියසාවකෙ (ආර්ය ශ්‍රාවකයන්) සෙසා (අනිත්අය) යෙභුය්‍යෙන (බොහෝසේ) ''පස්සථ (බලව්) සමණානං සක්‍යපුත්තියානං (ශ්‍රමණ සක්‍යපුත්ත්‍රයන්ගේ) [කම්මං+ඉති] කම්ම''න්ති (ක්‍රියා යැයි/ වැඩ යැයි) ආදීනි වත්වා (ආදීදේ

කියා) අන්තො-නගරෙ-පි (ඇතුල් නගරයේ ද/ නගරය ඇතුලේ ද) බහින-ගරෙ-පි (නගරයෙන් පිටද) භික්ඛූ අක්කොසන්තා විවරන්ති (භික්ෂූන්ට බනිමින් හැසිරෙති)

☞ රජු සුන්දරියගේ සිරුර අමු සොහොනෙහි මැස්සක තබා රැක්කවිය. සැවත්නුවර වැසියන්ගෙන් ආර්ය ශ්‍රාවකයන් හැර අනිත්අය බොහෝසේ ‘‘බලවි ශ්‍රමණ සක්‍යපුත්ත්‍රයන්ගේ වැඩ’’ යැයි ආදීදේ කියා, නගරය ඇතුලේ ද නගරයෙන් පිටද භික්ෂූන්ට බනිමින් හැසිරෙති.

• භික්ඛූ තං පවත්තිං තථාගතස්ස ආරොචෙසුං. සත්ථා ‘‘තෙන හි තුම්හෙපි තෙ මනුස්සෙ එවං පටිවොදෙථා’’ති වත්වා ඉමං [ගාථං+ආහ]ගාථමාහ

★ භික්ඛූ තං පවත්තිං (භික්ෂූන් ඒ පුවත) තථාගතස්ස ආරොචෙසුං (තථාගතයන් වහන්සේට දැනුම්දුන්නාහ) සත්ථා (ශාස්තෘන් වහන්සේ) ‘‘තෙන හි තුම්හෙ-පි (එසේනම් නුඹලා ද) තෙ මනුස්සෙ (ඒ මිනිසුන්ට) එවං පටිවොදෙථා’’ති (මෙසේ නැවත චෝදනාකරන්න යැයි) වත්වා (කියා) ඉමං (මේ) [ගාථං+ආහ] ගාථමාහ (ගාථාව කීය/ දේශනාකලේය)

☞ භික්ෂූන් ඒ පුවත තථාගතයන් වහන්සේට දැනුම්දුන්නාහ. ශාස්තෘන් වහන්සේ ‘‘එසේනම් නුඹලා ද ඒ මිනිසුන්ට මෙසේ නැවත චෝදනාකරන්න’’ යැයි කියා මේ ගාථාව දේශනාකලේය.

‘‘අභූතවාදී නිරයං උපෙති, - යො වාපි කත්වා න කරොමීචාහ;
උභොපි තෙ පෙච්ච සමා භවන්ති, - නිහීනකම්මා මනුජා පරත්ථා’’ති.

අභූතවාදී නිරයං උපෙති, යො වාපි [පාප කම්මං] කත්වා න කරොමීචාහ, [කරොමි-ච+ආහ] තෙ නිහීනකම්මා මනුජා උභොපි පෙච්ච පරත්ථ සමා භවන්ති,’’ති
[පෙච්ච = පරත්ථ = (පරලොව)]

★ අභූතවාදී (බොරුවට චෝදනාකරන්නා) නිරයං උපෙති (නිරයට එළඹේ/ යයි) යො වාපි (යමෙක් හෝ) [පාප කම්මං] කත්වා (පව්කම් කර) න [කරොමි-ච+ආහ] කරොමීචාහ (නො කලෙමි හෝ කියයිද), තෙ නිහීනකම්මා (ඒ ලාමක ක්‍රියාඇති) මනුජා උභො-පි (මිනිසුන් දෙදෙනා ද) පෙච්ච පරත්ථ (පරලොවදී) සමා භවන්ති (සමවෙති)

☞ බොරුවට චෝදනාකරන්නා නිරයට යයි. යමෙක් පව්කම් කර නො කලෙමි කියයිද, ලාමක ක්‍රියාඇති ඒ මිනිසුන් දෙදෙනා පරලොවදී සමවෙති.

• තත්ථ ‘‘**අභූතවාදී’’**ති පරස්ස දොසං අදිස්වාව මුසාවාදං කත්වා තුච්ඡෙන පරං අබ්භාචික්ඛන්තො. ‘‘**කත්වා’’**ති යො වා පන පාපකම්මං කත්වා ‘‘[න+අහං] නාහං එතං කරොමී’’ති ආහ.

★ තත්ථ (මෙහි/ මෙම ගාථාවේ) ‘‘**අභූතවාදී’’**ති (‘‘**අභූතවාදී’’** යන්නෙහි තේරුම) පරස්ස දොසං අදිස්වාව (අනෙකාගේ දෝසයක් නොදැක) මුසාවාදං කත්වා (බොරුකියා) තුච්ඡෙන (බොරුවෙන්) පරං (අනෙකාට) අබ්භාචික්ඛන්තො (චෝදනාකරන්නාය) ‘‘**කත්වා’’**ති (‘‘**කත්වා**’’ යන්නෙහි තේරුම) යො වා පන (යමෙක් හෝ වනාහි) පාපකම්මං කත්වා (පව්කම්කර) ‘[න+අහං] නාහං එතං කරොමී’’ති (මම එය නොකලෙමි යැයි) ආහ (කීය)

☞ මෙම ගාථාවේ ‘‘**අභූතවාදී’’** යන්නෙහි තේරුම අනෙකාගේ දෝසයක් නොදැක බොරුකියා, බොරුවෙන් අනෙකාට චෝදනාකරන්නා යන්නයි. ‘‘**කත්වා**’’ යන්නෙහි තේරුම, යමෙක් පව්කම්කර ‘‘මම එය නොකලෙමි’’ යැයි කීම, යන්නයි.

• ‘‘**පෙච්ච සමා භවන්තී’’**ති තෙ උභොපි ජනා පරලොකං ගන්ත්වා නිරයං උපගමනෙන ගතියා සමා භවන්ති. ගතියෙව නෙසං පරිච්ඡින්නා, ආයු පන නෙසං න පරිච්ඡින්නං.

★ ‘‘**පෙච්ච සමා භවන්තී’’**ති (‘‘**පෙච්ච සමා භවන්තී**’’ යන්නෙහි තේරුම) තෙ උභොපි ජනා (ඒ දෙදෙනාම) පරලොකං ගන්ත්වා (පරලොව ගොස්) නිරයං උපගමනෙන (නිරයට යෑමෙන්) ගතියා සමා භවන්ති (ගතියෙන් සමවෙති යන්නයි.) ගති-යෙව (ගතිය ම/ උප්පත්තිය ම) නෙසං පරිච්ඡින්නා (ඔවුන්ගේ සමකරනලදී), ආයු පන (අයුෂ වනාහි) නෙසං න පරිච්ඡින්නං (ඔවුන්ගේ සම නොකරනලදී)

☞‘‘**පෙච්ච සමා භවන්තී**’’ යන්නෙහි තේරුම ඒ දෙදෙනාම පරලොව ගොස් නිරයට යෑමෙන් ගතියෙන් සමවෙති යන්නයි. උප්පත්තිය ම ඔවුන්ගේ සමකරනලදී, අයුෂ වනාහි ඔවුන්ගේ සම නොකරනලදී.

• [බහුකං+හි] බහුකඤ්හි පාපකම්මං කත්වා චිරං නිරයෙ පච්චන්ති, පරිත්තං කත්වා [අප්පමත්තකං+ඒව] අප්පමත්තකමෙව කාලං. යස්මා පන නෙසං [උභින්නං+අපි] උභින්නම්පි [ලාමකං+ඒව] ලාමකමෙව කම්මං, තෙන වුත්තං ‘‘**නිහීනකම්මා මනුජා පරත්ථා**’’ති.

★ [බහුකං+හි] බහුකඤ්හි (බොහෝ වනාහි) පාපකම්මං කත්වා (පව්කම් කර) චිරං (බොහෝ කාලයක්) නිරයෙ පච්චන්ති (නිරයේ පැසෙති) පරිත්තං කත්වා (අඩුවෙන් කර) [අප්පමත්තකං+ඒව] අප්පමත්තකමෙව කාලං (අඩුකාලයක් මය) යස්මා පන (යම්සේ වනාහි) නෙසං (ඒ) [උභින්නං+අපි] උභින්නම්පි (දෙදෙනාගේ ද) [ලාමකං+ඒව] ලාමකමෙව (ලාමක මය) කම්මං (ක්‍රියාව), තෙන වුත්තං (එබැවින් කියනලදී) ‘‘**නිහීනකම්මා මනුජා පරත්ථා**’’ති (‘‘**නිහීනකම්මා මනුජා පරත්ථා**’’ යැයි)

☞ පව්කම් බොහෝ කර බොහෝ කාලයක් නිරයේ පැසෙති, අඩුවෙන් කර අඩුකාලයක් ම පැසෙති, යම්සේ ඒ දෙදෙනාගේම ක්‍රියාව ලාමක වේද, එබැවින් කියනලදී ‘‘**නිහීනකම්මා මනුජා පරත්ථා**’’ යැයි

• දෙසනාවසානෙ බහූ සොතාපත්තිඵලාදීනි පාපුණිංසූති.
★ [දෙසනා+අවසානෙ] දෙසනාවසානෙ (දේශනාව අවසානයේදී) බහූ (බොහෝදෙනෙක්) [සොතාපත්තිඵල+ආදීනි] සොතාපත්තිඵලාදීනි පාපුණිංසූති (සෝතාපත්ති ආදී ඵලයනට පැමිණියාහ.)
☞ දේශනාව අවසානයේදී බොහෝදෙනෙක් සෝතාපත්ති ආදී ඵලයනට පැමිණියාහ.

• රාජා ‘‘සුන්දරියා අඤ්ඤෙහි මාරිතභාවං ජානාථා’’ති පුරිසෙ උය්‍යොජෙසි. අථ තෙ ධුත්තා තෙහි කහාපණෙහි සුරං පිවන්තා අඤ්ඤමඤ්ඤං කලහං කරිංසු.

★ රාජා (රජු) ‘‘සුන්දරියා (සුන්දරිය) අඤ්ඤෙහි (අන්‍යයන් විසින්) මාරිතභාවං (මැරුබව) ජානාථා’’ති (දැනගනුව යැයි) පුරිසෙ උය්‍යොජෙසි (පුරුෂයන්/ මිනිසුන් යෙදවූහ) අථ තෙ ධුත්තා (ඉක්බිත් ඒ ධූර්තයෝ) තෙහි කහාපණෙහි (ඒ කහවනු වලින්) සුරං පිවන්තා (සුරා/ රා බොමින්) අඤ්ඤමඤ්ඤං (එකිනෙකා) කලහං කරිංසු (කලහා කලාහ)

☞ රජු ‘‘සුන්දරිය අන්‍යයන් විසින් මැරුබව දැනගනුව’’ යැයි මිනිසුන් යෙදවූහ. ඉක්බිත් ඒ ධූර්තයෝ ඒ කහවනු වලින් රා බොමින් එකිනෙකා කලහා කලාහ.

• එකො එකං ආහ – ''ත්වං සුන්දරිං [එක+පහාරෙන+ඒව] එකප්පහාරෙනෙව මාරෙත්වා මාලාකචවරන්තරෙ නික්ඛිපිත්වා තතො ලද්ධකහාපණෙහි සුරං පිවසි, හොතු හොතූ''ති. රාජපුරිසා තෙ ධුත්තෙ ගහෙත්වා රඤ්ඤො දස්සෙසුං.

★ එකො එකං ආහ (එකෙක් එකෙකුට කීය) ''ත්වං සුන්දරිං (උඹ/ තෝ සුන්දරිය) [එක+පහාරෙන+ඒව] එකප්පහාරෙනෙව (එක පහරින් ම) මාරෙත්වා (මරා/ මරල) මාලාකචවරන්තරෙ (පරමල් අතරේ) නික්ඛිපිත්වා (දමා) තතො (එයින්) ලද්ධ-කහාපණෙහි (ලැබූ කහවණු වලින්) සුරං පිවසි (රා බොනවද) හොතු හොතූ''ති (වේවා වේවා/ හොදයි හොදයි/ කමක්නෑ කමක්නෑ යැයි) රාජපුරිසා (රාජපුරුෂයෝ) තෙ ධුත්තෙ ගහෙත්වා (ඒ ධූර්ථයන් අල්වාගෙන) රඤ්ඤො දස්සෙසුං (රජුට දැක්වූහ)

☞ එකෙක් එකෙකුට කීය, "උඹ සුන්දරිය එක පහරින් ම මරල පරමල් අතරේ දමා එයින් ලැබූ කහවණු වලින් රා බොනවද, හොදයි හොදයි" යැයි, රාජපුරුෂයෝ ඒ ධූර්ථයන් අල්වාගෙන රජුට දැක්වූහ.

• අථ නෙ රාජා ''තුම්හෙහි සා මාරිතා''ති පුච්ඡි. ''ආම, දෙවා''ති. ''කෙහි මාරාපිතා''ති? ''අඤ්ඤතිත්ථියෙහි, දෙවා''ති. රාජා තිත්ථියෙ පක්කොසාපෙත්වා පුච්ඡි. තෙ තථෙව වදිංසු.

★ අථ නෙ රාජා (එවිට ඔවුන්ගෙන් රජු) ''තුම්හෙහි (නුඹලා විසින්) සා මාරිතා''ති පුච්ඡි (ඇය මැරුවාද ? යැයි ඇසීය) ''ආම, දෙවා''ති (ඔව් දේවයන්වහන්ස) ''කෙහි මාරාපිතා''ති? (කව්රුන් විසින්ද මැරෙව්වෙ ?) ''අඤ්ඤ-තිත්ථියෙහි, දෙවා''ති (අන්‍යතීර්තකයන් විසින් දේවයන්වහන්ස) රාජා තිත්ථියෙ (රජු තිර්ථකයන්) පක්කොසාපෙත්වා පුච්ඡි (කැදවා ඇසීය) තෙ තථෙව වදිංසු (ඔවුන් එසේම කීහ)

☞ එවිට ඔවුන්ගෙන් රජු "නුඹලා විසින් ඇය මැරුවාද ?" යැයි ඇසීය. "ඔව් දේවයන්වහන්ස" "කව්රුන් විසින්ද මැරෙව්වෙ ?" "අන්‍යතීර්තකයන් විසින් දේවයන්වහන්ස" රජු තිර්ථකයන් කැදවා ඇසීය. ඔවුන් එසේම කීහ.

• තෙන හි ගච්ඡථ තුම්හෙ එවං වදන්තා නගරං ආහිණ්ඩථ – ''අයං සුන්දරී සමණස්ස ගොතමස්ස අවණ්ණං ආරොපෙතුකාමෙහි අම්හෙහි මාරාපිතා, නෙව සමණස්ස ගොතමස්ස, න සාවකානං දොසො අත්ථි, [අම්හාකං+ඒව] අම්හාකමෙව දොසො''ති.

★ තෙන හි ගච්ඡථ (එහෙනම් යව්) තුම්හෙ එවං වදන්තා (උඹලා මෙහෙම කියමින්) නගරං ආහිණ්ඩථ (නගරයෙහි ඇවිදිව්) ''අයං සුන්දරී (මේ සුනදරිය) සමණස්ස ගොතමස්ස (ශ්‍රමණ ගෞතමයන්ට) අවණ්ණං (අගුණ) ආරොපෙතුකාමෙහි (පටවනු කැමතිවූ/ පතුරුවනු කැමතිවූ) අම්හෙහි මාරාපිතා (අප විසින් මරනලදී) නෙව සමණස්ස ගොතමස්ස (නොවේමය ශ්‍රමණ ගෞතමයන්ගේ) න සාවකානං දොසො අත්ථි (ශ්‍රාවකයන්ගේ දෝසයක් නැත) [අම්හාකං+ඒව] අම්හාකමෙව දොසො''ති (අපගේ ම දෝසය යැයි)

☞ එහෙනම් යව්, උඹලා මෙහෙම කියමින් නගරයෙහි ඇවිදිව් "මේ සුනදරිය, ශ්‍රමණ ගෞතමයන්ගේ අගුණ පතුරුවනු කැමතිවූ අප විසින් මරනලදී, ශ්‍රමණ ගෞතමයන්ගේ හෝ ශ්‍රාවකයන්ගේ හෝ දෝසයක් නැත. අපගේ මය දෝසය" යැයි

• තෙ තථා කරිංසු. බාලමහාජනො තදා සද්දහි, තිත්ථියාපි ධුත්තාපි පුරිසවධදණ්ඩං පාපුණිංසු. තතො පට්ඨාය බුද්ධානං සක්කාරො මහා අහොසීති.

★ තෙ තථා කරිංසු (ඔවුන් එසේ කලහ) බාල-මහාජනො (නුවණ අඩු මහජනයා) තදා සද්දහි (එකල විශ්වාසකලාය / එවිට විශ්වාසකලාය) තිත්ථියා-පි ධුත්තා-පි (තීර්ථකයෝ ද ධූර්ථයෝ ද) පුරිස-වධ-දණ්ඩං පාපුණිංසු (මිනිසුන්ගේ වදදීම් දඩුවම් වලට පැමිනියාහ/ ලක්වූහ) තතො පට්ඨාය (එතැන් පටන්) බුද්ධානං සක්කාරො මහා අහොසීති (බුදුන්ට සත්කාර වැඩි විය)

☞ ඔවුන් එසේ කලහ. නුවණ අඩු මයජනයා එකල විශ්වාසකලාය. තීර්ථකයෝ ද ධූර්ථයෝ ද මිනිසුන්ගේ වදදීම් දඩුවම් වලට ලක්වූහ. එතැන් පටන් බුදුන්ට සත්කාර වැඩි විය.

සුන්දරීපරිබ්බාජිකාවත්ථුං නිට්ඨිතං (සුන්දරී පරිබ්බාජිකාවගේ කථාව නිමියේය.)

2 කුම්භසොඝකසෙට්ඨීවත්ථු (කුම්භඝෝසක සිටුගේ කථාව)

• අතීතේ කිර [රාජගහනගරස්මිං+හි] රාජගහනගරස්මිඤ්හි රාජගහසෙට්ඨිනො ගෙහෙ අභිවාතරොගො උප්පජ්ජි, තස්මිං උප්පන්නෙ මක්ඛිකා ආදිං කත්වා යාව ගාවා පඨමං තිරච්ඡානගතා මරන්ති, තතො දාසකම්මකරො, සබ්බපච්ඡා ගෙහසාමිකා, තස්මා සො රොගො සබ්බපච්ඡා [සෙට්ඨිං+ච ජායං+ච] සෙට්ඨිඤ්ච ජායඤ්ච ගණ්හි.

★ අතීතේ කිර (අතීතයේ වනාහි) [රාජගහනගරස්මිං+හි] රාජගහනගරස්මිඤ්හි (රජගහ නගරයෙහි වනාහි) රාජගහ-සෙට්ඨිනො ගෙහෙ (රජගහ සිටුගේ ගෙදර) අභිවාතරොගො උප්පජ්ජි (අභිවාත රෝගය ඇතිවිය), තස්මිං උප්පන්නෙ (එය උපන්කල) මක්ඛිකා ආදිං කත්වා (මැස්සන් මුල්කරගෙන/ මැස්සන්ගෙන් පටන්ගෙන) යාව ගාවා (ගවයන් දක්වා) පඨමං තිරච්ඡානගතා මරන්ති (පළමුව තිරිසන් සතුන් මරති) තතො දාසකම්මකරො (ඉන්පසුව දාස කම්කරුවන්), සබ්බපච්ඡා (සියල්ලට පසුව) ගෙහසාමිකා (ගෙයි හිමිකරුවෝ) තස්මා සො රොගො (එබැවින් ඒ රෝගය) සබ්බපච්ඡා (සියල්ලට පසුව) [සෙට්ඨිං+ච ජායං+ච] සෙට්ඨිඤ්ච ජායඤ්ච ගණ්හි (සිටානන් ද බිරිඳ ද ගත්තාය)

☞ අතීතයේ රජගහ නගරයෙහි වනාහි රජගහ සිටුගේ ගෙදර අභිවාත රෝගය ඇතිවිය. එය උපන්කල මැස්සන්ගෙන් පටන්ගෙන ගවයන් දක්වා පළමුව තිරිසන් සතුන් මරති. ඉන්පසුව දාස කම්කරුවන්, සියල්ලට පසුව ගෙයි හිමිකරුවෝ, එබැවින් ඒ රෝගය සියල්ලට පසුව සිටානන්ට ද බිරිඳට ද හැදුනි.

• තෙ රොගෙන ඵුට්ඨා පුත්තං සන්තිකෙ යීතං ඔලොකෙත්වා අස්සුපුණ්ණෙහි නෙත්තෙහි තං ආහංසු – ‘‘තාත, ඉමස්මිං කිර රොගෙ උප්පන්නෙ භිත්තිං භින්දිත්වා පලායන්තාව ජීවිතං ලභන්ති,

★ තෙ රොගෙන ඵුට්ඨා (ඔවුන් රෝගය වැළදී) පුත්තං සන්තිකෙ යීතං (පුතා ලඟ සිටින) ඔලොකෙත්වා (බලා) අස්සු-පුණ්ණෙහි නෙත්තෙහි (කඳුලු පිරුණු ඇස්වලින්) තං ආහංසු (ඔහුට කීහ) ‘‘තාත,(පුතේ) ඉමස්මිං කිර රොගෙ (මේ වනාහි රෝගය) උප්පන්නෙ (උපන්කල) භිත්තිං භින්දිත්වා (බිත්තිය බිඳ) පලායන්තා-ව (පලායන්නන් ම) ජීවිතං ලභන්ති (ජීවිතය ලබති)

☞ ඔවුන් රෝගය වැළදී කඳුලු පිරුණු ඇස්වලින් ලඟ සිටින පුතාදෙස බලා ඔහුට කීහ. ‘‘පුතේ මේ රෝගය උපන්කල බිත්තිය බිඳ පලායන්නන් ම ජීවිතය ලබති,

• ත්වං අම්හෙ අනොලොකෙත්වා පලායිත්වා ජීවන්තො [පුන+ආගන්ත්වා] පුනාගන්ත්වා අම්හාකං [අසුක+ඨානෙ] අසුකට්ඨානෙ නාම චත්තාලීස ධනකොටියො නිදහිත්වා ඨපිතා, තා උද්ධරිත්වා ජීවිකං කප්පෙය්‍යාසි’’ති.

★ ත්වං අම්හෙ අනොලොකෙත්වා (ඔබ අපගැන නොබලා) පලායිත්වා ජීවන්තො (පලාගොස් ජීවත්වෙමින්) [පුන+ආගන්ත්වා] පුනාගන්ත්වා (නැවත ඇවිත්) අම්හාකං (අපගේ) [අසුක+ඨානෙ] අසුකට්ඨානෙ නාම (අසවල් ස්ථානයේ වනාහි) චත්තාලීස ධන-කොටියො (සතලිස් කෝටියක් ධනය) නිදහිත්වා ඨපිතා (නිදින්කර තබනලදී) තා උද්ධරිත්වා (ඒවා ගොඩගෙන) ජීවිකං කප්පෙය්‍යාසි’’ති (ජීවිතය ගතකරන්න යැයි)

☞ ඔබ අපගැන නොබලා පලාගොස් ජීවත්වෙමින්, නැවත ඇවිත් අසවල් ස්ථානයේ අපගේ සතලිස් කෝටියක් ධනය නිදින්කර තියෙනව, ඒවා ගොඩගෙන ජීවිතය ගතකරන්න’’ යැයි

• සො තෙසං වචනං සුත්වා රුදමානො මාතාපිතරො වන්දිත්වා මරණභයභීතො භිත්තිං භින්දිත්වා පලායිත්වා පබ්බතගහනං ගන්ත්වා ද්වාදස වස්සානි තත්ථ වසිත්වා මාතාපිතුවසනට්ඨානං පච්චාගඤ්ඡි.

★ සො තෙසං වචනං සුත්වා (ඔහු ඔවුන්ගේ වදන් අසා) රුදමානො මාතාපිතරො වන්දිත්වා (අඬමින් මව්පියන් වැඳ) මරණ-භය-භීතො (මරණ බයින් බියව) භිත්තිං භින්දිත්වා පලායිත්වා (බිත්තිය බිඳ පලාගොස්) පබ්බත-ගහනං ගන්ත්වා (කඳු ප්‍රදේශයකට ගොස්) ද්වාදස වස්සානි (අවුරුදු දොලසක්) තත්ථ වසිත්වා (එහි වාසයකර) මාතාපිතු-වසනට්ඨානං (මව්පියන් වසන තැනට) පච්චාගඤ්ඡි (පසුව ගියේය/ නැවත ගියේය)

☞ ඔහු ඔවුන්ගේ වදන් අසා අඬමින් මව්පියන් වැඳ මරණ බයින් බියව බිත්තිය බිඳ පලාගිහින්, කඳු ප්‍රදේශයකට ගොස් අවුරුදු දොලසක් එහි වාසයකර, මව්පියන් වසන තැනට නැවත ගියේය.

• අථ නං දහරකාලෙ ගන්ත්වා පරූළ්හකෙසමස්සුකාලෙ ආගතත්තා න කොචි සඤ්ජානි. සො මාතාපිතූහි දින්නසඤ්ඤාවසෙන ධනට්ඨානං ගන්ත්වා ධනස්ස අරොගභාවං ඤත්වා චින්තෙසි

★ අථ නං (ඉක්බිති ඔහුව) දහරකාලෙ ගන්ත්වා (ලමාකාලයේ ගොස්) පරූළ්හ-කෙසමස්සු-කාලෙ (වැඩුනු කෙස්රුවිල් ඇතිකාලයේ) ආගතත්තා (ආ බැවින්) න කොචි සඤ්ජානි (කිසිවෙක් හැඳින නො ගත්තේය) සො මාතාපිතූහි (ඔහු මව්පියන් විසින්) දින්න-සඤ්ඤා-වසෙන (දුන් සලකුණු අනුව) ධනට්ඨානං (ධනය ඇති තැනට) ගන්ත්වා (ගොස්) ධනස්ස අරොගභාවං (ධනය සුරුකිව ඇතිබව) ඤත්වා චින්තෙසි (දැන සිතුවේය)

☞ ඉක්බිති ඔහු ලමාකාලයේ ගොස් වැඩුනු කෙස්රුවිල් ඇතිකාලයේ ආ බැවින්, කිසිවෙක් ඔහුව හැඳින නො ගත්තේය. ඔහු මව්පියන් විසින් දුන් සලකුණු අනුව ධනය ඇති තැනට ගොස්, ධනය සුරුකිව ඇතිබව දැන මෙසේ සිතුවේය.

• ‘‘මං න කොචි සඤ්ජානාති, [සචේ+අහං] සචාහං ධනං උද්ධරිත්වා වලඤ්ජිස්සාමි, ‘එකෙන දුග්ගතෙන නිධි උද්ධතො’ති මං ගහෙත්වා විහෙඨෙය්‍යුං, [යංනූන+අහං] යංනූනාහං භතිං කත්වා ජීවෙය්‍ය’’න්ති.

★ ‘‘මං න කොචි සඤ්ජානාති (මාව කිසිවෙක් නො හඳුනයි) [සචේ+අහං] සචාහං (ඉඳින් මම) ධනං උද්ධරිත්වා (ධනය ගොඩගෙන) වලඤ්ජිස්සාමි (පාවිච්චිකලොත්) ‘එකෙන දුග්ගතෙන (එක් දුප්පතෙක් විසින්) නිධි උද්ධතො’ති (නිදානයක් ගොඩගත්තේ යැයි) මං ගහෙත්වා විහෙඨෙය්‍යුං (මාව ගෙන වෙහෙසවන්නාහ) [යංනූන+අහං] යංනූනාහං (ඉතාහොදයි මම) භතිං කත්වා (කුලීවැඩ කර) ජීවෙය්‍ය’’න්ති (ජීවත් වන්නේ නම් යැයි)

☞ “මාව කිසිවෙක් නො හඳුනයි, ඉඳින් මම ධනය ගොඩගෙන පාවිච්චිකලොත්, ‘එක් දුප්පතෙක් විසින් නිදානයක් ගොඩගත්තේය’ යැයි, මාව ගෙන වෙහෙසවන්නාහ. මම කුලීවැඩ කර ජීවත් වන්නේ නම් ඉතාහොදයි” යැයි

• අථෙකං පිලොතිකං නිවාසෙත්වා, ‘‘අත්ථි කොචි භතකෙන අත්ථිකො’’ති පුච්ඡන්තො භතකවීථිං පාපුණි. අථ නං භතකා දිස්වා, ‘‘සචෙ අම්හාකං එකං කම්මං කරිස්සසි, භත්තවෙතනං තෙ දස්සාමා’’ති ආහංසු.

★ [අථ+ඒකං] අථෙකං (ඉක්බිත් එක්) පිලොතිකං නිවාසෙත්වා (කඩමහල්ලක් ඇඳගෙන) ‘‘අත්ථි කොචි (ඇත්ද කිසිවෙක්) හතකෙන (කුලිවැඩකින්) අත්ථිකො’’ති (ප්‍රයෝජනයක් ඇති) පුච්ඡන්තො (අසමින්) හතකවීථිං (කුලිවැඩ කරුවන්ගේ වීථියට) පාපුණි (පැමිණියාය) අථ නං (ඉක්බිති ඔහුව) හතකා දිස්වා (කුලීවැඩකරුවෝ දැක) ‘‘සචෙ අම්හාකං (ඉඳින් අපගේ) එකං කම්මං කරිස්සසි (එක් වැඩක් කරන්නේ නම්) භත්තවෙතනං (කැම වියදම්) තෙ දස්සාමා’’ති (ඔබට දෙන්නෙමු යැයි) ආහංසු (කීහ)

☞ ඉක්බිත් එක් කඩමහල්ලක් ඇඳගෙන “කිසිවෙකුට කුලිවැඩකින් ප්‍රයෝජනයක් ඇත්ද” යැයි අසමින් කුලිවැඩ කරුවන්ගේ වීථියට පැමිණියාය. ඉක්බිති කුලීවැඩකරුවෝ ඔහුව දැක “ඉඳින් අපගේ එක් වැඩක් කරන්නේ නම්, කැම වියදම් ඔබට දෙන්නම්” යැයි කීහ.

• ‘‘කිං කම්මං නාමා’’ති? ‘‘පබොධනවොදනකම්මං. සචෙ උස්සහසි, පාතොව උට්ඨාය ‘තාතා, උට්ඨහථ, සකටානි සන්නය්හථ, ගොණෙ යොජෙථ, හත්ථිඅස්සානං තිණත්ථාය ගමනවෙලා; අම්මා, තුම්හෙපි උට්ඨහථ, යාගුං පචථ, භත්තං පචථා’ති විවරිත්වා ආරොචෙහී’’ති.

★ ‘‘කිං කම්මං නාමා’’ති? (මොනවගේ වැඩක්ද) ‘‘පබොධන-වොදන-කම්මං (අවදිවෙන්ඩ අඩගැසීමේ වැඩක්/ නින්දෙන් අවදිකරන වැඩක්) සචෙ උස්සහසි (ඉඳින් කැමතිනම්) පාතොව උට්ඨාය (උදෑසනම නැගිට) ‘තාතා උට්ඨහථ, (පියවරුනි නැගිටින්න) සකටානි සන්නය්හථ (කරත්ත සූදානම්කරන්න) ගොණෙ යොජෙථ (ගොණුන් යොදවන්න) හත්ථි-අස්සානං (ඇත් අසුන්ගේ) තිණත්ථාය (තණ පිණිස) ගමනවෙලා (යනවේලාව) අම්මා (මව්වරුනි) තුම්හෙ-පි උට්ඨහථ (නුඹලාත් නැගිටින්න) යාගුං පචථ (කැඳ උයන්න) භත්තං පචථා’ති (බත් උයන්න යැයි) විවරිත්වා ආරොචෙහී’’ති (සැරිසරමින් දන්වන්න යැයි)

☞ “මොනවගේ වැඩක්ද” “නින්දෙන් අවදිකරන වැඩක්. ඉඳින් කැමතිනම්, උදෑසනම නැගිට, පියවරුනි නැගිටින්න, කරත්ත සූදානම්කරන්න, ගොණුන් යොදවන්න, ඇත් අසුන්ගේ තණ පිණිස යනවේලාව. මව්වරුනි නුඹලාත් නැගිටින්න, කැඳ උයන්න, බත් උයන්න, යැයි සැරිසරමින් දන්වන්න” යැයි

• සො ‘‘සාධූ’’ති සම්පටිච්ඡි. [අථ+අස්ස] අථස්ස වසනත්ථාය එකං ඝරං අදංසු. සො දෙවසිකං තං කම්මං අකාසි.

★ සො ‘‘සාධූ’’ති (ඔහු හොඳයි යැයි) සම්පටිච්ඡි (පිළිගත්තේය/ බාරගත්තේය) [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුට) වසනත්ථාය (වාසයකිරීම පිණිස) එකං ඝරං අදංසු (එක් ගෙයක් දුන්නාහ) සො දෙවසිකං (ඔහු දිනපතා) තං කම්මං අකාසි (ඒ වැඩේ කලාය)

☞ ඔහු “හොඳයි” යැයි බාරගත්තේය. ඉක්බිති ඔහුට වාසයකිරීම පිණිස එක් ගෙයක් දුන්නාහ. ඔහු දිනපතා ඒ වැඩේ කලාය.

• [අථ+අස්ස] අථස්ස එකදිවසං රාජා බිම්බිසාරො [සද්දං+අස්සොසි] සද්දමස්සොසි. සො පන [සබ්බ-රව+අඤ්ඤූ] සබ්බරවඤ්ඤූ අහොසි. තස්මා ‘‘මහාධනස්ස [පුරිසස්ස+ඒස] පුරිසස්සෙස සද්දො’’ති ආහ.

★ [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුගේ) එකදිවසං (එක්දිනක්) රාජා බිම්බිසාරො (බිම්බිසාර රජු) [සද්දං+අස්සොසි] සද්දමස්සොසි (සද්දය ඇසීය) සො පන (ඔහු/ රජු වනාහි) [සබ්බ-රව+අඤ්ඤූ] සබ්බරවඤ්ඤූ (සියල්ලන්ගේ හඬ හඳුනන්නෙක්) අහොසි (විය) තස්මා (එබැවින්)

''මහාධනස්ස (මහධනය ඇති) [පුරිසස්ස+ඒස] පුරිසස්සෙස සද්දො''ති ආහ (මිනිසකුගේ ඒ සද්දය යැයි කිය)

☞ ඉක්බිති එක්දිනක් බිම්බිසාර රජු ඔහුගේ සද්දය ඇසීය. රජු වනාහි සියල්ලන්ගේ හඬ හඳුනන්නෙක් විය. එබැවින් ''ඒ සද්දය මහධනය ඇති මිනිසකුගේ'' යැයි කිය

• [අථ+අස්ස] අථස්ස සන්තිකෙ ඨිතා එකා පරිචාරිකා ''රාජා යං වා තං වා න කථෙස්සති, ඉදං මයා ඤාතුං වට්ටතී''ති චින්තෙත්වා – ''ගච්ඡ, තාත, එතං ජානාහී''ති එකං පුරිසං පහිණි.

★ [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුගේ) සන්තිකෙ ඨිතා (ලඟ සිටි) එකා පරිචාරිකා (එක් සේවිකාවක්) ''රාජා යං වා තං වා න කථෙස්සති (රජු කටට එනදෙයක් නො කියයි) ඉදං මයා (මෙය මා විසින්) ඤාතුං වට්ටතී''ති (දැනගැනීමට සුදුසුය යැයි) චින්තෙත්වා (සිතා) ''ගච්ඡ, තාත (යන්න පුතා) එතං ජානාහී''ති (එය දැනගෙන එන්න යැයි) එකං පුරිසං පහිණි (එක් මිනිසෙක් යැවීය)

☞ ඉක්බිති ඔහුගේ ලඟ සිටි එක් සේවිකාවක් ''රජු කටට එනදෙයක් නො කියයි, මෙය මා විසින් දැනගැනීමට සුදුසුය'' යැයි සිතා ''යන්න පුතා, එය දැනගෙන එන්න'' යැයි එක් මිනිසෙක් යැවීය.

• සො වෙගෙන ගන්ත්වා තං දිස්වා ආගන්ත්වා, ''එකො භතකානං භතිකාරකො කපණමනුස්සො එසො''ති ආරොචෙසි. රාජා තස්ස වචනං සුත්වා තුණ්හී හුත්වා දුතියදිවසෙපි තතියදිවසෙපි තං තස්ස සද්දං සුත්වා තථෙව ආහ.

★ සො වෙගෙන ගන්ත්වා (ඔහු වේගයනේ ගොස්) තං දිස්වා ආගන්ත්වා (ඔහුව දැක පැමිණ) ''එකො (එක්) භතකානං (කුලීවැඩ කාරයන්ගේ) භතිකාරකො (කුලීවැඩකාරයෙක්) කපණ-මනුස්සො එසො''ති (දුප්පත් මිනිහෙක් ඔහු යැයි) ආරොචෙසි (දැනුම් දුන්නාය) රාජා තස්ස වචනං සුත්වා (රජු ඔහුගේ වචන අසා) තුණ්හී හුත්වා (නිහඬ වී) දුතිය-දිවසෙ-පි (දෙවන දවසේ ත්) තතිය-දිවසෙ-පි (තුන්වන දවසේ ත්) තං තස්ස (ඒ ඔහුගේ) සද්දං සුත්වා (සද්දය අසා) තථෙව ආහ (එලෙසම කීය)

☞ ඔහු වේගයනේ ගොස් ඔහුව දැක පැමිණ, ''කුලීවැඩ කාරයන්ගේ එක් කුලීවැඩකාරයෙක්, ඔහු දුප්පත් මිනිහෙක්'' යැයි දැනුම් දුන්නාය. රජු ඔහුගේ වචන අසා නිහඬ වී දෙවන දවසේත් තුන්වන දවසේත් ඔහුගේ ඒ සද්දය අසා එලෙසම කීය.

• සාපි පරිචාරිකා තථෙව චින්තෙත්වා පුනප්පුනං පෙසෙත්වා, ''කපණමනුස්සො එසො''ති වුත්තෙ චින්තෙසි – ''රාජා 'කපණමනුස්සො එසො'ති වචනං සුත්වාපි න සද්දහති, පුනප්පුනං 'මහාධනස්ස [පුරිසස්ස+ඒස] පුරිසස්සෙස සද්දො'ති වදති, [භවිතබ්බං+එත්ථ] භවිතබ්බමෙත්ථ කාරණෙන, යථාසභාවතො එතං ඤාතුං වට්ටතී''ති.

★ සා-පි පරිචාරිකා (ඒ සේවිකාව ද) තථෙව (ඒ ආකාරයෙන්ම) චින්තෙත්වා (සිතා) පුනප්පුනං පෙසෙත්වා (නැවත නැවත යවා) ''කපණමනුස්සො එසො''ති (දුප්පත් මිනිසෙක් ඔහු යැයි) වුත්තෙ (කියූකල) චින්තෙසි (සිතුවේය) ''රාජා (රජු) 'කපණමනුස්සො එසො'ති (දුප්පත් මිනිසෙක් ඔහු යැයි) වචනං සුත්වා-පි (වචනය අසාත්) න සද්දහති (විශ්වාස නොකරයි) පුනප්පුනං (නැවත නැවත) ''මහාධනස්ස (මහධනය ඇති) [පුරිසස්ස+ඒස] පුරිසස්සෙස සද්දො''ති වදති (මිනිසකුගේ ඒ සද්දය යැයි කියයි) [භවිතබ්බං+එත්ථ] භවිතබ්බමෙත්ථ කාරණෙන (විය යුතුය මෙහි කරුණක්/ මෙහි කාරණාවක් තිබිය යුතුය) යථාසභාවතො

(ඇතිආකාරයට ම/ සත්‍යය ආකාරයට ම) එතං ඤාතුං වට්ටතී''ති (මෙය දැනගැනිමට වටින්නේය යැයි)

☞ ඒ සේවිකාව ද ඒ ආකාරයෙන්ම සිතා නැවත නැවත යවා ''ඔහු දුප්පත් මිනිසෙක්'' යැයි කියූකල මෙසේ සිතුවේය, ''රජු 'ඔහු දුප්පත් මිනිසෙක්' යැයි යන වචනය අසාත් විශ්වාස නොකරයි. නැවත නැවත ඒ සද්දය මහධනය ඇති මිනිසකුගේ යැයි කියයි, මෙහි කාරණාවක් තිබියයුතුය, සත්‍යය ආකාරයට ම මෙය දැනගැනිමට වටින්නේය'' යැයි

• සා රාජානං ආහ, ''දෙව අහං සහස්සං ලභමානා ඨිතරං ආදාය ගන්ත්වා එතං ධනං රාජකුලං පවෙසෙස්සාමී''ති. රාජා තස්සා සහස්සං දාපෙසි.

★ සා රාජානං ආහ (ඇය රජුට කීය) ''දෙව (දේවයන් වහන්ස) අහං සහස්සං ලභමානා (මම දහසක් ලබාගෙන) ඨිතරං ආදාය ගන්ත්වා (දුව ගෙන ගොස්/ දුවත් සමග ගොස්) එතං ධනං (ඒ ධනය) රාජකුලං පවෙසෙස්සාමී''ති (රජගෙදරට ගෙනඑන්නෙමි යැයි) රාජා තස්සා (රජු ඇයට) සහස්සං දාපෙසි (දහසක් දෙවාලිය)

☞ ඇය රජුට කීය ''දේවයන් වහන්ස මම දහසක් ලබාගෙන දුවත් සමග ගොස් ඒ ධනය රජගෙදරට ගෙනඑන්නෙමි'' යැයි රජු ඇයට දහසක් දෙවාලිය.

• සා තං ගහෙත්වා ඨිතරං එකං මලිනධාතුකං වත්ථං නිවාසාපෙත්වා තාය සද්ධිං රාජගෙහතො නික්ඛමිත්වා මග්ගපටිපන්නා විය හතකවීථිං ගන්ත්වා එකං ඝරං පවිසිත්වා, ''අම්ම, මයං මග්ගපටිපන්නා, [එක+අහං+ද්වී+අහං] එකාහද්වීහං ඉධ විස්සමිත්වා ගමිස්සාමා''ති ආහ.

★ සා තං ගහෙත්වා (ඇය එය ගෙන) ඨිතරං (දුවට) එකං මලිනධාතුකං වත්ථං (එක් කිලිටි ඇඳුමක්) නිවාසාපෙත්වා (අන්දවා) තාය සද්ධිං (ඇයත් සමග) රාජගෙහතො නික්ඛමිත්වා (රජගෙදරින් නික්ම) මග්ගපටිපන්නා විය (ගමනක් යන්නන් මෙන්) හතකවීථිං ගන්ත්වා (කුලීවැඩකාර වීදියට ගොස්) එකං ඝරං පවිසිත්වා (එක් ගෙදරකට ඇතුලුවී) ''අම්ම, මයං මග්ගපටිපන්නා (අම්මෙ අපි ගමනක් යනගමන්) [එක+අහං+ද්වී+අහං] එකාහද්වීහං (එකදවසක් දෙකක්) ඉධ විස්සමිත්වා (මෙහෙ ගිමන් හැර) ගමිස්සාමා''ති ආහ (යන්නම් යැයි කීය)

☞ ඇය එය ගෙන දුවට එක් කිලිටි ඇඳුමක් අන්දවා ඇයත් සමග රජගෙදරින් නික්ම ගමනක් යන්නන් මෙන් කුලීවැඩකාර වීදියට ගොස් එක් ගෙදරකට ඇතුලුවී ''අම්මෙ අපි ගමනක් යනගමන්, එකදවසක් දෙකක් මෙහෙ ගිමන් හැර යන්නම්'' යැයි කීය.

• ''අම්ම, බහූනි ඝරමානුසකානි, න සක්කා ඉධ වසිතුං, එතං කුම්භඝොසකස්ස ගෙහං තුච්ඡං, තත්ථ ගච්ඡථා''ති.

★ ''අම්ම (අම්මෙ) බහූනි (බොහෝ/ ගොඩක්) ඝර-මානුසකානි (ගෙදර මිනිස්සු) න සක්කා (නො හැකිය) ඉධ වසිතුං (මෙහි ඉන්න) එතං කුම්භඝොසකස්ස ගෙහං තුච්ඡං (අර කුම්භඝෝසකගේ ගෙදර හිස්) තත්ථ ගච්ඡථා''ති (එහි යන්න)

☞ ''අම්මෙ, මේ ගෙදර මිනිස්සු ගොඩක් ඉන්නව, මෙහි ඉන්න බෑ, අර කුම්භඝෝසකගෙ ගෙදර හිස් එහි යන්න''

• සා තත්ථ ගන්ත්වා, ''සාමි, මයං මග්ගපටිපන්නකා, [එක+අහං+ද්වී+අහං] එකාහද්වීහං ඉධ වසිස්සාමා''ති වත්වා තෙන පුනප්පුනං පටික්ඛිත්තාපි, ''සාමි, [අජ්ජ+ඒක-දිවස-මත්තං] අජ්ජෙකදිවසමත්තං වසිත්වා පාතොව ගමිස්සාමා''ති නික්ඛමිතුං න ඉච්ඡී.

★ සා තත්ථ ගන්ත්වා (ඇය එහි ගොස්) ''සාමි (ස්වාමීණි) මයං මග්ග-පටිපන්නකා (අපි ගමනක් යන්නෝ) [එක+අහං+ද්වී+අහං] එකාහද්වීහං (එකදවසක් දෙකක්) ඉධ වසිස්සාමා''ති (මෙහි ඉන්නම් යැයි) වත්වා (කියා) තෙන පුනප්පුනං (ඔහු විසින් නැවත නැවත) පටික්ඛිත්තා-පි (ප්‍රති ෂේපකල-ත්) ''සාමි (ස්වාමීණි) [අජ්ජ+ඒක-දිවස-මත්තං] අජ්ජෙකදිවසමත්තං (අද එක්දවසක් වත්) වසිත්වා (ඉඳල) පාතොව ගමිස්සාමා''ති (උදෑසනම යන්නන් යැයි) නික්ඛමිතුං න ඉච්ඡී (යැමට නො කැමතිවිය)

☞ ඇය එහි ගොස් ''ස්වාමීණි අපි ගමනක් යන්නෝ, එකදවසක් දෙකක් මෙහි ඉන්නම්'' යැයි කියා, ඔහු විසින් නැවත නැවත ප්‍රතික්ෂේපකලත් ''ස්වාමීණි අද එක්දවසක් වත් ඉඳල උදෑසනම යන්නන්'' යැයි යැමට නො කැමතිවිය.

• සා [තත්ථ+ඒව] තත්ථෙව වසිත්වා පුනදිවසෙ තස්ස අරඤ්ඤගමනවෙලාය, ''සාමි, තව නිවාපං දත්වා යාහි, ආහාරං තෙ පචිස්සාමී''ති වත්වා, ''අලං, අම්ම, [අහං+ඒව] අහමෙව පචිත්වා භුඤ්ජිස්සාමී''ති වුත්තෙ

★ සා (ඈ) [තත්ථ+ඒව] තත්ථෙව (එහිම) වසිත්වා (වාසයකර/ ඉඳ) පුනදිවසෙ (දෙවන දිනයේ/ ඊලග දහසේ) තස්ස අරඤ්ඤ-ගමන-වෙලාය (ඔහු කැලේට යන වේලාවෙහි) ''සාමි (ස්වාමීණි) තව (ඔබගේ) නිවාපං (කෑම උයන වියදං) දත්වා යාහි (දී යන්න) ආහාරං (කෑම/ආහාර) තෙ (ඔබට) පචිස්සාමී''ති වත්වා (උයන්නන් යැයි කියා) ''අලං, අම්ම (ඕන්නෑ අම්මෙ) [අහං+ඒව] අහමෙව (මම ම) පචිත්වා භුඤ්ජිස්සාමී''ති වුත්තෙ (උයා කන්නන් යැයි කියූකල)

☞ ඈ එහිම ඉඳ දෙවන දිනයේ ඔහු කැලේට යන වේලාවෙහි ''ස්වාමීණි ඔබගේ කෑම උයන වියදං දී යන්න, ඔබට කෑම උයන්නන්'' යැයි කියා ''ඕන්නෑ අම්මෙ මම ම උයා කන්නන්'' යැයි කියූකල

• පුනප්පුනං නිබන්ධිත්වා තෙන දින්නෙ ගහිතමත්තකෙයෙව කත්වා අන්තරාපණතො භාජනානි වෙව [පරිසුද්ධ-තණ්ඩුල+ආදීනි] පරිසුද්ධතණ්ඩුලාදීනි ච ආහරාපෙත්වා රාජකුලෙ පචනනියාමෙන සුපරිසුද්ධං ඔදනං, සාධුරසානි ච ද්වෙ තීණි සූපබ්‍යඤ්ජනානි පචිත්වා තස්ස අරඤ්ඤතො ආගතස්ස අදාසි.

★ පුනප්පුනං නිබන්ධිත්වා (නැවත නැවත ඉල්ලා) තෙන දින්නෙ (ඔහු දුන්දෙයින්) ගහිත-මත්තකෙ-යෙව කත්වා (ගත් ප්‍රමාණයක් ලෙසම කර) අන්තරාපණතො (කඩවලින්) භාජනානි වෙව (භාජන මෙන් ම) [පරිසුද්ධ-තණ්ඩුල+ආදීනි] පරිසුද්ධතණ්ඩුලාදීනි ච (පිරිසිදු හාල් ආදිය ද) ආහරාපෙත්වා (ගෙන්නවා) රාජකුලෙ (රජගෙදර) පචන-නියාමෙන (උයන ආකාරයට ම) සුපරිසුද්ධං ඔදනං (අතිපිරිසිදු බතක්/ රසවත් බතක්) සාධුරසානි **ච** (ප්‍රණීත) ද්වෙ තීණි (දෙතුන්/ දෙකතුනක්) සූපබ්‍යඤ්ජනානි (ව්‍යඤ්ජන **ද**) පචිත්වා (උයා) තස්ස (ඒ) අරඤ්ඤතො (කැලයෙන්) ආගතස්ස අදාසි (ආවාහුට දුන්නාය)

☞ නැවත නැවත ඉල්ලා, ඔහු දුන්දෙයින් ගත් ප්‍රමාණයක් ලෙසම කර, කඩවලින් භාජන මෙන් ම පිරිසිදු හාල් ආදිය ද ගෙන්නවා, රජගෙදර උයන ආකාරයට ම රසවත් බතක් ද ප්‍රණීත ව්‍යඤ්ජන දෙකතුනක් උයා ඒ කැලයෙන් ආවා ඔහුට දුන්නාය.

• අථ නං භූඤ්ජිත්වා මුදුචිත්තතං ආපන්නං ඤත්වා, ‘‘සාමි, කිලන්තම්හ, [එක+අහං+ද්වී+අහං] එකාහද්වීහං [ඉධ+ඒව] ඉධෙව හොමා’’ති ආහ. සො ‘‘සාධූ’’ති සම්පටිච්ඡි.

★ අථ නං (ඉක්බිති ඔහු) භූඤ්ජිත්වා (කෑමකා) මුදු-චිත්තතං (මෘදු සිතකට) ආපන්නං ඤත්වා (පැමිණිබව දැන)‘‘සාමි (ස්වාමීණි) කිලන්තම්හ (වෙහෙසයි) [එක+අහං+ද්වී+අහං] එකාහද්වීහං (එකදවසක් දෙකක්) [ඉධ+ඒව] ඉධෙව (මෙහි ම) හොමා’’ති ආහ (ඉන්නන් යැයි කීය) සො ‘‘සාධූ’’ති සම්පටිච්ඡි (ඔහු හොඳයි යැයි පිළිගත්තාය/ කැමතිවිය)

☞ ඉක්බිති ඔහු කෑමකා සිත මෘදුවූබව දැන ‘‘ස්වාමීණි, වෙහෙසයි, එකදවසක් දෙකක් මෙහි ම ඉන්නන්’’ යැයි කීය. ඔහු ‘‘හොඳයි’’ යැයි කැමතිවිය.

• [අථ+අස්ස] අථස්ස [සායං+අපි] සායම්පි පුනදිවසෙපි මධුරභත්තං පචිත්වා අදාසි. අථ මුදුචිත්තං තස්ස ඤත්වා ‘‘සාමි, කතිපාහං [ඉධ+ඒව] ඉධෙව වසිස්සාමා’’ති. තත්ථ වසමානා තිඛිණෙන සත්ථෙන තස්ස මඤ්චවාණං හෙට්ඨාඅටනියං තහං තහං ඡින්දි.

★ [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුට) [සායං+අපි] සායම්පි (සවස ද) පුන-දිවසෙ-පි (දෙවන දිනයෙහි ද/ ඊලග දිනයෙහි ද) මධුර-භත්තං පචිත්වා අදාසි (මිහිරි බත් උයා දුනි) අථ (ඉක්බිති) මුදුචිත්තං (මෘදු සිත) තස්ස ඤත්වා (ඔහුගේ දැන) ‘‘සාමි (ස්වාමීණි) කතිපාහං (දිනකීපයක්) [ඉධ+ඒව] ඉධෙව (මෙහි ම) වසිස්සාමා’’ති (ඉන්නන්) තත්ථ වසමානා (එහි වාසයකරමින්) තිඛිණෙන සත්ථෙන (තියුණු ආයුධයකින්) තස්ස මඤ්ච-වාණං (ඔහුගේ ඇඳේ ලණු) හෙට්ඨා-අටනියං (විටිටමට යටින්) තහං තහං ඡින්දි (තැන් තැන්වලින් කැපීය)

☞ ඉක්බිති ඔහුට සවස ද ඊලග දිනයෙහි ද මිහිරි බත් උයා දුනි. ඉක්බිති ඔහුගේ සිත මෘදුබව දැන ‘‘ස්වාමීණි දිනකීපයක් මෙහි ම ඉන්නන්’’ යැයි, එහි වාසයකරමින් තියුණු ආයුධයකින් ඔහුගේ ඇඳේ ලණු, විටිටමට යටින් තැන් තැන්වලින් කැපීය.

• මඤ්චො තස්මිං ආගන්ත්වා නිසින්නමත්තෙයෙව හෙට්ඨා ඔලම්බි. සො ‘‘කස්මා අයං මඤ්චො එවං ඡිජ්ජිත්වා ගතො’’ති ආහ. ‘‘සාමි, දහරදාරකෙ වාරෙතුං න සක්කොමි, [එත්ථ+ඒව] එත්ථෙව සන්නිපතන්ති’’ති.

★ මඤ්චො (ඇඳ) තස්මිං ආගන්ත්වා (එහි ඇවිත්/ ඇවිත් එහි) නිසින්න-මත්තෙ-යෙව (ඉඳගත් පමණකින් ම) හෙට්ඨා ඔලම්බි (යටට එල්ලිනි/ යටට බැස්සේය) සො (ඔහු) ‘‘කස්මා අයං මඤ්චො (ඇයි මේ ඇඳ) එවං (මෙසේ/ මෙහෙම) ඡිජ්ජිත්වා ගතො’’ති ආහ (කැඩී ගියේ යැයි කීය) ‘‘සාමි (ස්වාමීණි) දහර-දාරකෙ (පොඩි ළමයි) වාරෙතුං (වලක්වන්නට/ නවත්වන්නට) න සක්කොමි (නො හැක්කෙමි/ බෑ) [එත්ථ+ඒව] එත්ථෙව (මෙහි ම) සන්නිපතන්ති’’ති (රැස්වෙති/ රැස්වෙනව)

☞ ඇවිත් එහි ඉඳගත් පමණකින් ම ඇඳ යටට බැස්සේය. ඔහු ‘‘ඇයි මේ ඇඳ මෙහෙම කැඩී ගියේ’’ යැයි ඇසීය. ‘‘ස්වාමීණි, පොඩි ළමයි නවත්වන්නට බෑ මෙහි ම රැස්වෙනව’’

• ‘‘අම්ම, ඉදං මෙ දුක්ඛං තුම්හෙ නිස්සාය ජාතං. [අහං+හි] අහඤ්හි පුබ්බෙ කත්ථචි ගච්ඡන්තො ද්වාරං පිදහිත්වා ගච්ඡාමී’’ති. ‘‘කිං කරොමි, තාත, වාරෙතුං න සක්කොමී’’ති.

★ ''අම්ම (අම්මේ) ඉදං <u>මෙ</u> දුක්ඛං (මේ දුක <u>මට</u>) තුම්හෙ නිස්සාය ජාතං (ඔබ නිසා උපන්නා/ ඇතිවුනා). [අහං+හි] අහඤ්හි (මම වනාහි) පුබ්බෙ (පෙර/ ඉස්සෙල්ල) කත්ථචි ගච්ඡන්තො (කොහේහරි යනවිට) ද්වාරං පිදහිත්වා ගච්ඡාමී''ති (දොර වසා යමි) ''කිං කරොමි (මොනව කරන්නද) තාත (පුතේ) වාරෙතුං (වලක්වන්නට/ නවත්වන්නට) න සක්කොමි (නො හැක්කෙමි/ බෑ)

☞ ''අම්මේ මේ දුක මට ඔබ නිසා උපන්නෙ, මම ඉස්සෙල්ල කොහේ හරි යනවිට දොර වසා යමි'' ''මොනව කරන්නද පුතේ, නවත්වන්නට බෑ''

• සා ඉමිනාව නියාමෙන ද්වෙ තයො දිවසෙ ඡින්දිත්වා තෙන උජ්ඣායිත්වා ඛීයිත්වා වුච්චමානාපි [තථා+ඒව] තථෙව වත්වා පුන එකං ද්වෙ රජ්ජුකෙ ඨපෙත්වා සෙසෙ ඡින්දි.

★ සා ඉමිනා-ව නියාමෙන (ඈ මේම ආකාරයට) ද්වෙ තයො දිවසෙ (දෙතුන් දවසක්/ දවස් දෙකතුනක්) ඡින්දිත්වා (කපා) තෙන උජ්ඣායිත්වා (ඔහු විසින් බැන) ඛීයිත්වා (දොස්නගා) වුච්චමානා-පි (කිවත්) [තථා+ඒව] තථෙව (එලෙසම) වත්වා (කියා) පුන (නැවත) එකං ද්වෙ (එකක් දෙකක්) රජ්ජුකෙ ඨපෙත්වා (ලණු තියා/ තිබෙද්දී) සෙසෙ ඡින්දි (ඉතිරිව කැපීය)

☞ ඈ මේ ආකාරයටම දවස් දෙකතුනක් කපා, ඔහු විසින් බැන දොස්නගා කිවත්, එලෙසම කියා, නැවත ලණු එකක් දෙකක් තිබෙද්දී ඉතිරිව කැපීය.

• තං දිවසං තස්මිං නිසින්නමත්තෙයෙව සබ්බං වාණං භූමියං පති, සීසං ජණ්ණුකෙහි සද්ධිං එකතො අහොසි, සො උට්ඨාය, ''කිං කරොමි, ඉදානි කුහිං ගමිස්සාමි, නිපජ්ජනමඤ්චස්සපි තුම්හෙහි අසාමිකො විය කතොම්හී''ති ආහ.

★ තං දිවසං (ඒ දවසෙ) තස්මිං (එහි) නිසින්න-මත්තෙ-යෙව (හිඳි පමණින් ම) සබ්බං වාණං (සියලු ලණු) භූමියං පති (පොළොවට වැටිනි) සීසං (ඔලුව) ජණ්ණුකෙහි සද්ධිං (දණහිස් සමග) එකතො අහොසි (එකට විය) සො උට්ඨාය (ඔහු නැගිට) ''කිං කරොමි (මොකක් කරන්නද) ඉදානි කුහිං ගමිස්සාමි (දැන් කොහේ යන්නද) නිපජ්ජන-මඤ්චස්ස-පි (නිදන ඇඳට-ත්) තුම්හෙහි (නුඹල විසින්) අසාමිකො (අයිතියක් නැත්තෙක්) විය (මෙන්) කතොම්හී''ති ආහ (කලෙමි/ කලා යැයි කීය)

☞ ඒ දවසෙ එහි හිඳි පමණින් ම සියලු ලණු පොළොවට වැටිනි. ඔලුව දණහිස් සමග එකට විය. ඔහු නැගිට ''මොකක් කරන්නද, දැන් කොහේ යන්නද, නුඹල විසින් නිදන ඇඳට-ත් අයිතියක් නැත්තෙක් මෙන් කලා'' යැයි කීය.

• ''තාත, කිං කරොමි, පටිවිස්සකදාරකෙ වාරෙතුං න සක්කොමි, හොතු, මා චින්තයි, ඉමාය නාම වෙලාය කුහිං ගමිස්සසී''ති ධීතරං ආමන්තෙත්වා, ''අම්ම, තව භාතිකස්ස [නිපජ්ජන+ඕකාසං] නිපජ්ජනොකාසං කරොහී''ති ආහ. සා එකපස්සෙ සයිත්වා ''[ඉධ+ආගච්ඡ] ඉධාගච්ඡ, සාමී''ති ආහ.

★ ''තාත, කිං කරොමි (පුතේ මොකක් කරන්නද) පටිවිස්සක-දාරකෙ (අසල්වැසි දරුවන්) වාරෙතුං (වලක්වන්නට/ නවත්වන්නට) න සක්කොමි (නො හැක්කෙමි/ බෑ) හොතු (වේවා/ කමක් නෑ) මා චින්තයි (ඒගැන හිතන්ඩ එපා) ඉමාය නාම වෙලාය (මේ වේලාවේ) කුහිං ගමිස්සසී''ති (කොහේ යන්නද යැයි) ධීතරං ආමන්තෙත්වා (දුවට කතාකර) ''අම්ම (ලමයො) තව භාතිකස්ස (උඹේ සහෝදරයට) [නිපජ්ජන+ඕකාසං] නිපජ්ජනොකාසං කරොහී''ති

(නිදාගන්ඩ තැනක් දෙන්ඩ යැයි) ආහ (කීය) සා එකපස්සෙ සයිත්වා (ඈ එක්පැත්තක නිදා) ''[ඉධ+ආගච්ඡ] ඉධාගච්ඡ (මෙහි එන්න) සාමී''ති ආහ (ස්වාමීණි, යැයි කීය)

☞ ''පුතේ මොකක් කරන්නද, අසල්වැසි දරුවන් නවත්වන්නට බෑ, කමක් නෑ, ඒගැන හිතන්ඩ එපා, මේ වේලාවේ කොහේ යන්නද'' යැයි කියා. දුවට කතාකර ''ලමයො, උඹේ සහෝදරයට නිදාගන්ඩ තැනක් දෙන්ඩ'' යැයි කීය. ඈ එක්පැත්තක නිදා ''මෙහි එන්න ස්වාමීණි'' යැයි කීය.

• ඉතරොපි නං ''ගච්ඡ, තාත, භගිනියා සද්ධිං නිපජ්ජා''ති වදෙසි. සො තාය සද්ධිං එකමඤ්ඤෙ නිපජ්ජිත්වා තං [දිවසං+ඒව] දිවසඤ්ඤෙව සන්ථවං අකාසි, කුමාරිකා පරොදි. අථ නං මාතා පුච්ඡි

★ ඉතරො-පි නං (අනෙකා ද ඔහුට) ''ගච්ඡ, තාත (යන්න පුතේ) භගිනියා සද්ධිං (නැගනිය සමග/ නංගි එක්ක) නිපජ්ජා''ති වදෙසි (නිදාගන්න යැයි කීය) සො තාය සද්ධිං (ඔහු ඇ සමග) එකමඤ්ඤෙ (එක් ඇඳක) නිපජ්ජිත්වා (නිදා) තං (ඒ) [දිවසං+ඒව] දිවසඤ්ඤෙව (දවසෙ ම) සන්ථවං අකාසි (සංවාසය කලේය) කුමාරිකා පරොදි (කුමරිය හැඬීය) අථ නං මාතා පුච්ඡි (එවිට ඇගේ මව ඇසිය)

☞ අනෙකා ද ඔහුට ''යන්න පුතේ නංගි එක්ක නිදාගන්න'' යැයි කීය. ඔහු ඇ සමග එක් ඇඳක නිදා ඒ දවසෙ ම සංවාසය කලේය. කුමරිය හැඬීය. එවිට ඇගේ මව ඇසිය.

• ''කිං, අම්ම, රොදසී''ති? ''අම්ම, ඉදං නාම [ජාතං+ඉති] ජාත''න්ති. ''හොතු, අම්ම, කිං සක්කා කාතුං, තයාපි එකං භත්තාරං [ඉමිනා-අපි+ඒකං] ඉමිනාපෙකං පාදපරිචාරිකං ලද්ධුං වට්ටතී''ති තං ජාමාතරං අකාසි. තෙ සමග්ගවාසං වසිංසු.

★ ''කිං, (ඇයි/ මොකද) අම්ම, රොදසී''ති? (ළමයො අඬන්නෙ යැයි) ''අම්ම (අම්මෙ) ඉදං නාම (මේ වගේ දෙයක්) [ජාතං+ඉති] ජාත''න්ති (උනා යැයි) ''හොතු අම්ම (කමක් නෑ ළමයො) කිං සක්කා කාතුං (මොකක්ද කරන්ඩ පුලුවන්) තයා-පි (ඔබට-ද) එකං භත්තාරං (එක් ස්වාමියෙක්) [ඉමිනා-අපි+ඒකං] ඉමිනාපෙකං (මොහුට-ද-එක්) පාදපරිචාරිකං (බිරිඳක්) ලද්ධුං වට්ටතී''ති (ලබන්ඩ වටිනව/ සුදුසුයි යැයි) තං (ඔහු) ජාමාතරං අකාසි (බෑනා කලේය) තෙ (ඔවුන්) සමග්ගවාසං වසිංසු (සමගිව වාසය කලාහ)

☞ ''ඇයි ළමයො අඬන්නෙ'' ''අම්මෙ මේ වගේ දෙයක් උනා'' ''කමක් නෑ ළමයො, මොකක්ද කරන්ඩ පුලුවන් බලමු, ඔබටත් එක් ස්වාමියෙක් මොහුටත් එක් බිරිඳක් ලබන්ඩ වටිනව''යැයි, ඔහු බෑනා කලේය. ඔවුන් සමගිව වාසය කලාහ.

• සා [කතිපාහ+අච්චයෙන] කතිපාහච්චයෙන රඤ්ඤො සාසනං පෙසෙසි – ''භතකවීථියං ඡණං කරොන්තු. යස්ස පන සරෙ ඡණො න කරියති, තස්ස එත්තකො නාම දණ්ඩොති සොසනං කාරෙතූ''ති. රාජා තථා කාරෙසි.

★ සා (ඇය) [කතිපාහ+අච්චයෙන] කතිපාහච්චයෙන (දිනකීපයක් ඇවෑමෙන්) රඤ්ඤො සාසනං පෙසෙසි (රජුට පණිවිඩයක් යැවිය) ''භතකවීථියං (කුලිවැඩකාර වීථියෙහි) ඡණං කරොන්තු (සැනකෙලි කරන්න) යස්ස පන සරෙ (යමෙක්ගෙ ගෙදර වනාහි) ඡණො න කරියති (උත්සව නො කරයිද) තස්ස (ඔහුට) එත්තකො නාම (මෙතෙක් ප්‍රමාණයක්) දණ්ඩොති (දඩ යැයි) සොසනං කාරෙතූ''ති (සෝසා කරත්වා/ අණබෙර යවත්වා යැයි) රාජා තථා කාරෙසි (රජු එසේ කලාය)

☞ ඇය දිනකීපයක් ඇවෑමෙන් රජුට පණිවිඩයක් යැවිය. ‘‘කුලිවැඩකාර වීථියෙහි සැනකෙලි කරන්න, යමෙක්ගෙ ගෙදර උත්සව නො කරයිද, ඔහුට මෙතෙක් ප්‍රමාණයක් දඩ, යැයි අණබෙර යවත්වා’’ යැයි. රජු එසේ කලාය.

• අථ නං සස්සු ආහ – ‘‘තාත, හතකවීථියං රාජාණාය ඡණො කත්තබ්බො ජාතො, කිං කරොමා’’ති? ‘‘අම්ම, අහං හතිං කරොන්තොපි ජීවිතුං න සක්කොමි, කිං කරිස්සාමී’’ති? ‘‘තාත, සරාවාසං වසන්තා නාම ඉණම්පි ගණ්හන්ති, රඤ්ඤො ආණා අකාතුං න ලබ්භා.

★ අථ නං සස්සු ආහ (ඉක්බිති ඔහුට නැන්දම්මා කීය) ‘‘තාත (පුතේ) හතකවීථියං (කුලිවැඩකාර වීථියෙහි) [රාජ+ආණාය] රාජාණාය (රජුගේ අණින්) ඡණො කත්තබ්බො ජාතො (උත්සව කලයුතු බවට පත්විය/ පත්ඵනා) කිං කරොමා’’ති? (මොකද කරන්නෙ) ‘‘අම්ම,(අම්මෙ) අහං හතිං කරොන්තො-පි (මම කුලීවැඩ කරල-ත්) ජීවිතුං න සක්කොමි (ජීවත්වීමට නො හැක්මෙමි/ බෑ) කිං කරිස්සාමී’’ති? (මොකක් කරන්නද) ‘‘තාත (පුතේ), සරාවාසං වසන්තා නාම (ගිහිගෙයි වසන්නෝ නම්/ උනාම) [ඉණං+අපි] ඉණම්පි ගණ්හන්ති (ණය-ත් ගනිති/ ගන්නව) රඤ්ඤො ආණා (රජුගේ අණ) අකාතුං න ලබ්භා (නොකිරීමට නො ලැබෙන්නේය/ නොකර ඉන්ඩ බෑ)

☞ ඉක්බිති ඔහුට නැන්දම්මා කීය ‘‘පුතේ, කුලිවැඩකාර වීථියෙහි රජුගේ අණින් උත්සව කලයුතු බවට පත්ඵනා, මොකද කරන්නෙ’’ ‘‘අම්මෙ මම කුලීවැඩ කරලත් ජීවත්වෙන්ඩ බෑ, මොකක් කරන්නද’’ ‘‘පුතේ, ගිහිගෙයි වසන්නෝ උනාම ණයත් ගන්නව, රජුගේ අණ නොකර ඉන්ඩ බෑ,

• ඉණතො නාම යෙන කෙනචි උපායෙන මුච්චිතුං සක්කා, ගච්ඡ, කුතොචි එකං වා ද්වෙ වා කහාපණෙ ආහරා’’ති ආහ. සො උජ්ඣායන්තො ඛීයන්තො ගන්ත්වා චත්තාලීසකොටිධනට්ඨානතො එකමෙව කහාපණං ආහරි.

★ ඉණතො නාම (ණයෙන් නම්) යෙන කෙනචි උපායෙන (මොන උපායකින් හරි/ මොනවිදිහකින් හරි) මුච්චිතුං සක්කා (මිදීමට/ මිදෙන්ඩ පුලුවන්) ගච්ඡ (යන්න) කුතොචි (කොහෙන්හරි) එකං වා ද්වෙ වා (එකක් හෝ දෙකක් හෝ/ එකක් හරි දෙකක් හරි) කහාපණෙ ආහරා’’ති ආහ (කහවණු ගෙනඑන්න යැයි කිය) සො උජ්ඣායන්තො (ඔහු බනිමින්) ඛීයන්තො ගන්ත්වා (දොස්නගමින් ගොස්) චත්තාලීස-කොටි-ධනට්ඨානතො (සතලිස් කෝටියක් ධනය ඇති තැනින්) එකමෙව (එකම) කහාපණං ආහරි (කහවණුවක් ගෙනාවේය)

☞ ණයෙන් නම් මොනවිදිහකින් හරි මිදෙන්ඩ පුලුවන්, යන්න, කොහෙන්හරි එකක් හරි දෙකක් හරි කහවණු ගෙනඑන්න’’ යැයි කිය. ඔහු බනිමින් දොස්නගමින් ගොස් සතලිස් කෝටියක් ධනය ඇති තැනින් එකම කහවණුවක් ගෙනාවේය.

• සා තං කහාපණං රඤ්ඤො පෙසෙත්වා අත්තනො කහාපණෙන ඡණං කත්වා පුන [කතිපාහ+අච්චයෙන] කතිපාහච්චයෙන තථෙව සාසනං පහිණි. පුන රාජා තථෙව ‘‘ඡණං කරොන්තු, අකරොන්තානං එත්තකො දණ්ඩො’’ති ආණාපෙසි.

★ සා තං කහාපණං (ඇ ඒ කහවණුව) රඤ්ඤො පෙසෙත්වා (රජුට යවා) අත්තනො කහාපණෙන (තමන්ගේ කහවණුවලින්) ඡණං කත්වා (උත්සවය කර) පුන (නැවත) [කතිපාහ+අච්චයෙන] කතිපාහච්චයෙන (දින කිපයකින්) තථෙව (එලෙසම) සාසනං පහිණි (පණිවිඩයක් යැවීය) පුන රාජා තථෙව (නැවත රජු එලෙසම) ‘‘ඡණං කරොන්තු (උත්සව

කරන්න) අකරොන්තානං (නො කරන්නන්ට) එත්තකො දණ්ඩො''ති (මෙතෙක් දඩ යැයි) ආණාපෙසි (අණකරවිය)

☞ ඇ ඒ කහවණුව රජුට යවා තමන්ගේ කහවණුවලින් උත්සවය කර නැවත දින කිපයකින් එලෙසම පණිවිඩයක් යැවීය. රජු නැවත එලෙසම ''උත්සව කරන්න, නො කරන්නන්ට මෙතෙක් දඩ'' යැයි අණකරවිය.

• පුනපි සො තාය තථෙව වත්වා නිප්පීළියමානො ගන්ත්වා තයො කහාපණෙ ආහරි. සා තෙපි කහාපණෙ රඤ්ඤො පෙසෙත්වා පුන කතිපාහච්චයෙන තථෙව සාසනං පහිණි – ''ඉදානි පුරිසෙ පෙසෙත්වා ඉමං පක්කොසාපෙතූ''ති. රාජා පෙසෙසි.

★ පුන-පි සො (නැවතත් ඔහු) තාය (ඇය විසින්) තථෙව වත්වා (එලෙසම කියා) නිප්පීළියමානො (පිඩාකරන කල) ගන්ත්වා (ගොස්) තයො කහාපණෙ ආහරි (කහවණු තුනක් ගෙනආවේය) සා තෙ-පි කහාපණෙ (ඇය ඒ-ද කහවණු) රඤ්ඤො පෙසෙත්වා (රජුට යවා) පුන (නැවත) [කතිපාහ+අච්චයෙන] කතිපාහච්චයෙන (දින කිපයකින්) තථෙව (එලෙසම) සාසනං පහිණි (පණිවිඩයක් යැවීය) ''ඉදානි පුරිසෙ පෙසෙත්වා (දැන් පුරුෂයන්/ මිනිසුන් එවා) ඉමං පක්කොසාපෙතූ''ති (මොහු කැඳවත්වා/ කැඳවන්න යැයි) රාජා පෙසෙසි (රජු යැවිය)

☞ නැවතත් ඔහු ඇය විසින් එලෙසම කියා පිඩාකරන කල ගොස් කහවණු තුනක් ගෙනආවේය. ඇය ඒ කහවණු ද රජුට යවා නැවත දින කිපයකින් එලෙසම පණිවිඩයක් යැවීය. ''දැන් මිනිසුන් එවා මොහු කැඳවන්න'' යැයි. රජු යැවිය.

• පුරිසා ගන්ත්වා, ''කුම්භසොසකො නාම කතරො''ති පුච්ඡිත්වා පරියෙසන්තා තං දිස්වා ''එහි, හො රාජා, තං පක්කොසතී''ති ආහංසු. සො භීතො ''න මං රාජා ජානාතී''ති ආදීනි වත්වා ගන්තුං න ඉච්ඡි.

★ පුරිසා ගන්ත්වා (මිනිසුන් ගොස්) ''කුම්භසොසකො නාම කතරො''ති (කුම්භසොසක කියන්නෙ කාටද යැයි) පුච්ඡිත්වා (අසා) පරියෙසන්තා (සොයමින්) තං දිස්වා (ඔහු දැක) ''එහි හො (එන්න පින්වත) රාජා, තං (රජු ඔබව) පක්කොසතී''ති (කැඳවන්නේය යැයි) ආහංසු (කීහ) සො භීතො (ඔහු බියවි) ''<u>න</u> මං රාජා ජානාතී''ති (රජු මාව <u>නො</u> දන්නේය යැයි) ආදීනි වත්වා (ආදිය කියා) ගන්තුං න ඉච්ඡි (යෑමට නොකැමති විය)

☞ මිනිසුන් ගොස් ''කුම්භසොසක කියන්නෙ කාටද'' යැයි අසා සොයමින් ඔහු දැක, ''එන්න පින්වත රජු ඔබව කැඳවන්නේය'' යැයි කීහ. ඔහු බියවි ''රජු මාව දන්නෙ නෑ'' යැයි ආදිය කියා යෑමට නොකැමති විය.

• අථ නං බලක්කාරෙන [හත්ථ+ආදීසු] හත්ථාදීසු ගහෙත්වා ආකඩ්ඪිංසු. සා ඉත්ථී තෙ දිස්වා, ''අරෙ, දුබ්බිනීතා, තුම්හෙ මම ජාමාතරං [හත්ථ+ආදීසු] හත්ථාදීසු ගහෙතුං අනනුච්ඡවිකා''ති තජ්ජෙත්වා,

★ අථ නං (ඉක්බිති ඔහුව) බලක්කාරෙන (බලහත්කාරයෙන්) [හත්ථ+ආදීසු] හත්ථාදීසු ගහෙත්වා (අත් ආදියෙන් ගෙන/ අල්ලගෙන) ආකඩ්ඪිංසු (ඇද්දාහ) සා ඉත්ථී තෙ දිස්වා (ඒ ගැහැණිය ඔවුන්ව දැක) ''අරෙ, දුබ්බිනීතා (ඒයි දුෂ්ඨයො) තුම්හෙ (උඹල) මම ජාමාතරං (මගේ බෑනව) [හත්ථ+ආදීසු] හත්ථාදීසු ගහෙතුං (අත්අදියෙන් අල්ලගන්ඩ) අනනුච්ඡවිකා''ති (නුසුදුස්සෝය යැයි) තජ්ජෙත්වා (තර්ජනයකර)

☞ ඉක්බිති ඔහුව බලහත්කාරයෙන් අත් ආදියෙන් අල්ලගෙන ඇද්දාහ. ඒ ගැහැණිය ඔවුන්ව දැක "ඒයි දුෂ්ඨයො, උඹල මගේ බෑනව අත්අදියෙන් අල්ලගන්ඩ නුසුදුස්සෝය" යැයි තර්ජනයකර,

• ''එහි, තාත, මා භායි, රාජානං දිස්වා තව [හත්ථ+ආදි-ගාහකානං] හත්ථාදිගාහකානං හත්ථෙයෙව ඡින්දාපෙස්සාමී''ති ධීතරං ආදාය පුරතො හුත්වා රාජගෙහං පත්වා වෙසං පරිවත්තෙත්වා සබ්බාලඞ්කාරපටිමණ්ඩිතා එකමන්තං අට්ඨාසි. [ඉතරං+අපි] ඉතරම්පි පරිකඩ්ඪිත්වා ආනයිංසුයෙව.

★ ''එහි, තාත (එන්ඩ පුතේ/ වරෙන් පුතේ) මා භායි (බයවෙන්ඩ එපා) රාජානං දිස්වා (රජුව හමුවී) තව (ඔබේ) [හත්ථ+ආදි-ගාහකානං] හත්ථාදිගාහකානං (අත් ආදියෙන් ගන්නවුන්ගේ) හත්ථෙ-යෙව (අත්-ම) ඡින්දාපෙස්සාමී''ති (සිඳවන්නෙමි යැයි) ධීතරං ආදාය (දුවත් ගෙන) පුරතො හුත්වා (ඉදිරියට වී/ ඉදිරියෙන්) රාජගෙහං පත්වා (රජගෙදරට පිවිස/ ගොස්) වෙසං පරිවත්තෙත්වා (වෙස් මාරුකර) සබ්බාලඞ්කාර-පටිමණ්ඩිතා (සර්වාබරණයෙන් සැරසී) එකමන්තං අට්ඨාසි (එක්පසක සිටියේය) [ඉතරං+අපි] ඉතරම්පි (අනෙකා-ත්) පරිකඩ්ඪිත්වා ආනයිංසු-**<u>යෙව</u>** (ඇදගෙන **<u>ම</u>** ගෙනආවාහ.)

☞ "එන්ඩ පුතේ, බයවෙන්ඩ එපා, රජුව හමුවී ඔබේ අත් ආදියෙන් අදිනවුන්ගේ අත්ම සිඳවන්නෙමි" යැයි දුවත් ගෙන ඉදිරියෙන් රජගෙදරට ගොස්, වෙස් මාරුකර සර්වාබරණයෙන් සැරසී එක්පසක සිටියේය. අනෙකාත් ඇදගෙන ම ගෙනආවාහ.

• අථ නං වන්දිත්වා ඨිතං රාජා ආහ – ''ත්වං කුම්භඝොසකො නාමා''ති? ''ආම, දෙවා''ති. ''කිං කාරණා මහාධනං වඤ්චෙත්වා ඛාදසී''ති? ''කුතො මෙ, දෙව, ධනං භතිං කත්වා ජීවන්තස්සා''ති? ''මා එවං කරි, කිං අම්හෙ වඤ්චෙසී''ති? ''න වඤ්චෙමි, දෙව, නත්ථි මෙ ධන''න්ති.

★ අථ නං (ඉක්බිති ඒ) වන්දිත්වා ඨිතං (වැඳ සිටින්නාට) රාජා ආහ (රජු කීය) ''ත්වං කුම්භඝොසකො නාමා''ති? (ඔබද කුම්ඹඝෝසක කියන්නෙ ?) ''ආම, දෙවා''ති. (එහෙමයි දේවයන් වහන්ස) ''කිං කාරණා (කුමන කරුනක් නිසාද) මහාධනං (මහධනයක්) වඤ්චෙත්වා ඛාදසී''ති? (වංචාකර කන්නෙ/ හොරෙන් පාවිච්චිකරන්නෙ) ''කුතො මෙ (කොහෙන් ද මට) දෙව, ධනං (දේවයන්වහන්ස ධනය) භතිං කත්වා (කුලීවැඩකර) ජීවන්තස්සා''ති? (ජීවත්වන්නාට) ''මා එවං කරි (එහෙම කරන්ඩ එපා) කිං අම්හෙ වඤ්චෙසී''ති? (මොකද අපිව රවටනවද?) ''න වඤ්චෙමි, දෙව (නො රවටමි දේවයන්වහන්ස) නත්ථි මෙ ධන''න්ති (මට ධනය නෑ)

☞ ඉක්බිති ඒ වැඳ සිටින්නාට රජු කීය "ඔබද කුම්ඹඝෝසක කියන්නෙ ?" "එහෙමයි දේවයන් වහන්ස" "කුමන කරුනක් නිසාද මහධනයක් හොරෙන් පාවිච්චිකරන්නෙ" "කුලීවැඩකර ජීවත්වන මට කොහෙන් ද දේවයන්වහන්ස ධනය" "එහෙම කරන්ඩ එපා, මොකද අපිව රවටනවද?" "නො රවටමි දේවයන්වහන්ස, මට ධනය නෑ"

• අථස්ස රාජා තෙ කහාපණෙ දස්සෙත්වා, ''ඉමෙ කස්ස කහාපණා''ති ආහ. සො සඤ්ජානිත්වා, ''අහො බාලොම්හි [බාලො+අම්හි], කථං නු ඛො ඉමෙ රඤ්ඤො හත්ථං පත්තා''ති ඉතො චිතො ච ඔලොකෙන්තො තා ද්වෙපි පටිමණ්ඩිතපසාධනා ගබ්භද්වාරමූලෙ ඨිතා දිස්වා, ''භාරියං [වත+ඉදං] වතිදං කම්මං, ඉමාහි රඤ්ඤා පයොජිතාහි භවිතබ්බ''න්ති චින්තෙසි.

★ අථස්ස (ඉක්බිත් ඔහුට) රාජා (රජු) තෙ කහාපණෙ දස්සෙත්වා (ඒ කහවණු පෙන්වා) ''ඉමෙ කස්ස (මේවා කාගෙ) කහාපණා''ති ආහ (කහවණුද යැයි කීය / ඇසීය) සො සඤ්ජානිත්වා (ඔහු හඳුනායෙන) ''අහො (අයියෝ) [බාලො+අම්හි] බාලොම්හි (මෝඩවුනා) කථං නු ඛො ඉමෙ (කොහොමද මේවා) රඤ්ඤො හත්ථං පත්තා''ති (රජුගෙ අතට පත්වුනේ/ ගියේ යැයි) ඉතො චිතො ච ඔලොකෙන්තො (එහෙ මෙහෙ බලමින්) තා ද්වෙ-පි (ඈලා දෙදෙනා ද) පටිමණ්ඩිත-පසාධනා (ආබරණවලින් සැරසී) ගබ්භ-ද්වාරමූලෙ (කාඹරයේ දොරකඩ) ඨිතා දිස්වා (සිටිනවා දැක) ''භාරියං (බරපතලයි/ බයානකයි) [වත+ඉදං] වතිදං කම්මං (ඒකාන්තයෙන් මේ වැඩේ) ඉමාහි රඤ්ඤා (මෑලා රජු විසින්) පයොජිතාහි භවිතබ්බ''න්ති (යෙදෙව්වා වියයුතුය යැයි) චින්තෙසි (සිතීය.)

☞ ඉක්බිත් ඔහුට රජු ඒ කහවණු පෙන්වා ''මේවා කාගෙ කහවණුද'' යැයි ඇසීය. ඔහු හඳුනායෙන, ''අයියෝ මෝඩවුනා කොහොමද මේවා රජුගේ අතට ගයේ'' යැයි එහෙ මෙහෙ බලමින්, ඈලා දෙදෙනා ද ආබරණවලින් සැරසී කාඹරයේ දොරකඩ සිටිනවා දැක, ''ඒකාන්තයෙන් මේ වැඩේ බරපතලයි, මෑලා රජු විසින් යෙදෙව්වා වියයුතුය'' යැයි සිතීය.

• අථ නං රාජා ''වදෙහි, හො, කස්මා එවං කරොසී''ති ආහ. ''නිස්සයො මෙ නත්ථි, දෙවා''ති. ''මාදිසො නිස්සයො භවිතුං න වට්ටතී''ති. ''කල්‍යාණං, දෙව, සචෙ මෙ දෙවො අවස්සයො හොතී''ති.

★ අථ නං රාජා (ඉක්බිත් ඔහුට රජු) ''වදෙහි, හො (කියන්න පින්වත) කස්මා එවං කරොසී''ති ආහ (ඇයි මෙහෙම කරන්නෙ යැයි කිය) ''නිස්සයො මෙ නත්ථි (පිහිටක් මට නැත) දෙවා''ති (දේවයන් වහන්ස) ''මාදිසො (මා වැන්නෙක්) නිස්සයො භවිතුං (පිහිටවීමට) න වට්ටතී''ති (නුසුදුසු ද) ''කල්‍යාණං, දෙව (බොහොම හොඳයි දේවයන්වහන්ස) සචෙ මෙ (ඉඳින් මට) දෙවො (දේවයන් වහන්සේ) අවස්සයො හොතී''ති (පිහිට වෙනවනම්)

☞ ඉක්බිත් ඔහුට රජු ''කියන්න පින්වත, ඇයි මෙහෙම කරන්නෙ'' යැයි කිය. ''මට පිහිටක් නෑ දේවයන් වහන්ස'' ''මා වැන්නෙක් පිහිටවීමට නුසුදුසු ද'' ''බොහොම හොඳයි දේවයන්වහන්ස, ඉඳින් මට දේවයන් වහන්සේ පිහිට වෙනවනම්''

• ''හොමි, හො, කිත්තකං තෙ ධන''න්ති? ''චත්තාලීසකොටියො, දෙවා''ති. ''කිං ලද්ධුං වට්ටතී''ති? ''සකටානි දෙවා''ති?

★ ''හොමි, හො (වෙමි පින්වත) කිත්තකං (කෙතෙක් ද) තෙ ධන''න්ති? (ඔබේ ධනය) ''චත්තාලීසකොටියො, දෙවා''ති (සතලිස් කෝටියක් දේවයන් වහන්ස) ''කිං ලද්ධුං වට්ටතී''ති? (මොනව ලැබීම වටීද?/ මොනවද ඕන ?) ''සකටානි දෙවා''ති? (කරත්ත දේවයන් වහන්ස)

☞ ''වෙමි පින්වත, කෙතෙක් ද ඔබේ ධනය'' ''සතලිස් කෝටියක් දේවයන් වහන්ස'' ''මොනවද ඕන ?'' ''කරත්ත දේවයන් වහන්ස''

• රාජා අනෙකසතානි සකටානි යොජාපෙත්වා පහිණිත්වා තං ධනං ආහරාපෙත්වා [රාජ+අඞ්ගණෙ] රාජඞ්ගණෙ රාසිං කාරාපෙත්වා රාජගහවාසිනො සන්නිපාතාපෙත්වා, ''අත්ථි කස්සචි ඉමස්මිං නගරෙ ''එත්තකං ධන''න්ති පුච්ඡිත්වා ''නත්ථි, දෙවා''ති.

★ රාජා අනෙක-සතානි (රජු නොයෙක් සියගනන්) සකටානි යොජාපෙත්වා (කරත්ත යොදවා) පහිණිත්වා (යවා) තං ධනං (ඒ ධනය) ආහරාපෙත්වා (ගෙන්නවා) [රාජ+අඞ්ගණෙ]

රාජඞ්ගණෙ (රජගෙදර මිදුලේ) රාසිං කාරාපෙත්වා (ගොඩ ගස්සවා/ කරවා) රාජගහ-වාසිනො (රජගහවෙහි වැසියන්) සන්නිපාතාපෙත්වා (රැස්කරවා) ‘‘අත්ථි කස්සචි (ඇත්ද කිසිවෙකුට) ඉමස්මිං නගරෙ (මේ නගරයේ) ‘‘එත්තකං ධන’’න්ති (මෙතෙක් ධනය යැයි) පුච්ඡිත්වා (අසා)‘‘නත්ථි, දෙවා’’ති (නැත දේවයන්වහන්ස)

☞ රජු නොයෙක් සියගනන් කරත්ත යොදවා යවා ඒ ධනය ගෙන්නවා රජගෙදර මිදුලේ ගොඩ ගස්සවා රජගහවෙහි වැසියන් රැස්කරවා “මේ නගරයේ කිසිවෙකුට මෙතෙක් ධනය ඇත්ද” යැයි අසා, “නැත දේවයන්වහන්ස” යැයි කියූකල,

• ‘‘කිං [පන+අස්ස] පනස්ස කාතුං වට්ටතී’’ති? ‘‘සක්කාරං, දෙවා’’ති වුත්තෙ මහන්තෙන සක්කාරෙන තං සෙට්ඨිට්ඨානෙ ඨපෙත්වා ධිතරං [තස්ස+ඒව] තස්සෙව දත්වා තෙන සද්ධිං සත්ථු සන්තිකං ගන්ත්වා වන්දිත්වා

★‘‘කිං [පන+අස්ස] පනස්ස (කුමක් වනාහි මොහුට) කාතුං වට්ටතී’’ති? (කිරීමට සුදුසු ද?) ‘‘සක්කාරං, දෙවා’’ති (සත්කාර දේවයන් වහන්ස) වුත්තෙ (කියූකල) මහන්තෙන සක්කාරෙන (මහත් සත්කාරයෙන්) තං සෙට්ඨිට්ඨානෙ ඨපෙත්වා (ඔහු සිටුතනතුරේ පිහිටුවා) ධිතරං (දුව) [තස්ස+ඒව] තස්සෙව දත්වා (ඔහුට ම දී) තෙන සද්ධිං (ඔහු සමග) සත්ථු සන්තිකං (භාග්‍යවතුන් වහන්සේගේ ලඟට) ගන්ත්වා වන්දිත්වා (ගොස් වැඳ)

☞ “මොහුට කුමක් කිරීමට සුදුසු ද?” “සත්කාර දේවයන් වහන්ස” යැයි කියූකල, මහත් සත්කාරයෙන් ඔහු සිටුතනතුරේ පිහිටුවා, දුව ඔහුට ම දී ඔහුත් සමග භාග්‍යවතුන් වහන්සේගේ ලඟට ගොස් වැඳ

•‘‘භන්තෙ, [පස්සථ+ඉමං] පස්සථිමං පුරිසං, එවරූපො ධිතිමා නාම නත්ථි, චත්තාලීසකොටිවිභවො හොන්තොපි උප්පිලාවිතාකාරං වා අස්මිමානමත්තං වා න කරොති, කපණො විය පිලොතිකං නිවාසෙත්වා භතකවීථියං භතිං කත්වා ජීවන්තො මයා ඉමිනා නාම උපායෙන ඤාතො.

★‘‘භන්තෙ (ස්වාමීනි) [පස්සථ+ඉමං] පස්සථිමං පුරිසං (බලන්න මේ මිනිසාදෙස) එවරූපො (මෙවැනිවූ) ධිතිමා නාම නත්ථි (ධෛර්යවන්තයෝ නම් නැත) චත්තාලීසකොටි-විභවො (සතලිස්කෝටි ධනයක්) හොන්තො-පි (තිබෙද්දී-ත්) උබ්බිලාවිතාකාරං වා (උඩගුබවක් හෝ) අස්මිමාන-මත්තං වා (අස්මිමාන මාත්‍රයක් හෝ/ මන්‍යයක් හෝ) න කරොති (නොකරයි) කපණො විය (හිඟන්නෙක් මෙන්/ වගේ) පිලොතිකං නිවාසෙත්වා (කඩමහල්ලක් ඇඳගෙන) භතකවීථියං භතිං කත්වා (කුලීවැඩ විදියෙහි කුලීවැඩ කරමින්) ජීවන්තො (ජීවත්වන අතරේ) මයා (මා විසින්) ඉමිනා නාම උපායෙන ඤාතො (මේ ආකාරවූ උපායකින් දැනගත්ත)

☞ ස්වාමීනි! මේ මිනිසාදෙස බලන්න, මෙවැනිවූ ධෛර්යවන්තයෝ නම් නෑ, සතලිස්කෝටි ධනයක් තිබෙද්දීත් උඩගුබවක් හෝ මන්‍යයක් හෝ නෑ. හිඟන්නෙක් වගේ කඩමහල්ලක් ඇඳගෙන කුලීවැඩ විදියෙහි කුලීවැඩ කරමින් ජීවත්වන අතරේ මා විසින් මේ ආකාරවූ උපායකින් දැනගත්ත”

• ඤාතිත්වා ච පන පක්කොසාපෙත්වා [සහ+ධන-භාවං] සධනභාවං සම්පටිච්ඡාපෙත්වා තං ධනං ආහරාපෙත්වා සෙට්ඨිට්ඨානෙ ඨපිතො, ධිතා [ච+අස්ස] චස්ස මයා දින්නා. භන්තෙ, මයා ච එවරූපො ධිතිමා න දිට්ඨපුබ්බො’’ති ආහ.

★ ජානිත්වා ච පන (දැනගන වනාහි) පක්කොසාපෙත්වා (කැඳවා) [සහ+ධන-භාවං] සධනභාවං (ධනවත්බව) සම්පටිච්ඡාපෙත්වා (පිළිගන්නවා) තං ධනං ආහරාපෙත්වා (ඒ ධනය ගෙන්නවා) සෙට්ඨිට්ඨානෙ ඨපිතො (සිටුතනතුරේ තබනලද්දේය) ධීතා [ච+අස්ස] වස්ස (දුව ත් ඔහුට) මයා දින්නා (මා විසින්/ මං දෙනලදී) භන්තෙ (ස්වාමීණි) මයා ච එවරූපො (මං /මා විසින් ද මෙවැනිවූ) ධිතිමා (ධෛර්ය වන්තයෙක්) න දිට්ඨපුබ්බො''ති ආහ (පෙර නොදුටුවේය යැයි කීය)

☞ දැනගන කැඳවා, ධනවත්බව පිළිගන්නවා, ඒ ධනය ගෙන්නවා සිටුතනතුරේ තබනලද්දේය. ඔහුට මං දුවත් දුන්න, ස්වාමීණි මං මෙවැනිවූ ධෛර්ය වන්තයෙක් පෙර නොදුටුවේය''යැයි කීය.

• තං සුත්වා සත්ථා ''එවං ජීවන්තස්ස ජීවිකං ධම්මිකජීවිකං නාම, මහාරාජ, [චොරිකා+ආදි-කම්මං] චොරිකාදිකම්මං පන ඉධලොකෙ චෙව පීළෙති හිංසෙති, පරලොකෙ ච, තතොනිදානං සුඛං නාම නත්ථි.

★ තං සුත්වා සත්ථා (එය අසා ශාස්තෘන් වහන්සේ) ''එවං ජීවන්තස්ස ජීවිකං (මෙසේ ජීවත්වන්නාගේ ජීවිකාව) ධම්මික-ජීවිකං නාම (ධාර්මික ජීවිකාවක් නම්ය) මහාරාජ, [චොරිකා+ආදි-කම්මං] චොරිකාදිකම්මං පන (සොරකම් ආදී ක්‍රියාවලින් වනාහි) ඉධලොකෙ චෙව (මෙලොවදීම) පීළෙති (පීඩාකරයි) හිංසෙති (හිසාකරයි) පරලොකෙ ච (පරලොවදී ද) තතො-නිදානං (එය හේතුකරගෙන) සුඛං නාම නත්ථි (සැපයක් නම් නැත)

☞ එය අසා ශාස්තෘන් වහන්සේ ''මෙසේ ජීවත්වන්නාගේ ජීවිකාව ධාර්මික ජීවිකාවක්ය. මහරාජ, සොරකම් ආදී ක්‍රියාවලින් වනාහි මෙලොවදීම පීඩාකරයි, හිසාකරයි, පරලොවදී ද එය හේතුකරගෙන සැපයක් නම් නැත.

• පුරිසස්ස හි ධනපාරිජුඤ්ඤකාලෙ කසිං වා භතිං වා කත්වා ජීවිකමෙව ධම්මිකජීවිකං නාම.

★ පුරිසස්ස හි (මිනිසාට වනාහි) ධන-පාරිජුඤ්ඤ-කාලෙ (ධනයෙන් පිරිහුනු කාලයේ) කසිං වා (ගොවිතැන් හෝ) භතිං වා කත්වා (කුලීවැඩ හෝ කර) ජීවිකමෙව (ජීවත්වීම ම) ධම්මිකජීවිකං නාම (ධාර්මික ජීවිකාවක්ය)

☞ මිනිසාට වනාහි ධනයෙන් පිරිහුනු කාලයේ ගොවිතැන් හෝ කුලීවැඩ හෝ කර ජීවත්වීම ම ධාර්මික ජීවිකාවක්ය.

• එවරූපස්ස හි වීරියසම්පන්නස්ස සතිසම්පන්නස්ස කායවාචාහි පරිසුද්ධකම්මස්ස පඤ්ඤාය නිසම්මකාරිනො කායාදීහි සඤ්ඤතස්ස ධම්මජීවිකං ජීවන්තස්ස සතිඅවිප්පවාසෙ යීතස්ස ඉස්සරියං වඩ්ඪතියෙවා''ති වත්වා ඉමං [ගාථං+ආහ] ගාථමාහ

★ එවරූපස්ස හි (මෙවැනිවූ ඒකාන්තයෙන්) වීරියසම්පන්නස්ස (විර්යෙන්යුතු) සතිසම්පන්නස්ස (සිහියෙන්යුතු) කායවාචාහි (කයවචනයෙන්) පරිසුද්ධ-කම්මස්ස (පිරිසිදු ක්‍රියාඇති/ නිවැරදි ක්‍රියාඇති) පඤ්ඤාය (නුවණින්) නිසම්මකාරිනො (විමසාබලා කටයුතුකරන) කායාදීහි (කායාදියෙහි) සඤ්ඤතස්ස (හික්මුණු) ධම්මජීවිකං (ධාර්මික දිවියක්) ජීවන්තස්ස (ජීවත්වන) සති-අවිප්පවාසෙ (සිහිනුවනින් නොවෙන්ව) යීතස්ස (සිටින්නාගේ) ඉස්සරියං (ඉසුරුබව) වඩ්ඪති-යෙවා''ති (වැඩෙන්නේමය යැයි) වත්වා ඉමං (කියා මේ) [ගාථං+ආහ] ගාථමාහ (ගාථාව කීය/ දේශනාකලේය)

☞ ඒකාන්තයෙන් මෙවැනිවූ විර්යෙන්යුතු සිහියෙන්යුතු කයවචනයෙන් නිවැරදි ක්‍රියාඇති නුවණින් විමසාබලා කටයුතුකරන කායාදියෙහි හික්මුණු ධාර්මික දිවියක් ගෙවන සිහිනුවනින් නොවෙන්ව සිටින්නාගේ ඉසුරුබව වැඩෙන්නේමය'' යැයි කියා, මේ ගාථාව දේශනාකලේය.

''උට්ඨානවතො සතිමතො - සුචිකම්මස්ස නිසම්මකාරිනො;
සඤ්ඤතස්ස ධම්මජීවිනො - අප්පමත්තස්ස යසොභිවඩ්ඪති''ති.

උට්ඨානවතො සතිමතො සුචිකම්මස්ස නිසම්මකාරිනො සඤ්ඤතස්ස ධම්මජීවිනො අප්පමත්තස්ස [යසො+අභිවඩ්ඪති] යසොභිවඩ්ඪති

★ උට්ඨානවතො (වීර්යයෙන් උත්සහවත්වන) සතිමතො (සිහිඇති) සුචිකම්මස්ස (නිවැරදි ක්‍රියාඇති) නිසම්මකාරිනො (විමසාබලා කටයුතුකරන) සඤ්ඤතස්ස (හික්මුණු) ධම්මජීවිනො (ධාර්මික දිවියක් ගෙවන) අප්පමත්තස්ස (අප්‍රමාද වන්නාගේ) [යසො+අභිවඩ්ඪති] යසොභිවඩ්ඪති (යසස වැඩෙන්නේය / යස ඉසුරු සැපසම්පත් ආදිය වැඩෙන්නේය)

☞ වීර්යයෙන් උත්සහවත්වන සිහිඇති නිවැරදි ක්‍රියාඇති විමසාබලා කටයුතුකරන හික්මුණු ධාර්මික දිවියක් ගෙවන අප්‍රමාද වන්නාගේ යස ඉසුරු සැපසම්පත් ආදිය වැඩෙන්නේය.

• තත්ථ ''**උට්ඨානවතො**''ති උට්ඨානවීරියවන්තස්ස. ''**සතිමතො**''ති සතිසම්පන්නස්ස. ''**සුචිකම්මස්සා**''ති නිද්දොසෙහි නිරපරාධෙහි කායකම්මාදීහි සමන්නාගතස්ස.

★ තත්ථ (මෙහි /මේ ගාථාවේ) ''**උට්ඨානවතො**''ති (''**උට්ඨානවතො**'' යනු) උට්ඨාන-වීරියවන්තස්ස (උත්සහවත්වන වීර්යවන්තයාගේ) ''**සතිමතො**''ති (**සතිමතො** යනු) සතිසම්පන්නස්ස (සිහියෙන්යුතු කරන්නාගේ) ''**සුචිකම්මස්සා**''ති (**සුචිකම්මස්සා යනු**) නිද්දොසෙහි (නිර්දෝසවූ) නිරපරාධෙහි (අපරාද නොකරන) කාය-කම්මාදීහි (කාය ක්‍රියා ආදියෙන්) සමන්නාගතස්ස (සමන්විතයාගේ)

☞ මේ ගාථාවේ ''**උට්ඨානවතො**'' යනු උත්සහවත්වන වීර්යවන්තයාගේ **සතිමතො** යනු සිහියෙන්යුතු කරන්නාගේ **සුචිකම්මස්සා** යනු නිර්දෝසවූ අපරාද නොකරන කාය ක්‍රියා ආදියෙන් සමන්විතයාගේ

• ''**නිසම්මකාරිනො**''ති එවඤ්ඤෙව භවිස්සති, එවං කරිස්සාමීති වා, ඉමස්මිං කම්මෙ එවං කතෙ ඉදං නාම භවිස්සතීති වා එවං නිදානං සල්ලක්ඛෙත්වා රොගතිකිච්ඡනං විය සබ්බකම්මානි නිසාමෙත්වා උපධාරෙත්වා කරොන්තස්ස.

★ ''**නිසම්මකාරිනො**''ති (**නිසම්මකාරිනො යනු**) එවඤ්ඤෙව (මෙසේ ද) භවිස්සති (වන්නේය) එවං කරිස්සාමීති වා (මෙසේ කරන්නෙමි හෝ) ඉමස්මිං කම්මෙ (මේ ක්‍රියාවේ/ මේ කාර්යය) එවං කතෙ (මෙසේ කලවිට) ඉදං නාම භවිස්සතීති වා (මෙනම් දෙයක් වන්නේය හෝ) එවං නිදානං (මෙසේ නිදානය/ මෙසේ කරුණු) සල්ලක්ඛෙත්වා (සලකාබලා) රොග-තිකිච්ඡනං විය (රෝග සුවකරනවාක් මෙන්) සබ්බ-කම්මානි (සියලු ක්‍රියාවන්) නිසාමෙත්වා (අසා දැනගෙන) උපධාරෙත්වා (විමශාබලා) කරොන්තස්ස (කරන්නාගේ)

☞ **නිසම්මකාරිනො** යනු ''මෙසේ ද වන්නේය'' ''මෙසේ කරන්නෙමි'' හෝ මේ ක්‍රියාව මෙසේ කලවිට මෙනම් දෙයක් වන්නේය හෝ මෙසේ නිදානය-කරුණු සලකාබලා රෝග සුවකරනවාක් මෙන් සියලු ක්‍රියාවන් අසා දැනගෙන විමශාබලා කරන්නාගේ

• "**සඤ්ඤතස්සා**"ති කායාදීහි සඤ්ඤතස්ස නිච්ඡිද්දස්ස. "**ධම්මජීවිනො**"ති අගාරිකස්ස [තුලා-කූට+ආදීනි] තුලාකූටාදීනි වජ්ජෙත්වා [කසි-ගො-රක්ඛ+ආදීහි] කසිගොරක්ඛාදීහි, අනගාරිකස්ස වෙජ්ජකම්මදූතකම්මාදීනි වජ්ජෙත්වා ධම්මෙන සමෙන භික්ඛාචරියාය ජීවිකං කප්පෙන්තස්ස.

★ "**සඤ්ඤතස්සා**"ති ("**සඤ්ඤතස්සා**" යනු) කායාදීහි (කය ආදියෙහි) සඤ්ඤතස්ස (හික්මුනු) නිච්ඡිද්දස්ස (වැරදිනැත්තාගේ) "**ධම්මජීවිනො**"ති ("**ධම්මජීවිනො**" යනු) අගාරිකස්ස (ගිහියාගේ) [තුලා-කූට+ආදීනි] තුලාකූටාදීනි (සොරමැනීම් ආදිය) වජ්ජෙත්වා (හැරදමා) [කසි-ගො-රක්ඛ+ආදීහි] කසිගොරක්ඛාදීහි (ගොවිතැන් ගවයන් රැකීම ආදීයෙන්) අනගාරිකස්ස (පැවිද්දාගේ) වෙජ්ජකම්ම-දූතකම්මාදීනි (වෙදකම් පනිවිඩ ගෙනයෑම් ආදිය) වජ්ජෙත්වා (හැරදමා) ධම්මෙන සමෙන (දැහැමින් සෙමින්) භික්ඛාචරියාය (පින්ඩපාතයේ සැරිසරා) ජීවිකං කප්පෙන්තස්ස (ජීවිතය ගතකරන)

☞ "**සඤ්ඤතස්සා**" යනු කය ආදියෙහි හික්මුනු වැරදිනැත්තාගේ "**ධම්මජීවිනො**" යනු සොරමැනීම් ආදිය හැරදමා ගොවිතැනින් ගවයන් රැකීම ආදීයෙන් ජීවිතය ගතකරන ගිහියාගේ හා වෙදකම් පනිවිඩ ගෙනයෑම් ආදිය හැරදමා දැහැමින් සෙමින් පින්ඩපාතයේ සැරිසරා ජීවිතය ගතකරන පැවිද්දාගේ

• "**අප්පමත්තස්සා**"ති [න+විප්පවුත්ථ-සතිනො] අවිප්පවුත්ථසතිනො. "**යසොභිවඩ්ඪතී**"ති ඉස්සරියභොගසම්පන්නසඩ්ඛාතො වෙව කිත්තිවණ්ණහරණසඩ්ඛාතො ච යසො අභිවඩ්ඪතීති.

★ "**අප්පමත්තස්සා**"ති (**අප්පමත්තස්සා යනු**) [න+විප්පවුත්ථ-සතිනො] අවිප්පවුත්ථසතිනො (සිහියෙන් තොර නොවූවාගේ/ සිහියෙන් වාසයකරන්නාගේ) "**යසොභිවඩ්ඪතී**"ති (**යසොභිවඩ්ඪතී යනු**) ඉස්සරිය-භොග-සම්පන්න-සඩ්ඛාතො (ඉසුරුමත් ධන සම්පන්න යැයි කියනලද) වෙව (මෙන්ම) කිත්ති-වණ්ණ-හරණ-සඩ්ඛාතො (කීර්තිය ගුණ කීම් යැයි කියනලද) ච (ද) යසො අභිවඩ්ඪතීති (යසස වැඩෙයි)

☞ **අප්පමත්තස්සා යනු** සිහියෙන් වාසයකරන්නාගේ **යසොභිවඩ්ඪතී යනු** ඉසුරුමත් ධන සම්පන්න යැයි කියනලද මෙන්ම **කීර්තිය ගුණ කීම්** යැයි කියනලද ද යසස වැඩෙයි.

• ගාථාපරියොසානෙ කුම්භඝොසකො සොතාපත්තිඵලෙ පතිට්ඨහි. අඤ්ඤෙපි බහූ සොතාපත්තිඵලාදීනි පාපුණිංසු. එවං මහාජනස්ස සාත්ථිකා ධම්මදෙසනා ජාතාති.

★ ගාථා-පරියොසානෙ (ගාථාව අවසානයේ) කුම්භඝොසකො සොතාපත්තිඵලෙ පතිට්ඨහි (කුම්භඝෝසක සෝවාන් ඵලයේ පිහිටියේය) අඤ්ඤෙ-පි බහූ (අනෙත් බොහෝදෙනෙක් ද) සොතාපත්තිඵලාදීනි (සෝවාන් ඵල ආදියට) පාපුණිංසු (පැමිණියාහ) එවං මහාජනස්ස (මෙසේ මහජනයාට) සාත්ථිකා (අර්ථයක් සහිත/ ප්‍රයෝජනවත් දෙයක් බවට) ධම්මදෙසනා ජාතාති (ධර්ම දේශනාව පත්විය)

☞ ගාථාව අවසානයේ කුම්භඝෝසක සෝවාන් ඵලයේ පිහිටියේය. අනෙත් බොහෝදෙනෙක් ද සෝවාන් ඵල ආදියට පැමිණියාහ. මෙසේ ධර්ම දේශනාව මහජනයාට ප්‍රයෝජනවත්විය.

කුම්භඝොසකසෙට්ඨිවත්ථු නිට්ඨිතං. (කුම්භඝෝසක සිටුගේ කථාව නිමියේය.)

3. මහාධනසෙට්ඨීපුත්තවත්ථු (මහධන සිටුපුතාගේ කථාව)

• සො මහාධනසෙට්ඨීපුත්තෝ කිර බාරාණසියං අසීතිකොටිවිභවෙ කුලෙ නිබ්බත්ති. අථස්ස මාතාපිතරො චින්තෙසුං

★ සො මහාධනසෙට්ඨීපුත්තෝ කිර (ඒ මහධන සිටුපුතා වනාහි) බාරාණසියං (බරණැස) අසීතිකොටි-විභවෙ (අසූකොටියක් ධනයඇති) කුලෙ නිබ්බත්ති (ගෙදරක උපන්නේය) අථස්ස (ඉක්බිති ඔහුගේ) මාතාපිතරො චින්තෙසුං (මව්පියෝ සිතූහ.)

☞ ඒ මහධන සිටුපුතා වනාහි බරණැස අසූකොටියක් ධනයඇති ගෙදරක උපන්නේය. ඉක්බිති ඔහුගේ මව්පියෝ සිතූහ.

• ''අම්හාකං කුලෙ මහාභොගක්ඛන්ධො, පුත්තස්ස නො හත්ථෙ ඨපෙත්වා යථාසුඛං පරිභොගං කරිස්සාම, අඤ්ඤෙන කම්මෙන කිච්චං නත්ථී''ති. තං නච්චගීතවාදිතමත්තමෙව සික්ඛාපෙසුං.

★ ''අම්හාකං කුලෙ (අපගේ ගෙදර) මහාභොගක්ඛන්ධො (මහා ධනරාසියකි) පුත්තස්ස (පුතාගේ) නො (අපේ) හත්ථෙ ඨපෙත්වා (අතේ තබා) යථාසුඛං (සැපසේ) පරිභොගං කරිස්සාම (පරිභෝග කරමු) අඤ්ඤෙන කම්මෙන (අන් ක්‍රියාවකින්/ වෙනත් දෙයකින්) කිච්චං නත්ථී''ති (වැඩක් නෑ යැයි) තං (ඔහුට) නච්ච-ගීත-වාදිත-මත්තමෙව (නැටුම් ගැයුම් වාදනයන් පමණක්ම) සික්ඛාපෙසුං (පුරුදුකලාහ/ ඉගැන්නුවාහ)

☞ ''අපගේ ගෙදර මහා ධනරාසියක් තියෙන්ව, ඒවා අපේ පුතාට දීල සැපසේ පරිභෝග කරමු, වෙනත් දේකින් වැඩක් නෑ'' යැයි ඔහුට නැටුම් ගැයුම් වාදනයන් පමණක්ම ඉගැන්නුවාහ.

• තස්මිංයෙව නගරෙ අඤ්ඤස්මිං අසීතිකොටිවිභවෙ කුලෙ එකා ධීතාපි නිබ්බත්ති. තස්සාපි මාතාපිතරො තථෙව චින්තෙත්වා තං නච්චගීතවාදිතමත්තමෙව සික්ඛාපෙසුං.

★ තස්මිං යෙව නගරෙ (ඒ නගරයේ ම) අඤ්ඤස්මිං (තවත්) අසීතිකොටිවිභවෙ කුලෙ (අසූකොටියක් ධනයඇති ගෙදරක) එකා ධීතාපි නිබ්බත්ති (එක් දුවක් උපන්නාය) තස්සා-පි මාතාපිතරො (ඇගේ ද දෙමව්පියෝ) තථෙව චින්තෙත්වා (එලෙසම සිතා) තං (ඇයව) නච්ච-ගීත-වාදිත-මත්තමෙව (නැටුම් ගැයුම් වාදනයන් පමණක්ම) සික්ඛාපෙසුං (පුරුදුකලාහ/ ඉගැන්නුවාහ)

☞ ඒ නගරයේ ම තවත් අසූකොටියක් ධනයඇති ගෙදරක එක් දුවක් උපන්නාය ඇගේ දෙමව්පියෝ ද එලෙසම සිතා ඇයට නැටුම් ගැයුම් වාදනයන් පමණක්ම ඉගැන්නුවාහ.

• තෙසං වයප්පත්තානං ආවාහවිවාහො අහොසි. අථ නෙසං අපරභාගෙ මාතාපිතරො කාලමකංසු. ද්වෙඅසීතිකොටිධනං එකස්මිංයෙව ගෙහෙ අහොසි. සෙට්ඨීපුත්තො දිවසස්ස තික්ඛත්තුං රඤ්ඤො උපට්ඨානං ගච්ඡති.

★ තෙසං (ඔවුන්ගේ) වයප්පත්තානං (වැඩිවියට පැමිණියාවූ) ආවාහවිවාහො අහොසි (විවාහය සිදුවිය) අථ නෙසං (ඉක්බිති ඔවුන්ගේ) අපරභාගෙ (පසුකාලයේ) මාතාපිතරො කාලමකංසු (මව්පියෝ මැරුණාහ) ද්වෙ-අසීතිකොටිධනං (අසූකෝටියේ ඒවා දෙගුණයක් ධනය) එකස්මිං-යෙව (එක-ම) ගෙහෙ අහොසි (ගෙදරක විය) සෙට්ඨීපුත්තො (සිටුපුත්‍රයා) දිවසස්ස තික්ඛත්තුං (දවසට තුන්පාරක්) රඤ්ඤො උපට්ඨානං ගච්ඡති (රජුට සේවයකිරීමට යති)

☞ වැඩිවියට පැමිණියාවූ ඔවුන්ගේ විවාහය සිදුවිය. ඉක්බිති පසුකාලයේ ඔවුන්ගේ දෙමව්පියෝ මැරුණාහ. අසූකෝටියේ ඒවා දෙගුණයක් ධනය එක-ම ගෙදරක විය. සිටුපුත්‍රයා දවසට තුන්පාරක් රජුට සේවයකිරීමට යති.

• අථ තස්මිං නගරෙ ධුත්තා චින්තෙසුං – ‘‘[සචේ+අයං] සචායං සෙට්ඨීපුත්තො සුරාසොණ්ඩො භවිස්සති, අම්හාකං ඵාසුකං භවිස්සති, උග්ගණ්හාපෙම නං සුරාසොණ්ඩභාව’’න්ති.

★ අථ තස්මිං නගරෙ (ඉක්බිත් ඒ නගරයේ) ධුත්තා චින්තෙසුං (ධූර්තයෝ සිතූහ) ‘‘[සචේ+අයං] සචායං (ඉදින් මේ) සෙට්ඨීපුත්තො (සිටුපුත්‍රයා) සුරා-සොණ්ඩො භවිස්සති (සුරා සොඬෙක් වුනොත්/ සුරාව බොන්නෙක් වුවොත්) අම්හාකං ඵාසුකං භවිස්සති (අපට පහසුවක් වෙයි) උග්ගණ්හාපෙම (උගන්නමු) නං (ඔහුට) සුරාසොණ්ඩභාව’’න්ති (සුරා සොඬබව/ සුරා බොනහැටි යැයි)

☞ ඉක්බිත් ඒ නගරයේ ධූර්තයෝ මෙසේ සිතූහ. “ඉදින් මේ සිටුපුත්‍රයා සුරාව බොන්නෙක් වුවොත් අපට පහසුවක් වෙයි, ඔහුට සුරා බොනහැටි උගන්නමු” යැයි

• තෙ සුරං ආදාය බජ්ජකමංසෙ චෙව ලොණසක්ඛරා ච දුස්සන්තෙ බන්ධිත්වා මූලකන්දෙ ගහෙත්වා තස්ස රාජකුලතො ආගච්ඡන්තස්ස මග්ගං ඔලොකයමානා නිසීදිත්වා තං ආගච්ඡන්තං දිස්වා සුරං පිවිත්වා ලොණසක්ඛරං මුඛෙ ඛිපිත්වා මූලකන්දං ඛංසිත්වා ‘‘වස්සසතං ජීව සාමි, සෙට්ඨීපුත්ත, තං නිස්සාය මයං ඛාදනපිවනසමත්ථා භවෙය්‍යාමා’’ති ආහංසු.

★ තෙ සුරං ආදාය (ඔවුන් රා ගෙන) බජ්ජක-මංසෙ (මස්කැලි) චෙව (මෙන්ම) ලොණසක්ඛරා ච (ලුණුකැට ද) දුස්සන්තෙ බන්ධිත්වා (රෙද්දක බැඳගෙන) මූලකන්දෙ ගහෙත්වා (තල්මුල් ගෙන) තස්ස (ඔහුගේ) රාජකුලතො (රජගෙදරින්) ආගච්ඡන්තස්ස (එන) මග්ගං (පාර) ඔලොකයමානා (බලමින්) නිසීදිත්වා (හිඳ) තං ආගච්ඡන්තං (ඔහුව එන/ එන ඔහුව) දිස්වා (දැක) සුරං පිවිත්වා (රා බී) ලොණසක්ඛරං (ලුණුකැට) මුඛෙ ඛිපිත්වා (කටේ දාමගෙන) මූලකන්දං ඛංසිත්වා (තල්මුල් හපා) ‘‘වස්සසතං ජීව (අවුරුදු සීයක් ජීවත්වේවා) සාමි, සෙට්ඨීපුත්ත (ස්වාමීණි සිටුපුත්‍රය) තං නිස්සාය (ඔබ නිසා) මයං (අපි) ඛාදන-පිවන-සමත්ථා භවෙය්‍යාමා’’ති ආහංසු (කැමට බීමට සමත්වූවෝ වන්නෙමු යැයි කීහ / කාල බිල ඉන්නව යැයි කීහ]

☞ ඔවුන් රා ගෙන මස්කැලි මෙන්ම ලුණුකැට ද රෙද්දක බැඳගෙන තල්මුල් ගෙන රජගෙදරින් ඔහු එනතුරු පාරදෙස බලමින් හිඳ එන ඔහුව දැක රා බී ලුණුකැට කටේ දාමගෙන තල්මුල් හපා “ස්වාමීණි, අවුරුදු සීයක් ජීවත්වේවා! සිටුපුත්‍රය, ඔබ නිසා අපි කාල බිල ඉන්නව” යැයි කීහ.

• සො තෙසං වචනං සුත්වා පච්ඡතො ආගච්ඡන්තං [චූළ+උපට්ඨාකං] චූළූපට්ඨාකං පුච්ඡි ‘‘කිං එතෙ පිවන්තී’’ති. එකං පානකං, සාමීති. මනාපජාතිකං එතන්ති. සාමි, ඉමස්මිං ජීවලොකෙ ඉමිනා සදිසං පාතබ්බයුත්තකං නාම නත්ථීති.

★ සො තෙසං වචනං සුත්වා (ඔහු ඔවුන්ගේ වචන අසා) පච්ඡතො ආගච්ඡන්තං (පස්සෙන් එන) [චූළ+උපට්ඨාකං] චූළූපට්ඨාකං පුච්ඡි (සුලු උපස්ථායකයාගෙන් / සේවකයාගෙන් ඇසීය) ‘‘කිං එතෙ පිවන්තී’’ති (මොනවද ඒ අය බොන්නෙ යැයි) එකං පානකං, සාමීති (එක බීමක් ස්වාමීණි) මනාප-ජාතිකං (ප්‍රිය උපදවනව) [එතං+ඉති] එතන්ති (එය/ ඒක) සාමි

(ස්වාමීණි) ඉමස්මිං ජීවලොකෙ (මේ ලොකයේ) ඉමිනා සදිසං (මීට සමාන) පාතබ්බ-යුත්තකං නාම නත්ථීති (බිවයුත්තක් නම් නෑ)

☞ ඔහු ඔවුන්ගේ වචන අසා පස්සෙන් එන සුලු සේවකයාගෙන් ඇසීය. ‘‘මොනවද ඒ අය බොන්නෙ’’ යැයි ‘‘එක බීමක් ස්වාමීණි, ඒක ප්‍රිය උපදවනව, ස්වාමීණි, මේ ලොකයේ මීට සමාන බිවයුත්තක් නම් නෑ’’

• සො ‘‘එවං සන්තෙ මයාපි පාතුං වට්ටතී’’ති ථොකං ථොකං ආහරාපෙත්වා පිවති. අථස්ස නචිරස්සෙව තෙ ධුත්තා පිවනභාවං ඤත්වා තං පරිවාරයිංසු.

★ සො (ඔහු) ‘‘එවං සන්තෙ (එහෙම නම්/ එහෙනම්) මයා-පි (මා විසින් ද/ මාත්) පාතුං වට්ටතී’’ති (බොන්ඩ වටිනව යැයි) ථොකං ථොකං (ටික ටික) ආහරාපෙත්වා පිවති (ගෙන්නවාගෙන බොයි) අථස්ස (ඉක්බිති ඔහුගේ) නචිරස්සෙ-ව (කෙටිකාලයකින්-ම) තෙ ධුත්තා (ඒ ධූර්තයෝ) පිවනභාවං ඤත්වා (බොනබව දැන) තං පරිවාරයිංසු (ඔහුව පිරිවරාගත්හ.)

☞ ඔහු ‘‘එහෙනම් මාත් බොන්ඩ වටිනව’’ යැයි ටික ටික ගෙන්නවාගෙන බොයි. ඉක්බිති ඒ ධූර්තයෝ කෙටිකාලයකින් ම ඔහුගේ බොනබව දැන ඔහුව පිරිවරාගත්හ.

• ගච්ඡන්තෙ කාලෙ පරිවාරො මහා අහොසි. සො සතෙනපි සතද්වයෙනපි සුරං ආහරාපෙත්වා පිවන්තො ඉමිනා [අනුක්කමෙන+එව] අනුක්කමෙනෙව [නිසින්න+යාන+ආදීසු] නිසින්නට්යානාදීසු කභාපණරාසිං යපෙත්වා සුරං පිවන්තො

★ ගච්ඡන්තෙ කාලෙ (කාලය ගතවෙද්දී) පරිවාරො මහා අහොසි (පිරිවර විශාල විය) සො සතෙන-පි (ඔහු සියයකින් ද) සතද්වයෙන-පි (දෙසියකින් ද) සුරං ආහරාපෙත්වා (රා ගෙන්නවා) පිවන්තො (බොමින්) ඉමිනා (මේ) [අනුක්කමෙන+එව] අනුක්කමෙනෙව (ක්‍රමයෙන්-ම/ ආකාරයට-ම) [නිසින්න+යාන+ආදීසු] නිසින්නට්යානාදීසු (හිඳින තැන් ආදියෙහි) කභාපණ-රාසිං යපෙත්වා (කහවනු ගොඩවල් තබා) සුරං පිවන්තො (රා බොමින්)

☞ කාලය ගතවෙද්දී පිරිවර විශාල විය. ඔහු සියයකින් ද දෙසියකින් ද රා ගෙන්නවා බොමින්, මේ ආකාරයටම හිඳින තැන් ආදියෙහි කහවනු ගොඩවල් තබා රා බොමින්,

• ‘‘ඉමිනා මාලා ආහරථ, ඉමිනා ගන්ධෙ, අයං ජනො ජුතෙ ඡෙකො, අයං නච්චෙ, අයං ගීතෙ, අයං වාදිතෙ. ඉමස්ස සභස්සං දෙථ, ඉමස්ස ද්වෙ සභස්සානී’’ති

★ ‘‘ඉමිනා මාලා ආහරථ (මෙයින් මල් ගේන්න) ඉමිනා ගන්ධෙ (මෙයින් සුවඳ) අයං ජනො (මේ අය) ජුතෙ ඡෙකො (සූදුවෙහි දක්ෂය) අයං නච්චෙ (මොහු නැටීමෙහි) අයං ගීතෙ (මොහු ගී කීමෙහි) අයං වාදිතෙ (මොහු වාදනයෙහි) ඉමස්ස සභස්සං දෙථ (මොහුට දහසක් දෙන්න) ඉමස්ස ද්වෙ සභස්සානී’’ති (මොහුට දෙදහසක් යැයි)

☞ ‘‘මෙයින් මල් ගේන්න’’ ‘‘මෙයින් සුවඳ’’ ‘‘මේ අය සූදුවෙහි දක්ෂය, මොහු නැටීමෙහි, මොහු ගී කීමෙහි’’ මොහු වාදනයෙහි’’ මොහුට දහසක් දෙන්න’’ මොහුට දෙදහසක්’’ යැයි

• එවං විකිරන්තො නචිරස්සෙව අත්තනො සන්තකං අසීතිකොටිධනං ඛෙපෙත්වා ‘‘ඛීණං තෙ, සාමි, ධන’’න්ති වුත්තෙ කිං භරියාය මෙ සන්තකං නත්ථීති. අත්ථි, සාමීති. තෙන හි තං ආහරථාති.

★ එවං විකිරන්තො (මෙසේ විසුරුවමින් / නාස්තිකරමින්) නචිරස්සෙව (කෙටිකලකින්ම) අත්තනො සන්තකං (තමා සතු) අසීතිකොටිධනං ඛෙපෙත්වා (අසූකොටියක් ධනය අවසන්කර) ‘‘ඛීණං (අවසන්වුයේය) තෙ (ඔබගේ) සාමි, ධන’’න්ති වුත්තෙ (ස්වාමීණි ධනය යැයි කීකල) කිං හරියාය මෙ (ඇයි මගේ බිරිඳ) සන්තකං නත්ථීති (සතුදේ නැද්ද) අත්ථි, සාමීති (ඇත ස්වාමීණි) තෙන හි (එහෙනම්) තං ආහරථාති (ඒවා ගේන්න)

☞ මෙසේ නාස්තිකරමින් කෙටිකලකින්ම තමා සතු අසූකොටියක් ධනය අවසන්කර ‘‘ස්වාමීණි, ඔබගේ ධනය අවසන්වුයේය’’ යැයි කීකල, ‘‘ඇයි මගේ බිරිඳ සතුදේ නැද්ද’’ ‘‘ඇත ස්වාමීණි’’ ‘‘එහෙනම් ඒවා ගේන්න’’

• තම්පි තථෙව ඛෙපෙත්වා අනුපුබ්බෙන [ඛෙත්ත-ආරාම+උය්‍යාන-යොග්ග+ආදිකම්+අපි] ඛෙත්තආරාමුය්‍යානයොග්ගාදිකම්පි අන්තමසො භාජනහණ්ඩකම්පි [අත්ථරණ-පාවුරණ-නිසීදනං+අපි] අත්ථරණපාවුරණනිසීදනම්පි සබ්බං අත්තනො සන්තකං වික්කිණිත්වා ඛාදි.

★ තම්පි (එයද) තථෙව (එලෙසම) ඛෙපෙත්වා (අවසන්කර) අනුපුබ්බෙන (ක්‍රමයෙන්) [ඛෙත්ත-ආරාම+උය්‍යාන-යොග්ග+ආදිකම්+අපි] ඛෙත්තආරාමුය්‍යානයොග්ගාදිකම්පි (කුඹුරු වතුපිටි උයන් යානවාහන ආදිය ද) අන්තමසො (අඩුමතරමේ/ අඩුමවශයෙන්) භාජන-හණ්ඩකම්පි (භාජන බඩුත්) [අත්ථරණ-පාවුරණ-නිසීදනං+අපි] අත්ථරණපාවුරණනිසීදනම්පි (ඇතිරිලි පොරවනරෙදි එලනරෙදි ත්) සබ්බං අත්තනො සන්තකං (සියල්ල තමා සතු) වික්කිණිත්වා ඛාදි (විකුණා කෑවේය)

☞ එයද එලෙසම අවසන්කර ක්‍රමයෙන් කුඹුරු වතුපිටි උයන් යානවාහන ආදිය ද අඩුමතරමේ භාජන බඩුත් ඇතිරිලි පොරවනරෙදි එලනරෙදිත් තමා සතු සියල්ල විකුණා කෑවේය.

• අථ නං මහල්ලකකාලෙ [යෙහි+අස්ස] යෙහිස්ස කුලසන්තකං ගෙහං වික්කිණිත්වා ගහිතං, තෙ තං ගෙහා නීහරිංසු. සො හරියං ආදාය පරජනස්ස ගෙහහිත්තිං නිස්සාය වසන්තො කපාලඛණ්ඩං ආදාය භික්ඛාය චරිත්වා ජනස්ස උච්ඡිට්ඨකං භුඤ්ජිතුං ආරභි.

★ අථ නං මහල්ලකකාලෙ (ඉක්බිති ඔහු මහලුකාලයේ) [යෙහි+අස්ස] යෙහිස්ස (යමෙක් විසින් ඔහුගේ) කුලසන්තකං ගෙහං (කුලයසතු ගෙය) වික්කිණිත්වා ගහිතං (විකුණුව ගන්නාලද්දේ ද) තෙ (ඔවුන්) තං (ඔහුව) ගෙහා නීහරිංසු (ගෙයින් පිටමංකලහ) සො හරියං ආදාය (ඔහු බිරිඳත් ගෙන) පරජනස්ස (අන්ජනයාගේ/ අන්අයගේ) ගෙහහිත්තිං (ගෙවල්වල බිත්ති) නිස්සාය (ඇසුරුකරගෙන) වසන්තො (වසමින්) කපාලඛණ්ඩං ආදාය (වලංකැබැල්ලක් ගෙන) භික්ඛාය චරිත්වා (හිඟමන් ගොස්) ජනස්ස උච්ඡිට්ඨකං (ජනයාගේ/ මිනිසුන්ගේ ඉඳුල්) භුඤ්ජිතුං ආරභි (කෑමට පටන්ගත්තේය)

☞ ඉක්බිති ඔහු මහලුකාලයේ ඔහුගේ විකුණුව කුලයසතු ගෙය යමෙක් විසින් ගන්නාලද්දේ ද ඔවුන් ඔහුව ගෙයින් පිටමංකලහ. ඔහු බිරිඳත් ගෙන අන්අයගේ ගෙවල්වල බිත්ති ඇසුරුකරගෙන වාසයකරමින් වලං කැබැල්ලක් ගෙන හිඟමන් ගොස් මිනිසුන්ගේ ඉඳුල් කෑමට පටන්ගත්තේය.

• අථ නං එකදිවසං ආසනසාලාය ද්වාරෙ ඨත්වා දහරසාමණෙරෙහි දිය්‍යමානං උච්ඡිට්ඨකභොජනං පටිග්ගණ්හන්තං දිස්වා සත්ථා සිතං පාත්වාකාසි.

★ අථ නං එකදිවසං (ඉක්බිති ඔහු එක්දවසක්) ආසන-සාලාය (හිඳින සාලාවේ/ දාන සාලාවේ) ද්වාරෙ ඨත්වා (දොරකඩ සිට) දහර-සාමණෙරෙහි (බාල සාමණේරයන්) දිය්‍යමානං

(දෙනුලබන) උච්ඡිට්ඨක-භොජනං (ඉඳුල් ආහාර) පටිග්ගණ්හන්තං (පිළිගන්නවා) දිස්වා (දැක) සත්ථා සිතං පාත්වාකාසි (ශාස්තෘන් වහන්සේ සිනහ පහළකලේය)

☞ ඉක්බිති එක්දවසක් ඔහු දාන සාලාවේ දොරකඩ සිට බාල සාමණේරයන් දෙනුලබන ඉඳුල් ආහාර පිළිගන්නවා, ශාස්තෘන් වහන්සේ දැක, සිනහ පහළකලේය.

• අථ නං ආනන්දත්ථෙරො සිතකාරණං පුච්ඡි. සත්ථා සිතකාරණං කථෙන්තො ‘‘[පස්ස+ආනන්ද] පස්සානන්ද, ඉමං මහාධනසෙට්ඨිපුත්තං ඉමස්මිං නගරෙ ද්වෙඅසීතිකොටිධනං ඛෙපෙත්වා හරියං ආදාය භික්ඛාය චරන්තං.

★ අථ නං (ඉක්බිති ඔහුගෙන්/ භාග්‍යවතුන් වහන්සේගෙන්) ආනන්දත්ථෙරො (ආනන්ද තෙරුන්) සිතකාරණං පුච්ඡි (සිනාසුණු කාරණාව ඇසීය) සත්ථා සිතකාරණං කථෙන්තො (ශාස්තෘන් වහන්සේ සිනාසුණු කාරණාව කියමින්) ‘‘[පස්ස+ආනන්ද] පස්සානන්ද (බලන්න ආනන්ද) ඉමං මහාධනසෙට්ඨිපුත්තං (මේ මහධන සිටුපුතා) ඉමස්මිං නගරෙ (මේ නගරයේ) ද්වෙඅසීතිකොටිධනං (අසූකෝටියේ ඒවා දෙගුණයක් ධනය) ඛෙපෙත්වා (අවසන්කර/ විනාශකර) හරියං ආදාය භික්ඛාය චරන්තං (බිරිඳත් ගෙන හිඟමනේ යන)

☞ ඉක්බිති භාග්‍යවතුන් වහන්සේගෙන් ආනන්ද තෙරුන් සිනාසුණු කාරණාව ඇසීය ‘‘ශාස්තෘන් වහන්සේ සිනාසුණු කාරණාව කියමින්, බලන්න ආනන්ද මේ මහධන සිටුපුතා, මේ නගරයේ අසූකෝටියේ ඒවා දෙගුණයක් ධනය විනාශකර, බිරිඳත් ගෙන හිඟමනේ යනව,

• සචෙ හි අයං පඨමවයෙ භොගෙ අඛෙපෙත්වා කම්මන්තෙ පයොජයිස්ස, ඉමස්මිංයෙව නගරෙ අග්ගසෙට්ඨි අභවිස්ස.

★ සචෙ හි අයං (ඉඳින් මොහු) පඨමවයෙ (පළමුවියේ) භොගෙ අඛෙපෙත්වා (ධනය විනාශනොකර) කම්මන්තෙ පයොජයිස්ස (කර්මාන්තයන්හි යෙදෙව්වානම්) ඉමස්මිං යෙව නගරෙ (මේ නගරයේ ම) අග්ග-සෙට්ඨි අභවිස්ස (ප්‍රධාන සිටු වන්නේය)

☞ ඉඳින් මොහු පළමුවියේ ධනය විනාශනොකර කර්මාන්තයන්හි යෙදෙව්වානම් මේ නගරයේ ම ප්‍රධාන සිටු වන්නේය.

• සචෙ පන නික්ඛමිත්වා පබ්බජිස්ස, අරහත්තං පාපුණිස්ස, [හරියා+අපි+අස්ස] හරියාපිස්ස අනාගාමිඵලෙ පතිට්ඨහිස්ස.

★ සචෙ පන (ඉඳින් වනාහි) නික්ඛමිත්වා පබ්බජිස්ස (නික්මී පැවැදිවූවානම්) අරහත්තං පාපුණිස්ස (රහත්බවට පැමිණෙන්නේය/ රහත්වන්නේය) [හරියා+අපි+අස්ස] හරියාපිස්ස (බිරිඳ ද ඔහුගේ) අනාගාමිඵලෙ පතිට්ඨහිස්ස (අනාගාමි ඵලේ පිහිටන්නේය/ අනාගාමී වන්නේය)

☞ ඉඳින් නික්මී පැවැදිවූවානම් රහත්වන්නේය බිරිඳ ද ඔහුගේ අනාගාමි වන්නේය.

• සචෙ මජ්ඣිමවයෙ භොගෙ අඛෙපෙත්වා කම්මන්තෙ පයොජයිස්ස, දුතියසෙට්ඨි අභවිස්ස, නික්ඛමිත්වා පබ්බජන්තො අනාගාමී අභවිස්ස. හරියාපිස්ස සකදාගාමිඵලෙ පතිට්ඨහිස්ස.

★ සචෙ (ඉඳින්) මජ්ඣිමවයෙ (මධ්‍යමවියේ/ දෙවන වියේ) භොගෙ අඛෙපෙත්වා (ධනය විනාශනොකර) කම්මන්තෙ පයොජයිස්ස (කර්මාන්තයන්හි යෙදෙව්වානම්) දුතිය-සෙට්ඨි

අභවිස්ස (දෙවන සිටු වන්නේය) නික්ඛමිත්වා පබ්බජන්තො (නික්මී පැවැදිවෙමින්) අනාගාමී අභවිස්ස (අනාගාමී වන්නේය) භරියාපිස්ස (බිරිඳ ද ඔහුගේ) සකදාගාමිඵලෙ පතිට්ඨහිස්ස (සකදාගාමී ඵලේ පිහිටන්නේය/ සකදාගාමී වන්නේය)

☞ ඉදින් මධ්‍යමවියේ ධනය විනාශ නොකර කර්මාන්තයන්හි යෙදෙව්වානම්, දෙවන සිටු වන්නේය. නික්මී පැවැදිවෙමින් අනාගාමී වන්නේය, බිරිඳ ද ඔහුගේ සකදාගාමී වන්නේය.

• සචෙ පච්ඡිමවයෙ හොගෙ අඛෙපෙත්වා කම්මන්තෙ පයොජයිස්ස, තතියසෙට්ඨී අභවිස්ස, නික්ඛමිත්වා පබ්බජන්තොපි සකදාගාමී අභවිස්ස, භරියාපිස්ස සොතාපත්තිඵලෙ පතිට්ඨහිස්ස.

★ සචෙ (ඉදින්) පච්ඡිමවයෙ (අවසන්විසේ) හොගෙ අඛෙපෙත්වා (ධනය විනාශනොකර) කම්මන්තෙ පයොජයිස්ස (කර්මාන්තයන්හි යෙදෙව්වානම්) තතිය-සෙට්ඨී අභවිස්ස (තුන්වන සිටු වන්නේය) නික්ඛමිත්වා පබ්බජන්තො-පි (නික්මී පැවැදිවෙමින් ද) සකදාගාමී අභවිස්ස (සකදාගාමී වන්නේය) භරියාපිස්ස (බිරිඳ ද ඔහුගේ) සොතාපත්තිඵලෙ පතිට්ඨහිස්ස. (සෝවාන් ඵලේ පිහිටන්නේය/ සෝවාන් වන්නේය)

☞ ඉදින් අවසන්විසේ ධනය විනාශනොකර කර්මාන්තයන්හි යෙදෙව්වානම් තුන්වන සිටු වන්නේය. නික්මී පැවැදිවෙමින් සකදාගාමී වන්නේය, බිරිඳ ද ඔහුගේ සෝවාන් වන්නේය.

• ඉදානි [පන+එස] පනෙස ගිහිභොගතොපි පරිහීනො සාමඤ්ඤතොපි. පරිහායිත්වා ච පන සුක්ඛපල්ලලෙ කොඤ්චසකුණො විය ජාතො''ති වත්වා ඉමා ගාථා අභාසි

★ ඉදානි [පන+එස] පනෙස (දැන් වනාහි මොහු) ගිහි-භොගතො-පි (ගිහි භෝගයන්ගෙන් ද) පරිහීනො (පිරිහුණේය) සාමඤ්ඤතො-පි (මහණබවින් ද) පරිහායිත්වා ච පන (පිරිහී ද වනාහි) සුක්ඛ-පල්ලලෙ (වියලුණු විලක) කොඤ්චසකුණො (කොස්වහ ලිහිණියෙක්) විය ජාතො''ති (මෙන් පත්වූයේ/ විය යැයි) වත්වා (කියා) ඉමා ගාථා අභාසි (මේ ගාථා කීය/ දේශනාකලේය)

☞ දැන් මොහු වනාහි ගිහි භෝගයන්ගෙන් ද පිරිහුණේය, මහණබවින් ද පිරිහී, වියලුණු විලක කොස්වහ ලිහිණියෙක් මෙන් විය'' යැයි කියා, මේ ගාථා දේශනාකලේය.

''අවරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං;
ජීණ්ණකොඤ්චාව ඣායන්ති - ඛීණමච්ඡෙව පල්ලලෙ.

''අවරිත්වා බ්‍රහ්මචරියං - අලද්ධා යොබ්බනෙ ධනං;
සෙන්ති චාපාතිඛීණාව - පුරාණානි අනුත්ථුන''න්ති.

බ්‍රහ්මචරියං අවරිත්වා යොබ්බනෙ ධනං අලද්ධා, ඛීණමච්ඡෙව පල්ලලෙ ජීණ්ණකොඤ්චාව ඣායන්ති

★ බ්‍රහ්මචරියං අවරිත්වා (බ්‍රහ්මචරියාව නොරැක) යොබ්බනෙ ධනං අලද්ධා (තරුණවියේ ධනය නොලැබ/ රැස්නොකර) ඛීණ-මච්ඡෙව (අවසන්වූ මත්සයන් ඇති) පල්ලලෙ (විලක) ජීණ්ණ-කොඤ්චා-ව (වයසක කොස්වහ ලිහිණියෙක් මෙන්) ඣායන්ති (නැවත නැවත සිතති/ නැවත නැවත සිතා දුක්වේ)

☞ බ්‍රහ්මචරියාව නොරැක, තරුණවියේ ධනය රැස්නොකර, මත්සයන් අවසන්වූ විලක වයසක කොස්වහ ලිහිණියෙක් මෙන්, නැවත නැවත සිතා දුක්වේ.

[සරා] වාපාතිඛීණාව සෙන්ති පුරාණානි අනුත්ථුනං
★ [සරා (ඊතල)] [වාපා+අතිඛීණා-**වූ**] වාපාතිඛීණාව (දුන්නෙන් බොහෝදුරස්ව) සෙන්ති (වැටීසිටිනවා **මෙන්**) පුරාණානි (අතීතය ගැන) අනුත්ථුනං (කියකියා තැවේ)

☞ ඊතල දුන්නෙන් බොහෝදුරස්ව වැටීසිටිනවා මෙන් අතීතය ගැන කියකියා තැවේ.

• තත්ථ ''**අචරිත්වා**''ති බ්‍රහ්මචරියවාසං අවසිත්වා. ''**යොබ්බනෙ**''ති අනුප්පන්නෙ වා භොගෙ උප්පාදෙතුං උප්පන්නෙ වා භොගෙ රක්ඛිතුං සමත්ථකාලෙ **ධන**ම්පි අලභිත්වා.

★ තත්ථ (මෙහි/ මෙම ගාථාවල) ''**අචරිත්වා**''ති (''**අචරිත්වා**'' යනු) බ්‍රහ්මචරියවාසං අවසිත්වා (බ්‍රහ්මචරියාවෙහි වාසයනොකර/ බ්‍රහ්මචරියාව නොරැක) ''**යොබ්බනෙ**''ති (''**යොබ්බනෙ**'' යනු) අනුප්පන්නෙ වා භොගෙ (නූපන් හෝ ධනය) උප්පාදෙතුං (ඉපදවීමට) උප්පන්නෙ වා භොගෙ (උපන්නාවූ හෝ ධනය) රක්ඛිතුං සමත්ථ-කාලෙ (රැකීමට හැකි කැලයේ) [ධනං+අපි] **ධන**ම්පි අලභිත්වා (ධනය ද නොලැබ)

☞ මෙම ගාථාවල ''**අචරිත්වා**'' යනු බ්‍රහ්මචරියාව නොරැක ''**යොබ්බනෙ**'' යනු නූපන් ධනය ඉපදවීමට හෝ උපන්නාවූ ධනය රැකීමට හෝ හැකි කැලයේ ධනය ද නොලැබ

• ''**ඛීණමච්ඡෙ**''ති තෙ එවරූපා බාලා උදකස්ස අභාවා ඛීණමච්ඡෙ **පල්ලලෙ** පරික්ඛීණපත්තා ජිණ්ණකොඤ්චා විය අවක්කායන්ති.

★ ''**ඛීණමච්ඡෙ**''ති (''**ඛීණමච්ඡෙ**'' යනු) තෙ එවරූපා බාලා (ඒ මෙවැනිවූ අඥ්ඤානයෝ) උදකස්ස අභාවා (දිය නැතිකමින්) ඛීණ-මච්ඡෙ (මාළු අවසන්වූ) **පල්ලලෙ** (විලෙහි) පරික්ඛීණ-පත්තා (පිරිහුණු පියාපත් ඇති/ හැලීගිය පියාපත් ඇති) ජිණ්ණ-කොඤ්චා විය (වයසක කොස්වා ලිහිණියෙක් මෙන්) අවක්කායන්ති (නැවත නැවත සිතා දුක්වෙති)

☞''**ඛීණමච්ඡෙ**'' යනු ඒ මෙවැනිවූ අඥ්ඤානයෝ දිය නැතිකමින් මාළු අවසන්වූ විලෙහි, හැලීගිය පියාපත් ඇති වයසක කොස්වා ලිහිණියෙක් මෙන්, අතීතය ගැන නැවත නැවත සිතා දුක්වෙති.

• ඉදං වුත්තං හොති, පල්ලලෙ උදකස්ස අභාවො විය ඉමෙසං වසනට්ඨානස්ස අභාවො, මච්ඡානං ඛීණභාවො විය ඉමෙසං භොගානං අභාවො, ඛීණපත්තානං කොඤ්චානං උප්පතිත්වා [ගමන+අභාවො] ගමනාභාවො විය ඉමෙසං ඉදානි ජලට්ඨලපථාදීහි භොගෙ සණ්ඨාපෙතුං අසමත්ථභාවො. තස්මා තෙ ඛීණපත්තා කොඤ්චා විය එත්ථෙව බජ්ඣිත්වා අවක්කායන්තීති.

★ ඉදං වුත්තං හොති (මෙය කීවා වේ/ මෙහි කීදේ නම්) පල්ලලෙ (විලෙහි) උදකස්ස අභාවො විය (දිය නැතිබව මෙන්) ඉමෙසං (මොවුන්ගේ) වසනට්ඨානස්ස අභාවො (වාසයට තැනක් නැතිබව) මච්ඡානං ඛීණභාවො විය (මසුන් අවසන්වුබව මෙන්) ඉමෙසං (මොවුන්ගේ) භොගානං අභාවො (ධනය නැතිකම) ඛීණ-පත්තානං (හැලීගිය පියාපත් ඇති) කොඤ්චානං (කොස්වා ලිහිණියන්ගේ) උප්පතිත්වා (පියඹා) [ගමන+අභාවො] ගමනාභාවො විය (යා නොහැකිබව මෙන්) ඉමෙසං (මොවුන්ගේ) ඉදානි (දැන්) ජල-ථල-පථාදීහි (දිය ගොඩ මාර්ග ආදියෙහි) භොගෙ සණ්ඨාපෙතුං (බෝගයන් පිහිටවීමට/ ධනය උපදින මාර්ග ඇතිකිරීමට) අසමත්ථභාවො (අසමර්ථබව) තස්මා තෙ (එබැවින් ඔවුන්) ඛීණ-පත්තා (හැලීගිය පියාපත්

ඇති) කොඤ්ඡා විය (කොස්වා ලිහිණියෙක් මෙන්) එත්ථෙව (මෙහිම) බජ්ඣිත්වා (බැඳී) අවඣායන්තීති (නැවත නැවත සිතා දුක්වෙති)

☞ මෙහි කීදේ නම්, විලෙහි දිය නැතිබව මෙන් මොවුන්ගේ වාසයට තැනක් නැතිබව, මසුන් අවසන්වුබව මෙන් මොවුන්ගේ ධනය නැතිකම, හැලීගිය පියාපත් ඇති කොස්වා ලිහිණියන්ගේ පියඹා යා නොහැකිබව මෙන් මොවුන්ගේ දැන් දිය ගොඩ මාර්ග ආදියෙහි ධනය උපදින මාර්ග ඇතිකිරීමට අසමර්ථබව, එබැවින් ඔවුන් හැලීගිය පියාපත් ඇති කොස්වා ලිහිණියෙක් මෙන් මෙහිම බැඳී නැවත නැවත සිතා දුක්වෙති.

• ''**චාපාතිඛීණාවා**''ති චාපතො අතිඛීණා, චාපා විනිමුත්තාති අත්ථො.

★ ''**චාපාතිඛීණාවා**''ති (''**චාපාතිඛීණාවා**'' යනු) චාපතො අතිඛීණා (දුන්නෙන් අතිශයින් ක්ෂයවුයේ) චාපා (දුන්නෙන්) [විනිමුත්තා+ඉති] විනිමුත්තාති (මිදුනේ යැයි) අත්ථො (අර්ථය වේ)

☞ ''**චාපාතිඛීණාවා**'' යනු දුන්නෙන් අතිශයින් ක්ෂයවුයේ, දුන්නෙන් මිදුනේ යැයි අර්ථය වේ.

• ඉදං වුත්තං හොති, යථා චාපා විනිමුත්තා සරා යථාවෙගං ගන්ත්වා පතිතා, තං ගහෙත්වා උක්ඛිපන්තෙ අසති තත්ථෙව උපචිකානං භත්තං හොන්ති, එවං ඉමෙපි තයො වයෙ අතික්කන්තා ඉදානි අත්තානං උද්ධරිතුං අසමත්ථතාය මරණං උපගමිස්සන්ති. තෙන වුත්තං ''**සෙන්ති චාපාතිඛීණාවා**''ති.

★ ඉදං වුත්තං හොති (මෙය කීවා වේ/ මෙහි කීදේ නම්) යථා (යම්සේ) චාපා විනිමුත්තා (දුන්නෙන් මිදුනාවූ) සරා (ඊය) යථා-වෙගං (වේගය ඇතිතාක්) ගන්ත්වා පතිතා (ගොස් වැටුන) තං ගහෙත්වා (එය ගෙන) උක්ඛිපන්තෙ අසති (ඔසවන්නෙක් නැතිකල) තත්ථෙව (එහිම) උපචිකානං (වෙයන්ට) භත්තං හොන්ති (ආහාර වෙති) එවං ඉමෙ-පි (එසේ මොවුන් ද) තයො වයෙ (තුන්විය) අතික්කන්තා (ඉක්මවා) ඉදානි (දැන්) අත්තානං උද්ධරිතුං (තමාව ඔසවාගැනිමට) අසමත්ථතාය (අසමර්ථබැවින්) මරණං උපගමිස්සන්ති (මරණය වෙත යති) තෙන වුත්තං (එබැවින් කියන ලදී) ''**සෙන්ති චාපාතිඛීණාවා**''ති (''**සෙන්ති චාපාතිඛීණාවා**'' යැයි)

☞ මෙහි කීදේ නම්, යම්සේ දුන්නෙන් මිදුනාවූ ඊය, වේගය ඇතිතාක් ගොස් වැටේ, එය ගෙන ඔසවන්නෙක් නැතිකල, එහිම වෙයන්ට ආහාර වෙති. එසේම තුන්විය ඉක්මවාඇති මොවුන් ද දැන් තමාව ඔසවාගැනිමට අසමර්ථබැවින් මරණය වෙත යති. එබැවින් කියන ලදී ''**සෙන්ති චාපාතිඛීණාවා**'' යැයි.

• ''**පුරාණානි අනුත්ථුනන්**''ති ''ඉති අම්හෙහි ඛාදිතං ඉති පීත''න්ති පුබ්බෙ කතානි ඛාදිතපිවිතනච්චගීතවාදිතාදීනි අනුත්ථුනන්තා සොචන්තා අනුසොචන්තා සෙන්තීති.

★ ''**පුරාණානි අනුත්ථුනන්**''ති (''**පුරාණානි අනුත්ථුනන්**'' යනු) ''ඉති අම්හෙහි ඛාදිතං (මෙසේ අපි කෑවා) ඉති පීත''න්ති (මෙසේ බීවා යැයි) පුබ්බෙ කතානි (පෙර කරනලද) ඛාදිත-පිවිත-නච්ච-ගීත-වාදිතාදීනි (කෑම් බීම් නැටීම් ගැගීම් වැයිම් ආදිය) අනුත්ථුනන්තා (නැවත නැවත කියමින්) සොචන්තා (සෝකවෙමින්) අනුසොචන්තා (ඒගැන සිතා සෝකවෙමින්) සෙන්තීති (වැටීසිටිති)

☞ ‘‘**පුරාණානි අනුත්ථුනන්**’’ යනු මෙසේ අපි කෑවා මෙසේ බීවා යැයි පෙර කරනලද කැම් බීම් නැටීම් ගැගීම් වැයිම් ආදිය නැවත නැවත කියමින් සෝකවෙමින් ඒගැන සිතා සෝකවෙමින් වැටීසිටිති.

• දෙසනාවසානෙ බහූ සොතාපත්තිඵලාදීනි පාපුණිංසූති.
☞ දේශනාව අවසානයේ බොහෝදෙනෙක් සෝවාන් ඵල ආදියට පැමිණියාහ.

මහාධනසෙට්ඨිපුත්තවත්ථු නිට්ඨිතං (මහධන සිටුපුතාගේ කථාව නිමියේය.)

4. ගඬ්ගාරෝහන පූජා (ගඬ්ගාරෝහන පූජාව)

• එකස්මිඤ්හි සමයෙ වෙසාලී ඉද්ධා අහොසි ඵීතා බහුජනා ආකිණ්ණමනුස්සා. තත්ථ හි වාරෙන වාරෙන රජ්ජං කාරෙන්තානං ඛත්තියානංයෙව සත්තසතාධිකානි සත්තසහස්සානි සත්ත ච ඛත්තියා අහෙසුං.

★ [එකස්මිං+හි] එකස්මිඤ්හි සමයෙ (එක් කාලයක වනාහි) වෙසාලී (වේසාලිය) ඉද්ධා අහොසි (ධනවත් විය) ඵීතා (සමෘද්ධිමත් විය) බහුජනා (බෝහෝජනයන් විය) ආකිණ්ණ-මනුස්සා (මිනිසුන්ගෙන් ගැවසීගත්තේය) තත්ථ හි (එහි වනාහි) වාරෙන වාරෙන (වාරයෙන් වාරයට) රජ්ජං කාරෙන්තානං (රාජ්‍යය කරන්නාවූ) ඛත්තියානං-යෙව (ක්ෂත්‍රියෝ ම) [සත්ත-සතා+අධිකානි] සත්තසතාධිකානි (සත්සියයක් වැඩි) සත්ත-සහස්සානි (සත්දහසක්) සත්ත ච (සතක්ද) ඛත්තියා අහෙසුං (ක්ෂත්‍රියෝ වූහ)

☞ එක් කාලයක වනාහි වේසාලිය ධනවත් විය, සමෘද්ධිමත් විය, බෝහෝජනයන් විය, මිනිසුන්ගෙන් ගැවසීගත්තේය. එහි වනාහි වාරයෙන් වාරයට රාජ්‍යය කරන්නාවූ ක්ෂත්‍රියෝ ම සත්දහසක්සත්සියසතක් වූහ.

• තෙසං වසනත්ථාය තත්තකායෙව පාසාදා තත්තකානෙව කූටාගාරානි උය්‍යානෙ විහාරත්ථාය තත්තකායෙව ආරාමා ච පොක්ඛරණියො ච අහෙසුං.

★ තෙසං වසනත්ථාය (ඔවුගේ වාසය පිණිස) තත්තකා-යෙව (එතෙකක් ප්‍රමාණයක් ම) පාසාදා (ප්‍රාසාද) තත්තකානෙව (එතෙකක් ප්‍රමාණයක් ම) කූටාගාරානි (පත්තිරිප්පු) උය්‍යානෙ විහාරත්ථාය (උයනේ කාලය ගතකිරීම පිණිස) තත්තකායෙව (එතෙකක් ප්‍රමාණයක් ම) ආරාමා ච පොක්ඛරණියො ච අහෙසුං (ආරාම ද පොකුණු ද වූහ)

☞ ඔවුගේ වාසය පිණිස එතෙකක් ප්‍රමාණයක් ම ප්‍රාසාද, එතෙකක් ප්‍රමාණයක් ම පත්තිරිප්පු, උයනේ කාලය ගතකිරීම පිණිස එතෙකක් ප්‍රමාණයක් ම ආරාම ද පොකුණු ද වූහ.

• සා අපරෙන සමයෙන දුබ්භික්ඛා අහොසි දුස්සස්සා. තත්ථ ඡාතකභයෙන පඨමං දුග්ගතමනුස්සා කාලමකංසු. තෙසං තෙසං තත්ථ තත්ථ ඡඩ්ඩිතානං කුණපානං ගන්ධෙන අමනුස්සා නගරං පවිසිංසු.

★ සා අපරෙන සමයෙන (එය පසුකාලයේදී) දුබ්භික්ඛා අහොසි (දුර්භික්ෂයකට පත්විය) දුස්සස්සා (බෝගයන් නැතිවීගියේය) තත්ථ ඡාතක-භයෙන (එහි බඩගිනි බියෙන්/ බඩගින්න නිසා) පඨමං දුග්ගතමනුස්සා කාලමකංසු (පළමුව දුගී මිනිසුන් මැරුණාහ) තෙසං තෙසං (ඒ ඔවුන්ගේ) තත්ථ තත්ථ (තැන තැන) ඡඩ්ඩිතානං කුණපානං (හැරදැමූ කුණුපයන්ගේ/ මිනීවල) ගන්ධෙන (ගඳනිසා) අමනුස්සා නගරං පවිසිංසු (අමුනුස්සයෝ නගරයට ඇතුලුවූහ)

☞ එය පසුකාලයේදී දුර්භික්ෂයකට පත්විය. බෝගයන් නැතිවීගියේය. එහි බඩගින්න නිසා පළමුව දුගී මිනිසුන් මැරුණාහ. ඒ ඔවුන්ගේ තැන තැන හැරදැමූ මිනීවල ගඳනිසා අමුනුස්සයෝ නගරයට ඇතුලුවූහ.

• [අමනුස්ස+උපද්දවෙන] අමනුස්සූපද්දවෙන බහුතරා කාලමකංසු. තෙසං කුණපගන්ධපටික්කූලතාය සත්තානං අභිවාතරොගො උප්පජ්ජි. එවං දුබ්භික්ඛභයං අමනුස්සභයං රොගභයන්ති තීණි භයානි උප්පජ්ජිංසු.

★ [අමනුස්ස+උපද්දවෙන] අමනුස්සූපද්දවෙන (අමනුස්ස උපද්ද්‍රවයෙන්) බහුතරා කාලමකංසු (බොහෝදෙනෙක් මැරුණාහ) තෙසං (ඔවුන්ගේ) කුණප-ගන්ධ-පටික්කූලතාය (මිනීවල ගඳේ පිළිකුල්බැවින්) සත්තානං (සත්ත්වයන්ට) අභිවාතරොගො උප්පජ්ජි (අභිවාත රෝගය ඇතිවිය) එවං දුබ්භික්ඛ-භයං (මෙසේ දුර්භික්ෂ බිය) අමනුස්සභයං (අමනුස්ස බිය) රොගභයන්ති (රෝග බිය යැයි) තීණි භයානි උප්පජ්ජිංසු (තුන් බියක් ඇතිවූහ)

☞ අමනුස්ස උපද්ද්‍රවයෙන් බොහෝදෙනෙක් මැරුණාහ. ඔවුන්ගේ මිනීවල ගඳේ පිළිකුල්බැවින් සත්ත්වයන්ට අභිවාත රෝගය ඇතිවිය. මෙසේ දුර්භික්ෂ බිය අමනුස්ස බිය රෝග බිය යැයි තුන් බියක් ඇතිවූහ.

• නගරවාසිනො සන්නිපතිත්වා රාජානං ආහංසු – ''මහාරාජ, ඉමස්මිං නගරෙ තීණි භයානි උප්පන්නානි, ඉතො පුබ්බෙ යාව සත්තමා රාජපරිවට්ටා එවරූපං භයං නාම න උප්පන්නපුබ්බං. අධම්මිකරාජූනඤ්හි කාලෙ එවරූපං භයං උප්පජ්ජතී''ති.

★ නගරවාසිනො සන්නිපතිත්වා (නගරවැසියෝ රැස්වී) රාජානං ආහංසු (රජවරුන්ට කීහ) ''මහාරාජ, ඉමස්මිං නගරෙ (මේ නගරයේ) තීණි භයානි උප්පන්නානි (තුන් බියක් උපන්නා/ ඇතිවූනි) ඉතො පුබ්බෙ (මීට පෙර) **<u>යාව</u>** සත්තමා රාජපරිවට්ටා (සත්වන රාජ පරම්පරාව **<u>දක්වා</u>**) එවරූපං භයං නාම (මෙවැනිවූ බියක් නම්) න උප්පන්න-පුබ්බං (පෙර නූපන්නේය) අධම්මික-රාජූනඤ්හි කාලෙ (අධාර්මික රජවරුන්ගේ කාලයේ) එවරූපං භයං උප්පජ්ජතී''ති (මෙවැනිවූ බියක් ඇතිවෙයි යැයි)

☞ නගරවැසියෝ රැස්වී රජවරුන්ට කීහ, ''මහරාජ, මේ නගරයේ තුන් බියක් උපන්නා, මීට පෙර සත්වන රාජ පරම්පරාව දක්වා මෙවැනිවූ බියක් නම් පෙර නූපන්නේය, අධාර්මික රජවරුන්ගේ කාලයේ මෙවැනිවූ බියක් ඇතිවෙයි'' යැයි.

• රාජා සන්ථාගාරෙ සබ්බෙසං සන්නිපාතං කාරෙත්වා ''සචෙ මෙ අධම්මිකභාවො අත්ථි, තං විචිනථා''ති ආහ.

★ රාජා සන්ථාගාරෙ (රජු රැස්වීම් සාලාවේ) සබ්බෙසං සන්නිපාතං කාරෙත්වා (සියල්ලගේ රැස්කිරීම කර/ සියලුදෙනා රැස්කර) ''සචෙ මෙ (ඉඳින් මගේ) අධම්මික-භාවො අත්ථි (අධාර්මික බවක් ඇත්නම්) තං (එය) [විචිනථ+ඉති] විචිනථා''ති ආහ (සොයන්න යැයි කීය)

☞ රජු රැස්වීම් සාලාවේ සියලුදෙනා රැස්කර ''ඉඳින් මගේ අධාර්මික බවක් ඇත්නම්, එය සොයන්න'' යැයි කීය.

• වෙසාලිවාසිනො සබ්බං පවෙණි විචිනන්තා රඤ්ඤො කඤ්චි දොසං අදිස්වා, ''මහාරාජ, නත්ථි තෙ දොසො''ති වත්වා ''කථං නු ඛො ඉදං අම්හාකං භයං වූපසමං ගච්ඡෙය්‍යා''ති මන්තයිංසු.

★ වෙසාලිවාසිනො (විසාලාවේ වැසියෝ) සබ්බං පවෙණි (සියලු පරම්පරාව / සියලු ක්‍රියාකලාපයන්) විචිනන්තා (සොයාබලමින්) රඤ්ඤො කඤ්චි (රජුගේ කිසි) දොසං අදිස්වා (දෝසයක් නොදැක) ''මහාරාජ, නත්ථි (නැත) තෙ (ඔබේ) දොසො''ති වත්වා (දෝසයක් යැයි කියා) ''කථං නු ඛො (කෙසේද) ඉදං අම්හාකං භයං (මේ අපේ බිය) වූපසමං ගච්ඡෙය්‍යා''ති (පහවී යන්නේ යැයි) මන්තයිංසු (සාකච්ඡාකලහ)

☞ විසාලාවේ වැසියෝ රජුගේ සියලු ක්‍රියාකලාපයන් සොයාබලමින් කිසි දෝසයක් නොදැක ‘‘මහරාජ, ඔබේ දෝසයක් නැත’’ යැයි කියා ‘‘කෙසේද අපේ මේ බිය පහවී යන්නේ’’ යැයි සාකච්ඡාකලහ.

• තත්ථ එකච්චෙහි ‘‘බලිකම්මෙන ආයාචනාය මඞ්ගලකිරියායා’’ති වුත්තෙ සබ්බම්පි තං විධිං කත්වා පටිබාහිතුං නාසක්ඛිංසු.

★ තත්ථ එකච්චෙහි (එහි ඇතැමෙක්) ‘‘බලිකම්මෙන (බලිපූජාවලින්) ආයාචනාය (ආවනාකිරිමෙන්) මඞ්ගලකිරියායා’’ති (මංගල ක්‍රියාවක්/ යහපතක් වන්නේය යැයි) වුත්තෙ (කියූකල) සබ්බම්පි (සියල්ලෝ ම) තං විධිං කත්වා (ඒ ක්‍රමය කර) පටිබාහිතුං නාසක්ඛිංසු (වැලැක්විමට නො හැකිවූහ)

☞ එහි ඇතැමෙක් ‘‘බලිපූජාවලින් ආවනාකිරිමෙන් යහපතක් වන්නේය’’ යැයි කියූකල සියල්ලෝ ම ඒ ක්‍රමය කර වැලැක්විමට නො හැකිවූහ.

• අථඤ්ඤෙ එවමාහංසු – ‘‘ඡ සත්ථාරො මහානුභාවා, තෙසු ඉධාගතමත්තෙසු භයං වූපසමෙය්‍යා’’ති.

★ [අථ+අඤ්ඤෙ] අථඤ්ඤෙ (ඉක්බිති අනිත්අය) [එවං+ආහංසු] එවමාහංසු (මෙසේ කීහ) ‘‘ඡ සත්ථාරො (ශාස්තෘන් සයදෙන) මහානුභාවා (මහානුභාව සම්පන්නය) තෙසු (ඔවුන්) [ඉධ+ආගත-මත්තෙසු] ඉධාගතමත්තෙසු (මෙහි ආ පමණින්) භයං වූපසමෙය්‍යා’’ති (බිය සමනයවන්නේය යැයි)

☞ ඉක්බිති අනිත් අය මෙසේ කීහ. ‘‘ශාස්තෘන් සයදෙන මහානුභාව සම්පන්නය, ඔවුන් මෙහි ආ පමණින්ම බිය සමනයවන්නේය’’ යැයි.

• අපරෙ ‘‘සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො. සො හි භගවා සබ්බසත්තහිතාය ධම්මං දෙසෙති, මහිද්ධිකො මහානුභාවො. තස්මිං ඉධ ආගතෙ ඉමානි භයානි වූපසමෙය්‍යු’’න්ති ආහංසු.

★ අපරෙ (තවත් අය) ‘‘සම්මාසම්බුද්ධො ලොකෙ උප්පන්නො (සම්මාසම්බුදුන් ලොවෙහි උපන්නා) සො හි භගවා (ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි) සබ්බ-සත්ත-හිතාය (සියලු සත්ත්වයන්ගේ හිතපිණිස) ධම්මං දෙසෙති (දහම් දෙසයි) මහිද්ධිකො (මහාඍද්ධිමත්ය) මහානුභාවො (මහානුභාව සම්පන්නය) තස්මිං (ඔහු/ උන්වහන්සේ) ඉධ ආගතෙ (මෙහි ආකල) ඉමානි භයානි (මේ බියන්) වූපසමෙය්‍යු’’න්ති ආහංසු (සමනයවනේය යැයි කීහ)

☞ තවත් අය ‘‘සම්මාසම්බුදුන් ලොවෙහි උපන්නා, ඒ භාග්‍යවතුන් වහන්සේ වනාහි සියලු සත්ත්වයන්ගේ හිතපිණිස දහම් දෙසයි, මහාඍද්ධිමත්ය මහානුභාව සම්පන්නය උන්වහන්සේ මෙහි ආකල මේ බියන් සමනයවනේය’’ යැයි කීහ.

• තෙසං වචනං සබ්බෙපි අභිනන්දිත්වා ‘‘කහං නු ඛො සො භගවා එතරහි විහරතී’’ති ආහංසු. තදා පන සත්ථා උපකට්ඨාය වස්සූපනායිකාය රඤ්ඤො බිම්බිසාරස්ස පටිඤ්ඤං දත්වා වෙළුවනෙ විහරති.

★ තෙසං වචනං (ඔවුන්ගේ වදනට) සබ්බෙ-පි අභිනන්දිත්වා (සියල්ලන් ම සතුටුව) ‘‘කහං නු ඛො (කොහේද) සො භගවා (ඒ භාග්‍යවතුන් වහන්සේ) එතරහි විහරතී’’ති (දැන්

වාසයකරන්නේ යැයි) ආහංසු (ඇසූහ) තදා පන සත්ථා (එකල ශාස්තෘන් වහන්සේ වනාහි) උපකට්ඨාය (ආසන්නයේ) වස්සූපනායිකාය (වස්වැසීමට) රඤ්ඤො බිම්බිසාරස්ස (බිම්බිසාර රජුට) පටිඤ්ඤං දත්වා (පොරොන්දුවක් දී/ වස්වැසීමට පොරොන්දුවී) වෙළුවනෙ විහරති (වේළුවනයෙහි වැඩවාසයකරයි)

☞ ඔවුන්ගේ වදනට සියල්ලන් ම සතුටුව ‘‘කොහේද ඒ භාග්‍යවතුන් වහන්සේ දැන් වාසයකරන්නේ’’ යැයි ඇසූහ. එකල ශාස්තෘන් වහන්සේ වනාහි වස්වැසීමට ආසන්නයේ බිම්බිසාර රජුට වස්වැසීමට පොරොන්දුවී වේළුවනයෙහි වැඩවාසයකරයි.

• තෙන ච සමයෙන බිම්බිසාරසමාගමෙ බිම්බිසාරෙන සද්ධිං සොතාපත්තිඵලං පත්තො මහාලි නාම ලිච්ඡවී තස්සං පරිසායං නිසින්නො හොති.

★ තෙන ච සමයෙන (ඒ වෙලාවේ) බිම්බිසාරසමාගමෙ (බිම්බිසාර රජු හා එක්ව බුදුන්ගෙන් ධහම්ඇසූ පිරිසෙහි) බිම්බිසාරෙන සද්ධිං (බිම්බිසාර රජු සමග) සොතාපත්තිඵලං පත්තො (සෝවාන් ඵලයට පත්වූ) මහාලි නාම ලිච්ඡවී (මහලී නම් ලිච්ඡවීතෙම) තස්සං පරිසායං (ඒ පිරිසෙහි) නිසින්නො හොති (හුන්නේය/ උන්නේය)

☞ ඒ වෙලාවේ, බිම්බිසාර රජු හා එක්ව බුදුන්ගෙන් ධහම්ඇසූ පිරිසෙහි බිම්බිසාර රජු සමග සෝවාන් ඵලයට පත්වූ මහලී නම් ලිච්ඡවීතෙම ඒ පිරිසෙහි උන්නේය.

• වෙසාලිවාසිනො මහන්තං පණ්ණාකාරං සජ්ජෙත්වා රාජානං බිම්බිසාරං සඤ්ඤාපෙත්වා ‘‘සත්ථාරං [ඉධ+ආනෙථ+ඉති] ඉධානෙථා’’ති [මහාලිං+චෙව] මහාලිඤ්චෙව ලිච්ඡවිං පුරොහිතපුත්තඤ්ච පහිණිංසු.

★වෙසාලිවාසිනො (වේසාලි වැසියෝ) මහන්තං පණ්ණාකාරං සජ්ජෙත්වා (ගොඩක් තෑගිබෝග පිළියෙලකර) රාජානං බිම්බිසාරං සඤ්ඤාපෙත්වා (බිම්බිසාර රජුට දැනුම්දී) ‘‘සත්ථාරං (ශාස්තෘන් වහන්සේ) [ඉධ+ආනෙථ+ඉති] ඉධානෙථා’’ති (මෙහි ගෙනඑන්/ මෙහෙට වැඩමකරවන්න යැයි) [මහාලිං+චෙව] මහාලිඤ්චෙව ලිච්ඡවිං (මහලි ලිච්ඡවී මෙන්ම) පුරොහිත-පුත්තඤ්ච (පුරෝහිත පුත්‍රයන්ද) පහිණිංසු (යැවූහ)

☞ වේසාලි වැසියෝ ගොඩක් තෑගිබෝග පිළියෙලකර බිම්බිසාර රජුට දැනුම්දී ‘‘ශාස්තෘන් වහන්සේ මෙහෙට වැඩමකරවන්න’’ යැයි මහලී ලිච්ඡවී මෙන්ම පුරෝහිත පුත්‍රයන්ද යැවූහ.

• තෙ ගන්ත්වා රඤ්ඤො පණ්ණාකාරං දත්වා තං පවත්තිං නිවෙදෙත්වා, ‘‘මහාරාජ, සත්ථාරං අම්හාකං නගරං පෙසෙථා’’ති යාචිංසු. රාජා ‘‘තුම්හෙව ජානාථා’’ති න සම්පටිච්ඡි.

★ තෙ ගන්ත්වා (ඔවුන් ගොස්) රඤ්ඤො පණ්ණාකාරං දත්වා (රජුට තෑගිබෝග දී) තං පවත්තිං (ඒ පුවත) නිවෙදෙත්වා (දැනුම්දී) ‘‘මහාරාජ (මහරජ) සත්ථාරං (ශාස්තෘන් වහන්සේ) අම්හාකං නගරං (අපගේ නගරයට) පෙසෙථා’’ති (එවන්න යැයි) යාචිංසු (අයැදසිටියාහ) රාජා (රජු) ‘‘තුම්හෙ-ව (නුඹලා-ම) ජානාථා’’ති (දැනගන්න/ ආරාධනාකරන්න යැයි) න සම්පටිච්ඡි (නො පිළිගත්තේය)

☞ ඔවුන් ගොස් රජුට තෑගිබෝග දී ඒ පුවත දැනුම්දී ‘‘මහරජ, ශාස්තෘන් වහන්සේ අපගේ නගරයට එවන්න’’ යැයි අයැදසිටියාහ. රජු ‘‘නුඹලාම ආරාධනාකරන්න’’ යැයි නො පිළිගත්තේය.

• තෙ භගවන්තං උපසඞ්කමිත්වා වන්දිත්වා යාචිංසු – ''භන්තෙ, වෙසාලියං තීණි භයානි උප්පන්නානි, තානි තුම්හෙසු ආගතෙසු වූපසමිස්සන්ති, එථ, භන්තෙ, ගච්ඡාමා''ති.

★ තෙ භගවන්තං උපසඞ්කමිත්වා (ඔවුන් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ) වන්දිත්වා යාචිංසු (වැඳ අයැදසිටියාහ) ''භන්තෙ (ස්වාමීණි) වෙසාලියං (විසාලා මහනුවර) තීණි භයානි උප්පන්නානි (තුන් බියක් උපන්නා) තානි (ඒවා) තුම්හෙසු ආගතෙසු (නුඹ වහන්සේ ආකල/ වැඩියකල) වූපසමිස්සන්ති (සමනයවන්නෝය) එථ (එන්න/ වඩින්න) භන්තෙ (ස්වාමීණි) ගච්ඡාමා''ති (යමු යැයි)

☞ ඔවුන් භාග්‍යවතුන් වහන්සේ වෙත පැමිණ වැඳ අයැදසිටියාහ. ''ස්වාමීණි, විසාලා මහනුවර තුන් බියක් උපන්නා, ඒවා නුඹ වහන්සේ වැඩියකල සමනයවෙයි, වඩින්න ස්වාමීණි, යමු'' යැයි

• සත්ථා තෙසං වචනං සුත්වා ආවජ්ජෙන්තො ''වෙසාලියං රතනසුත්තෙ වුත්තෙ සා රක්ඛා චක්කවාළානං කොටිසතසහස්සං එරිස්සති, සුත්තපරියොසානෙ චතුරාසීතියා පාණසහස්සානං [ධම්ම+අභිසමයො] ධම්මාභිසමයො භවිස්සති, තානි ච භයානි වූපසමිස්සන්තී''ති ඤත්වා තෙසං වචනං සම්පටිච්ඡි.

★ සත්ථා (ශාස්තෘන් වහන්සේ) තෙසං වචනං සුත්වා (ඔවුන්ගේ වදන් අසා) ආවජ්ජෙන්තො (සිහිකරබලමින්) ''වෙසාලියං (විසාලාවෙහි) රතනසුත්තෙ වුත්තෙ (රතනසූත්‍රය කීකල/ දේශනාකලවිට) සා රක්ඛා (ඒ ආරක්ෂාව) චක්කවාළානං (සක්වලවල්) කොටි-සතසහස්සං (කෝටි ලක්ෂයක) එරිස්සති (පැතිරෙන්නේය) සුත්ත-පරියොසානෙ (සූත්‍රය අවසානයේ) චතුරාසීතියා පාණ-සහස්සානං (අසූහාරදහසක් ප්‍රාණින්ට/ සත්ත්වයන් අසූහාරදහසකට) [ධම්ම+අභිසමයො] ධම්මාභිසමයො භවිස්සති (ධර්මාවබෝධය වන්නේය) තානි ච භයානි (ඒ බියන් ද) වූපසමිස්සන්තී''ති (සමනයවන්නේය යැයි) ඤත්වා (දැන) තෙසං වචනං සම්පටිච්ඡි (ඔවුන්ගේ වචන පිළිගත්තේය/ ආරාධනාව පිළිගත්තේය)

☞ ශාස්තෘන් වහන්සේ ඔවුන්ගේ වදන් අසා සිහිකරබලමින් ''විසාලාවෙහි රතනසූත්‍රය දේශනාකලවිට ඒ ආරක්ෂාව සක්වලවල් කෝටි ලක්ෂයක පැතිරෙන්නේය, සූත්‍රය අවසානයේ සත්ත්වයන් අසූහාරදහසකට ධර්මාවබෝධය වන්නේය, ඒ බියන් ද සමනයවන්නේය'' යැයි දැන ඔවුන්ගේ ආරාධනාව පිළිගත්තේය.

• රාජා බිම්බිසාරො ''සත්ථාරා කිර වෙසාලිගමනං සම්පටිච්ඡිත''න්ති සුත්වා නගරෙ සොසනං කාරෙත්වා සත්ථාරං උපසඞ්කමිත්වා ''කිං, භන්තෙ, වෙසාලිගමනං සම්පටිච්ඡිත''න්ති පුච්ඡිත්වා

★ රාජා බිම්බිසාරො (බිම්බිසාර රජු) ''සත්ථාරා කිර (ශාස්තෘන් වහන්සේ වනාහි) වෙසාලි-ගමනං (විශාලාමහනුවර ගමන) [සම්පටිච්ඡිතං+ඉති] සම්පටිච්ඡිත''න්ති (පිළිගත්තේය යැයි/ බාරගත්තේය යැයි) සුත්වා (අසා) නගරෙ සොසනං කාරෙත්වා (නගරයෙහි අඩබෙර යවා) සත්ථාරං උපසඞ්කමිත්වා (ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ) ''කිං, භන්තෙ (කිමෙක්ද ස්වාමීණි) (විශාලාමහනුවර ගමන) [සම්පටිච්ඡිතං+ඉති] සම්පටිච්ඡිත''න්ති (පිළිගත්තේද යැයි/ බාරගත්තේද යැයි) පුච්ඡිත්වා (අසා)

☞ බිම්බිසාර රජු ''ශාස්තෘන් වහන්සේ වනාහි විශාලාමහනුවර ගමන පිළිගත්තේය'' යැයි අසා නගරයෙහි අඩබෙර යවා ශාස්තෘන් වහන්සේ වෙත පැමිණ ''කිමෙක්ද ස්වාමීනි, විශාලාමහනුවර ගමන පිළිගත්තේද'' යැයි අසා

• ''ආම, මහාරාජා''ති වුත්තෙ ''තෙන හි, හන්තෙ, ආගමෙථ, තාව මග්ගං පටියාදෙස්සාමී''ති වත්වා රාජගහස්ස ච ගඬ්ගාය ච අන්තරෙ පඤ්චයොජනභූමිං සමං කාරෙත්වා යොජනෙ යොජනෙ විහාරං පතිට්ඨාපෙත්වා සත්ථු ගමනකාලං ආරොචෙසි.

★ ''ආම, මහාරාජා''ති වුත්තෙ (ඔව් මහරජ යැයි කියූකල) ''තෙන හි, හන්තෙ (එහෙනම් ස්වාමීනි) ආගමෙථ (මදක්ඉන්න) <u>තාව</u> මග්ගං පටියාදෙස්සාමී''ති (මග සකස්කරනතුරු යැයි) වත්වා (කියා) රාජගහස්ස ච ගඬ්ගාය ච අන්තරෙ (රජගහත් ගංඟාවතං අතරේ) පඤ්ච-යොජන-භූමිං (පස් යොදුන් බිම) සමං කාරෙත්වා (සම කරවා) යොජනෙ යොජනෙ (යොදුනෙන් යොදුන) විහාරං පතිට්ඨාපෙත්වා (විහාරවල් පිහිටුවා) සත්ථු (ශාස්තෘන් වහන්සේට) ගමනකාලං (ගමනට/ යෑමට/ වැඩමවීමට කාලය) ආරොචෙසි (දැන්වීය)

☞ ''ඔව් මහරජ'' යැයි කියූකල ''එහෙනම් ස්වාමීනි, මදක්ඉන්න මග සකස්කරනතුරු'' යැයි කියා රජගහත් ගංඟාවතං අතරේ පස් යොදුන් බිම සම කරවා යොදුනෙන් යොදුන විහාරවල් පිහිටුවා ශාස්තෘන් වහන්සේට වැඩමවීමට කාලය දැන්වීය.

• සත්ථා පඤ්චහි භික්ඛුසතෙහි සද්ධිං මග්ගං පටිපජ්ජි. රාජා යොජනන්තරෙ ජණ්ණුමත්තෙන ඔධිනා පඤ්චවණ්ණානි පුප්ඵානි ඔකිරාපෙත්වා ධජපටාකකදලීආදීනි උස්සාපෙත්වා

★ සත්ථා (ශාස්තෘන් වහන්සේ) පඤ්චහි භික්ඛු-සතෙහි සද්ධිං (පන්සියයක් භික්ෂූන් සමග) මග්ගං පටිපජ්ජි (මගට පිළිපන්නේය/ ගමන් ඇරඹීය) රාජා [යොජන+අන්තරෙ] යොජනන්තරෙ (යොදුනක් අතරේ) ජණ්ණු-මත්තෙන (දණක් පමන) ඔධිනා (අවකාශයක/ ඉඩක) පඤ්ච-වණ්ණානි (පස් වර්ණයකින්යුතු) පුප්ඵානි ඔකිරාපෙත්වා (මල් විසුරුවා) ධජ-පටාක-කදලී-ආදීනි (කොඩි පතාක[පාලං කොඩි] කැන්සහිත කෙසෙල් ගස් ආදියෙන්) උස්සාපෙත්වා (ඔසවා/ සරසා)

☞ ශාස්තෘන් වහන්සේ පන්සියයක් භික්ෂූන් සමග ගමන් ඇරඹීය. රජු යොදුනක් අතරේ දණක් පමන අවකාශයක පස් වර්ණයකින්යුතු මල් විසුරුවා, කොඩි පතාක[පාලං කොඩි] කැන්සහිත කෙසෙල් ගස් ආදියෙන් සරසා,

• භගවතො ඡත්තාතිඡත්තං කත්වා ද්වෙ සෙතච්ඡත්තානි එකමෙකස්ස භික්ඛුනො එකමෙකං සෙතච්ඡත්තං උපරි ධාරෙත්වා සපරිවාරො පුප්ඵගන්ධාදීහි පූජං කරොන්තො

★ භගවතො (භාග්‍යවතුන් වහන්සේට) [ඡත්ත+අතිඡත්තං] ඡත්තාතිඡත්තං කත්වා (කුඩයක් මත කුඩයක් තබා) ද්වෙ සෙතච්ඡත්තානි (සුදු කුඩ දෙකක්) [එකස්ස+ඒකස්ස] එකමෙකස්ස භික්ඛුනො (එක් එක් භික්ෂූන් වහන්සේනමකට) [එකං+එකං] එකමෙකං (එක එක බැගින්) සෙතච්ඡත්තං (සුදුකුඩ) උපරි ධාරෙත්වා (ඉහලින් ධරා/ ඔසවාගෙන) සපරිවාරො (පිරිවර සහිතව) [පුප්ඵ-ගන්ධ+ආදීහි] පුප්ඵගන්ධාදීහි (මල් සුවඳ ආදියෙන්) පූජං කරොන්තො (පූජා කරමින්)

☞ භාග්‍යවතුන් වහන්සේට කුඩයක් මත කුඩයක් තබා සුදු කුඩ දෙකක් ද එක් එක් භික්ෂූන් වහන්සේනමකට එක එක බැගින් සුදුකුඩ ද ඉහලින් ඔසවාගෙන පිරිවර සහිතව මල් සුවඳ ආදියෙන් පූජා කරමින්

• සත්ථාරං එකෙකස්මිං විහාරෙ වසාපෙත්වා මහාදානාදීනි දත්වා පඤ්චහි දිවසෙහි ගඬ්ගාතීරං පාපෙත්වා තත්ථ නාවං අලඬ්කරොන්තො වෙසාලිකානං සාසනං පෙසෙසි

★ සත්ථාරං (ශාස්තෘන් වහන්සේව) [එකස්මිං+එකස්මිං] එකෙකස්මිං විහාරෙ (එක් එක් විහිරායහි) වසාපෙත්වා (වාසයකරවා/ වැඩවාසයකරවා) මහාදානාදීනි දත්වා (මහදන් දී) පඤ්චහි දිවසෙහි (පස් දවසකින්/ දිනකින්) ගඬ්ගාතීරං පාපෙත්වා (ගංතෙරට පමුණුවා/ වැඩමවා) තත්ථ (එහි) නාවං අලඬ්කරොන්තො (නැව අලංකාර කරමින්) වෙසාලිකානං (විසාලා මහනුවර වැසියනට) සාසනං පෙසෙසි (පණිවිඩයක් යැවීය/ හසුනක් යැවිය)

☞ ශාස්තෘන් වහන්සේව එක් එක් විහිරායහි වැඩවාසයකරවා මහදන් දී පස් දිනකින් ගංතෙරට වැඩමවා එහි නැව අලංකාර කරමින් විසාලා මහනුවර වැසියනට හසුනක් යැවිය.

• ''මග්ගං පටියාදෙත්වා සත්ථු පච්චුග්ගමනං කරොන්තූ''ති. තෙ ''දිගුණං පූජං කරිස්සාමා''ති වෙසාලියා ච ගඬ්ගාය ච අන්තරෙ තියොජනභූමිං සමං කාරෙත්වා

★ ''මග්ගං පටියාදෙත්වා (මග සකසා) සත්ථු (ශාස්තෘන් වහන්සේට) පච්චුග්ගමනං (පෙරගමන්) කරොන්තූ''ති (කරන්න යැයි) තෙ (ඔවුන්) ''දිගුණං පූජං කරිස්සාමා''ති (දෙගුණයකින් පූජා කරන්නෙමු යැයි) වෙසාලියා ච ගඬ්ගාය ච අන්තරෙ (වේසාලියත් ගංඟාවත් අතරේ) ති-යොජන-භූමිං (තුන් යොදුන් බිම) සමං කාරෙත්වා (සම කරවා)

☞ ''මග සකසා ශාස්තෘන් වහන්සේට පෙරගමන් කරන්න'' යැයි ඔවුන් ''අපි දෙගුණයකින් පූජා කරමු'' යැයි වේසාලියත් ගංඟාවත් අතරේ තුන් යොදුන් බිම සම කරවා

• භගවතො චතූහි සෙතච්ඡත්තෙහි එකමෙකස්ස භික්ඛුනො ද්වීහි ද්වීහි සෙතච්ඡත්තෙහි ඡත්තාතිඡත්තානි සජ්ජෙත්වා ආගන්ත්වා ගඬ්ගාතීරෙ අට්ඨංසු.

★ භගවතො (භාග්‍යවතුන් වහන්සේට) චතූහි [සෙත+ඡත්තෙහි] සෙතච්ඡත්තෙහි (සුදුකුඩ සතරකින් ද) [එකස්ස+ඒකස්ස] එකමෙකස්ස භික්ඛුනො (එක් එක් භික්ෂූන් වහන්සේනමකට) ද්වීහි ද්වීහි සෙතච්ඡත්තෙහි (සුදුකුඩ දෙක දෙක බැගින්) [ඡත්ත+අතිඡත්තානි] ඡත්තාතිඡත්තානි (කුඩයක් මත කුඩයක් තබා) සජ්ජෙත්වා (සරසා/ පිළියෙල කර) ආගන්ත්වා ගඬ්ගාතීරෙ අට්ඨංසු (පැමිණ ගංතීරයේ සිටියාහ)

☞ භාග්‍යවතුන් වහන්සේට සුදුකුඩ සතරක් ද එක් එක් භික්ෂූන් වහන්සේනමකට සුදුකුඩ දෙක දෙක බැගින් ද කුඩයක් මත කුඩයක් තබා සරසාගෙන පැමිණ ගංතීරයේ සිටියාහ.

• බිම්බිසාරො ද්වෙ නාවා සඬ්ඝාටෙත්වා මණ්ඩපං කාරෙත්වා පුප්ඵදාමාදීහි අලඬ්කාරාපෙත්වා සබ්බරතනමයං බුද්ධාසනං පඤ්ඤාපෙසි.

★ බිම්බිසාරො (බිම්බිසාර රජු) ද්වෙ නාවා (නැව් දෙකක්) සඬ්ඝාටෙත්වා (එක්කර) මණ්ඩපං කාරෙත්වා (මණ්ඩපයක් සාදා) [පුප්ඵ-දාම+ආදීහි] පුප්ඵදාමාදීහි (මල් දම් ආදියෙන්) අලඬ්කාරාපෙත්වා (අලංකාර කරවා/ සරසවා) සබ්බ-රතනමයං (සියල්ල මැණික්වලින්/ මැණික්මය) බුද්ධාසනං පඤ්ඤාපෙසි (බුද්ධාසනයක් පැනවීය/ සූදානම්කලේය)

☞ බිම්බිසාර රජු නැව් දෙකක් එක්කර මණ්ඩපයක් සාදා මල් දම් ආදියෙන් අලංකාර කරවා සියල්ල මැණික්මය බුද්ධාසනයක් සූදානම්කලේය.

• භගවා තස්මිං නිසීදි. භික්ඛූපි නාවං අභිරුහිත්වා භගවන්තං පරිවාරෙත්වා නිසීදිංසු. රාජා අනුගච්ඡන්තො ගලප්පමාණං උදකං ඔතරිත්වා

★ භගවා තස්මිං නිසීදි (භාග්‍යවතුන් වහන්සේ එහි හිඳියේය/ වැඩසිටියේය) භික්ඛු-පි නාවං අභිරුහිත්වා (භික්ෂූන් ද නැවට නැග) භගවන්තං පරිවාරෙත්වා (භාග්‍යවතුන් වහන්සේ පිරිවරාගෙන/ වටකරගෙන) නිසීදිංසු (ඉදගත්තාහ/ වැඩසිටියාහ) රාජා අනුගච්ඡන්තො (රජු අනුව යමින් / පස්සෙන් යමින්) ගලප්පමාණං (බෙල්ල දක්වා) උදකං ඔතරිත්වා (දියෙහි බැස)

☞ භාග්‍යවතුන් වහන්සේ එහි වැඩසිටියේය. භික්ෂූන් ද නැවට නැග භාග්‍යවතුන් වහන්සේ වටකරගෙන වැඩසිටියාහ. රජු පස්සෙන් යමින් බෙල්ල දක්වා දියෙහි බැස,

•''යාව, හන්තෙ, භගවා ආගච්ඡති, තාවාහං ඉධෙව ගඞ්ගාතීරෙ වසිස්සාමී''ති වත්වා නාවං උය්‍යොජෙත්වා නිවත්ති. සත්ථා යොජනමත්තං අද්ධානං ගඞ්ගාය ගන්ත්වා වෙසාලිකානං සීමං පාපුණි.

★ [මෙහි "**යාව - තාව**" එක්වී තුරු යන අර්ථයදේ] ''යාව, හන්තෙ (ස්වාමීණි) භගවා ආගච්ඡති (භාග්‍යවතුන් වහන්සේ එනතුරු) [තාව+අහං] තාවාහං (මම) ඉධෙව (මෙහිම) ගඞ්ගාතීරෙ වසිස්සාමී''ති (ගංතෙර වාසයකරන්නෙමි යැයි) වත්වා (කියා) නාවං උය්‍යොජෙත්වා (නැව පිටත්කර) නිවත්ති (නැවතිනි) සත්ථා (ශාස්තෘන් වහන්සේ) යොජන-මත්තං (යොදුනක් පමණ) අද්ධානං (දුර) ගඞ්ගාය ගන්ත්වා (ගංඟාවෙහි ගොස්) වෙසාලිකානං සීමං පාපුණි (වොසාලි වැසියන්ගේ සීමාවට පැමිණියේය)

☞ "ස්වාමීණි, භාග්‍යවතුන් වහන්සේ එනතුරු මම මේ ගංතෙරහි ම වාසයකරන්නෙමි" යැයි කියා නැව පිටත්කර නැවතිනි. ශාස්තෘන් වහන්සේ යොදුනක් පමණ දුර ගංඟාවෙහි ගොස් වොසාලි වැසියන්ගේ සීමාවට පැමිණියේය.

• ලිච්ඡවීරාජානො සත්ථාරං පච්චුග්ගන්ත්වා ගලප්පමාණං උදකං ඔතරිත්වා නාවං තීරං උපනෙත්වා සත්ථාරං නාවාතො ඔතාරයිංසු. සත්ථාරා ඔතරිත්වා තීරෙ අක්කන්තමත්තෙයෙව මහාමෙඝො උට්ඨහිත්වා පොක්ඛරවස්සං වස්සි.

★ ලිච්ඡවී-රාජානො (ලිච්ඡවී රජවරු) සත්ථාරං (ශාස්තෘන් වහන්සේට) පච්චුග්ගන්ත්වා (පෙරගමන්කර) ගලප්පමාණං (බෙල්ල දක්වා) උදකං ඔතරිත්වා (දියෙහි බැස) නාවං තීරං (නැව ඉවුරට/ වෙරලට) උපනෙත්වා (පමුණුවා/ ගෙනගොස්) සත්ථාරං (ශාස්තෘන් වහන්සේ) නාවාතො ඔතාරයිංසු (නැවෙන් බැස්සවූහ) සත්ථාරා (ශාස්තෘන් වහන්සේ) ඔතරිත්වා (බැස) තීරෙ (ඉවුරේ/ වෙරලේ) අක්කන්ත-මත්තෙ-යෙව (පය තැබූ පමණින් ම) මහාමෙඝො උට්ඨහිත්වා (මහාවර්ෂාවක් ඇතිවී) පොක්ඛර-වස්සං වස්සි (පොකුරුවැසි වැස්සාය)

☞ ලිච්ඡවී රජවරු ශාස්තෘන් වහන්සේට පෙරගමන්කර බෙල්ල දක්වා දියෙහි බැස නැව ගංවෙරලට පමුණුවා ශාස්තෘන් වහන්සේ නැවෙන් බැස්සවූහ. ශාස්තෘන් වහන්සේ බැස ගං වෙරලේ පය තැබූ පමණින් ම මහාවර්ෂාවක් ඇතිවී පොකුරුවැසි වැස්සාය.

• සබ්බත්ථ ජණ්ණුප්පමාණඋරුප්පමාණකටිප්පමාණාදීනි උදකානි සන්දන්තානි සබ්බකුණපානි ගඞ්ගං පවෙසයිංසු, පරිසුද්ධො භූමිභාගො අහොසි.

★ සබ්බත්ථ (සියලුතැන) [ජණ්ණු+පමාණ-උරු+පමාණ-කටි+පමාණ+ආදීනි] ජණ්ණුප්පමාණඋරුප්පමාණකටිප්පමාණාදීනි (දණක් පමණ කලව පමණ ඉණ පමණ

ආදීලෙස) උදකානි සන්දන්තානි (ජලය ගලමින්) සබ්බ-කුණපානි (සියලු කුණප/ සියලු මලකුණු) ගඞ්ගං පවෙසයිංසු (ගංඟාවට ගෙනදැමූහ) පරිසුද්ධො භූමිභාගො අහොසි (පිරිසිදු පොළොවක් විය)

☞ සියලුතැන දණක් පමණ කලව පමණ ඉණ පමණ ආදීලෙස ජලය ගලමින් සියලු මලකුණු ගංඟාවට ගෙනදැමූහ. පොළොව පිරිසිදු විය.

• ලිච්ඡවීරාජානො සත්ථාරං යොජනෙ යොජනෙ වසාපෙත්වා මහාදානං දත්වා දිගුණං පූජං කරොන්තා තීහි දිවසෙහි වෙසාලිං නයිංසු.

★ ලිච්ඡවීරාජානො (ලිච්ඡවී රජවරු) සත්ථාරං (ශාස්තෘන් වහන්සේව) යොජනෙ යොජනෙ (යොදුනෙන් යොදුන) වසාපෙත්වා (වාසයකරවා) මහාදානං දත්වා (මහදන් දී) දිගුණං පූජං කරොන්තා (දෙගුණයක් පූජාකරමින්) තීහි දිවසෙහි (තුන් දිනකින්) වෙසාලිං නයිංසු (විසාලාවට කැඳවාගෙන ගියාහ/ වැඩමකෙරුවාහ)

☞ ලිච්ඡවී රජවරු ශාස්තෘන් වහන්සේව යොදුනෙන් යොදුන වාසයකරවා මහදන් දී දෙගුණයක් පූජාකරමින් තුන් දිනකින් විසාලාවට වැඩමකෙරුවාහ.

• සක්කො දෙවරාජා දෙවගණපරිවුතො ආගමාසි, මහෙසක්ඛානං දෙවානං සන්නිපාතෙන අමනුස්සා යෙභුය්‍යෙන පලායිංසු.

★ සක්කො දෙවරාජා (සක්දෙවිඳු) දෙව-ගණ-පරිවුතො (දේව සමූහයා පිරිවරාගෙන) ආගමාසි (ගියේය) මහෙසක්ඛානං දෙවානං (මහේෂාක්‍ය දෙවියන්ගේ) සන්නිපාතෙන (රැස්වීමෙන්) අමනුස්සා (අමුනුස්සයෝ) යෙභුය්‍යෙන (බොහෝසේ) පලායිංසු (පලාගියහ)

☞ සක්දෙවිඳු දේව සමූහයා පිරිවරාගෙන ගියේය. මහේෂාක්‍ය දෙවියන්ගේ රැස්වීමෙන් අමුනුස්සයෝ බොහෝසේ පලාගියහ.

• සත්ථා සායං නගරද්වාරෙ ඨත්වා ආනන්දත්ථෙරං ආමන්තෙසි – ‘‘ඉමං, ආනන්ද, රතනසුත්තං උග්ගණ්හිත්වා ලිච්ඡවීකුමාරෙහි සද්ධිං විචරන්තො වෙසාලියා තිණ්ණං පාකාරානං අන්තරෙ පරිත්තං කරොහී’’ති.

★ සත්ථා සායං (ශාස්තෘන් වහන්සේ සවස) නගර-ද්වාරෙ ඨත්වා (නගර දොරටුවෙහි සිට) ආනන්දත්ථෙරං ආමන්තෙසි (ආනන්ද තෙරුන්වහන්සේට ඇමතීය) ‘‘ඉමං (මේ) ආනන්ද (ආනන්ද) රතනසුත්තං උග්ගණ්හිත්වා (රතනසූත්‍රය ඉගෙනගෙන) ලිච්ඡවී-කුමාරෙහි සද්ධිං (ලිච්ඡවී කුමාරවරු සමග) විචරන්තො (සැරිසරමින්/ ගමන්කරමින්) වෙසාලියා (විසලාවේ) තිණ්ණං පාකාරානං අන්තරෙ (තුන් ප්‍රාකාර අතරේ) පරිත්තං කරොහී’’ති (පිරිත් කරන්න/ ආරක්ෂා කරන්න යැයි)

☞ ශාස්තෘන් වහන්සේ සවස නගර දොරටුවෙහි සිට ආනන්ද තෙරුන්වහන්සේට ඇමතීය ‘‘ආනන්ද, මේ රතනසූත්‍රය ඉගෙනගෙන ලිච්ඡවී කුමාරවරු සමග ගමන්කරමින් විසලාවේ තුන් ප්‍රාකාර අතරේ පිරිත්කර ආරක්ෂා කරන්න’’ යැයි.

• ථෙරො සත්ථාරා දින්නං රතනසුත්තං උග්ගණ්හිත්වා සත්ථු සෙලමයපත්තෙන උදකං ආදාය නගරද්වාරෙ ඨිතො පණිධානතො පට්ඨාය තථාගතස්ස දස පාරමියො දස උපපාරමියො දස

පරමත්ථපාරමියොති සමතිංස පාරමියො පඤ්ච මහාපරිච්චාගෙ ලොකත්ථචරියා ඤාතත්ථචරියා බුද්ධිචරියාති තිස්සො චරියායො

★ ථෙරො (තෙරුන්වහන්සේ) සත්ථාරා (ශාස්තෘන් වහන්සේ විසින්) දින්නං රතනසුත්තං (දුන් රතනසූත්‍රය) උග්ගණ්හිත්වා (ඉගෙනගෙන) සත්ථු (ශාස්තෘන් වහන්සේගේ) සෙලමය-පත්තෙන (ශෛලමය පාත්‍රයෙන්) උදකං ආදාය (දිය ගෙන) නගර-ද්වාරෙ ඨිතො (නගර දොරටුවෙහි සිටිමින්) පණිධානතො පට්ඨාය (ප්‍රථම ප්‍රාර්ථනාවේ පටන්) තථාගතස්ස (තථාගතයන් වහන්සේගේ) දස පාරමියො (දස පාරමී) දස උපපාරමියො (දස උපපාරමී) දස පරමත්ථපාරමියො-ති (දස පරමත්ථ පාරමී යැයි) සමතිංස පාරමියො (සමතිස් පාරමී) පඤ්ච මහාපරිච්චාගෙ (ධනය දරුවන් බිරිඳ අංග ජීවිත යන පස්මහා පරිත්‍යාගයන්) [ලොක+අත්ථ-චරියා] ලොකත්ථචරියා (ලෝකයාගේ හිතපිණිස කටයුතුකිරීම්) [ඤාති+අත්ථ-චරියා] ඤාතත්ථචරියා (ඤාතීන්ගේ හිතපිණිස කටයුතුකිරීම්) බුද්ධි-චරියාති (බුද්ධිය වැඩීම පිණිස කටයුතුකිරීම් යැයි) තිස්සො චරියායො (තුන් චර්යාවන්/ තුන් චරිතයන්)

☞ තෙරුන්වහන්සේ ශාස්තෘන් වහන්සේ විසින් දුන් රතනසූත්‍රය ඉගෙනගෙන, ශාස්තෘන් වහන්සේගේ ශෛලමය පාත්‍රයෙන් දිය ගෙන නගර දොරටුවෙහි සිටිමින්, තථාගතයන් වහන්සේගේ ප්‍රථම ප්‍රාර්ථනාවේ පටන් පිරූ දස පාරමී, දස උපපාරමී, දස පරමත්ථ පාරමී යැයි සමතිස් පාරමී ද ධනය දරුවන් බිරිඳ අංග ජීවිත යන පස්මහා පරිත්‍යාගයන් ද ලෝකයාගේ හිතපිණිස කටයුතුකිරීම්, ඤාතීන්ගේ හිතපිණිස කටයුතුකිරීම්, බුද්ධිය වැඩීම පිණිස කටයුතුකිරීම්, යැයි තුන් චර්යාවන් ද

• පච්ඡිමභවෙ ගබ්භවොක්කන්තිං ජාතිං අභිනික්ඛමනං පධානචරියං බොධිපල්ලඞ්කෙ මාරවිජයං සබ්බඤ්ඤුතඤ්ඤාණපටිවෙධං ධම්මචක්කපවත්තනං නවලොකුත්තරධම්මෙති සබ්බෙපිමෙ බුද්ධගුණෙ ආවජ්ජෙත්වා නගරං පවිසිත්වා තියාමරත්තිං තීසු පාකාරන්තරෙසු පරිත්තං කරොන්තො විචරි.

★ පච්ඡිම-භවෙ (අන්තිම භවයේ) ගබ්භවොක්කන්තිං (මව්ගැබට පැමිණීම) ජාතිං (ඉපදීම) අභිනික්ඛමනං (මහභිනිෂ්ක්‍රමය) පධානචරියං (ප්‍රදන් වීර්යය වැඩීම) බොධිපල්ලඞ්කෙ මාරවිජයං (බෝමැඩ මරුන් ජයගැනීම) සබ්බඤ්ඤුතඤ්ඤාණ-පටිවෙධං (සර්වඥඥතා ඤාණාවබෝධය) ධම්මචක්කපවත්තනං (ධම්සක් පැවැත්වීම) නව-ලොකුත්තරධම්මෙති (නවලෝකුත්තර ධර්ම යැයි) [සබ්බේ+අපි+ඉමෙ] සබ්බෙපිමෙ (මේ සියලුම) බුද්ධගුණෙ ආවජ්ජෙත්වා (බුදුගුණ ආවර්ජනාකර) නගරං පවිසිත්වා (නගරයට ඇතුලුවී) තියාමරත්තිං (තුන්යම රාත්‍රිය) තීසු පාකාරන්තරෙසු (තුන් ප්‍රාකාර අතරේ) පරිත්තං කරොන්තො විචරි (පිරිත් කියමින් සැරිසැරීය / ආරක්ෂා කරමින් සැරිසැරීය)

☞ අන්තිම භවයේ මව්ගැබට පැමිණීම, ඉපදීම, මහභිනිෂ්ක්‍රමය, ප්‍රදන් වීර්යය වැඩීම, බෝමැඩ මරුන් ජයගැනීම, සර්වඥතා ඤාණාවබෝධය, ධම්සක් පැවැත්වීම, නවලෝකුත්තර ධර්ම යැයි, මේ සියලුම බුදුගුණ ආවර්ජනාකර නගරයට ඇතුලුවී, තුන්යම රාත්‍රිය තුන් ප්‍රාකාර අතරේ පිරිත් කියා ආරක්ෂා කරමින් සැරිසැරීය.

• තෙන ‘‘යංකිඤ්චී’’ති වුත්තමත්තෙයෙව උද්ධං බ්භන්තඋදකං අමනුස්සානං උපරි පති. ‘‘යානීධ භූතානී’’ති ගාථාකථනතො පට්ඨාය රජතවටංසකා විය උදකබින්දූනි ආකාසෙන ගන්ත්වා ගිලානමනුස්සානං උපරි පතිංසු.

★ තෙන (ඔහු/ උන්වහන්සේ) ‘‘යංකිඤ්චී’’ති (‘‘යංකිඤ්චී’’ යැයි) වුත්ත-මත්තෙ-යෙව (කියූ පමණින් ම) උද්ධං (උඩට) බ්භන්ත-උදකං (දැමූ දිය) අමනුස්සානං උපරි පති (අමනුස්සයන්

මතට වැටුනි) ''යානීධ භූතානී''ති (''යානීධ භූතානී'' යැයි) ගාථා-කථනතො පට්ඨාය (ගාථා කීමේ පටන්) රජත-වට්ටංසකා විය (රිදී මුදුන් මල්කඩවල් මෙන්/ රිදීපාට හිසේ පළඳින මල්දම් මෙන්) උදක-බින්දූනි (දියබිඳු) ආකාසෙන ගන්ත්වා (අහසින් ගොස්) ගිලාන-මනුස්සානං (ගිලන් මිනිසුන්ගේ) උපරි පතිංසු (මතට වැටුනාහ)

☞ උන්වහන්සේ ''යංකිඤ්චී'' යැයි කියා දිය උඩට දැමූ පමණින් ම දියබිඳු අමනුස්සයන් මතට වැටුනි. ''යානීධ භූතානී'' යැයි ගාථා කීමේ පටන් රිදීපාට හිසේ පළඳින මල්දම් මෙන් දියබිඳු අහසින් ගොස් ගිලන් මිනිසුන්ගේ මතට වැටුනාහ.

• තාවදෙව වූපසන්තරොගා මනුස්සා උට්ඨායුට්ඨාය ථෙරං පරිවාරෙසුං. ''යංකිඤ්චී''ති වුත්තපදතො පට්ඨාය පන උදකඵුසිතෙහි ඵුට්ඨඵුට්ඨා සබ්බෙ අපලායන්තා සඞ්කාරකූටභිත්තිපදෙසාදිනිස්සිතා අමනුස්සා තෙන තෙන ද්වාරෙන පලායිංසු.

★ තාවදෙව (ඒමොහොතෙම) වූපසන්ත-රොගා (සුවවූ රෝග ඇති) මනුස්සා (මිනිසුන්) [උට්ඨාය+උට්ඨාය] උට්ඨායුට්ඨාය (නැගිට නැගිට) ථෙරං පරිවාරෙසුං (තෙරුන්වහන්සේව පිරිවරාගත්හ/ වටකරගත්හ) ''යංකිඤ්චී''ති (''යංකිඤ්චී'' යැයි) වුත්ත-පදතො පට්ඨාය (කියූ පදයේ පටන්) පන (වනාහි) උදක-ඵුසිතෙහි (දිය ස්ඵර්ෂයෙන්/ දියබිඳු) ඵුට්ඨ-ඵුට්ඨා (වැදුන වැදුන) සබ්බෙ අපලායන්තා (සියලු පලානොගියාවූ) [සඞ්කාරකූට-භිත්තිපදෙස+ආදි-නිස්සිතා] සඞ්කාරකූටභිත්තිපදෙසාදිනිස්සිතා (කුණුගොඩවල් බිත්තිඅයින් ආදිය ඇසුරුකර සිටි) අමනුස්සා (අමනුස්සයෝ) තෙන තෙන ද්වාරෙන (ඒ ඒ දොරෙන්) පලායිංසු (පලාගියාහ)

☞ ඒමොහොතෙම රෝග සුවවූ මිනිසුන් තෙරුන්වහන්සේව වටකරගත්හ. ''යංකිඤ්චී'' යැයි කියූ පදයේ පටන් දියබිඳු වැදුන වැදුන, කුණුගොඩවල් බිත්තිඅයින් ආදිය ඇසුරුකර සිටි සියලු පලානොගියාවූ අමනුස්සයෝ ඒ ඒ දොරෙන් පලාගියාහ.

• ද්වාරානි අනොකාසානි අහෙසුං. තෙ ඔකාසං අලභන්තා පාකාරං භින්දිත්වාපි පලායිංසු.

★ ද්වාරානි (දොරවල්) අනොකාසානි අහෙසුං (ඉඩමදිවුහ) තෙ ඔකාසං අලභන්තා (ඒ ඉඩක් නොලබන්නෝ) පාකාරං භින්දිත්වා-පි පලායිංසු (ප්‍රාකාර බිඳගෙන-ත් පලාගියාහ)

☞ දොරවල් ඉඩමදිවුහ. ඒ ඉඩක් නොලබන්නෝ ප්‍රාකාර බිඳගෙනත් පලාගියාහ.

• මහාජනො නගරමජ්ඣෙ සන්ථාගාරං සබ්බගන්ධෙහි උපලිම්පෙත්වා උපරි සුවණ්ණතාරකාදිවිචිත්තං විතානං බන්ධිත්වා බුද්ධාසනං පඤ්ඤාපෙත්වා සත්ථාරං ආනෙසි.

★ මහාජනො (මහජනයා) නගර-මජ්ඣෙ (නගරයේ මැද) සන්ථාගාරං (රැස්වීම් ශාලාව) සබ්බ-ගන්ධෙහි (සියලු සුවඳයන්ගෙන්) උපලිම්පෙත්වා (ගා / තවරා) උපරි (උඩ) [සුවණ්ණ-තාරකා+ආදි-විචිත්තං] සුවණ්ණතාරකාදිවිචිත්තං (රන්තරු ආදියෙන් විසිතුරු වූ) විතානං බන්ධිත්වා (වියනක් බැඳ) බුද්ධාසනං පඤ්ඤාපෙත්වා (බුද්ධාසනයක් පනවා/ සූදානම්කර) සත්ථාරං (ශාස්තෘන් වහන්සේව) ආනෙසි (කැඳවාගෙන ආවේය/ වැඩමකෙරුවේය)

☞ මහජනයා නගරයේ මැද රැස්වීම් ශාලාව සියලු සුවඳයන්ගෙන් තවරා, උඩ රන්තරු ආදියෙන් විසිතුරු වූ වියනක් බැඳ, බුද්ධාසනයක් පනවා- සූදානම්කර ශාස්තෘන් වහන්සේව වැඩමකෙරුවේය.

• සත්ථා පඤ්ඤත්තෙ ආසනෙ නිසීදි. භික්ඛුසඞ්ඝොපි ලිච්ඡවීගණොපි සත්ථාරං පරිවාරෙත්වා නිසීදි. සක්කො දෙවරාජා දෙවගණපරිවුතො පතිරූපෙ ඔකාසෙ අට්ඨාසි.

★ සත්ථා (ශාස්තෘන් වහන්සේ) පඤ්ඤත්තෙ ආසනෙ (පැනවූ/ සූදානම්කල ආසනයේ) නිසීදි (ඉදගත්තේය/ වැඩසිටියේය) භික්ඛුසඞ්ඝො-පි (භික්ෂු සංඝයා ද) ලිච්ඡවී-ගණො-පි (ලිච්ඡවී සමූහයා ද) සත්ථාරං (ශාස්තෘන් වහන්සේව) පරිවාරෙත්වා නිසීදි (වටකරගෙන ඉදගත්තේය) සක්කො දෙවරාජා (සක්දෙවිඳු) දෙව-ගණ-පරිවුතො (දේව සමූහයා පිරිවරාගෙන) පතිරූපෙ ඔකාසෙ අට්ඨාසි (සුදුසු තැනක සිටියේය)

☞ ශාස්තෘන් වහන්සේ සූදානම්කල ආසනයේ වැඩසිටියේය. භික්ෂු සංඝයා ද ලිච්ඡවී සමූහයා ද ශාස්තෘන් වහන්සේව වටකරගෙන ඉදගත්තේය. සක්දෙවිඳු දේව සමූහයා පිරිවරාගෙන සුදුසු තැනක සිටියේය.

• ථෙරොපි සකලනගරං අනුවිචරිත්වා වූපසන්තරොගෙන මහාජනෙන සද්ධිං ආගන්ත්වා සත්ථාරං වන්දිත්වා නිසීදි. සත්ථා පරිසං ඔලොකෙත්වා තදෙව රතනසුත්තං අභාසි. දෙසනාවසානෙ චතුරාසීතියා පාණසහස්සානං ධම්මාභිසමයො අහොසි.

★ ථෙරො-පි (තෙරුන්වහන්සේ ද) සකල-නගරං (මුලු නගරයේම) අනුවිචරිත්වා (සැරිසරා) වූපසන්ත-රොගෙන (සුවවූ රෝග ඇති) මහාජනෙන සද්ධිං (මහජනයා සමග) ආගන්ත්වා (ඇවිත්) සත්ථාරං (ශාස්තෘන් වහන්සේට) වන්දිත්වා නිසීදි (වැඳ හිඳගත්තේය) සත්ථා (ශාස්තෘන් වහන්සේ) පරිසං ඔලොකෙත්වා (පිරිසදෙස බලා) [තං+එව] තදෙව (ඒම) රතනසුත්තං අභාසි (රතනසූත්‍රය කිවේය/ දේශනාකලේය) දෙසනාවසානෙ (දේශානාව අවසානයේ) චතුරාසීතියා පාණ-සහස්සානං (සත්ත්වයන් අසූහාරදහසකට) [ධම්ම+අභිසමයො] ධම්මාභිසමයො අහොසි (ධර්මාවබෝදය විය)

☞ තෙරුන්වහන්සේ ද මුලු නගරයේම සැරිසරා, රෝග සුවවූ මහජනයා සමග ඇවිත් ශාස්තෘන් වහන්සේට වැඳ හිඳගත්තේය. ශාස්තෘන් වහන්සේ පිරිසදෙස බලා ඒ රතනසූත්‍රය ම දේශනාකලේය. දේශානාව අවසානයේ සත්ත්වයන් අසූහාරදහසකට ධර්මාවබෝදය විය.

• එවං පුනදිවසෙපීති සත්තාහං තදෙව රතනසුත්තං දෙසෙත්වා සබ්බභයානං වූපසන්තභාවං ඤත්වා ලිච්ඡවීගණං ආමන්තෙත්වා වෙසාලිතො නික්ඛමි. ලිච්ඡවීරාජානො දිගුණං සක්කාරං කරොන්තා පුන තීහි දිවසෙහි සත්ථාරං ගඞ්ගාතීරං නයිංසු.

★ එවං (මෙසේ) [පුන-දිවසෙ+අපි+ඉති] පුනදිවසෙපීති (ඊලඟ දවසේ ද යැයි) [සත්ත+අහං] සත්තාහං (දිනහතක්) තදෙව (ඒම) රතනසුත්තං දෙසෙත්වා (රතනසූත්‍රය දේශනාකර) සබ්බ-භයානං (සියලු බියන්) වූපසන්තභාවං ඤත්වා (සමනයවූබව දැන) ලිච්ඡවීගණං ආමන්තෙත්වා (ලිච්ඡවී සමූහයාට අමතා/ කියා) වෙසාලිතො නික්ඛමි (වේසාලියෙන් නික්මුනේය) ලිච්ඡවී-රාජානො (ලිච්ඡවී රජවරු) දිගුණං සක්කාරං කරොන්තා (දෙගුණයක් සත්කාර කරමින්) පුන තීහි දිවසෙහි (නැවත තුන් දිනකින්) සත්ථාරං (ශාස්තෘන් වහන්සේව) ගඞ්ගාතීරං (ගං තෙරට/ ගංඟාවේ වෙරළට) නයිංසු (කැඳවාගෙන ගියාහ/ වැඩමකරවූවාහ)

☞ මෙසේ ඊලඟ දවසේ ද යැයි දිනහතක් ඒ රතනසූත්‍රය ම දේශනාකර සියලු බියන් සමනයවූබව දැන ලිච්ඡවී සමූහයාට අමතා වේසාලියෙන් නික්මුනේය. ලිච්ඡවී රජවරු දෙගුණයක් සත්කාර කරමින් නැවත තුන් දිනකින් ශාස්තෘන් වහන්සේව ගං තෙරට වැඩමකරවූවාහ.

• ගඬ්ගාය නිබ්බත්තනාගරාජානො චින්තෙසුං – ‘‘මනුස්සා තථාගතස්ස සක්කාරං කරොන්ති, මයං කිං න කරොමා’’ති.

★ ගඬ්ගාය (ගඟෙහි) නිබ්බත්ත-නාග-රාජානො (උපන්නාවූ නාග රජවරු) චින්තෙසුං (සිතූහ) ‘‘මනුස්සා (මිනිසුන්) තථාගතස්ස (තථාගතයන් වහන්සේට) සක්කාරං කරොන්ති (සත්කාර කරති) මයං (අපි) කිං න කරොමා’’ති (ඇයි නොකරන්නෙ යැයි)

☞ ගඟෙහි උපන්නාවූ නාග රජවරු මෙසේ සිතූහ. ‘‘මිනිසුන් තථාගතයන් වහන්සේට සත්කාර කරති, අපි ඇයි නොකරන්නෙ’’ යැයි.

• තෙ සුවණ්ණරජතමණිමයා නාවායො මාපෙත්වා සුවණ්ණරජතමණිමයෙ පල්ලඞ්කෙ පඤ්ඤාපෙත්වා පඤ්චවණ්ණපදුමසඤ්ඡන්නං උදකං කරිත්වා, ‘‘හන්තෙ, අම්හාකම්පි අනුග්ගහං කරොථා’’ති අත්තනො අත්තනො නාවං අභිරුහණත්ථාය සත්ථාරං යාචිංසු.

★ තෙ (ඔවුන්) සුවණ්ණ-රජත-මණි-මයා (රන් රිදී මැණික්මය) නාවායො මාපෙත්වා (නැව් මවා) සුවණ්ණ-රජත-මණිමයෙ (රන් රිදී මැණික්මය) පල්ලඞ්කෙ පඤ්ඤාපෙත්වා (ආසන පනවා/ ආසන සූදානම්කර) පඤ්ච-වණ්ණ-පදුම-සඤ්ඡන්නං (පස්පැහැ පියුමින් ගැවසීගත්තක්/ පිරුණක් බවට/ වැසිගියාක් බවට) උදකං කරිත්වා (ජලය පත්කර) ‘‘හන්තෙ (ස්වාමීණි) [අම්හාකං+අපි] අම්හාකම්පි (අපට-ත්) අනුග්ගහං කරොථා’’ති (අනුග්‍රහ කරන්න/ කරනසේක්වා යැයි) අත්තනො අත්තනො නාවං (තම තමාගේ නැවට) [අභිරුහණ+අත්ථාය] අභිරුහණත්ථාය (නැගීම පිණිස) සත්ථාරං යාචිංසු (ශාස්තෘන් වහන්සේට ආයාචනාකලහ)

☞ ඔවුන් රන් රිදී මැණික්මය නැව් මවා, රන් රිදී මැණික්මය ආසන සූදානම්කර, ගඟේ දිය පස්පැහැ පියුමින් වැසිගියාක් බවට පත්කර, ‘‘ස්වාමීණි, අපටත් අනුග්‍රහ කරනසේක්වා’’ යැයි තම තමාගේ නැවට නැගීම පිණිස ශාස්තෘන් වහන්සේට ආයාචනාකලහ.

• ‘‘මනුස්සා ච නාගා ච තථාගතස්ස පූජං කරොන්ති, මයං පන කිං න කරොමා’’ති භූමට්ඨකදෙවෙපි ආදිං කත්වා යාව අකනිට්ඨබ්‍රහ්මලොකා සබ්බෙ දෙවා සක්කාරං කරිංසු.

★ ‘‘මනුස්සා ච නාගා ච (මිනිසුන් ද නාගයෝ ද) තථාගතස්ස (තථාගතයන් වහන්සේට) පූජං කරොන්ති (පූජා පවත්වති) මයං පන (අපි වනාහි) කිං න කරොමා’’ති (ඇයි නොකරන්නෙ යැයි) භූමට්ඨකදෙවෙ-පි (භූමට්ඨක දෙවියන් ද) ආදිං කත්වා (මුල්කරගෙන) **<u>යාව</u>** අකනිට්ඨ-බ්‍රහ්මලොකා (අකනිට්ඨ බ්‍රක්මලෝකය **<u>දක්වා</u>**) සබ්බෙ දෙවා (සියලු දෙවියෝ) සක්කාරං කරිංසු (පුදසත්කාර කලහ)

☞ ‘‘මිනිසුන් ද නාගයෝ ද තථාගතයන් වහන්සේට පූජා පවත්වති, අපි ඇයි නොකරන්නෙ’’ යැයි භූමට්ඨක දෙවියන් මුල්කරගෙන අකනිට්ඨා බ්‍රක්මලෝකය දක්වා සියලු දෙවියෝ පුදසත්කාර කලහ.

• තත්ථ නාගා යොජනිකානි ඡත්තාතිඡත්තානි උක්ඛිපිංසු. එවං හෙට්ඨා නාගා භූමිතලෙ රුක්ඛගච්ඡපබ්බතාදීසු භූමට්ඨකා දෙවතා, අන්තලික්ඛෙ ආකාසට්ඨදෙවාති නාගභවනං ආදිං කත්වා චක්කවාළපරියන්තෙන යාව බ්‍රහ්මලොකා ඡත්තාතිඡත්තානි උස්සාපිතානි අහෙසුං.

★ තත්ථ නාගා (එහි නාගයෝ) යොජනිකානි (යොදුනක්) [ඡත්ත+අතිඡත්තානි] ඡත්තාතිඡත්තානි (කුඩයක් මත කුඩයක්) උක්ඛිපිංසු (එසවූහ) එවං (මෙසේ) හෙට්ඨා නාගා (යටින් නාගයෝ) භූමිතලෙ (පොළොවෙහි) රුක්ඛ-ගච්ඡ-පබ්බතාදීසු (රුක් ගොමු පර්වත

ආදියෙහි) භූමට්ඨකා දෙවතා (භූමට්ඨක දෙවියෝ) අන්තලික්ඛෙ (අහසෙහි) ආකාසට්ඨ-දෙවාති (ආකාසගත දෙවියෝ) නාගභවනං ආදිං කත්වා (නාගභවන මුල්කරගෙන) චක්කවාළ-පරියන්තෙන (සක්වල කෙලවරකොට) යාව බ්‍රහ්මලොකා (බඹ ලොව දක්වා) ඡත්තාතිඡත්තානි (කුඩයක් මත කුඩයක්) උස්සාපිතානි අහෙසුං (ඔසවනලද්දා වූහ)

☞ එහි නාගයෝ යොදුනක්, කුඩයක් මත කුඩයක් එසවූහ. මෙසේ යටින් නාගයෝ ද පොළොවෙහි රුක් ගොමු පර්වත ආදියෙහි භූමට්ඨක දෙවියෝ ද අහසෙහි ආකාසගත දෙවියෝ ද නාගභවන මුල්කරගෙන සක්වල කෙලවරකොට, බඹ ලොව දක්වා කුඩයක් මත කුඩයක් ඔසවනලද්දාහ.

• ඡත්තන්තරෙසු ධජා, ධජන්තරෙසු පටාකා, තෙසං අන්තරන්තරා පුප්ඵදාමවාසචුණ්ණධූමාදීහි සක්කාරො අහොසි.

★ [ඡත්ත+අන්තරෙසු] ඡත්තන්තරෙසු ධජා (කුඩඅතරේ කොඩි ද) [ධජ+අන්තරෙසු] ධජන්තරෙසු පටාකා (කොඩි අතරේ පතාක ද) තෙසං (ඔවුන්) [අන්තර+අන්තරා] අන්තරන්තරා (අතරින් අතර) [පුප්ඵ-දාම-වාස-චුණ්ණ-ධූම+ආදීහි] පුප්ඵදාමවාසචුණ්ණධූමාදීහි (මල්දම් සුවඳ කුඩු සුවඳ දුම් ආදියෙන්) සක්කාරො අහොසි (පූජාසත්කාර විය)

☞ කුඩ අතරේ කොඩි ද කොඩි අතරේ පතාක ද ඔවුන් අතරින් අතර මල්දම් සුවඳ කුඩු සුවඳ දුම් ආදියෙන් පූජාසත්කාර විය.

• සබ්බලඞ්කාරපටිමණ්ඩිතා දෙවපුත්තා ඡණුවෙසං ගහෙත්වා උග්ඝොසයමානා ආකාසෙ විචරිංසු. තයො එව කිර සමාගමා මහන්තා අහෙසුං – යමකපාටිහාරියසමාගමො දෙවොරොහණසමාගමො අයං ගඞ්ගොරොහණසමාගමොති.

★ සබ්බලඞ්කාර-පටිමණ්ඩිතා (සියලු අලංකාරයෙන් සැරසුනු/ සර්වාභරණයෙන් සැරසුනු) දෙවපුත්තා (දේවපුත්‍රයෝ) ඡණුවෙසං ගහෙත්වා (උත්සව සිරියක් ගෙන) උග්ඝොසයමානා (හඬනගමින්/ නාදකරමින්) ආකාසෙ විචරිංසු (අහසෙහි සැරිසැරූහ) තයො එව කිර (තුනක්-ම වනාහි) සමාගමා (සමාගම්) මහන්තා අහෙසුං (මහත්විය/ විශාලවිය) යමකපාටිහාරිය-සමාගමො (යමකප්‍රාතිහාර්ය සමාගම) දෙවොරොහණ-සමාගමො (දේවාරෝහණ සමාගම) අයං ගඞ්ගොරොහණ-සමාගමොති (මේ ගංගාරෝහණ සමාගම යැයි)

☞ සියලු අලංකාරයෙන් සැරසුනු දේවපුත්‍රයෝ උත්සව සිරියක් ගෙන නාදකරමින් අහසෙහි සැරිසැරූහ. සමාගම් තුනක්ම වනාහි මහත්විය, යමකප්‍රාතිහාර්ය සමාගම, දේවාරෝහණ සමාගම, මේ ගංගාරෝහණ සමාගම යැයි.

• පරතීරෙ බිම්බිසාරොපි ලිච්ඡවීහි කතසක්කාරතො දිගුණං සක්කාරං සජ්ජෙත්වා භගවතො ආගමනං උදික්ඛමානො අට්ඨාසි.

★ පරතීරෙ (එතෙර) බිම්බිසාරො-පි (බිම්බිසාර රජුද) ලිච්ඡවීහි කත-සක්කාරතො (ලිච්ඡවීන් කල පූජාසත්කාරය මෙන්) දිගුණං සක්කාරං (දෙගුණයක් පූජාසත්කාරය) සජ්ජෙත්වා (සූදානම්කර) භගවතො ආගමනං (භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම) උදික්ඛමානො අට්ඨාසි (බලාපොරොත්තුවෙමින් සිටියාය)

☞ එතෙර බිම්බිසාර රජුද ලිච්ඡවීන් කල පූජාසත්කාරය මෙන් දෙගුණයක් පූජාසත්කාර සූදානම්කර භාග්‍යවතුන් වහන්සේගේ පැමිණීම බලාපොරොත්තුවෙමින් සිටියාය.

• සත්ථා ගඞ්ගාය උභොසු පස්සෙසු රාජූනං මහන්තං පරිච්චාගං ඔලොකෙත්වා නාගාදීනඤ්ච අජ්ඣාසයං විදිත්වා එකෙකාය නාවාය පඤ්චපඤ්චභික්ඛුසතපරිවාරං එකෙකං නිම්මිතබුද්ධං මාපෙසි.

★ සත්ථා (ශාස්තෘන් වහන්සේ) ගඞ්ගාය උභොසු පස්සෙසු (ගංඟාවේ දෙපසෙහි) රාජූනං (රජවරුන්ගේ) මහන්තං පරිච්චාගං (මහත් පරිත්‍යාග) ඔලොකෙත්වා (බලා) [නාගා+ආදීනං+ච] නාගාදීනඤ්ච (නාගයන් ආදීන්ගේ ද) අජ්ඣාසයං විදිත්වා (අදහස දැන) [එකාය+එකාය] එකෙකාය නාවාය (එක් එක් නැවෙහි) පඤ්ච-පඤ්ච-භික්ඛු-සත-පරිවාරං (පන්සියය පන්සියය බැගින් භික්ෂූන් පිරිවරාගත්) [එකං+එකං] එකෙකං (එක් එක්) නිම්මිත-බුද්ධං (නිර්මිත බුදුකෙනෙක්) මාපෙසි (මැවිය)

☞ ශාස්තෘන් වහන්සේ ගංඟාවේ දෙපසෙහි රජවරුන්ගේ මහත් පරිත්‍යාග බලා නාගයන් ආදීන්ගේ ද අදහස දැන එක් එක් නැවෙහි පන්සියය පන්සියය බැගින් භික්ෂූන් පිරිවරාගත් එක් එක් නිර්මිත බුදුකෙනෙක් මැවිය.

• සො එකෙකස්ස නාවාය එකෙකස්ස සෙතච්ඡත්තස්ස වෙව කප්පරුක්ඛස්ස ච පුප්ඵදාමස්ස ච හෙට්ඨා නාගගණපරිවුතො නිසින්නො හොති. භූමට්ඨකදෙවතාදීසුපි එකෙකස්මිං ඔකාසෙ සපරිවාරං එකෙකං නිම්මිතබුද්ධං මාපෙසි.

★ සො (ඔහු/ උන්වහන්සේ) [එකස්ස+එකස්ස] එකෙකස්ස (එක් එක්) නාවාය (නැවේ) [එකස්ස+එකස්ස] එකෙකස්ස (එක් එක්) සෙතච්ඡත්තස්ස (සුදුකුඩයක) වෙව (මෙන්ම) කප්පරුක්ඛස්ස ච (කප්රුකක ද) පුප්ඵදාමස්ස ච (මල්වැලක ද) හෙට්ඨා (යට) නාග-ගණ-පරිවුතො (නාග සමූහයා පිරිවරාගෙන) නිසින්නො හොති (හිඳින්නේවේ) [භූමට්ඨක-දෙවතා+ආදීසු+අපි] භූමට්ඨකදෙවතාදීසුපි (භූමට්ඨක දේව ආදීන්ගේ ද) [එකස්මිං+එකස්මිං] එකෙකස්මිං (එක් එක්) ඔකාසෙ (අවකාශයේ) සපරිවාරං (පිරිවරසහිත) [එකං+එකං] එකෙකං (එක් එක්) නිම්මිත-බුද්ධං (නිර්මිත බුදුකෙනෙක්) මාපෙසි (මැවිය)

☞ උන්වහන්සේ, එක් එක් නැවේ, එක් එක් සුදුකුඩයක මෙන්ම කප්රුකක ද මල්වැලක ද යට නාග සමූහයා පිරිවරාගෙන හිඳින්නේවේ. භූමට්ඨක දේව ආදීන්ගේ ද එක් එක් අවකාශයේ පිරිවරසහිත එක් එක් නිර්මිත බුදුකෙනෙක් මැවිය.

• එවං සකලචක්කවාළගබ්භෙ එකාලඞ්කාරෙ එකුස්සවෙ එකඡණෙයෙව ච ජාතෙ සත්ථා නාගානමනුග්ගහං කරොන්තො එකං රතනනාවං අභිරුහි. භික්ඛූසුපි එකෙකො එකෙකමෙව අභිරුහි.

★ එවං (මෙසේ) සකල-චක්කවා-ළගබ්භෙ (සියලු සක්වල ගැබ) එකාලඞ්කාරෙ (ඒකාලංකාරව) [එක+උස්සවෙ] එකුස්සවෙ (එක් උස්සවයක්) එක-ඡණෙ-යෙව ච (එක් සැණකෙලියක් ම) ජාතෙ (වූකල) සත්ථා (ශාස්තෘන් වහන්සේ) [නාගානං+අනුග්ගහං] නාගානමනුග්ගහං කරොන්තො (නාගයන්ට අනුග්‍රහ කරමින්) එකං රතනනාවං අභිරුහි (එක් රුවන් නැවකට නැග්ගේය/ වැඩමකලේය) භික්ඛූසුපි (භික්ෂූන් වහන්සේලා ද) [එකො+එකො] එකෙකො (එකිනෙකා) [එකං+එකං+එව] එකෙකමෙව (එක එකකට ම) අභිරුහි (නැග්ගේය/ වැඩමකලේය)

☞ මෙසේ සියලු සක්වල ගැබ ඒකාලංකාරව එක් උස්සවයක් එක් සැණකෙලියක් ම වූකල ශාස්තaaන් වහන්සේ නාගයන්ට අනුග්‍රහ කරමින් එක් රුවන් නැවකට වැඩමකලේය. භික්ෂූන් වහන්සේලා ද එකිනෙකා එක එක කට ම වැඩමකලේය.

• නාගරාජානො බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං නාගභවනං පවෙසෙත්වා සබ්බරත්තිං සත්ථු සන්තිකෙ ධම්මකථං සුත්වා දුතියදිවසෙ දිබ්බෙන ඛාදනීයෙන භොජනීයෙන බුද්ධප්පමුඛං භික්ඛුසඞ්ඝං පරිවිසිංසු.

★ නාග-රාජානො (නා රජවරු) [බුද්ධ+පමුඛං] බුද්ධප්පමුඛං (බුදුන් ප්‍රධාන) භික්ඛුසඞ්ඝං (භික්ෂු සංඝයා) නාගභවනං පවෙසෙත්වා (නාගභවනට ගෙනගොස්/ වඩම්මවා) සබ්බරත්තිං (මුලු රැයම) සත්ථු සන්තිකෙ (ශාස්තaaන් වහන්සේගේ ලඟ) ධම්මකථං සුත්වා (දහම් කථා අසා) දුතියදිවසෙ (දෙවන දිනයෙහි) දිබ්බෙන (දිව්‍යමය) ඛාදනීයෙන (කෑයතුදෙයින්) භොජනීයෙන (වැළඳිය යුතුදෙයින්) [බුද්ධ+පමුඛං] බුද්ධප්පමුඛං (බුදුන් ප්‍රධාන) භික්ඛුසඞ්ඝං (භික් ෂු සංඝයා) පරිවිසිංසු (වැළඳවුහ)

☞ නා රජවරු බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයා නාගභවනට වඩම්මවා මුලු රැයම ශාස්තaaන් වහන්සේගේ ලඟ දහම් කථා අසා දෙවන දිනයෙහි දිව්‍යමය කෑයතුදෙයින් වැළඳිය යුතුදෙයින් බුදුන් ප්‍රධාන භික්ෂු සංඝයා වැළඳවුහ.

• සත්ථා අනුමොදනං කත්වා නාගභවනා නික්ඛමිත්වා සකලචක්කවාළදෙවතාහි පූජියමානො පඤ්චහි නාවාසතෙහි ගඞ්ගානදිං අතික්කමි.

★ සත්ථා (ශාස්තaaන් වහන්සේ) අනුමොදනං කත්වා (අනුමෝදනාව කර) නාගභවනා නික්ඛමිත්වා (නාගභවනෙන් නික්මී) සකල-චක්කවාළ-දෙවතාහි (සියලු සක්වල දෙවියන් ගෙන්) පූජියමානො (පුදලබමින්) පඤ්චහි නාවා-සතෙහි (නැව් පන්සියයකින්) ගඞ්ගානදිං අතික්කමි (ගංගා නදිය තරණයකලේය)

☞ ශාස්තaaන් වහන්සේ අනුමෝදනාව කර නාගභවනෙන් නික්මී සියලු සක්වල දෙවියන් ගෙන් පුදලබමින් නැව් පන්සියයකින් ගංගා නදිය තරණයකලේය.

• රාජා පච්චුග්ගන්ත්වා සත්ථාරං නාවාතො ඔතාරෙත්වා ආගමනකාලෙ ලිච්ඡවීහි කතසක්කාරතො දිගුණං සක්කාරං කත්වා පුරිමනයෙනෙව පඤ්චහි දිවසෙහි රාජගහං අභිනෙසි.

★ රාජා පච්චුග්ගන්ත්වා (රජු පසුගමන් කර) සත්ථාරං (ශාස්තaaන් වහන්සේව) නාවාතො ඔතාරෙත්වා (නැවෙන් බස්සවා) ආගමන-කාලෙ (එන කාලයේ/ නැවත වඩිනකාලයේ) ලිච්ඡවීහි කත-සක්කාරතො (ලිච්ඡවීන් කල පූජාසත්කාරය වගේ) දිගුණං සක්කාරං කත්වා (දෙගුණයකින් පූජාසත්කාර කර) [පුරිම-නයෙන+එව] පුරිමනයෙනෙව (පෙර ක්‍රමයෙන් ම/ පෙර පරිදි ම) පඤ්චහි දිවසෙහි (පස් දිනකින්) රාජගහං අභිනෙසි (රජගහවට කැඳවාගෙන ගියේය/ වැඩමකරවීය)

☞ රජු පසුගමන් කර, ශාස්තaaන් වහන්සේව නැවෙන් බස්සවා, නැවත වඩිනකාලයේ ලිච්ඡවීන් කල පූජාසත්කාරය වගේ දෙගුණයකින් පූජාසත්කාර කර, පෙර පරිදි ම පස් දිනකින් රජගහවට වැඩමකරවීය.

• දුතියදිවසෙ භික්ඛූ පිණ්ඩපාතපටික්කන්තා සායන්හසමයෙ ධම්මසභායං සන්නිසින්නා කථං සමුට්ඨාපෙසුං

★ දුතියදිවසෙ (දෙවන දිනයෙහි) භික්ඛූ (භික්ෂූන් වහන්සේලා) පිණ්ඩපාත-පටික්කන්තා (පිණ්ඩපාතය ප්‍රතික්ෂේපබැවින්/ පිණ්ඩපාතයේ නොයන බැවින්) සායන්හසමයෙ (සවස්වරුවේ) ධම්ම-සභායං සන්නිසින්නා (දම්සභාවේ රැස්වී) කථං සමුට්ඨාපෙසුං (කථාවක් ඉපදවූහ / කථාබහක් සිදුකලහ / කථාබහකලහ)

☞ දෙවන දිනයෙහි භික්ෂූන් වහන්සේලා සවස්වරුවේ පිණ්ඩපාතයේ නොයනබැවින් දම්සභාවේ රැස්වී මෙසේ කථාබහකලහ.

• ''අහො බුද්ධානං මහානුභාවො, අහො සත්ථරි දෙවමනුස්සානං පසාදො, ගඬගාය නාම ඔරතො ච පාරතො ච අට්ඨයොජනෙ මග්ගෙ බුද්ධගතෙන පසාදෙන රාජූහි සමතලං භූමිං කත්වා වාලුකා ඔකිණ්ණා, ජණ්ණුමත්තෙන ඔධිනා නානාවණ්ණානි පුප්ඵානි සන්ථතානි,

★ ''අහො බුද්ධානං මහානුභාවො (අස්චර්යවත්ය බුදුන්ගේ මහානුභාවය) අහො (අස්චර්යවත්ය) සත්ථරි (ශාස්තෘන් වහන්සේ කෙරෙහි) දෙවමනුස්සානං පසාදො (දෙව්මිනිසුන්ගේ ප්‍රසාදය) ගඬගාය නාම (ගඟෙහි වනාහි) ඔරතො ච පාරතො ච (එතෙරින් ද මෙතෙරින් ද) අට්ඨ-යොජනෙ මග්ගෙ (අට යොදුනක් මග) බුද්ධ-ගතෙන (බුදුන්කෙරෙහි ඇතිවූ) පසාදෙන (ප්‍රසාදයෙන්) රාජූහි (රජවරු) සමතලං භූමිං කත්වා (භූමිය සමතලාකර) වාලුකා ඔකිණ්ණා (වැලි ඉස) ජණ්ණු-මත්තෙන ඔධිනා (දණක්පමණ අවකාශයේ) නානාවණ්ණානි (නොයෙක් පැහැ) පුප්ඵානි සන්ථතානි (මල් අතුරනලදී)

☞ බුදුන්ගේ මහානුභාවය අස්චර්යවත්ය, ශාස්තෘන් වහන්සේ කෙරෙහි දෙව්මිනිසුන්ගේ ප්‍රසාදය අස්චර්යවත්ය, ගඟෙහි එතෙරින් ද මෙතෙරින් ද අට යොදුනක් මග, බුදුන්කෙරෙහි ඇතිවූ ප්‍රසාදයෙන්, රජවරු භූමිය සමතලාකර වැලි ඉස දණක්පමණ අවකාශයේ නොයෙක් පැහැ මල් අතුරනලදී.

• ගඬගාය උදකං නාගානුභාවෙන පඤ්චවණ්ණෙහි පදුමෙහි සඤ්ඡන්නං, යාව අකනිට්ඨභවනා ඡත්තාතිඡත්තානි උස්සාපිතානි, සකලචක්කවාළගබ්භං එකාලඞ්කාරං එකුස්සවං විය ජාත''න්ති.

★ ගඬගාය උදකං (ගඟෙහි දිය) නාගානුභාවෙන (නාගයන්ගේ ආනුභාවයෙන්) පඤ්ච-වණ්ණෙහි පදුමෙහි (පස්පැහැ පියුමින්) සඤ්ඡන්නං (වැසීගියේය/ පිරීගියේය) <u>**යාව**</u> අකනිට්ඨ-භවනා (අකනිට්ඨා භවන **<u>දක්වා</u>**) ඡත්තාතිඡත්තානි (කුඩමතින් කුඩ) උස්සාපිතානි (ඔසවනලදී) සකල-චක්කවා-ළගබ්භං (සියලු සක්වල ගැබ) එකාලඞ්කාරං (එකම අලංකාරයක්) [එක+උස්සවං] එකුස්සවං (එක් උත්සවයක්) විය ජාත''න්ති (මෙන් උපන්නා යැයි)

☞ ගඟෙහි දිය නාගයන්ගේ ආනුභාවයෙන් පස්පැහැ පියුමින් වැසීගියේය. අකනිට්ඨා භවන දක්වා කුඩමතින් කුඩ ඔසවනලදී. සියලු සක්වල ගැබ එකම අලංකාරයක් එක් උත්සවයක් බවට පත්විය.

• සත්ථා ආගන්ත්වා ''කාය නුත්ථ, භික්ඛවෙ, එතරහි කථාය සන්නිසින්නා''ති පුච්ඡිත්වා ''ඉමාය නාමා''ති වුත්තෙ ''න, භික්ඛවෙ, එස පූජාසක්කාරො මය්හං බුද්ධානුභාවෙන නිබ්බත්තො, න නාගදෙවබ්‍රහ්මානුභාවෙන. අතීතෙ පන අප්පමත්තකපරිච්චාගානුභාවෙන නිබ්බත්තො''ති වත්වා භික්ඛූහි යාචිතො අතීතං ආහරි.

★ සත්ථා ආගන්ත්වා (ශාස්තෘන් වහන්සේ පැමිණ) ''කාය [නු+එත්ථ] නුත්ථ (කිනම් මෙහි), භික්ඛවෙ (භික්ෂුණි) එතරහි (දැන්) කථාය (කතාවකින්) සන්නිසින්නා''ති (හිඳියේද/ සිටියේ ද යැයි) පුච්ඡිත්වා (අසා) ''ඉමාය නාමා''ති (මෙනම් දෙයකින් යැයි) වුත්තෙ (කී කල) ''**නූ,** භික්ඛවෙ (මහණෙනි) එස පූජාසක්කාරො (මේ පූජාසත්කාරය) මය්හං (මගේ) බුද්ධානුභාවෙන (බුද්ධානුභාවයෙන්) නිබ්බත්තො (**නූ**පන්නේය) න නාග-දෙව-බ්‍රහ්මානුභාවෙන (නාග දේව බ්‍රහ්මයන්ගේ ආනුභාවයෙන් නොවේ) අතීතෙ පන (අතීතයේ වනාහි) [අප්ප-මත්ත-කපරිච්චාග+ආනුභාවෙන] අප්පමත්තකපරිච්චාගානුභාවෙන (අල්ප මාත්‍ර පරිත්‍යාගයක ආනුභාවයෙන්) නිබ්බත්තො''ති (උපන්නේය යැයි) වත්වා (කියා) භික්ඛූහි යාචිතො (භික්ෂූන්ගේ අයැදීමෙන්) අතීතං ආහරි (අතීතය ගෙනආවේය/ ගෙනහැරපෑවේය)

☞ ශාස්තෘන් වහන්සේ පැමිණ, ''භික්ෂුණි දැන් මෙහි කිනම් කතාවකින් සිටියේ ද'' යැයි අසා, ''මෙනම් දෙයකින්ය'' යැයි කී කල ''මහණෙනි! මේ පූජාසත්කාරය මගේ බුද්ධානුභාවයෙන් නූපන්නේය, නාග දේව බ්‍රහ්මයන්ගේ ආනුභාවයෙන් ද නොවේ, අතීතයේ වනාහි අල්ප මාත්‍ර පරිත්‍යාගයක ආනුභාවයෙන් උපන්නේය'' යැයි කියා, භික්ෂූන්ගේ අයැදීමෙන් අතීතය ගෙනහැරපෑවේය.

• අතීතෙ තක්කසිලායං සඞ්ඛො නාම බ්‍රාහ්මණො අහොසි. තස්ස පුත්තො සුසීමො නාම මාණවො සොළසවස්සුද්දෙසිකො එකදිවසං පිතරං උපසඞ්කමිත්වා ආහ

★ අතීතෙ (අතීතයේ) තක්කසිලායං (තක්සිලාවෙහි) සඞ්ඛො නාම බ්‍රාහ්මණො අහොසි (සංඛ නම් බ්‍රාහ්මණයෙක් විය) තස්ස පුත්තො (ඔහුගේ පුත්) සුසීමො නාම මාණවො (සුසීම නම් තරුණයා) සොළස-වස්සුද්දෙසිකො (දහසය හැවැරිදි වියටය පැමිණ) එකදිවසං (එක්දිනක්) පිතරං උපසඞ්කමිත්වා ආහ (පියා ලගට පැමිණ කීය)

☞ අතීතයේ තක්සිලාවෙහි සංඛ නම් බ්‍රාහ්මණයෙක් විය. ඔහුගේ පුත් සුසීම නම් තරුණයා දහසය හැවැරිදි වියටය පැමිණ, එක්දිනක් පියා ලගට පැමිණ මෙසේ කීය.

• ''ඉච්ඡාමහං, තාත, බාරාණසිං ගන්ත්වා මන්තෙ අජ්ඣායිතු''න්ති. අථ නං පිතා ආහ – ''තෙන හි, තාත, අසුකො නාම බ්‍රාහ්මණො මම සහායකො, තස්ස සන්තිකං ගන්ත්වා අධීයස්සූ''ති.

★ ''[ඉච්ඡාමි+අහං] ඉච්ඡාමහං (මම කැමති) තාත (තාත්තෙ) බාරාණසිං ගන්ත්වා (බරණැසට ගොස්) මන්තෙ (මන්ත්‍ර) [අජ්ඣායිතුං+ඉති] අජ්ඣායිතු''න්ති (හැදෑරීමට යැයි) අථ නං පිතා ආහ (ඉක්බිති ඔහුට පියා කීය) ''තෙන හි, තාත (එහෙනම් පුතේ) අසුකො නාම බ්‍රාහ්මණො (අසවල් නමැති බ්‍රාහ්මණයා) මම සහායකො (මගේ මිතුරෙකි) තස්ස සන්තිකං ගන්ත්වා (ඔහුගේ ලගට ගොස්) [අධීයස්සු+ඉති] අධීයස්සූ''ති (අධ්‍යනයකරන්න යැයි)

☞ ''තාත්තෙ! මම කැමති බරණැසට ගොස් මන්ත්‍ර හැදෑරීමට'' යැයි ඉක්බිති ඔහුට පියා කීය, ''එහෙනම් පුතේ අසවල් නමැති බ්‍රාහ්මණයා මගේ මිතුරෙකි, ඔහුගේ ලගට ගොස් අධ්‍යනයකරන්න'' යැයි

• සො ''සාධූ''ති පටිස්සුණිත්වා අනුපුබ්බෙන බාරාණසිං ගන්ත්වා තං බ්‍රාහ්මණං උපසඞ්කමිත්වා පිතරා පහිතභාවමාචික්ඛි.

★ සො ''සාධූ''ති (ඔහු හොඳයි යැයි) පටිස්සුණිත්වා (පවසා/ පිලිවදන් දී) අනුපුබ්බෙන (පිළිවෙලින්/ ක්‍රමයෙන්) බාරාණසිං ගන්ත්වා (බරණැසට ගොස්/ ගිහින්) තං බ්‍රාහ්මණං (ඒ බමුණාවෙත) උපසඞ්කමිත්වා (පැමිණ/ එළඹ) පිතරා (පියා විසින්) [පහිත-භාවං+ආචික්ඛි] පහිතභාවමාචික්ඛි (එවූබව කීවේය)

☞ ඔහු ''හොඳයි'' යැයි පවසා ක්‍රමයෙන් බරණැසට ගිහින් ඒ බමුණාවෙත පැමිණ පියා විසින් එවූබව කීවේය.

• අථ නං සො ''සහායකස්ස මෙ පුත්තො''ති සම්පටිච්ඡිත්වා පටිපස්සද්ධදරථං භද්දකෙන දිවසෙන මන්තෙ වාචෙතුමාරභි.

★ අථ (ඉක්බිති) නං (ඔහුව) සො(ඔහු/ බමුණා) ''සහායකස්ස මෙ පුත්තො''ති (මගේ මිතුරාගේ පුතා යැයි) සම්පටිච්ඡිත්වා (පිළිගෙන) පටිපස්සද්ධ-දරථං (සන්සිඳුනු දාහ ඇත්තාට/ ගමන්වෙහෙස නිමවූවාහට) භද්දකෙන දිවසෙන (හොඳ දවසකින්/ නැකත් දවසකින්) මන්තෙ (මන්ත්‍ර) [වාචෙතුං+ආරභි] වාචෙතුමාරභි (ඉගැන්වීමට පටන්ගත්තාය)

☞ ඉක්බිති බමුණා ඔහුව ''මගේ මිතුරාගේ පුතා'' යැයි පිළිගෙන ගමන්වෙහෙස නිමවූපසු, නැකත් දවසකින් මන්ත්‍ර ඉගැන්වීමට පටන්ගත්තාය.

• සො ලහුඤ්ච ගණ්හන්තො බහුඤ්ච ගණ්හන්තො අත්තනො උග්ගහිතුග්ගහිතං සුවණ්ණභාජනෙ පක්ඛිත්තසීහතෙලම්ව අවිනස්සමානං ධාරෙන්තො න විරස්සෙව ආචරියස්ස සම්මුඛතො උග්ගණ්හිතබ්බං සබ්බං උග්ගණ්හිත්වා සජ්ඣායං කරොන්තො අත්තනො උග්ගහිතසිප්පස්ස ආදිමජ්ඣමෙව පස්සති, නො පරියොසානං.

★ සො (ඔහු) [ලහුං+ච] ලහුඤ්ච ගණ්හන්තො (සුළුවෙන් ඉගෙනගත්තත්) [බහුං+ච] බහුඤ්ච ගණ්හන්තො (බොහෝ ඉගෙනගත්තත්) අත්තනො (තමා) [උග්ගහිතං+උග්ගහිතං] උග්ගහිතුග්ගහිතං (ඉගෙනගත් ඉගෙනගත් දෙය) සුවණ්ණ-භාජනෙ (රන් භාජනයක) [පක්ඛිත්ත-සීහතෙලං+ඉව] පක්ඛිත්තසීහතෙලම්ව (දැමූ සිංහ තෙල් මෙන්) අවිනස්සමානං (විනාශ නොවෙමින්) ධාරෙන්තො (ධරාගනිමින්) න විරස්සෙව (කෙටිකලකින් ම) ආචරියස්ස සම්මුඛතො (ගුරුවරයා හමුවේ) උග්ගණ්හිතබ්බං (ඉගෙනගතයුතු) සබ්බං උග්ගණ්හිත්වා (සියල්ල ඉගෙන) සජ්ඣායං කරොන්තො (සජ්ඣායනා කරමින්) අත්තනො උග්ගහිත-සිප්පස්ස (තමා උගත් ශිල්පයේ) [ආදි-මජ්ඣමං+එව] ආදිමජ්ඣමෙව (මුල හා මැදම) පස්සති (දකියි) නො පරියොසානං (නෑ කෙලවරක් / කෙලවරක් නො දකියි)

☞ ඔහු සුළුවෙන් ඉගෙනගත්තත් බොහෝ ඉගෙනගත්තත් තමා ඉගෙනගත් ඉගෙනගත් දෙය රන් භාජනයක දැමූ සිංහ තෙල් මෙන් විනාශ නොවෙමින් ධරාගනිමින් කෙටිකලකින් ම ගුරුවරයා හමුවේ ඉගෙනගතයුතු සියල්ල ඉගෙන සජ්ඣායනා කරමින් තමා උගත් ශිල්පයේ මුල හා මැද පමණක්ම දකියි, කෙලවරක් නො දකියි.

• සො ආචරියං උපසඞ්කමිත්වා ''අහං ඉමස්ස සිප්පස්ස ආදිමජ්ඣමෙව පස්සාමි, නො පරියොසාන''න්ති වත්වා ආචරියෙන ''අහම්පි, තාත, න පස්සාමී''ති වුත්තෙ

★ සො ආචරියං උපසඞ්කමිත්වා (ඔහු ගුරුවරයා වෙත පැමිණ) ''අහං ඉමස්ස සිප්පස්ස (මම මේ ශිල්පයේ) [ආදි-මජ්ඣමං+එව] ආදිමජ්ඣමෙව පස්සාමි (මුල හා මැදම දකිමි), නො පරියොසාන''න්ති (නෑ කෙලවරක් යැයි/ කෙලවරක් නො දකිමි යැයි) වත්වා (කියා)

ආචරියෙන (ගුරුවරයා විසින්) ''අහම්පි, තාත (මමත් පුතේ) න පස්සාමී''ති වුත්තෙ (නො දකිමි යැයි කියූකල)

☞ ඔහු ගුරුවරයා වෙත පැමිණ, "මම මේ ශිල්පයේ මුල හා මැද පමණක්ම දකිමි, කෙලවරක් නො දකිමි" යැයි කියා, ගුරුවරයා විසින් "මමත් පුතේ නො දකිමි" යැයි කියූකල,

• ''අථ කො, ආචරිය, පරියොසානං ජානාතී''ති පුච්ඡිත්වා ''ඉමෙ, තාත, ඉසයො ඉසිපතනෙ විහරන්ති, තෙ ජානෙය්‍යුං, තෙසං සන්තිකං උපසඞ්කමිත්වා පුච්ඡස්සූ''ති ආචරියෙන වුත්තෙ පච්චෙකබුද්ධෙ උපසඞ්කමිත්වා පුච්ඡි

★''අථ (ඉක්බිති) කො (කව්ද) ආචරිය (ගුරුතුමනි) පරියොසානං ජානාතී''ති (කෙලවරක් දන්නේ යැයි) පුච්ඡිත්වා (විමසා) ''ඉමෙ (මේ) තාත (පුතේ) ඉසයො (ඍෂීන්) ඉසිපතනෙ විහරන්ති (ඉසිපතනයෙහි වාසයකරති) තෙ ජානෙය්‍යුං (ඔවුන් දන්නෝය) තෙසං සන්තිකං (ඔවුන් ලගට) උපසඞ්කමිත්වා (ගිහින්) පුච්ඡස්සූ''ති (අසන්න යැයි) ආචරියෙන වුත්තෙ (ගුරුවරයා කියූකල) පච්චෙකබුද්ධෙ (පසේ බුදුන්වෙත) උපසඞ්කමිත්වා පුච්ඡි (පැමිණ ඇසුවේය)

☞ ඉක්බිති "ගුරුතුමනි! කව්ද කෙලවරක් දන්නෙ" යැයි විමසා "පුතේ මේ ඍෂීන් ඉසිපතනයෙහි වාසයකරති. ඔවුන් දන්නෝය, ඔවුන් ලගට ගිහින් අසන්න" යැයි ගුරුවරයා කියූකල, පසේ බුදුන්වෙත පැමිණ ඇසුවේය.

• ''තුම්හෙ කිර පරියොසානං ජානාථා''ති? ''ආම, ජානාමා''ති. ''තෙන හි මෙ ආචික්ඛථා''ති? ''න මයං අපබ්බජිතස්ස ආචික්ඛාම. සචෙ තෙ පරියොසානෙනත්ථො, පබ්බජස්සූ''ති.

★ ''තුම්හෙ කිර (නුඹලා වනාහි) පරියොසානං ජානාථා''ති? (කෙලවරක් දන්නේද යැයි) ''ආම, ජානාමා''ති. (ඔව් දන්නෙමු) ''තෙන හි (එහෙනම්) මෙ ආචික්ඛථා''ති? (මට කියන්න) ''<u>න</u> මයං (අපි) අපබ්බජිතස්ස (පැවිදි නොවූවෙකුට) ආචික්ඛාම (<u>නො</u> කින්නෙමු/ කියන්නෙ නෑ) සචෙ තෙ (ඉඳින් ඔබට) [පරියොසානෙන+අත්ථො] පරියොසානෙනත්ථො (කෙලවරින් / අවසානයෙන් අර්ථයක් ඇත්නම්) පබ්බජස්සූ''ති (පැවිදිවන්න)

☞ "නුඹලා කෙලවරක් දන්නේද" යැයි "ඔව් දන්නෙමු" "එහෙනම් මට කියන්න" "අපි පැවිදි නොවූවෙකුට කියන්නෙ නෑ, ඉඳින් ඔබට කෙලවරක් අවශ්‍යනම් පැවිදිවන්න"

• සො ''සාධූ''ති සම්පටිච්ඡිත්වා තෙසං සන්තිකෙ පබ්බජි. අථස්ස තෙ ''ඉදං තාව සික්ඛස්සූ''ති වත්වා ''එවං තෙ නිවාසෙතබ්බං, එවං පාරුපිතබ්බ''න්ති ආදිනා නයෙන ආභිසමාචාරිකං ආචික්ඛිංසු.

★ සො ''සාධූ''ති (ඔහු හොඳයි යැයි) සම්පටිච්ඡිත්වා (පිළිගෙන) තෙසං සන්තිකෙ පබ්බජි (ඔවුන් ලග පැවිදිවිය) [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුට) තෙ (ඔවුන්) ''ඉදං තාව (මෙය මුලින්) [සික්ඛස්සු+ඉති] සික්ඛස්සූ''ති වත්වා (හික්මෙන්න යැයි කියා) ''එවං තෙ නිවාසෙතබ්බං (මෙසේ ඔබ ඇඳිය යුතුය) එවං (මෙසේ) [පාරුපිතබ්බං+ඉති] පාරුපිතබ්බ''න්ති (පෙරවිය යුතුය යැයි) ආදිනා නයෙන (ආදී ක්‍රමයෙන්) ආභිසමාචාරිකං (චාරිත්‍රවාරිත්‍ර ශීලය) ආචික්ඛිංසු (කියූහ)

☞ ඔහු ‘‘හොඳයි’’ යැයි පිළිගෙන ඔවුන් ලග පැවිදිවිය. ඉක්බිති ඔහුට ඔවුන් ‘‘මෙහි මුලින් හික්මෙන්න’’ යැයි කියා ‘‘මෙසේ ඔබ ඇඳිය යුතුය, මෙසේ පෙරවිය යුතුය’’ යැයි ආදී ක්‍රමයෙන් වාරිත්‍රවාරිත්‍ර ශීලය කියූහ.

• සො තත්ථ සික්ඛන්තො උපනිස්සයසම්පන්නත්තා නචිරස්සෙව පච්චෙකසම්බොධිං අභිසම්බුජ්ඣිත්වා සකලබාරාණසිනගරෙ ගගනතලෙ පුණ්ණචන්දො විය පාකටො ලාභග්ගයසග්ගප්පත්තො අහොසි.

★ සො තත්ථ සික්ඛන්තො (ඔහු එහි හික්මෙමින්) උපනිස්සය-සම්පන්නත්තා (උපනිස්සය සම්පන්න බැවින්/ පාරමී පිරීඇති බැවින්) නචිරස්සෙව (කෙටිකලකින් ම) පච්චෙකසම්බොධිං (පසේ බුද්ධත්වය) අභිසම්බුජ්ඣිත්වා (අවබෝධකර) සකල-බාරාණසි-නගරෙ (මුලු බරණැස් නගරයෙහි) ගගනතලෙ පුණ්ණචන්දො විය (අහසෙහි පුණ්සඳ මෙන්) පාකටො (ප්‍රකටව/ ප්‍රසිද්ධව) [ලාභ+අග්ග-යස+අග්ග+පත්තො] ලාභග්ගයසග්ගප්පත්තො අහොසි (ලාභයෙන් යසසින් අග්‍රබවට පත්විය)

☞ ඔහු එහි හික්මෙමින්, පාරමී පිරීඇති බැවින් කෙටිකලකින් ම පසේ බුද්ධත්වය අවබෝධකර, මුලු බරණැස් නගරයෙහි ම අහසෙහි පුණ්සඳ මෙන් ප්‍රසිද්ධව, ලාභයෙන් යසසින් අග්‍රබවට පත්විය.

• සො අප්පායුකසංවත්තනිකස්ස කම්මස්ස කතත්තා න චිරස්සෙව පරිනිබ්බායි. අථස්ස පච්චෙකබුද්ධා ච මහාජනො ච සරීරකිච්චං කත්වා ධාතුයො ච ගහෙත්වා නගරද්වාරෙ ථූපං කාරෙසුං.

★ සො (ඔහු) [අප්ප+ආයුක-සංවත්තනිකස්ස] අප්පායුකසංවත්තනිකස්ස (අඩු ආයුෂයකයට හේතුවන) කම්මස්ස කතත්තා (කර්මක් කලබැවින්) න චිරස්සෙව (කෙටිකලකින් ම) පරිනිබ්බායි (පිරිනිවන් පෑවේය) [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුගේ) පච්චෙකබුද්ධා ච මහාජනො ච (පසේබුදුවරු ද මහජනයා ද) සරීරකිච්චං කත්වා (ශරීරය ආදාහනය කර) ධාතුයො ච ගහෙත්වා (ධාතූන් ද ගෙන) නගරද්වාරෙ (නගර දොරටුවෙහි) ථූපං කාරෙසුං (චෛත්‍යයක් සැදූහ)

☞ ඔහු පෙර අඩු ආයුෂයකයට හේතුවන කර්මක් කලබැවින් කෙටිකලකින් ම පිරිනිවන් පෑවේය. ඉක්බිති පසේබුදුවරු ද මහජනයා ද ඔහුගේ ශරීරය ආදාහනය කර ධාතූන් ගෙන නගර දොරටුවෙහි චෛත්‍යයක් සැදූහ.

• සඞ්ඛොපි බ්‍රාහ්මණො ‘‘පුත්තො මෙ චිරං ගතො, පවත්තිමස්ස ජානිස්සාමී’’ති තං දට්ඨුකාමො තක්කසිලාතො නික්ඛමිත්වා අනුපුබ්බෙන බාරාණසිං පත්වා මහාජනකායං සන්නිපතිතං දිස්වා ‘‘අද්ධා ඉමෙසු එකොපි මෙ පුත්තස්ස පවත්තිං ජානිස්සතී’’ති උපසඞ්කමිත්වා පුච්ඡි

★ සඞ්ඛො-පි බ්‍රාහ්මණො (සංඛ බමුණා ද) ‘‘පුත්තො මෙ (මගේ පුතා) චිරං ගතො (බොහෝකලක් ගිහින්) [පවත්තිං+අස්ස] පවත්තිමස්ස (ඔහුගේ තොරතුරු) ජානිස්සාමී’’ති (දැනගන්නෙමි යැයි) තං දට්ඨුකාමො (ඔහු දකිනු කැමතිව) තක්කසිලාතො නික්ඛමිත්වා (තක්සිලාවෙන් නික්මී) අනුපුබ්බෙන බාරාණසිං පත්වා (ක්‍රමයෙන් බරණැසට පැමිණ) මහාජනකායං (මහාජනකායක්) සන්නිපතිතං දිස්වා (රැස්වීසිටිනු දැක) ‘‘අද්ධා ඉමෙසු (ඒකාන්තයෙන් මොවුන් අතරින්) එකො-පි (එක්කෙනෙක් හෝ)

මෙ පුත්තස්ස (මගේ පුතාගේ) පවත්තිං ජානිස්සතී''ති (තොරතුරක් දන්නේය/ තොරතුරක් දන්නව ඇති යැයි) උපසඞ්කමිත්වා පුච්ඡි (පැමිණ ඇසීය)

☞ සංඛ බමුණා ද ''මගේ පුතා බොහෝකලක් ගිහින්, ඔහුගේ තොරතුරු දැනගන්නෙමි'' යැයි ඔහු දකිනු කැමතිව තක්සිලාවෙන් නික්මී ක්‍රමයෙන් බරණැසට පැමිණ මහාජනකායක් රැස්වීසිටිනු දැක ''ඒකාන්තයෙන් මොවුන් අතරින් එක්කෙනෙක් හෝ මගේ පුතාගේ තොරතුරක් දන්නව ඇති'' යැයි පැමිණ ඇසීය.

• ''සුසීමො නාම මාණවො ඉධාගමි, අපි නු ඛො තස්ස පවත්තිං ජානාථා''ති? ''ආම, බ්‍රාහ්මණ, ජානාම, අසුකස්ස බ්‍රාහ්මණස්ස සන්තිකෙ තයො වෙදෙ සජ්ඣායිත්වා පබ්බජිත්වා පච්චෙකසම්බොධිං සච්ඡිකත්වා පරිනිබ්බුතො, අයමස්ස ථූපො පතිට්ඨාපිතො''ති.

★ ''සුසීමො නාම මාණවො (සුසීම නම් තරුණයෙක්) [ඉධ+ආගමි] ඉධාගමි (මෙහි ආව) අපි නු ඛො තස්ස පවත්තිං ජානාථා''ති? (ඔහුගේ තොරතුරක් දන්නවාද) ''ආම, බ්‍රාහ්මණ, ජානාම (ඔව් බමුණ දන්නෙමු) අසුකස්ස බ්‍රාහ්මණස්ස සන්තිකෙ (අසවල් බමුණා ළඟ) තයො වෙදෙ සජ්ඣායිත්වා (තුන් වේදය ඉගෙන) පබ්බජිත්වා (පැවිදිව) පච්චෙකසම්බොධිං සච්ඡිකත්වා (පසේබුදුබව අවබෝධකර) පරිනිබ්බුතො (පිරිනිවන් පානලදී) [අයං+අස්ස] අයමස්ස (මේ ඔහුගේ) ථූපො පතිට්ඨාපිතො''ති (චෛත්‍යය පිහිටුවනලද)

☞ ''සුසීම නම් තරුණයෙක් මෙහි ආව, ඔහුගේ තොරතුරක් දන්නවාද'' ''ඔව් බමුණ දන්නෙමු, අසවල් බමුණා ළඟ තුන් වේදය ඉගෙන පැවිදිව පසේබුදුබව අවබෝධකර පිරිනිවන් පානලදී, මේ ඔහුගේ පිහිටුවනලද චෛත්‍යයයි''

• සො භූමිං හත්ථෙන පහරිත්වා රොදිත්වා කන්දිත්වා තං චෙතියඞ්ගණං ගන්ත්වා තිණානි උද්ධරිත්වා උත්තරසාටකෙන වාලුකං ආහරිත්වා චෙතියඞ්ගණෙ ආකිරිත්වා කමණ්ඩලුතො උදකෙන පරිප්ඵොසිත්වා වනපුප්ඵෙහි පූජං කත්වා සාටකෙන පටාකං ආරොපෙත්වා ථූපස්ස උපරි අත්තනො ඡත්තකං බන්ධිත්වා පක්කාමි.

★ සො (ඔහු) භූමිං හත්ථෙන පහරිත්වා (පොළොවට අතින් ගසා) රොදිත්වා කන්දිත්වා (හඬා වැලපී) තං චෙතියඞ්ගණං ගන්ත්වා (ඒ චෛත්‍යය මලුවට ගිහින්) තිණානි උද්ධරිත්වා (තණකොල ගලවා) උත්තර-සාටකෙන (උතුරු සලුවෙන්/ කරේදාගෙන යන සලුවෙන්) වාලුකං ආහරිත්වා (වැලි ගෙනවිත්) [චෙතිය+අඞ්ගණෙ] චෙතියඞ්ගණෙ (චෛත්‍යය මලුවේ) ආකිරිත්වා (විසුරුවා) කමණ්ඩලුතො (කෙණ්ඩියෙන්) උදකෙන (වතුර) පරිප්ඵොසිත්වා (වටේට ඉස) වනපුප්ඵෙහි (වනමල්වලින්) පූජං කත්වා (පූජාකර) සාටකෙන (සලුවෙන්) පටාකං ආරොපෙත්වා (කොඩියක් ඔසවා) ථූපස්ස උපරි (චෛත්‍යයට ඉහලින්) අත්තනො ඡත්තකං (තමාගේ කුඩය) බන්ධිත්වා පක්කාමි (බැඳ ගියේය)

☞ ඔහු පොළොවට අතින් ගසා හඬා වැලපී, ඒ චෛත්‍යය මලුවට ගිහින්, තණකොල ගලවා කරේදාගෙන යන සලුවෙන් වැලි ගෙනවිත් චෛත්‍යය මලුවේ විසුරුවා, කෙණ්ඩියෙන් වතුර වටේට ඉස, වනමල් පූජාකර, සලුවෙන් කොඩියක් ඔසවා, චෛත්‍යයට ඉහලින් තමාගේ කුඩය බැඳ, ගියේය.

• සත්ථා ඉදං අතීතං ආහරිත්වා ''තදා, භික්ඛවෙ, අහං සඞ්ඛො බ්‍රාහ්මණො අහොසිං. මයා සුසීමස්ස පච්චෙකබුද්ධස්ස චෙතියඞ්ගණෙ තිණානි උද්ධටානි, තස්ස මෙ කම්මස්ස නිස්සන්දෙන අට්ඨයොජනමග්ගං විහතඛාණුකකණ්ටකං කත්වා සුද්ධං සමතලං කරිංසු.

★ සත්ථා (ශාස්තෘන් වහන්සේ) ඉදං අතීතං ආහරිත්වා (මේ අතීතය ගෙනහැරදක්වා) ‘‘තදා, භික්ඛවෙ (එකල මහණෙනි) අහං සඞ්ඛො බ්‍රාහ්මණො අහොසිං (මම සංඛ බමුණා විය) මයා (මා විසින්) සුසීමස්ස පච්චෙකබුද්ධස්ස (සුසීම පසේබුදුන්ගේ) චෙතියඞ්ගණෙ (චෛත්‍යය මලුවේ) තිණානි උද්ධරානි (තණකොල ගලවනලදී) තස්ස මෙ (ඒ මගේ) කම්මස්ස නිස්සන්දෙන (කර්මයේ විපාකයෙන්) අට්ඨ-යොජන-මග්ගං (අට යොදුන් මග) විහත-ඛාණුක-කණ්ටකං කත්වා (මුල් කටු ඉවත්කර) සුද්ධං සමතලං කරිංසු (පිරිසිදුව සමතලා කලහ)

☞ ශාස්තෘන් වහන්සේ මේ අතීතය ගෙනහැරදක්වා ‘‘මහණෙනි, එකල මම සංඛ බමුණා විය, මා විසින් සුසීම පසේබුදුන්ගේ චෛත්‍යය මලුවේ තණකොල ගලවනලදී, මගේ ඒ කර්මයේ විපාක වශයෙන් අට යොදුන් මග මුල් කටු ඉවත්කර පිරිසිදුව සමතලා කලහ.

• මයා තත්ථ වාලුකා ඔකිණ්ණා, තස්ස මෙ නිස්සන්දෙන අට්ඨයොජනමග්ගෙ වාලුකං ඔකිරිංසු.

★ මයා තත්ථ (මා විසින් එහි) වාලුකා ඔකිණ්ණා (වැලි ඉසිනලදී) තස්ස මෙ (ඒ මගේ) නිස්සන්දෙන (විපාකයෙන්) අට්ඨ-යොජන-මග්ගෙ (අට යොදුන් මග) වාලුකං ඔකිරිංසු (වැලි විසිරවූහ)

☞ මා විසින් එහි වැලි ඉසිනලදී, මගේ ඒ විපාකයෙන් අට යොදුන් මග වැලි විසිරවූහ.

• මයා තත්ථ වනකුසුමෙහි පූජා කතා, තස්ස මෙ නිස්සන්දෙන අට්ඨයොජනමග්ගෙ නානාවණ්ණානි පුප්ඵානි ඔකිණ්ණානි, එකයොජනට්ඨානෙ ගඞ්ගාය උදකං පඤ්චවණ්ණෙහි පදුමෙහි සඤ්ජන්නං.

★ මයා තත්ථ (මා විසින් එහි) වන-කුසුමෙහි පූජා කතා (වනමලින් පූජාකරන ලදී) තස්ස මෙ (ඒ මගේ) නිස්සන්දෙන (විපාකයෙන්) අට්ඨ-යොජන-මග්ගෙ (අට යොදුන් මග) නානා-වණ්ණානි පුප්ඵානි ඔකිණ්ණානි (නොයෙක් වර්ණ මල් ඉසිනලදී) [එක-යොජන+ඨානෙ] එකයොජනට්ඨානෙ (එක් යොදුනක් තැන) ගඞ්ගාය උදකං (ගංඟාවේ ජලය) පඤ්ච-වණ්ණෙහි පදුමෙහි සඤ්ජන්නං (පස්පැහැ පියුමින් වැසීගියේය)

☞ මා විසින් එහි වනමල් පූජාකරන ලදී, මගේ ඒ විපාකයෙන්, අට යොදුන් මග නොයෙක් වර්ණ මල් ඉසිනලදී, එක් යොදුනක් තැන ගංඟාවේ ජලය පස්පැහැ පියුමින් වැසීගියේය.

• මයා තත්ථ කමණ්ඩලුඋදකෙන භූමි පරිප්ඵොසිතා, තස්ස මෙ නිස්සන්දෙන වෙසාලියං පොක්ඛරවස්සං වස්සි.

★ මයා තත්ථ (මා විසින් එහි) කමණ්ඩලු-උදකෙන (කෙන්ඩියේ දියෙන්) භූමි පරිප්ඵොසිතා (පොළොව තෙමනලදී) තස්ස මෙ (ඒ මගේ) නිස්සන්දෙන (විපාකයෙන්) වෙසාලියං පොක්ඛර-වස්සං වස්සි (විසාලාවෙහි පොකුරු වැසි වසිනලදී)

☞ මා විසින් එහි, කෙන්ඩියේ දියෙන් පොළොව තෙමනලදී, මගේ ඒ විපාකයෙන්, විසාලාවෙහි පොකුරු වැසි වසිනලදී.

• මයා තත්ථ පටාකා, ආරොපිතා, ඡත්තකඤ්ච බද්ධං, තස්ස මෙ නිස්සන්දෙන යාව අකනිට්ඨභවනා ධජපටාකඡත්තාතිඡත්තාදීහි සකලචක්කවාළගබ්භං එකුස්සවං විය ජාතං.

★ මයා තත්ථ (මා විසින් එහි) පටාකා ආරොපිතා (කොඩියක් ඔසවනලදී) [ඡත්තකං+ච] ඡත්තකඤ්ච බද්ධං (කුඩයක් ද බඳිනලදී) තස්ස මෙ (ඒ මගේ) නිස්සන්දෙන (විපාකයෙන්) යාව අකනිට්ඨභවනා (අකනිට්ඨ භවන දක්වා) [ධජ-පටාක-ඡත්ත+අතිඡත්ත+ආදීහි] ධජපටාකඡත්තාතිඡත්තාදීහි (කොඩි පතාක කුඩමත කුඩ ආදියෙන්) සකල-චක්කවාළ-ගබ්භං (මුලු සක්වල ගැබ) [එක+උස්සවං] එකුස්සවං විය ජාතං (එකම උත්සවයක් වගේ විය)

☞ මා විසින් එහි කොඩියක් ඔසවනලදී, කුඩයක් ද බඳිනලදී, මගේ ඒ විපාකයෙන්, අකනිට්ඨ භවන දක්වා කොඩි පතාක කුඩමත කුඩ ආදියෙන් මුලු සක්වල ගැබ එකම උත්සවයක් වගේ විය.

• ඉති ඛො, භික්ඛවෙ, එස පූජාසක්කාරො මය්හං නෙව බුද්ධානුභාවෙන නිබ්බත්තො, න නාගදෙවබ්‍රහ්මානුභාවෙන, අතීතෙ පන අප්පමත්තකපරිච්චාගානුභාවෙනා''ති වත්වා ධම්මං දෙසෙන්තො ඉමං ගාථමාහ

★ ඉති ඛො, භික්ඛවෙ (මෙසේ මහණෙනි) එස පූජා-සක්කාරො (මේ පූජා සත්කාර) මය්හං (මගේ) **නෙව** බුද්ධානුභාවෙන (බුද්ධානුභාවයෙන්) නිබ්බත්තො (**නූ**පන්නේය), න නාග-දෙව-බ්‍රහ්මානුභාවෙන (නාග දේව බ්‍රක්මයන්ගේ ආනුභාවයෙන් නොවේ) අතීතෙ පන (අතීතයේ වනාහි) [අප්ප-මත්ත-කපරිච්චාග+ආනුභාවෙන] අප්පමත්තකපරිච්චාගානුභාවෙනා''ති (අල්ප මාත්‍ර පරිත්‍යාගයක ආනුභාවයෙන් යැයි) වත්වා (කියා) ධම්මං දෙසෙන්තො (දහම් දෙසමින්) ඉමං [ගාථං+ආහ] ගාථමාහ (මේ ගාථාව කීය/ දේශනාකලේය)

☞ මෙසේ මහණෙනි මේ පූජාසත්කාරය මගේ බුද්ධානුභාවයෙන් නූපන්නේය, නාග දේව බ්‍රක්මයන්ගේ ආනුභාවයෙන් ද නොවේ, අතීතයේ වනාහි අල්ප මාත්‍ර පරිත්‍යාගයක ආනුභාවයෙන් උපන්නේය'' යැයි කියා, දහම් දෙසමින් මේ ගාථාව දේශනාකලේය.

''**මත්තාසුඛපරිච්චාගා - පස්සෙ චෙ විපුලං සුඛං;**
චජෙ මත්තාසුඛං ධීරො - සම්පස්සං විපුලං සුඛ''න්ති.

මත්තාසුඛපරිච්චාගා පස්සෙ චෙ විපුලං සුඛං, ධීරො මත්තාසුඛං චජෙ විපුලං සුඛං සම්පස්සං

★ මත්තා-සුඛ-පරිච්චාගා (සුළු සැපක් අතහැරීමෙන්) පස්සෙ චෙ (ඉදින් දකින්නේනම්) විපුලං සුඛං (මහත් සැපක් / මහත් සැපක් ලැබෙන්නේයැයි) ධීරො (පණ්ඩිතයා) මත්තා-සුඛං (සුළු සැප) චජෙ (අත්හරියි) විපුලං සුඛං සම්පස්සං (මහත් සැප දකිමින්)

☞ ඉදින් සුළු සැපක් අතහැරීමෙන් මහත් සැපක් ලැබෙන්නේයැයි දකින්නේනම්, පණ්ඩිතයා මහත් සැප දකිමින් සුළු සැප අත්හරියි.

• තත්ථ ''**මත්තාසුඛන්**''ති පමාණයුත්තකං පරිත්තසුඛං වුච්චති, තස්ස පරිච්චාගෙන. ''**විපුලං සුඛන්**''ති උළාරං සුඛං නිබ්බානසුඛං වුච්චති, තං චෙ පස්සෙය්‍යාති අත්ථො.

★ තත්ථ (මෙහි/ මේ ගාථාවේ) ''**මත්තාසුඛන්**''ති (''**මත්තාසුඛන්**'' යනු) පමාණ-යුත්තකං (ප්‍රමාණවත් කලහැකි) පරිත්ත-සුඛං වුච්චති (සුළු සැපට කියයි) තස්ස පරිච්චාගෙන (එය අතහැරීමෙන්) ''**විපුලං සුඛන්**''ති (''**විපුලං සුඛන්**'' යනු) උළාරං සුඛං (මහත් සැප) නිබ්බාන-සුඛං වුච්චති (නිවන් සැපයට කියයි) තං චෙ (ඉදින් එය) පස්සෙය්‍යාති (දකින්නේනම් යැයි) අත්ථො (අර්ථයවේ)

☞ මේ ගාථාවේ "**මත්තාසුඛන්**" යනු ප්‍රමාණවත් කලහැකි සුළු සැපට කියයි. එය අතහැරීමෙන් "**විපුලං සුඛන්**" යනු මහත් සැප නිවන් සැපයට කියයි. ඉදින් එය දකින්නේනම්, යැයි අර්ථයවේ.

• ඉදං වුත්තං හොති එකඤ්ඡි හොජනපාතිං සජ්ජාපෙත්වා භුඤ්ජන්තස්ස මත්තාසුඛං නාම උප්පජ්ජති, තං පන පරිච්චජිත්වා උපොසථං වා කරොන්තස්ස දානං වා දදන්තස්ස විපුලං උළාරං නිබ්බානසුඛං නාම නිබ්බත්තති.

★ ඉදං වුත්තං හොති (මෙය කීවා වේ/ මෙහි කීදේ නම්) [එකං+හි] එකඤ්ඡි (එකක් වනාහි) හොජන-පාතිං (කන පිගානක්/ වළඳන තලියක්) සජ්ජාපෙත්වා (පිළියෙලකරවා) භුඤ්ජන්තස්ස (කන්නාට) මත්තාසුඛං (සුලු සැපක්) නාම උප්පජ්ජති (වනාහි උපදියි) තං පන පරිච්චජිත්වා (එය වනාහි පරිත්‍යාගකර) උපොසථං වා කරොන්තස්ස (උපෝසථ කරන්නාට හෝ/ පොහොයසිල් රකින්නාට හෝ) දානං වා දදන්තස්ස (දන් හෝ දෙන්නාට) විපුලං උළාරං (විපුලවූ මහත්වූ) නිබ්බාන-සුඛං නාම නිබ්බත්තති (නිවන් සැප නම් උපදියි)

☞ මෙහි කීදේ නම්, එක් කන පිගානක් පිළියෙල කරවාගෙන කන්නාට සුලු සැපක් නම් උපදියි. එය වනාහි පරිත්‍යාගකර පොහොයසිල් රකින්නාට හෝ දන් දෙන්නාට හෝ විපුලවූ මහත්වූ නිවන් සැප නම් උපදියි.

• තස්මා සචෙ එවං තස්ස මත්තාසුඛස්ස පරිච්චාගා විපුලං සුඛං පස්සති, අථෙතං විපුලං සුඛං සම්මා පස්සන්තො පණ්ඩිතො තං මත්තාසුඛං වජෙයය්‍යාති.

★ තස්මා (එබැවින්) සචෙ (ඉදින්) එවං (මෙසේ) තස්ස මත්තා-සුඛස්ස (ඒ අල්ප සැපයේ) පරිච්චාගා (පරිත්‍යාගයෙන්) විපුලං සුඛං පස්සති (මහත් සැපක් දකියි නම්) [අථ+එතං] අථෙතං (එවිට) විපුලං සුඛං (මහත් සැප) සම්මා පස්සන්තො (මනාලෙස දකින්නාවූ) පණ්ඩිතො (පණ්ඩිතයා) තං මත්තා-සුඛං (ඒ සුළු සැප) වජෙයය්‍යාති (අත්හරින්නේය)

☞ එබැවින්, ඉදින් මෙසේ ඒ අල්ප සැපයේ පරිත්‍යාගයෙන් මහත් සැපක් දකියි නම්, එවිට මහත් සැප මනාලෙස දකින්නාවූ පණ්ඩිතයා ඒ සුළු සැප අත්හරින්නේය.

• දෙසනාවසානෙ බහූ සොතාපත්තිඵලාදීනි පාපුණිංසූති.
☞ දේශනාව අවසානයේ බොහෝදෙනෙක් සෝවාන් ඵල ආදියට පැමිණියාහ.

ගඩිගාරෝහන පූජා නිට්ඨිතං (ගඩිගාරෝහන පූජාව නිමියේය.)

5. සෝසකසෙට්ඨී වත්ථු (සෝසක සිටුගේ කථාව)

• අල්ලකප්පරට්ඨෙ පන දුබ්භික්ඛෙ ජීවිතුං අසක්කොන්තො එකො කොතූහලිකො නාම මනුස්සො කාපිං නාම තරුණපුත්තඤ්ච කාළිං නාම භරියඤ්ච ආදාය ''කොසම්බිං ගන්ත්වා ජීවිස්සාමී''ති පාථෙය්‍යං ගහෙත්වා නික්ඛමි.

★ අල්ලකප්ප-රට්ඨෙ පන (අල්ලකප්ප රටේ වනාහි) දුබ්භික්ඛෙ (දුර්භික්ෂයෙන්) ජීවිතුං අසක්කොන්තො (ජීවත්වීමට නොහැකි) එකො කොතූහලිකො නාම මනුස්සො (එක් කොතූහලික නම් මිනිසෙක්) කාපිං නාම (කාපි නම්) [තරුණ-පුත්තං+ච] තරුණපුත්තඤ්ච (ළදරු පුතා ද) කාළිං නාම (කාලි නම්) [භරියං+ච] භරියඤ්ච ආදාය (බිරිඳ-ත් ගෙන) ''කොසම්බිං ගන්ත්වා (කොසඹෑවට ගිහින්) ජීවිස්සාමී''ති (ජීවත්වෙමි යැයි) පාථෙය්‍යං ගහෙත්වා නික්ඛමි (මගවියදම් ගෙන නික්මුණේය)

☞ අල්ලකප්ප රටේ දුර්භික්ෂයෙන් ජීවත්වීමට නොහැකි එක් කොතූහලික නම් මිනිසෙක් කාපි නම් ළදරු පුතා ද කාලි නම් බිරිඳත් ගෙන ''කොසඹෑවට ගිහින් ජීවත්වෙමි'' යැයි මගවියදම් ගෙන නික්මුණේය.

• තෙ ගච්ඡන්තා පාථෙය්‍යෙ පරික්ඛීණෙ බුදාභිභූතා දාරකං වහිතුං නාසක්ඛිංසු. අථ සාමිකො පජාපතිං ආහ – ''භද්දෙ, මයං ජීවන්තා පුන පුත්තං ලභිස්සාම, ඡඩ්ඩෙත්වා නං ගච්ඡාමා''ති.

★ තෙ ගච්ඡන්තා (ඔවුන් යන අතරේ) පාථෙය්‍යෙ පරික්ඛීණෙ (මගවියදම් අවසන්වූකල) [බුදා+අභිභූතා] බුදාභිභූතා (බඩගින්නෙන් පෙලී) දාරකං වහිතුං (දරුවා ඔසවාගෙන යාමට) නාසක්ඛිංසු (නොහැකිවූහ) අථ සාමිකො (ඉක්බිති සැමියා) පජාපතිං ආහ (බිරිඳට කීය) ''භද්දෙ (සොදුරිය) මයං ජීවන්තා (අපි ජීවත්වෙමින්) පුන පුත්තං ලභිස්සාම (නැවත පුතෙක් ලබන්නෙමු/ ලබමු) ඡඩ්ඩෙත්වා (හැරදමා/ දාල) නං ගච්ඡාමා''ති (මොහු යමු යැයි)

☞ ඔවුන් යන අතරේ මගවියදම් අවසන්වූකල බඩගින්නෙන් පෙලී දරුවා ඔසවාගෙන යාමට නොහැකිවූහ. ඉක්බිති සැමියා බිරිඳට කීය, ''සොදුරිය! අපි ජීවත්වෙමින් නැවත පුතෙක් ලබමු, මොහු දාලා යමු'' යැයි

• මාතු හදයං නාම මුදුකං හොති. තස්මා සා ආහ – ''නාහං ජීවන්තමෙව පුත්තං ඡඩ්ඩෙතුං සක්ඛිස්සාමී''ති. ''අථ කිං කරොමා''ති? ''වාරෙන නං වහාමා''ති.

★ මාතු හදයං නාම (මවගේ හදවත නම්) මුදුකං හොති (මෘදු වෙති) තස්මා සා ආහ (එබැවින් ඇය කීය) ''[<u>න</u>+අහං] නාහං (මට) [ජීවන්තං+එව] ජීවන්තමෙව (ජීවත්වෙන) පුත්තං ඡඩ්ඩෙතුං (පුතා හැරදැමීමට) සක්ඛිස්සාමී''ති (<u>නො</u> හැක්කෙමි) ''අථ (එහෙනම්) කිං කරොමා''ති? (මොකක්ද කරන්නෙ) ''වාරෙන නං වහාමා''ති (වාරයෙන් වාරයට මොහු ඔවාසවාගෙනයමු)

☞ මවගේ හදවත නම් මෘදු වෙති එබැවින් ඇය කීය ''මට ජීවත්වෙන පුතාව හැරදැමීමට නොහැක්කෙමි'' ''එහෙනම් මොකක්ද කරන්නෙ'' ''වාරයෙන් වාරයට මොහු ඔවාසවාගෙනයමු''

• මාතා අත්තනො වාරෙ පුප්ඵදාමං විය නං උක්ඛිපිත්වා උරෙ නිපජ්ජාපෙත්වා අඞ්කෙන වහිත්වා පිතුනො දෙති. තස්ස තං ගහෙත්වා ගමනකාලෙ ඥාතකතොපි බලවතරා වෙදනා උප්පජ්ජි.

★ මාතා අත්තනො වාරෙ (මව තමාගේ වාරයේ) පුප්ඵ-දාමං විය (මල්දමක් මෙන්) නං උක්ඛිපිත්වා (ඔහුව ඔසවාගෙන) උරෙ නිපජ්ජාපෙත්වා (උරේ නිදිකරවා) අඞ්කෙන වහිත්වා (ඇකයෙන් ඔසවාගෙන ගිහින්) පිතුනො දෙති (පියට දෙයි) තස්ස (ඔහුට) තං ගහෙත්වා (ඔහුව ගෙන) ගමනකාලෙ (ගමන්කරන වෙලාවේ) ඡාතකතො-පි (බඩගින්නෙන්-ද) බලවතරා (දැඩි) වෙදනා උප්පජ්ජි (වේදනා උපන්නේය)

☞ මව තමාගේ වාරයේ මල්දමක් මෙන් ඔහුව ඔසවාගෙන උරේ නිදිකරවා ඇකයෙන් ඔසවාගෙන ගිහින් පියට දෙයි. ඔහුට ඔහුව ගෙන ගමන්කරන වෙලාවේ බඩගින්නෙන් දැඩි වේදනා උපන්නේය.

• සො පුනප්පුනං ආහ – ‘‘භද්දෙ, මයං ජීවන්තා පුත්තං ලභිස්සාම, ඡඩ්ඩෙම න’’න්ති. සාපි පුනප්පුනං පටික්ඛිපිත්වා පටිවචනං නාදාසි. දාරකො වාරෙන පරිවත්තියමානො කිලන්තො පිතු හත්ථෙ නිද්දායි.

★ සො පුනප්පුනං ආහ (ඔහු නැවත නැවත කීය) ‘‘භද්දෙ (සොදුරිය) මයං ජීවන්තා (අපි ජීවත්වෙමින්) පුන පුත්තං ලභිස්සාම (නැවත පුතෙක් ලබන්නෙමු/ ලබමු) ඡඩ්ඩෙම (හැරදමමු/ දමමු) [නං+ඉති] න’’න්ති (මොහු යැයි) සා-පි පුනප්පුනං පටික්ඛිපිත්වා (ඇය-ත් නැවත නැවත ප්‍රතික්ෂේපකර) පටිවචනං (පිලිතුරක්/ ප්‍රතිවදනක්) [න+අදාසි] නාදාසි (නොදුනි) දාරකො (දරුවා) වාරෙන (වාරය අනුව) පරිවත්තියමානො (මාරුකරන) කිලන්තො (ක්ලාන්තවී/ වෙහෙසවී) පිතු හත්ථෙ නිද්දායි (පියාගේ අතේ නිදාගත්තේය)

☞ ඔහු නැවත නැවත කීය ‘‘සොදුරිය, අපි ජීවත්වෙමින් නැවත පුතෙක් ලබමු, මොහු හැරදමමු’’ යැයි ඇයත් නැවත නැවත ප්‍රතික්ෂේපකර පිලිතුරක් නොදුනි. වාරය අනුව මාරුකරන දරුවා ක්ලාන්තවී පියාගේ අතේ නිදාගත්තේය.

• සො තස්ස නිද්දායනභාවං ඤත්වා මාතරං පුරතො කත්වා එකස්ස ගච්ඡස්ස හෙට්ඨා පණ්ණසන්ථරෙ තං නිපජ්ජාපෙත්වා පායාසි. මාතා නිවත්තිත්වා ඔලොකෙන්තී පුත්තං අදිස්වා, ‘‘සාමි, කුහිං මෙ පුත්තො’’ති පුච්ඡි.

★ සො (ඔහු/ පියා) තස්ස (ඔහුව/ දරුවා) නිද්දායනභාවං ඤත්වා (නිදනබව දැන) මාතරං පුරතො කත්වා (මව ඉස්සර කරගෙන) එකස්ස ගච්ඡස්ස හෙට්ඨා (එක් ගසක් යට) පණ්ණ-සන්ථරෙ (කොල ඇතිරියේ) තං නිපජ්ජාපෙත්වා පායාසි (ඔහුව නිදිකරවා ගියේය) මාතා නිවත්තිත්වා ඔලොකෙන්තී (මව නැවතී බලමින්) පුත්තං අදිස්වා (පුතා නොදැක) ‘‘සාමි (ස්වාමීණි) කුහිං මෙ පුත්තො’’ති පුච්ඡි (මාගෙ පුතා කොහෙද යැයි ඇසීය)

☞ පියා දරුවා නිදනබව දැන, මව ඉස්සර කරගෙන ගිහින්, එක් ගසක් යට කොල ඇතිරියේ ඔහුව නිදිකරවා ගියේය. මව නැවතී බලමින් පුතා නොදැක ‘‘ස්වාමීණි, මගෙ පුතා කොහෙද’’ යැයි ඇසීය

• ‘‘එකස්ස මෙ ගච්ඡස්ස හෙට්ඨා නිපජ්ජාපිතො’’ති. ‘‘සාමි, මා මං නාසයි, පුත්තං විනා ජීවිතුං න සක්ඛිස්සාමි, ආනෙහි මෙ පුත්ත’’න්ති උරං පහරිත්වා පරිදෙවි. අථ සො නිවත්තිත්වා නං ආනෙසි.

★‘‘එකස්ස මෙ (මා විසින්/ මං එක්) ගච්ඡස්ස හෙට්ඨා (ගසක් යට) නිපජ්ජාපිතො’’ති (නිදිකරවන ලද්දේය/ නිදිකෙරෙව්ව) ‘‘සාමි (ස්වාමීණි) මා මං නාසයි (මාව විනාශකරන්න එපා/ මරන්න එපා) පුත්තං විනා (පුතා නැතිව) ජීවිතුං (ජීවත්වීමට)

න සක්ඛිස්සාමි (නොහැක්කෙමි/ බෑ) ආනෙහි (ගේන්න) මෙ(මගෙ) [පුත්තං+ඉති] පුත්ත''න්ති (පුතා යැයි) උරං පහරිත්වා (ළයට ගසාගෙන) පරිදෙවි (හැඩීය) අථ සො (එවිට ඔහු) නිවත්තිත්වා (නැවතී) නං (ඔහුව/ පුතාව) ආනෙසි (ගෙනාවේය)

☞ ''මං එක් ගසක් යට නිදිකෙරෙව්ව''. ''ස්වාමීණි, මාව මරන්න එපා, පුතා නැතිව ජීවත්වෙන්ඩ බෑ, ගේන්න මගෙ පුතා'' යැයි ළයට ගසාගෙන හැඩීය. එවිට ඔහු නැවතී පුතාව ගෙනාවේය.

• පුත්තොපි අන්තරාමග්ගෙ මතො හොති. ඉති සො එත්තකෙ ඨානෙ පුත්තං ඡඩ්ඩෙත්වා තස්ස නිස්සන්දෙන භවන්තරෙ සත්ත වාරෙ ඡඩ්ඩිතො. ''පාපකම්මං නාමෙතං අප්පක''න්ති න අවමඤ්ඤිතබ්බං.

★ පුත්තො-පි (පුතා-ද) අන්තරාමග්ගෙ (අතරමගදී) මතො හොති (මැරුණාය) ඉති සො (මෙසේ ඔහු) එත්තකෙ ඨානෙ (මෙවන් කාලයක්) පුත්තං ඡඩ්ඩෙත්වා (පුතා අතහැරදමා) තස්ස නිස්සන්දෙන (එහි විපාක වශයෙන්) භවන්තරෙ (භවගමනේදී) සත්ත වාරෙ ඡඩ්ඩිතො (සත්වාරයක් අතහැර-දමනලදී) ''පාපකම්මං (පාප ක්‍රියා) [නාම+එතං] නාමෙතං (නම් මෙය) [අප්පකං+ඉති] අප්පක''න්ති (කුඩාය යැයි) න අවමඤ්ඤිතබ්බං (අවමන් නොකලයුතුය)

☞ පුතා ද අතරමගදී මැරුණේය. මෙසේ ඔහු මෙවන් කාලයක් පුතා අතහැරදමා එහි විපාක වශයෙන් භවගමනේදී සත්වාරයක් අතහැරදමනලදී, පාප ක්‍රියා නම් ''මෙය කුඩාය'' යැයි අවමන් නොකලයුතුය.

• තෙ ගච්ඡන්තා එකං ගොපාලකුලං පාපුණිංසු. තං දිවසඤ්ච ගොපාලකස්ස ධෙනුමඩ්ගලං හොති. ගොපාලකස්ස ගෙහෙ නිබද්ධං එකො පච්චෙකබුද්ධො භුඤ්ජති. සො තං හොජෙත්වා මඩ්ගලමකාසි. බහු පායාසො පටියත්තො හොති.

★ තෙ ගච්ඡන්තා (ඔවුන් යන අතරේ) එකං ගොපාල-කුලං (එක් ගවයන් රකින පවිලකට/ ගෙදරකට) පාපුණිංසු (පැමිණියාහ) තං(ඒ) [දිවසං+ච] දිවසඤ්ච (දවසේ ද) ගොපාලකස්ස (ගොපල්ලාගේ) ධෙනුමඩ්ගලං හොති (ධෙනුන් සඳහා උත්සවයක් විය) ගොපාලකස්ස ගෙහෙ (ගොපල්ලාගේ ගෙදර) නිබද්ධං (දිනපතා/ නිතර) එකො පච්චෙකබුද්ධො භුඤ්ජති (එක් පසේබුදුවරයෙක් වළඳයි) සො(ඔහු/ ගොපල්ලා) තං(ඔහුව/ උන්වහන්සේව) හොජෙත්වා (වළඳවා) [මඩ්ගලං+අකාසි] මඩ්ගලමකාසි (උත්සවය කලේය) බහු පායාසො (බොහෝ කිරිබත්) පටියත්තො හොති (පිළියෙලකරනලදී)

☞ ඔවුන් යන අතරේ එක් ගවයන් රකින ගෙදරකට පැමිණියාහ. ඒ දවසේ ගොපල්ලාගේ ධෙනුන් සඳහා උත්සවයක් විය. ගොපල්ලාගේ ගෙදර නිතර එක් පසේබුදුවරයෙක් වළඳයි. ගොපල්ලා උන්වහන්සේව වළඳවා උත්සවය කලේය. බොහෝ කිරිබත් පිළියෙලකරනලදී.

• ගොපාලකො තෙ ආගතෙ දිස්වා, ''කුතො ආගතත්ථා''ති පුච්ඡිත්වා සබ්බං පවත්තිං සුත්වා මුදුජාතිකො කුලපුත්තො තෙසු අනුකම්පං කත්වා බහුකෙන සප්පිනා පායාසං දාපෙසි.

★ ගොපාලකො (ගොපල්ලා) තෙ ආගතෙ දිස්වා (ඔවුන් එනවා දැක) ''කුතො ආගතත්ථා''ති (කොහෙසිට එන්නේද යැයි) පුච්ඡිත්වා (අසා) සබ්බං පවත්තිං සුත්වා (සියලු කථාව/පුවත අසා) මුදුජාතිකො (මෘදු හදක්ඇති) කුලපුත්තො (කුලපුත්‍රයා/ ගුණවත් තැනැත්තා) තෙසු අනුකම්පං කත්වා (ඔවුන් කෙරෙහි අනුකම්පා කර) බහුකෙන සප්පිනා (බොහෝ ගිතෙල් සමග) පායාසං දාපෙසි (කිරිබත් දෙවාලීය)

☞ ගොපල්ලා ඔවුන් එනවා දැක ''කොහෙසිට එන්නේද'' යැයි අසා, සියලු කථාව අසා, මෘදු හදක්ඇති ගුණවත් තැනැත්තා ඔවුන්ට අනුකම්පා කර, බොහෝ ගිතෙල් සමග කිරිබත් දෙවාලීය.

• භරියා ''සාමි, තයි ජීවන්තෙ අහම්පි ජීවාමි නාම, දීඝරත්තං ඌනොදරොසි, යාවදත්ථං භුඤ්ජාහී''ති සප්පිඤ්ච දධිඤ්ච තදභිමුඛඤ්ඤෙව කත්වා අත්තනා මන්දසප්පිනා ථොකමෙව භුඤ්ජි.

★ භරියා (බිරිඳ) ''සාමි (ස්වාමීණි) තයි ජීවන්තෙ (ඔබ ජීවත්වනකල) [අහං+අපි] අහම්පි (මම-ත්) ජීවාමි නාම (ජීවත්වෙමි නම්වේ) දීඝරත්තං (බොහෝකලක්) [ඌනොදරො+අසි] ඌනොදරොසි (හිස්බඩ/ බඩගින්නේ විය/හිටිය) යාවදත්ථං (ඇතිතාක්/ කැමතිතාක්) භුඤ්ජාහී''ති (කන්න යැයි) [සප්පිං+ච] සප්පිඤ්ච (ගිතෙල් ද) [දධිං+ච] දධිඤ්ච (දීකිරි ද) [තං+අභිමුඛං+එව] තදභිමුඛඤ්ඤෙව (ඔහු දෙසට ම) කත්වා (කර) අත්තනා (තමා) මන්ද-සප්පිනා (ගිතෙල් අඩුවෙන්) [ථොකං+එව] ථොකමෙව භුඤ්ජි (පොඩ්ඩක් ම කෑවාය)

☞ බිරිඳ ''ස්වාමීණි, ඔබ ජීවත්වනකල මමත් ජීවත්වෙමි, බොහෝකලක් බඩගින්නේ හිටියනෙ, ඇතිතාක් කන්න'' යැයි ගිතෙල් ද දීකිරි ද ඔහු දෙසට ම කර තමා ගිතෙල් අඩුවෙන් පොඩ්ඩක් ම කෑවාය.

• ඉතරො බහුං භුඤ්ජිත්වා සත්තට්ඨදිවසෙ ඡාතතාය ආහාරතණ්හං ඡින්දිතුං නාසක්ඛි. ගොපාලකො තෙසං පායාසං දාපෙත්වා සයං භුඤ්ජිතුං ආරභි.

★ ඉතරො බහුං භුඤ්ජිත්වා (අනෙකා ගොඩක් කා) [සත්ත+අට්ඨ-දිවසෙ] සත්තට්ඨදිවසෙ (හත් අට දිනක්) ඡාතතාය (නිරාහාර බැවින්/ බඩගින්නේ සිටිබැවින්) ආහාර-තණ්හං (ආහාර තණ්හාව) ඡින්දිතුං (සිඳීමට/ නැවැත්වීමට) නාසක්ඛි (නොහැකිවිය) ගොපාලකො (ගොපල්ලා) තෙසං පායාසං දාපෙත්වා (ඔවුන්ට කිරිබත් දෙවා/ දීමට සලස්වා) සයං භුඤ්ජිතුං ආරභි (තමා කෑමට පටන්ගත්තාය)

☞ අනෙකා ගොඩක් කෑවත්, හත් අට දිනක් බඩගින්නේ සිටිබැවින් ආහාර තණ්හාව නැවැත්වීමට නොහැකිවිය. ගොපල්ලා ඔවුන්ට කිරිබත් දීමට සලස්වා තමා කෑමට පටන්ගත්තාය.

• කොතූහලිකො තං ඔලොකෙන්තො නිසීදිත්වා හෙට්ඨාපීයෙ නිපන්නාය සුනඛියා ගොපාලකෙන වඩ්ඪෙත්වා දියාමානං පායාසපිණ්ඩං දිස්වා ''පුඤ්ඤා වතායං සුනඛී, නිබද්ධං එවරූපං භොජනං ලභතී''ති චින්තෙසි.

★ කොතූහලිකො (කොතූහලික) තං ඔලොකෙන්තො (ඔහුදෙස බලමින්) නිසීදිත්වා (හිඳ) හෙට්ඨා-පීයෙ (පුටුව යට) නිපන්නාය සුනඛියා (ලැගසිටි බැල්ලියට) ගොපාලකෙන (ගොපල්ලා විසින්) වඩ්ඪෙත්වා (වඩා/ ලොකුකර) දියාමානං (දෙනුලබන) පායාස-පිණ්ඩං දිස්වා (කිරිබත් පිඬ දැක) ''පුඤ්ඤා (පින්වන්තය) [වත+අයං] වතායං සුනඛී (ඒකාන්තයෙන් මේ බැල්ලි) නිබද්ධං (නිතර/ දිනපතා) එවරූපං (මෙවැනි) භොජනං ලභතී''ති (කෑමක් ලබන්නේය යැයි) චින්තෙසි (සිතුවේය)

☞ කොතුහලික ඔහුදෙස බලමින් හිඳ, පුටුව යට ලැගසිටි බැල්ලියට ගොපල්ලා විසින් ලොකුකර දෙන කිරිබත් පිඬ දැක, ‘‘ඒකාන්තයෙන් මේ බැල්ලි පින්වන්තය, නිතර මෙවැනි කෑමක් ලබන්නේය’’ යැයි සිතුවේය.

• සො රත්තිභාගෙ තං පායාසං ජීරාපෙතුං අසක්කොන්තො කාලං කත්වා තස්සා සුනඛියා කුච්ඡිම්හි නිබ්බත්ති අථස්ස භරියා සරීරකිච්චං කත්වා තස්මිංයෙව ගෙහෙ භතිං කත්වා තණ්ඩුලනාළිං ලභිත්වා පචිත්වා පච්චෙකබුද්ධස්ස පත්තෙ පතිට්ඨාපෙත්වා, ‘‘දාසස්ස වො පාපුණාතූ’’ති වත්වා චින්තෙසි

★ සො රත්තිභාගෙ (ඔහු රෑ යාමේ/ රාත්‍රී කාලයේ) තං පායාසං ජීරාපෙතුං (ඒ කිරිබත දිරවාගැනීමට) අසක්කොන්තො (නොහැකිවෙමින්) කාලං කත්වා (මැරී) තස්සා සුනඛියා (ඒ බැල්ලියගේ) කුච්ඡිම්හි නිබ්බත්ති (බඩේ උපන්නේය) [අථ+අස්ස] අථස්ස භරියා (ඉක්බිති ඔහුගේ බිරිඳ) සරීරකිච්චං කත්වා (සිරුර ආදාහනය කර) තස්මිං-යෙව ගෙහෙ (ඒ ගෙදර ම) භතිං කත්වා (කුලීවැඩකර / වැඩකාරකම් කර / බැලමෙහෙකම් කර) තණ්ඩු-ලනාළිං ලභිත්වා (හාල් නැලියක් ලැබ) පචිත්වා (උයා) පච්චෙකබුද්ධස්ස පත්තෙ (පසේබුදුන්ගේ පාත්‍රයේ) පතිට්ඨාපෙත්වා (තබා/ තැන්පත්කර) ‘‘දාසස්ස වො පාපුණාතූ’’ති (නුඹලාගේ දාසයාට පින්ලැබේවා යැයි) වත්වා චින්තෙසි (කියා සිතුවේය)

☞ ඔහු රෑ යාමේ ඒ කිරිබත දිරවාගැනීමට නොහැකිව මැරී ඒ බැල්ලියගේ බඩේ උපන්නේය. ඉක්බිති ඔහුගේ බිරිඳ සිරුර ආදාහනය කර ඒ ගෙදර ම බැලමෙහෙකම් කර, හාල් නැලියක් ලැබ උයා පසේබුදුන්ගේ පාත්‍රයේ තැන්පත්කර, ‘‘නුඹලාගේ දාසයාට පින්ලැබේවා’’ යැයි කියා සිතුවේය.

• ‘‘මයා ඉධෙව වසිතුං වට්ටති, නිබද්ධං, අය්‍යා, ඉධාගච්ඡති, දෙය්‍යධම්මො හොතු වා, මා වා, දෙවසිකං වන්දන්තී වෙය්‍යාවච්චං කරොන්තී චිත්තං පසාදෙන්තී බහුං පුඤ්ඤං පසවිස්සාමී’’ති. සා තත්ථෙව භතිං කරොන්තී වසි.

★‘‘මයා ඉධෙව (මං මෙහිම) වසිතුං වට්ටති (ඉඳීමට සුදුසුය) නිබද්ධං (දිනපතා) අය්‍යා (ආර්යන් වහන්සේ) [ඉධ+ආගච්ඡති] ඉධාගච්ඡති (මෙහි එයි) දෙය්‍යධම්මො (දිමට දෙයක්) හොතු වා, මා වා (තිබුනත් නැතත්) දෙවසිකං වන්දන්තී (දිනපතා වඳිමින්) වෙය්‍යාවච්චං කරොන්තී (උපස්ථාන කරමින්) චිත්තං පසාදෙන්තී (සිත පහදවාගනිමින්) බහුං පුඤ්ඤං පසවිස්සාමී’’ති (බොහෝ පින් රැස්කරන්නෙමි යැයි) සා (ඈ) [තත්ථ+එව] තත්ථෙව (එහි-ම) භතිං කරොන්තී වසි (බැලමෙහෙකම් කරමින් වාසයකලේය)

☞ ‘‘මං මෙහිම ඉඳීමට සුදුසුය, දිනපතා ආර්යන් වහන්සේ මෙහි එයි, දිමට දෙයක් තිබුනත් නැතත් දිනපතා වඳිමින්, උපස්ථාන කරමින්, සිත පහදවාගනිමින්, බොහෝ පින් රැස්කරන්නෙමි’’ යැයි ඈ එහිම බැලමෙහෙකම් කරමින් වාසයකලේය.

• සාපි සුනඛී ඡට්ඨෙ වා සත්තමෙ වා මාසෙ එකමෙව කුක්කුරං විජායි. ගොපාලකො තස්ස එකධෙනුයා ඛීරං දාපෙසි. සො න චිරස්සෙව වඩ්ඪි. අථස්ස පච්චෙකබුද්ධො භුඤ්ජන්තො නිබද්ධං එකං හත්තපිණ්ඩං දෙති. සො හත්තපිණ්ඩං නිස්සාය පච්චෙකබුද්ධෙ සිනෙහමකාසි.

★ සා-පි සුනඛී (ඒ බැල්ලි-ත්) ඡට්ඨෙ වා සත්තමෙ වා මාසෙ (හයවන හෝ හත්වන හෝ මාසයේ) එකමෙව (එකම) කුක්කුරං විජායි (බල්ලෙක්/ බලුපැටියෙක් බිහිකල්ය) ගොපාලකො (ගොපල්ලා) තස්ස (ඌට) එක-ධෙනුයා (එක් දෙනකගේ) ඛීරං දාපෙසි (කිරි දෙවාලීය) සො (ඔහු/ඌ) න චිරස්සෙව වඩ්ඪි (කෙටිකලකින්ම වැඩුනේය) [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුට/

ඌට) පච්චෙකබුද්ධො (පසේබුදුවරයන් වහන්සේ) භුඤ්ජන්තො (වළඳන අතරේ) නිබද්ධං (දිනපතා/ නිතර) එකං හත්තපිණ්ඩං දෙති (එක් බත්පිඬක් දෙයි) සො (ඔහු/ ඌ) හත්තපිණ්ඩං නිස්සාය (බත්පිඬ නිසා) පච්චෙකබුද්ධෙ (පසේබුදුන් කෙරෙහි) [සිනෙහං+අකාසි] සිනෙහමකාසි (ප්‍රේම කලේය/ ආදරය කලේය/ ඇලුම් කලේය)

☞ ඒ බැල්ලිත් හයවන හෝ හත්වන හෝ මාසයේ එකම බලුපැටියෙක් බිහිකල්ය. ගොපල්ලා ඌට එක් දෙනකගේ කිරි දෙවාලීය. ඌ කෙටිකලකින්ම වැඩුනේය. ඉක්බිති ඌට පසේබුදුවරයන් වහන්සේ වළඳන අතරේ, දිනපතා එක් බත්පිඬක් දෙයි. ඌ බත්පිඬ නිසා පසේබුදුන් කෙරෙහි ප්‍රේම කලේය.

• ගොපාලකොපි නිබද්ධං ද්වෙ වාරෙ පච්චෙකබුද්ධස්සුපට්ඨානං යාති. ගච්ඡන්තොපි අන්තරාමග්ගෙ වාළමිගට්ඨානෙ දණ්ඩෙන ගච්ඡෙ ච භූමිඤ්ච පහරිත්වා ‘‘සුසූ’’ති තික්ඛත්තුං සද්දං කත්වා වාළමිගෙ පලාපෙති. සුනඛොපි තෙන සද්ධිං ගච්ඡති.

★ ගොපාලකො-පි (ගොපල්ලා-ත්) නිබද්ධං (දිනපතා) ද්වෙ වාරෙ (දෙවාරයක්) [පච්චෙකබුද්ධස්ස+උපට්ඨානං] පච්චෙකබුද්ධස්සුපට්ඨානං යාති (පසේබුදුන්ට උපස්ථානකිරීමට යයි) ගච්ඡන්තො-පි (යන අතරේ ද) අන්තරා-මග්ගෙ (අතරමග) [වාළමිග+ඨානෙ] වාළමිගට්ඨානෙ (නපුරු වල්සතුන් සිටින තැන්වල) දණ්ඩෙන (ලීයකින් / පොල්ලකින් / දන්ඩකින්) ගච්ඡෙ ච (ගස්වලට ද) භූමිඤ්ච පහරිත්වා (පොළොවට ද ගසා) ‘‘සුසූ’’ති (සූ සූ යැයි) තික්ඛත්තුං සද්දං කත්වා (තුන්සැරයක් සද්දකර) වාළමිගෙ පලාපෙති (නපුරු වල්සතුන් පලවාහරියි) සුනඛො-පි (බල්ලා-ත්) තෙන සද්ධිං ගච්ඡති (ඔහු සමග යයි)

☞ ගොපල්ලාත් දිනපතා දෙවාරයක් පසේබුදුන්ට උපස්ථානකිරීමට යයි. යන අතරේ ද අතරමග නපුරු වල්සතුන් සිටින තැන්වල ලීයකින් ගස්වලට ද පොළොවට ද ගසා “සූ සූ” යැයි තුන්සැරයක් සද්දකර නපුරු වල්සතුන් පලවාහරියි. බල්ලාත් ඔහු සමග යයි.

• සො එකදිවසං පච්චෙකබුද්ධං ආහ – ‘‘භන්තෙ, යදා මෙ ඔකාසො න භවිස්සති, තදා ඉමං සුනඛං පෙසෙස්සාමි, තෙන සඤ්ඤාණෙන ආගච්ඡෙය්‍යාථා’’ති. තතො පට්ඨාය අනොකාසදිවසෙ, ‘‘ගච්ඡ, තාත, අය්‍යං ආනෙහී’’ති සුනඛං පෙසෙසි.

★ සො එකදිවසං (ඔහු එකදවසක්) පච්චෙකබුද්ධං ආහ (පසේබුදුන්ට කීය) ‘‘භන්තෙ (ස්වාමීනි) **[මෙහි “යදා හා තදා” එක්ව අර්ථයදේ]** යදා මෙ ඔකාසො න භවිස්සති තදා (මට ඉඩක් නැතිවෙලාවට/ වෙලාවක් නැතිවෙලාවට) ඉමං සුනඛං පෙසෙස්සාමි (මේ බල්ල එවන්නෙමි) තෙන සඤ්ඤාණෙන (ඒ සලකුණෙන්) ආගච්ඡෙය්‍යාථා’’ති (එනුමැනවි යැයි) තතො පට්ඨාය (එතැන් පටන්) අනොකාස-දිවසෙ (ඉඩනැති දවස්වල) ‘‘ගච්ඡ, තාත (පලයං පුතේ) අය්‍යං ආනෙහී’’ති (ආර්යන් වහන්සේ එක්කරගෙන වරෙන් යැයි) සුනඛං පෙසෙසි (බල්ලා යැවීය)

☞ ඔහු එකදවසක් පසේබුදුන්ට කීය, “ස්වාමීණි! මට ඉඩක් නැතිවෙලාවට, මේ බල්ල එවන්නෙමි, ඒ සලකුණෙන් එනුමැනවි” යැයි, එතැන් පටන් ඉඩනැති දවස්වල “පලයං පුතේ ආර්යන් වහන්සේ එක්කරගෙන වරෙන්” යැයි බල්ලා යැවීය.

• සො එකවචනෙනෙව පක්ඛන්දිත්වා සාමිකස්ස ගච්ඡපොථනභූමිපොථනට්ඨානෙ තික්ඛත්තුං භුස්සිත්වා තෙන සද්දෙන වාළමිගානං පලාතභාවං ඤත්වා පාතොව සරීරපටිජග්ගනං කත්වා පණ්ණසාලං පවිසිත්වා නිසින්නස්ස පච්චෙකබුද්ධස්ස වසනට්ඨානං ගන්ත්වා

පණ්ණසාලද්වාරෙ තික්ඛත්තුං භුස්සිත්වා අත්තනො ආගතභාවං ජානාපෙත්වා එකමන්තෙ නිපජ්ජති, පච්චෙකබුද්ධෙ වෙලං සල්ලක්ඛෙත්වා නික්ඛන්තෙ භුස්සන්තො පුරතො ගච්ඡති.

★ සො (ඔහු/ ඌ) [එක-වචනෙන+එව] එකවචනෙනෙව (එක වචනයෙන් ම) පක්ඛන්දිත්වා (පැනගොස්) සාමිකස්ස (ස්වාමියාගේ) [ගච්ඡ-පොථන-භූමි-පොථන+යානෙ] ගච්ඡපොථනභූමිපොථනට්යානෙ (ගස්වලට ගසන පොළොවට ගසන තැන) තික්ඛත්තුං භුස්සිත්වා (තුන්වරක් බුරා) තෙන සද්දෙන (ඒ සද්දයෙන්) වාළමිගානං (දරුණු වනසතුන්) පලාතභාවං ඤත්වා (පලාගියබව දැන) පාතොව (උදෑසනම) සරීරපටිජග්ගනං කත්වා (සිරුර පිළිදැගුම්කර) පණ්ණසාලං පවිසිත්වා (පන්සලට ඇතුලුවී) නිසින්නස්ස පච්චෙකබුද්ධස්ස (හිඳින පසේබුදුන්ගේ) වසනට්යානං ගන්ත්වා (වාසස්ථානයට ගිහින්) පණ්ණසාල-ද්වාරෙ (පන්සලේ දොරකඩ) තික්ඛත්තුං භුස්සිත්වා (තුන්සැරයක් බුරා) අත්තනො ආගතභාවං (තමන් ආබව) ජානාපෙත්වා (දන්වා) එකමන්තෙ නිපජ්ජති (එක්පැත්තක ලගියි) පච්චෙකබුද්ධෙ වෙලං සල්ලක්ඛෙත්වා (පසේබුදුන් වෙලාව සලකා/ බලා) නික්ඛන්තෙ (නික්මෙනකල) භුස්සන්තො පුරතො ගච්ඡති (බුරමින් ඉදිරියෙන් යයි)

☞ ඌ එක වචනයෙන් ම පැනගොස්, ස්වාමියා ගස්වලට ගසන පොළොවට ගසන තැන තුන්වරක් බුරා ඒ සද්දයෙන් දරුණු වනසතුන් පලාගියබව දැන, උදෑසනම සිරුර පිළිදැගුම්කර පන්සලට ඇතුලුවී හිඳින පසේබුදුන්ගේ වාසස්ථානයට ගිහින්, පන්සලේ දොරකඩ තුන්සැරයක් බුරා තමන් ආබව දන්වා, එක්පැත්තක ලගියි. පසේබුදුන් වෙලාව බලා නික්මෙනකල, බුරමින් ඉදිරියෙන් යයි.

• අන්තරන්තරා පච්චෙකබුද්ධො තං වීමංසන්තො අඤ්ඤං මග්ගං පටිපජ්ජති. අථස්ස පුරතො තිරියං ඨත්වා භුස්සිත්වා ඉතරමග්ගමෙව නං ආරොපෙති.

★ අන්තරන්තරා (අතරින් අතර/ අතරින්පතර) පච්චෙකබුද්ධො (පසේබුදුන්) තං(ඌව) වීමංසන්තො (විමසමින්/ පරික්ෂාකරමින්) අඤ්ඤං මග්ගං පටිපජ්ජති (වෙනත් මගකින් යෑම අරඹයි) [අථ+අස්ස] අථස්ස (එවිට ඔහුගේ) පුරතො තිරියං ඨත්වා (ඉදිරියේ හරහට ඉඳ) භුස්සිත්වා (බුරා) [ඉතර-මග්ගං+එව] ඉතරමග්ගමෙව (අනිත් මගට ම) නං (ඔහුව/ උන්වහන්සේව) ආරොපෙති (යොමුකරයි)

☞ අතරින් අතර පසේබුදුන් ඌව පරික්ෂාකරමින් වෙනත් මගකින් යෑම අරඹයි. එවිට උන්වහන්සේගේ ඉදිරියේ හරහට ඉඳ බුරා අනිත් මගට ම උන්වහන්සේව යොමුකරයි.

• අථෙකදිවසං අඤ්ඤං මග්ගං පටිපජ්ජිත්වා තෙන පුරතො තිරියං ඨත්වා වාරියමානොපි අනිවත්තිත්වා පායාසි. සුනඛො තස්ස අනිවත්තනභාවං ඤත්වා නිවාසනකණ්ණෙ ඩංසිත්වා ආකඩ්ඪන්තො ඉතරමග්ගමෙව නං ආරොපෙසි. එවං සො තස්මිං බලවසිනෙහං උප්පාදෙසි.

★ [අථ+එක-දිවසං] අථෙකදිවසං (ඉක්බිති එක් දවසක්) අඤ්ඤං මග්ගං පටිපජ්ජිත්වා (අන් මගකින් ගමන් අරඹා) තෙන (ඌ විසින්) පුරතො තිරියං ඨත්වා (ඉදිරියේ හරහට ඉඳ) වාරියමානො-පි (උත්සහකරන අතරේ ද) අනිවත්තිත්වා පායාසි (නොනැවතී ගියේය) සුනඛො (බල්ල) තස්ස (උන්වහන්සේගේ) අනිවත්තනභාවං ඤත්වා (නො නවතින්බව දැන) නිවාසන-කණ්ණෙ (වස්ත්‍ර කොනින්/ සිව්රු කොනින්) ඩංසිත්වා (හපාගෙන) ආකඩ්ඪන්තො (අදිමින්) [ඉතර-මග්ගං+එව] ඉතරමග්ගමෙව (අනිත් මගට ම) නං (ඔහුව/ උන්වහන්සේව) ආරොපෙසි (යොමුකලේය) එවං (මෙසේ) සො(ඔහු/ඌ) තස්මිං (ඔහු කෙරෙහි/ උන්වහන්සේ කෙරෙහි) බල-වසිනෙහං උප්පාදෙසි (බලවත් ස්නේහයක් ඉපදවීය)

☞ ඉක්බිති එක් දවසක් අන් මගකින් ගමන් අරඹා, ඌ විසින් ඉදිරියේ හරහට ඉඳ උත්සහකරන අතරේ දීත් නොනැවතී ගියේය. බල්ලා උන්වහන්සේගේ නො නවතින්බව දැන, සිව්රු කොනින් හපාගෙන අදිමින් උන්වහන්සේව අනිත් මගට ම යොමුකලේය. මෙසේ ඌ උන්වහන්සේ කෙරෙහි බලවත් ස්නේහයක් ඉපදවීය.

• තතො අපරභාගෙ පච්චෙකබුද්ධස්ස චීවරං ජීරි. අථස්ස ගොපාලකො චීවරවත්ථානි අදාසි. තමෙනං පච්චෙකබුද්ධො ආහ – ''ආවුසො, චීවරං නාම එකකෙන කාතුං දුක්කරං, ථාසුකට්ඨානං ගන්ත්වා කාරෙස්සාමී''ති.

★ තතො අපරභාගෙ (එයින් පසුකාලයකදී) පච්චෙකබුද්ධස්ස චීවරං ජීරි (පසේබුදුන්ගේ සිව්ර දිරාගියේය) [අථ+අස්ස] අථස්ස (එවිට ඔහුට/ උන්වහන්සේට) ගොපාලකො (ගොපල්ලා) චීවර-වත්ථානි අදාසි (සිව්රු රෙද්දක් දුන්නේය) තමෙනං (ඔහුටම) පච්චෙකබුද්ධො ආහ (පසේබුදුන් කීය) ''ආවුසො (ඇවැත්නි) චීවරං නාම (සිව්රක් නම්) එකකෙන (එක්කෙනෙක් විසින්) කාතුං දුක්කරං (කිරීමට දුෂ්කරයි/ සැකසීමට දුෂ්කරයි) ථාසුකට්ඨානං ගන්ත්වා (පහසුතැනකට ගිහින්) කාරෙස්සාමී''ති (කරන්නෙමි/ සකසන්නෙමි යැයි)

☞ එයින් පසුකාලයකදී පසේබුදුන්ගේ සිව්ර දිරාගියේය. එවිට උන්වහන්සේට ගොපල්ලා සිව්රු රෙද්දක් දුන්නේය. පසේබුදුන් ඔහුට කීය, ''ඇවැත්නි! සිව්රක් නම් එක්කෙනෙක් විසින් සැකසීමට දුෂ්කරයි, පහසුතැනකට ගිහින් සකසන්නෙමි'' යැයි

• ''ඉධෙව, භන්තෙ, කරොථා''ති. ''න සක්කා, ආවුසො''ති. ''තෙන හි, භන්තෙ, මා චිරං බහි වසිත්ථා''ති. සුනඛො තෙසං කථං සුණන්තොව අට්ඨාසි, පච්චෙකබුද්ධොපි ''තිට්ඨ, උපාසකා''ති ගොපාලකං නිවත්තාපෙත්වා වෙහාසං අබ්භුග්ගන්ත්වා ගන්ධමාදනාභිමුඛො පායාසි.

★ ''ඉධෙව (මෙහිම) භන්තෙ, කරොථා''ති (ස්වාමීණි සකසන්න) ''න සක්කා, ආවුසො''ති (නො හැකිය ඇවැත්නි) ''තෙන හි, භන්තෙ (එහෙනම් ස්වාමීණි) මා චිරං බහි වසිත්ථා''ති (බොහෝ කාලයක් පිට ඉන්න එපා) සුනඛො තෙසං කථං (බල්ලා ඔවුන්ගේ කථාව) සුණන්තො-ව අට්ඨාසි (අසමින් ම සිටියේය) පච්චෙකබුද්ධො-පි (පසේබුදුන් ද) ''තිට්ඨ, උපාසකා''ති (සිටින්න උපාසක යැයි) ගොපාලකං නිවත්තාපෙත්වා (ගොපල්ලා නවත්වා) වෙහාසං අබ්භුග්ගන්ත්වා (අහසට නැඟී) (ගන්ධමාදන+අභිමුඛො) ගන්ධමාදනාභිමුඛො පායාසි (ගන්ධමාදනයට මුහුණලා ගියේය)

☞ ''ස්වාමීණි මෙහිම සකසන්න'' ''නො හැකිය ඇවැත්නි'' ''එහෙනම් ස්වාමීණි බොහෝ කාලයක් පිට ඉන්න එපා'' බල්ලා ඔවුන්ගේ කථාව අසමින් ම සිටියේය. පසේබුදුන් ද ''උපාසකමහත්තය ඉන්න'' යැයි ගොපල්ලා නවත්වා අහසට නැඟී ගන්ධමාදනයට මුහුණලා ගියේය.

• සුනඛස්ස තං ආකාසෙන ගච්ඡන්තං දිස්වා භුක්කරිත්වා ඨිතස්ස තස්මිං චක්ඛුපථං විජහන්තෙ හදයං එලිත්වා මතො. තිරච්ඡානා කිර නාමෙතෙ උජුජාතිකා හොන්ති අකුටිලා. මනුස්සා පන අඤ්ඤං හදයෙන චින්තෙන්ති, අඤ්ඤං මුඛෙන කථෙන්ති.

★ සුනඛස්ස (බල්ලාගේ) තං (ඔහු/උන්වහන්සේ) ආකාසෙන ගච්ඡන්තං දිස්වා (අහසින් යනවා දැක) භුක්කරිත්වා ඨිතස්ස (බුරා සිටින) තස්මිං (උන්වහන්සේ) චක්ඛුපථං (ඇස්මානයෙන්) විජහන්තෙ (නොපෙනීයනකල/ ඉවත්වනකල) හදයං එලිත්වා මතො (හදවත පැලී මැරුණි) තිරච්ඡානා කිර (තිරිසන් සතුන්වන) [නාම+එතෙ] නාමෙතෙ (මොවුන් නම්)

උජුජාතිකා හොන්ති (ඍජු ගතිඇත්තෝය) අකුටිලා (අවංකය) මනුස්සා පන (මිනිසුන් වනාහි) අඤ්ඤං හදයෙන චින්තෙන්ති (අනෙකක් හදවතින් සිතති) අඤ්ඤං මුඛෙන කථෙන්ති (අනෙකක් මුවෙන් කියති)

☞ උන්වහන්සේ අහසින් යනවා දැක බුරා සිටින බල්ලාගේ ඇස්මානයෙන් උන්වහන්සේ නොපෙනීයනකල, ඌ හදවත පැලී මැරුණි. තිරිසන් සතුන්වන මොවුන් නම් ඍජු ගතිඇත්තෝය අවංකය. මිනිසුන් වනාහි අනෙකක් හදවතින් සිතති වෙනෙකක් මුවෙන් කියති.

• ඉති සො තාය උජුචිත්තතාය අකුටිලතාය කාලං කත්වා තාවතිංසභවනෙ නිබ්බත්තො අච්ඡරාසහස්සපරිවුතො මහාසම්පත්තිං අනුභොසි.

★ ඉති සො (මෙසේ ඔහු/ඌ) තාය උජුචිත්තතාය (ඒ ඍජුසිත නිසා) අකුටිලතාය (අවංකනිසා) කාලං කත්වා (මැරී) තාවතිංසභවනෙ නිබ්බත්තො (තව්තිසාභවනේ ඉපිද) අච්ඡරා-සහස්ස-පරිවුතො (දෙවඟනන් දහසක් පිරිවාරාගෙන) මහාසම්පත්තිං අනුභොසි (මහාසම්පත් විඳ්දේය)

☞ මෙසේ ඌ ඒ ඍජුසිත නිසා අවංකකම නිසා මැරී තව්තිසාභවනේ ඉපිද දෙවඟනන් දහසක් පිරිවාරාගෙන මහාසම්පත් විඳ්දේය.

• තස්ස කණ්ණමූලෙ මන්තයන්තස්ස සද්දො සොළසයොජනට්ඨානං එරති, පකතිකථාසද්දො පන සකලං දසයොජනසහස්සං දෙවනගරං ඡාදෙති. තෙනෙවස්ස ‘‘සොසකදෙවපුත්තො’’ති නාමං අහොසි.

★ තස්ස (ඔහුගේ) කණ්ණ-මූලෙ (කණමුල) මන්තයන්තස්ස (කථාකරන්න) සද්දො (සද්දය) සොළස-යොජනට්ඨානං එරති (යොදුන් දහසයක් තැන පැතිරෙයි) පකති-කථා-සද්දො පන (සාමාන්‍ය කථා සද්දය වනාහි) සකලං (සියලු/ මුලු) දස-යොජන-සහස්සං (යොදුන් දසදහස්) දෙවනගරං ඡාදෙති (දෙව්නගරය වසාලයි) [තෙන+එව+අස්ස] තෙනෙවස්ස (එයින්ම ඔහුට) ‘‘සොසකදෙවපුත්තො’’ති නාමං අහොසි (සෝසකදේවපුත්‍රය යැයි නමක් විය)

☞ කණමුල කථාකරන්න ඔහුගේ සද්දය යොදුන් දහසයක් තැන පැතිරෙයි. සාමාන්‍ය කථා සද්දය වනාහි යොදුන් දසදහස් දෙව්නගරය වසාලයි. එයින්ම ඔහුට ‘‘සෝසකදේවපුත්‍රය’’ යැයි නමක් විය

• ‘‘කිස්ස පනෙස නිස්සන්දො’’ති. පච්චෙකබුද්ධෙ පෙමෙන භුක්කරණස්ස නිස්සන්දො. සො තත්ථ න චිරං ඨත්වා චවි. දෙවලොකතො හි දෙවපුත්තා ආයුක්ඛයෙන පුඤ්ඤක්ඛයෙන ආහාරක්ඛයෙන කොපෙනාති චතූහි කාරණෙහි චවන්ති.

★ ‘‘කිස්ස (කාගේ/ කුමක) [පන+එස] පනෙස (එය වනාහි) නිස්සන්දො’’ති (විපාකයක් ද/ ප්‍රතිඵලයක්ද යත්) පච්චෙකබුද්ධෙ පෙමෙන (පසේබුදුන් කෙරෙහි ප්‍රේමයෙන්) භුක්කරණස්ස නිස්සන්දො (බුරන්නාගේ විපාකයක් / ප්‍රතිඵලයක්) සො තත්ථ (ඔහු එහි) න චිරං ඨත්වා චවි (බොහෝකලක් නොසිට චුතවිය) දෙවලොකතො හි දෙවපුත්තා (දෙව්ලොවින් වනාහි දෙව්පුත්‍රයෝ) ආයුක්ඛයෙන (ආයුෂ අවසන්වීමෙන්) පුඤ්ඤක්ඛයෙන (පින් අවසන්වීමෙන්) ආහාරක්ඛයෙන (ආහාර අවසන්වීමෙන්) [කොපෙන+ඉති] කොපෙනාති (කෝපයෙන් යැයි) චතූහි කාරණෙහි චවන්ති (සතර කාරණයකින් චුතවෙති)

☞ එය වනාහි කුමක විපාකයක් ද යත් පසේබුදුන් කෙරෙහි ප්‍රේමයෙන් බිරීමෙහි විපාකයක්ය. ඔහු එහි බොහෝකලක් නොසිට චුතවිය. දෙව්ලොවින් දෙව්පුත්‍රයෝ වනාහි ආයුෂ

අවසන්වීමෙන් පින් අවසන්වීමෙන් ආහාර අවසන්වීමෙන් කෝපයෙන් යැයි සතර කාරණයකින් චුතවෙති.

• තත්ථ යෙන බහුං පුඤ්ඤකම්මං කතං හොති, සො දෙවලොකෙ උප්පජ්ජිත්වා යාවතායුකං ඨත්වා උපරූපරි නිබ්බත්තති. එවං ආයුක්ඛයෙනවවති නාම.

★ තත්ථ යෙන (එහි යමෙක් විසින්) බහුං පුඤ්ඤකම්මං (බොහෝ පුණ්‍යක්‍රියා) කතං හොති (කරනලද වේද) සො දෙවලොකෙ උප්පජ්ජිත්වා (ඔහු දෙව්ලොව ඉපිද) යාවතායුකං ඨත්වා (ආයු තියෙනතාක් ඉඳ) උපරූපරි නිබ්බත්තති (මතුමත්තෙහි උපදිති) එවං ආයුක්ඛයෙන-වවති නාම (මෙසේ ආයුෂ ගෙවීයාමෙන් චුතවේ නම්ය)

☞ එහි යමෙක් විසින් බොහෝ පුණ්‍යක්‍රියා කරනලද වේද, ඔහු දෙව්ලොව ඉපිද ආයු තියෙනතාක් ඉඳ, මතුමත්තෙහි උපදිති. මෙය ආයුෂ ගෙවීයාමෙන් චුතවීම නම්වේ.

• යෙන පරිත්තං පුඤ්ඤං කතං හොති, තස්ස රාජකොට්ඨාගාරෙ පක්ඛිත්තං තිචතුනාළිමත්තං ධඤ්ඤං විය අන්තරාව තං පුඤ්ඤංඛීයති, අන්තරාව කාලං කරොති. එවං පුඤ්ඤක්ඛයෙන වවති නාම.

★ යෙන පරිත්තං පුඤ්ඤං (යමෙක් විසින් සුළුපිනක්) කතං හොති (කරනලද වේද) තස්ස (ඔහුගේ) රාජ-කොට්ඨාගාරෙ (රජදෙර ගබඩාවේ) පක්ඛිත්තං (දමනලද) ති-චතු-නාළි-මත්තං (තුන් සතර නැලියක් පමණ) ධඤ්ඤං විය (ධාන්‍ය මෙන්) අන්තරාව (අතරමගදීම) තං පුඤ්ඤං ඛීයති (ඒ පින ගෙවෙයි) අන්තරා-ව (අතරමගදී ම) කාලං කරොති (මරණයට පත්වේ) එවං පුඤ්ඤක්ඛයෙන වවති නාම (මෙසේ පින් ගෙවීයාමෙන් චුතවේ නම්ය)

☞ යමෙක් විසින් සුළුපිනක් කරනලද වේද, ඔහුගේ ඒ පින, රජදෙර ගබඩාවේ දමනලද තුන්-සතර නැලියක් පමණ ධාන්‍ය මෙන්, ගෙවෙයි. අතරමගදී ම මරණයට පත්වේ. මෙය පින් ගෙවීයාමෙන් චුතවීම නම්වේ.

• අපරොපි කාමගුණෙ පරිභුඤ්ජමානො සතිසම්මොසෙන ආහාරං අපරිභුඤ්ජිත්වා කිලන්තකායො කාලං කරොති. එවං ආහාරක්ඛයෙන වවති නාම. අපරොපි පරස්ස සම්පත්තිං අසහන්තො කුජ්ඣිත්වා කාලං කරොති. එවං කොපෙන වවති නාම.

★ අපරො-පි (තවකෙනෙක් ද) කාමගුණෙ පරිභුඤ්ජමානො (කාමයන් විඳිමින්) සති-සම්මොසෙන (සිහිමුලාවී/ අමතකවී) ආහාරං අපරිභුඤ්ජිත්වා (කෑම නොකා) කිලන්තකායො (ක්ලාන්තවී) කාලං කරොති (මරණයට පත්වේ) එවං ආහාරක්ඛයෙන වවති නාම (මෙසේ ආහාර අවස්වීමෙන් චුතවීම නම්ය) අපරො-පි (තවකෙනෙක් ද) පරස්ස සම්පත්තිං (අනුන්ගේ සැපසම්පත්) අසහන්තො (නොඉවසා/ ඉවසාගත නොහැකිව) කුජ්ඣිත්වා කාලං කරොති (කිපී මරණයට පත්වේ) එවං කොපෙන වවති නාම (මෙසේ කෝපයෙන් චුතවේ නම්ය)

☞ තවකෙනෙක් කාමයන් විඳිමින් අමතකවී කෑම නොකා ක්ලාන්තවී මරණයට පත්වේ. මෙය ආහාර අවසන්වීමෙන් චුතවීම නම්වේ. තවකෙනෙක් ද අනුන්ගේ සැපසම්පත් ඉවසාගත නොහැකිව කිපී මරණයට පත්වේ. මෙය කෝපයෙන් චුතවීම නම්වේ.

• අයං පන කාමගුණෙ පරිභුඤ්ජන්තො මුට්ඨස්සති හුත්වා ආහාරක්ඛයෙන වවි, වවිත්වා ච පන කොසම්බියං නගරසොභිනියා කුච්ඡිම්හි පටිසන්ධිං ගණ්හි.

★ අයං පන (මොහු වනාහි) කාමගුණෙ පරිභුඤ්ජන්තො (කාමසම්පත් විඳින අතරේ) මුට්ඨස්සති හුත්වා (අමතකවී) ආහාරක්ඛයෙන වවි (ආහාර නැතිවීයාමෙන් චුතවිය) වවිත්වා ච පන (චුතවී ද වනාහි) කොසම්බියං (කොසබෑවෙහි) නගරසොහිනියා කුච්ඡිම්හි (නගරසෝභනියගේ කුසෙහි) පටිසන්ධිං ගණ්හි (පිළිසිඳ ගත්තේය)

☞ මොහු වනාහි කාමසම්පත් විඳින අතරේ අමතකවී ආහාර නැතිවීයාමෙන් චුතවිය. චුතවී ද කොසබෑවෙහි නගරසෝභනියගේ කුසෙහි පිළිසිඳ ගත්තේය.

• සාපි ජාතදිවසෙ ''කිං එත''න්ති දාසිං පුච්ඡිත්වා, ''පුත්තො, අය්‍යෝ''ති වුත්තෙ – ''හන්ද, ජෙ, ඉමං දාරකං කත්තරසුප්පෙ ආරොපෙත්වා සඞ්කාරකූටෙ ඡඩ්ඩෙහී''ති ඡඩ්ඩාපෙසි. ඉදං තං පඨමවාරඡඩ්ඩනං

★ සා-පි (ඇය ද) ජාත-දිවසෙ (උපන් දවසේ) ''කිං [එතං+ඉති] එත''න්ති (මොහු කවරෙක්ද යැයි) දාසිං පුච්ඡිත්වා (දාසියගෙන් අසා) ''පුත්තො, අය්‍යෝ''ති වුත්තෙ (පුතෙකි ආර්යාවනි යැයි කයුකල) ''හන්ද, ජෙ (එහෙනම් කෙල්ලෙ) ඉමං දාරකං (මේ දරුවා) කත්තරසුප්පෙ ආරොපෙත්වා (පරණකුල්ලක දමා) සඞ්කාරකූටෙ (කුනුගොඩට / කසලගොඩට) ඡඩ්ඩෙහී''ති (දමන්න/ ගිහින් දාන්න යැයි) ඡඩ්ඩාපෙසි (දම්මවාලිය/ ඉවත්කරලිය) ඉදං තං පඨමවාරඡඩ්ඩනං (මේ ඔහුව පළමු වරට ඉවතදැමීමයි)

☞ ඇය ද උපන් දවසේ ''මොහු කවරෙක්ද'' යැයි දාසියගෙන් අසා, ''පුතෙකි, ආර්යාවනි'' යැයි කයුකල, ''එහෙනම් කෙල්ලෙ මේ දරුවා පරණකුල්ලක දමා කුනුගොඩට ගිහින් දාන්න'' යැයි කියා ඉවත්කරලිය. මේ ඔහුව පළමු වරට ඉවතදැමීමයි.

• නගරසොහිනියො හි ධීතරං පටිජග්ගන්ති, න පුත්තං. ධීතරා හි තාසං පවෙණී සටීයති. දාරකං කාකාපි සුනඛාපි පරිවාරෙත්වා නිසීදිංසු. පච්චෙකබුද්ධෙ සිනෙහප්පහවස්ස භුක්කරණස්ස නිස්සන්දෙන එකොපි උපගන්තුං න විසහි.

★ නගරසොහිනියො හි (නගරසෝභනියෝ වනාහි) ධීතරං පටිජග්ගන්ති (දුව පෝෂණයකරති) න පුත්තං (පුතාව නොකරයි) ධීතරා හි (දුව වනාහි) තාසං (ඇලාගේ) පවෙණී සටීයති (පරම්පරාව ගෙනයයි) දාරකං (දරුවාව) කාකා-පි සුනඛා-පි (කාක්කන් ද බල්ලන් ද) පරිවාරෙත්වා නිසීදිංසු (වටකරගෙන හිඳියාහ/ සිටියාහ) පච්චෙකබුද්ධෙ (පසේබුදුන්කෙරෙහි) [සිනෙහ+පහවස්ස] සිනෙහප්පහවස්ස (උපන්නාවූ සෙනෙහසින්) භුක්කරණස්ස නිස්සන්දෙන (කරනලද බිරීමෙහි විපාකයෙන්) එකො-පි (එකෙකුටවත්) උපගන්තුං න විසහි (ලංවිමට නොහැකිවිය)

☞ නගරසෝභනියෝ වනාහි දුව පෝෂණයකරති, පුතාව නොකරති. දුව වනාහි ඇලාගේ පරම්පරාව ගෙනයයි. දරුවාව කාක්කන් ද බල්ලන් ද වටකරගෙන සිටියාහ. පසේබුදුන්කෙරෙහි උපන්නාවූ සෙනෙහසින් කරනලද බිරීමෙහි විපාකයෙන් එකෙකුටවත් ලංවිමට නොහැකිවිය.

• තස්මිං ඛණෙ එකො මනුස්සො බහි නික්ඛන්තො තං කාකසුනඛසන්නිපාතං දිස්වා, ''කිං නු ඛො එත''න්ති ගන්ත්වා දාරකං දිස්වා පුත්තසිනෙහං පටිලභිත්වා ''පුත්තො මෙ ලද්ධො''ති ගෙහං නෙසි.

★ තස්මිං ඛණෙ (ඒ වෙලාවේ) එකො මනුස්සො (එක් මිනිසෙක්) බහි නික්ඛන්තො (පිටතට යමින්/ යනගමන්) තං කාක-සුනඛ-සන්නිපාතං දිස්වා (ඒ කවුඩන් බල්ලන්ගේ එකතුවිම දැක)

''කිං නු ඛො එත''න්ති [එතං+ඉති] (මේ මොකක්ද යැයි) ගන්ත්වා දාරකං දිස්වා (ගොස් දරුවා දැක) පුත්තසිනෙහං පටිලභිත්වා (පුත්‍ර සෙනෙහස ඇතිවී) ''පුත්තො මෙ ලද්ධො''ති (මට පුතෙක් ලැබුනේය යැයි) ගෙහං නෙසි (ගෙදරට ගෙනගියේය)

☞ ඒ වෙලාවේ එක් මිනිසෙක් පිටතට යනගමන්, ඒ කව්ඩන් බල්ලන්ගේ එකතුවීම දැක ''මේ මොකක්ද'' යැයි ගොස් දරුවා දැක පුත්‍ර සෙනෙහස ඇතිවී ''මට පුතෙක් ලැබුනේය'' යැයි ගෙදරට ගෙනගියේය.

• තදා කොසම්බකසෙට්ඨී රාජකුලං ගච්ඡන්තො රාජනිවෙසනතො ආගච්ඡන්තං පුරොහිතං දිස්වා, ''කිං, ආචරිය, අජ්ජ තෙ තිථිකරණනක්ඛත්තයොගො ඔලොකිතො''ති පුච්ඡි.

★ තදා කොසම්බකසෙට්ඨී (එකල/ එදින කෝසම්බික සිටු) රාජකුලං ගච්ඡන්තො (රජගෙදරට යනඅතරේ) රාජනිවෙසනතො ආගච්ඡන්තං (රජගෙදරින් එන) පුරොහිතං දිස්වා (පුරෝහිත දැක) ''කිං, ආචරිය (කොහොමද ඇදුරුතුමනි!) අජ්ජ තෙ (අද ඔබ) තිථිකරණ-නක්ඛත්ත-යොගො (තිථියට අනුව නැකත් යෝග) ඔලොකිතො''ති පුච්ඡි (බැලුවේද යැයි ඇසීය)

☞ එදින කෝසම්බික සිටු රජගෙදරට යනඅතරේ, රජගෙදරින් එන පුරෝහිත දැක, ''කොහොමද ඇදුරුතුමනි! අද ඔබ තිථියට අනුව නැකත් යෝග බැලුවේද'' යැයි ඇසීය.

• ''ආම, මහාසෙට්ඨී, අම්හාකං කිං අඤ්ඤං කිච්චන්ති? ජනපදස්ස කිං භවිස්සති''ති? ''අඤ්ඤං නත්ථි, ඉමස්මිං පන නගරෙ අජ්ජ ජාතදාරකො ජෙට්ඨකසෙට්ඨී භවිස්සති''ති.

★ ''ආම, මහාසෙට්ඨී (ඔව් සිටුතුමනි) අම්හාකං කිං අඤ්ඤං කිච්චන්ති? (අපට මොකටද අනිත්අයගේ වැඩ) ජනපදස්ස කිං භවිස්සති''ති? (රටට මොකක් වෙයිද ?) ''අඤ්ඤං නත්ථි (වෙනෙකක් නෑ/ මොකවත් නෑ) ඉමස්මිං පන නගරෙ (මේ නගරයේ වනාහි) අජ්ජ ජාත-දාරකො (අද උපන් දරුවා) ජෙට්ඨක-සෙට්ඨී භවිස්සති''ති (ජේෂ්ඨ සිටු වන්නේය/ වෙනව)

☞ ''ඔව් සිටුතුමනි'' ''අපට මොකටද අනිත්අයගේ වැඩ, රටට මොකක් වෙයිද ?'' ''මොකවත් නෑ, මේ නගරයේ අද උපන් දරුවා ජේෂ්ඨ සිටු වෙනව''

• තදා සෙට්ඨිනො භරියා ගරුගබ්භා හොති. තස්මා සො සීඝං ගෙහං පුරිසං පෙසෙසි – ''ගච්ඡ භණෙ, ජානාහි නං විජාතා වා, නො වා''ති. ''න විජායති''ති සුත්වා රාජානං දිස්වා වෙගෙන ගෙහං ගන්ත්වා කාළිං නාම දාසිං පක්කොසිත්වා සහස්සං දත්වා, ''ගච්ඡ ජෙ, ඉමස්මිං නගරෙ උපධාරෙත්වා සහස්සං දත්වා අජ්ජ ජාතදාරකං ගණ්හිත්වා එහී''ති.

★ තදා සෙට්ඨිනො භරියා (එකල සිටුගේ බිරිඳ) ගරුගබ්භා හොති (ගැබ්බර විය) තස්මා සො (එබැවින් ඔහු) සීඝං ගෙහං (වහා ගෙදරට) පුරිසං පෙසෙසි (පුරුෂයෙක්/ මිනිසෙක් යැවිය) ''ගච්ඡ භණෙ (යන්න පුතේ/ පලයං පුතේ) ජානාහි (දැනගන්න/ දැනගෙන එන්න) නං (ඇය) විජාතා වා, නො වා''ති (වැදුවාද නැද්ද යැයි) ''න විජායති''ති සුත්වා (නො වැදුවේය/ වැදුවෙ නෑ යැයි අසා) රාජානං දිස්වා (රජු බැහැදැක) වෙගෙන ගෙහං ගන්ත්වා (වේගයෙන් ගෙදරට ගිහින්) කාළිං නාම දාසිං පක්කොසිත්වා (කාලි නම් දාසිය කැඳවා) සහස්සං දත්වා, (දහසක් දි) ''ගච්ඡ ජෙ, (යන්න/ පලයං කෙල්ලෙ) ඉමස්මිං නගරෙ උපධාරෙත්වා (මේ නගරයේ හොයාබලා) සහස්සං දත්වා (දහසක් දී) අජ්ජ ජාත-දාරකං (අද උපන් දරුවා) ගණ්හිත්වා එහී''ති (ඇරගෙන එන්න යැයි)

☞ එකල සිටුගේ බිරිඳ ගැබ්බර විය. එබැවින් ඔහු වහා ගෙදරට මිනිසෙක් යැවිය. ‘‘යන්න පුතේ, දැනගෙන එන්න ඇය වැදුවාද නැද්ද කියල’’ ‘‘වැදුවේ නෑ’’ යැයි අසා, රජු බැහැදැක වේගයෙන් ගෙදරට ගිහින් කාලි නම් දාසිය කැදවා දහසක් දි ‘‘පලයං කෙල්ලෙ, මේ නගරයේ හොයාබලා දහසක් දී අද උපන් දරුවා ඇරගෙන එන්න’’ යැයි කිය.

• සා උපධාරෙන්තී තං ගෙහං ගන්ත්වා දාරකං දිස්වා, ‘‘අයං දාරකො කදා ජාතො’’ති ගහපතානිං පුච්ඡිත්වා ‘‘අජ්ජ ජාතො’’ති වුත්තෙ, ‘‘ඉමං මය්හං දෙහී’’ති එකකහාපණං ආදිං කත්වා මූලං වඩ්ඪෙන්තී සහස්සං දත්වා තං ආනෙත්වා සෙට්ඨිනො දස්සෙසි.

★ සා උපධාරෙන්තී (ඇය සොයාබලමින්) තං ගෙහං ගන්ත්වා (ඒ ගෙදරට ගිහින්) දාරකං දිස්වා (දරුවා දැක) ‘‘අයං දාරකො (මේ දරුවා) කදා ජාතො’’ති (කවදා උපන්නේද යැයි) ගහපතානිං පුච්ඡිත්වා (ගෘහනියගෙන් අසා) ‘‘අජ්ජ ජාතො’’ති වුත්තෙ (අද උපන්නේය යැයි කියූකල) ‘‘ඉමං මය්හං දෙහී’’ති (මොහු මට දෙන්න යැයි) එක-කහාපණං ආදිං කත්වා (එක කහවණුවක් මුල්කරගෙන/ එක කහවණුවෙන් පටන්ගෙන) මූලං වඩ්ඪෙන්තී (මිල වැඩිකරමින්) සහස්සං දත්වා (දහසක් දී) තං ආනෙත්වා (ඔහුව ගෙනවිත්) සෙට්ඨිනො දස්සෙසි (සිටානන්ට දුන්නේය)

☞ ඇය සොයාබලමින් ඒ ගෙදරට ගිහින් දරුවා දැක ‘‘මේ දරුවා කවදා උපන්නේද’’ යැයි ගෘහනියගෙන් අසා ‘‘අද උපන්නෙ’’ යැයි කියූකල ‘‘මොහු මට දෙන්න’’ යැයි එක කහවණුවෙන් පටන්ගෙන මිල වැඩිකරමින් දහසක් දී ඔහුව ගෙනවිත් සිටානන්ට දුන්නේය.

• සෙට්ඨී ‘‘සචෙ මෙ ධීතා විජායිස්සති, තාය නං සද්ධිං නිවෙසෙත්වා සෙට්ඨිට්ඨානස්ස සාමිකං කරිස්සාමි. සචෙ මෙ පුත්තො විජායිස්සති, මාරෙස්සාමි න’’න්ති චින්තෙත්වා තං ගෙහෙ කාරෙසි. අථස්ස භරියා කතිපාහච්චයෙන පුත්තං විජායි.

★ සෙට්ඨී (සිටානන්) ‘‘සචෙ මෙ (ඉඳින් මට) ධීතා විජායිස්සති (දුවක් ඉපදුනොත්/ ලැබුනොත්/ බිහිකරයිනම්) තාය නං සද්ධිං (ඇය මොහු සමග) නිවෙසෙත්වා (වාසයකරවා) සෙට්ඨිට්ඨානස්ස සාමිකං කරිස්සාමි (සිටුතනතුරට ස්වාමියා කරමි) සචෙ මෙ (ඉඳින් මට) පුත්තො විජායිස්සති (පුතෙක් ඉපදුනොත්/ ලැබුනොත්/ බිහිකරයිනම්) මාරෙස්සාමි (මරන්නෙමි) [නං+ඉති] න’’න්ති (මොහු යැයි) චින්තෙත්වා (සිතා) තං ගෙහෙ කාරෙසි (ඔහුව ගෙදරට ගත්තේය) අථස්ස භරියා (ඉක්බිති ඔහුගේ බිරිඳ) කතිපාහච්චයෙන (දිනකීපයක් ඇවෑමෙන්) පුත්තං විජායි (පුතෙක් බිහිකලේය)

☞ සිටානන් ‘‘ඉඳින් මට දුවක් ඉපදුනොත්, ඇය මොහු සමග වාසයකරවා සිටුතනතුරට ස්වාමියා කරමි, ඉඳින් මට පුතෙක් ඉපදුනොත්, මොහු මරන්නෙමි’’ යැයි සිතා ඔහුව ගෙදරට ගත්තේය. ඉක්බිති ඔහුගේ බිරිඳ දිනකීපයක් ඇවෑමෙන් පුතෙක් බිහිකලේය.

• සෙට්ඨී ‘‘ඉමස්මිං අසති මම පුත්තොව සෙට්ඨිට්ඨානං ලභිස්සති, ඉදානෙව තං මාරෙතුං වට්ටතී’’ති චින්තෙත්වා කාළිං ආමන්තෙත්වා, ‘‘ගච්ඡ, ජෙ, වජතො ගුන්නං නික්ඛමනවෙලාය වජද්වාරමජ්ඣෙ ඉමං තිරියං නිපජ්ජාපෙහි, ගාවියො නං මද්දිත්වා මාරෙස්සන්ති, මද්දිතාමද්දිතභාවං පනස්ස ඤත්වා එහී’’ති ආහ. ඉදං තං දුතියවාරඡඩ්ඩනං.

★ සෙට්ඨී (සිටානන්) ‘‘ඉමස්මිං අසති (මොහු නැතිකල) මම පුත්තො-ව (මගේ පුතා ම) සෙට්ඨිට්ඨානං ලභිස්සති (සිටුතනතුර ලබන්නේය) [ඉදානි+එව] ඉදානෙව (දැන්ම) තං මාරෙතුං වට්ටතී’’ති (මොහු මරන්න සුදුසුය යැයි) චින්තෙත්වා (සිතා) කාළිං ආමන්තෙත්වා (කාලිට අමතා) ‘‘ගච්ඡ, ජෙ (පලයන් කෙල්ලෙ) වජතො ගුන්නං (ගාලෙන් ගොනුන්)

නික්ඛමන-වෙලාය (නික්මෙන වෙලාවේ) වජ-ද්වාර-මජ්ඣෙ (ගාලේ දොර මැද) ඉමං තිරියං නිපජ්ජාපෙහි (මොහුව හරහට නිදිකරවන්න) ගාවියෝ නං (දෙනුන් මොහුව) මද්දිත්වා (පාගා/ පොඩිකර) මාරෙස්සන්ති (මරන්නෝය/ මරයි) [මද්දිත+අමද්දිත-භාවං] මද්දිතාමද්දිතභාවං (පෑගූ නොපෑගූ බව/ පොඩිකල නොකල බව) [පන+අස්ස] පනස්ස (ඔහුගේ වනාහි) ඤත්වා එහි''ති ආහ (දැන එන්න යැයි කීය) ඉදං තං දුතියවාරඡඩ්ඩනං (මේ ඔහුව දෙවන වරට ඉවතදැමීමයි)

☞ සිටානන් ''මොහු නැතිකල මගේ පුතා ම සිටුතනතුර ලබන්නේය, දැන්ම මොහු මරන්න සුදුසුය'' යැයි සිතා කාලිට අමතා ''පලයන් කෙල්ලෙ, ගාලෙන් ගොනුන් නික්මෙන වෙලාවේ, ගාලේ දොර මැද මොහුව හරහට නිදිකරවන්න, දෙනුන් මොහුව පාගා පොඩිකර මරයි, ඔහුව පෑගූ නොපෑගූ බව දැන එන්න'' යැයි කීය. මේ ඔහුව දෙවන වරට ඉවතදැමීමයි

• සා ගන්ත්වා ගොපාලකෙන වජද්වාරෙ විවටමත්තෙයෙව තං තථා නිපජ්ජාපෙසි. ගොගණජෙට්ඨකො උසභො අඤ්ඤස්මිං කාලෙ සබ්බපච්ඡා නික්ඛමන්තොපි තං දිවසං සබ්බපඨමං නික්ඛමිත්වා දාරකං වතූන්නං පාදානං අන්තරෙ කත්වා අට්ඨාසි. අනෙකසතගාවියො උසභස්ස ද්වෙ පස්සානි සංසන්තියො නික්ඛමිංසු.

★ සා ගන්ත්වා (ඇය ගිහින්) ගොපාලකෙන (ගොපල්ලා විසින්) වජ-ද්වාරෙ (ගාල් දොර) විවට-මත්තෙ-යෙව (ඇරි මොහොතේ ම/ ඇරිය පමණින් ම) තං තථා නිපජ්ජාපෙසි (ඔහුව එලෙස නිදිකෙරුවේය) ගො-ගණ-ජෙට්ඨකො උසභො (ගව සමූහයාගේ ප්‍රධාන ගවය) අඤ්ඤස්මිං කාලෙ (අනිත් වෙලාවන්හි/ අනිත් වෙලාවට) සබ්බ-පච්ඡා (සියල්ලට පසුව/ පිටුපසින්) නික්ඛමන්තො-පි (නික්මුණ-ත්) තං දිවසං (ඒ දවසෙ) සබ්බ-පඨමං (සියල්ලට පළමුව) නික්ඛමිත්වා (නික්මී) දාරකං (දරුවාව) චතූන්නං පාදානං (පා සතර) අන්තරෙ කත්වා (අතරට කරගෙන) අට්ඨාසි (සිටියේය) අනෙක-සත-ගාවියො (නොයෙක් සියගනන් දෙනුන්) උසභස්ස (උසභයාගේ/ ප්‍රධාන ගවයාගේ) ද්වෙ පස්සානි (දෙපස) සංසන්තියො (ගටමින්/ හැප්පෙමින්) නික්ඛමිංසු (නික්මුනාහ)

☞ ඇය ගිහින් ගොපල්ලා විසින් ගාල් දොර ඇරි මොහොතේ ම ඔහුව එලෙස නිදිකෙරුවේය. ගව සමූහයාගේ ප්‍රධාන ගවය අනිත් වෙලාවට සියල්ලටම පසුව නික්මුණත්, ඒ දවසෙ සියල්ලට පළමුව නික්මී, දරුවාව පා සතර අතරට කරගෙන සිටියේය. නොයෙක් සියගනන් දෙනුන් ප්‍රධාන ගවයාගේ දෙපස හැප්පෙමින් නික්මුනාහ.

• ගොපාලකොපි ''අයං උසභො පුබ්බෙ සබ්බපච්ඡා නික්ඛමති, අජ්ජ පන සබ්බපඨමං නික්ඛමිත්වා වජද්වාරමජ්ඣෙ නිච්චලොව ඨිතො, කිං නු ඛො එත''න්ති චින්තෙත්වා ගන්ත්වා තස්ස හෙට්ඨා නිපන්නං දාරකං දිස්වා පුත්තසිනෙහං පටිලභිත්වා, ''පුත්තො මෙ ලද්ධො''ති ගෙහං නෙසි.

★ ගොපාලකො-පි (ගොපල්ලා-ත්) ''අයං උසභො (මේ ප්‍රධාන ගවයා) පුබ්බෙ සබ්බපච්ඡා නික්ඛමති (පෙර සියල්ලට පසුව නික්මෙති) අජ්ජ පන (අද වනාහි) සබ්බපඨමං නික්ඛමිත්වා (සියල්ලට පළමුව නික්මී) වජ-ද්වාර-මජ්ඣෙ (ගාල් දොර මැද) නිච්චලො-ව ඨිතො (නිස්ඡලව ම සිටියි) කිං නු ඛො එත''න්ති [එතං+ඉති] (මොකද මේ යැයි) චින්තෙත්වා ගන්ත්වා (සිතා ගොස්) තස්ස (ඔහුගේ/ උෟගේ) හෙට්ඨා (යට) නිපන්නං දාරකං දිස්වා (නිදන දරුවා දැක) පුත්තසිනෙහං පටිලභිත්වා (පුත්‍ර ස්නේහය ලැබ) ''පුත්තො මෙ ලද්ධො''ති (මට පුතෙක් ලැබුනේය/ ලැබුන යැයි) ගෙහං නෙසි (ගෙදරට ගෙනගියේය)

☞ ගොපල්ලාත් ‘‘මේ ප්‍රධාන ගවයා පෙර සියල්ලට පසුව නික්මෙති, අද වනාහි සියල්ලට පළමුව නික්මී, ගාල් දොර මැද නිස්ඡලව ම සිටියි, මොකද මේ’’ යැයි සිතා ගොස් ඌගේ යට නිදන දරුවා දැක පුත්‍ර ස්නේහය ලැබ ‘‘මට පුතෙක් ලැබුන’’ යැයි ගෙදරට ගෙනගියේය.

• කාළී ගන්ත්වා සෙට්ඨිනා පුච්ඡිතා තමත්ථං ආරොචෙත්වා, ‘‘ගච්ඡ, නං පුන සහස්සං දත්වා ආනෙහී’’ති වුත්තා සහස්සං දත්වා පුන ආනෙත්වා අදාසි.

★ කාළී ගන්ත්වා (කාලි ගිහින්) සෙට්ඨිනා පුච්ඡිතා (සිටානන් විමසනලදුව) තමත්ථං (ඒ බව/ සිදුවිම) ආරොචෙත්වා (කියා/ දැනුම්දී) ‘‘ගච්ඡ (යන්න) නං පුන (ඔහුව නැවත) සහස්සං දත්වා (දහසක් දී) ආනෙහී’’ති (ගෙනඑන්න යැයි) වුත්තා (කියනලදුව) සහස්සං දත්වා (දහසක් දී) පුන ආනෙත්වා අදාසි (නැවත ගෙනවිත් දුන්නේය)

☞ කාලි ගිහින් සිටානන් විමසනලදුව සිදුවිම කියා ‘‘යන්න, ඔහුව නැවත දහසක් දී ගෙනඑන්න’’ යැයි කියනලදුව, දහසක් දී නැවත ඔහුව ගෙනවිත් දුන්නේය.

• අථ නං ආහ – ‘‘කාළි ඉමස්මිං නගරෙ පඤ්ච සකටසතානි පච්චූසකාලෙ උට්ඨාය වාණිජ්ජාය ගච්ඡන්ති, ත්වං ඉමං නෙත්වා චක්කමග්ගෙ නිපජ්ජාපෙහි, ගොණා වා නං මද්දිස්සන්ති, චක්කා වා ඡින්දිස්සන්ති, පවත්තිං වස්ස ඤත්වා ආගච්ඡෙය්‍යාසී’’ති. ඉදං තං තතියවාරඡඩ්ඩනං.

★ අථ නං ආහ (ඉන්පසු ඇයට කීය) ‘‘කාළි ඉමස්මිං නගරෙ (කාලි මේ නගරයේ) පඤ්ච සකට-සතානි (පන්සියයක් කරත්ත/ ගැල් පන්සියයක්) පච්චූසකාලෙ උට්ඨාය (අළුයම අවදිවී/ නැගිට) වාණිජ්ජාය ගච්ඡන්ති (වෙළඳාම පිණිස යති) ත්වං (ඔබ/උඹ) ඉමං නෙත්වා (මොහු ගෙනගොස්) චක්ක-මග්ගෙ නිපජ්ජාපෙහි (කරත්ත පාරේ නිදිකරවන්න) ගොණා වා නං මද්දිස්සන්ති (ගොනුන් හෝ මොහුව පාගා පොඩිකරති) චක්කා වා ඡින්දිස්සන්ති (කරත්ත රෝද හෝ සිඳලති) පවත්තිං (සිද්ධිය/ පුවත/ වෙච්චදේ) [ච+අස්ස] වස්ස (මොහුට) ඤත්වා ආගච්ඡෙය්‍යාසී’’ති (දැනගෙන එන්න යැයි) ඉදං තං තතියවාරඡඩ්ඩනං (මේ ඔහුව තෙවන වරට ඉවතදැමීමයි)

☞ ඉන්පසු ඇයට කීය ‘‘කාලි මේ නගරයේ පන්සියයක් කරත්ත අළුයම අවදිවී වෙළඳාම පිණිස යති, ඔබ මොහු ගෙනගොස් කරත්ත පාරේ නිදිකරවන්න, ගොණුන් හෝ මොහුව පාගා පොඩිකරති, කරත්ත රෝද හෝ සිඳලති, මොහුට වෙච්චදේ දැනගෙන එන්න’’ යැයි කීය. මේ ඔහුව තෙවන වරට ඉවතදැමීමයි.

• සා තං නෙත්වා චක්කමග්ගෙ නිපජ්ජාපෙසි. තදා සාකටිකජෙට්ඨකො පුරතො අහොසි. අථස්ස ගොණා තං ඨානං පත්වා ධුරං ඡඩ්ඩෙසුං, පුනප්පුනං ආරොපෙත්වා පාජියමානාපි පුරතො න ගච්ඡිංසු.

★ සා තං නෙත්වා (ඈ ඔහුව ගෙනගොස්) චක්කමග්ගෙ නිපජ්ජාපෙසි (කරත්තපාරේ නිදිකරවාලිය) තදා (එදා/ එකල) සාකටික-ජෙට්ඨකො (ප්‍රධාන ගැල්කරුවා) පුරතො අහොසි (ඉදිරියෙන් විය) [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුගේ) ගොණා තං ඨානං පත්වා (ගොන්නු ඒ තැනට පැමිණ) ධුරං ඡඩ්ඩෙසුං (ධුරය අතහැරියාහ/ ගමන නැවැත්වූහ) පුනප්පුනං ආරොපෙත්වා (නැව නැවත ඔසවා) පාජියමානා-පි (දක්වනකල-ත්) පුරතො න ගච්ඡිංසු (ඉදිරියට නො ගියාහ.)

☞ ඈ ඔහුව ගෙනගොස් කරත්තපාරේ නිදිකරවාලිය. එදා ප්‍රධාන ගැල්කරුවා ඉදිරියෙන් විය. ඉක්බිති ඔහුගේ ගොන්නු ඒ තැනට පැමිණ ගමන නැවැත්වූහ. නැව නැවත ඔසවා දක්වනකලත් ඉදිරියට නො ගියාහ.

• එවං තස්ස තෙහි සද්ධිං වායමන්තස්සෙව අරුණං උට්ඨහි. සො ''කිං නාමෙතං ගොණා කරිංසූ''ති මග්ගං ඔලොකෙන්තො දාරකං දිස්වා, ''භාරියං වත මෙ කම්ම''න්ති චින්තෙත්වා, ''පුත්තො මෙ ලද්ධො''ති තුට්ඨමානසො තං ගෙහං නෙසි.

★ එවං (මෙසේ) තස්ස (ඔහු/ ගැල්කරු) තෙහි (ඔවුන්/ උන්) සද්ධිං (සමග) [වායමන්තස්ස+එව] වායමන්තස්සෙව (උත්සහකරද්දී ම) අරුණං උට්ඨහි (අරුණ නැග්ගේය/ අරුණ උදාවිය) සො (ඔහු) ''කිං නාමෙතං ගොණා කරිංසූ''ති (මොකක්ද මේ ගොන්නු කරන්නෙ යැයි) මග්ගං ඔලොකෙන්තො (පාරදෙස බලද්දී) දාරකං දිස්වා (දරුවා දැක) ''භාරියං වත මෙ කම්ම''න්ති (ඒකාන්තයෙන් මගේ වැඩේ දරුණුයි යැයි) චින්තෙත්වා (සිතා) ''පුත්තො මෙ ලද්ධො''ති (මට පුතෙක් ලැබුනේය යැයි) තුට්ඨ-මානසො (සතුටු සිතින්) තං ගෙහං නෙසි (ඔහුව ගෙදරට ගෙනගියේය)

☞ මෙසේ ගැල්කරු උන් සමග උත්සහකරද්දී ම අරුණ උදාවි. ඔහු ''මොකක්ද මේ ගොන්නු කරන්නෙ'' යැයි පාර දෙස බලද්දී දරුවා දැක ''ඒකාන්තයෙන් මගේ වැඩේ දරුණුයි'' යැයි සිතා ''මට පුතෙක් ලැබුනේය'' යැයි සතුටු සිතින් ඔහුව ගෙදරට ගෙනගියේය.

• කාළී ගන්ත්වා සෙට්ඨිනා පුච්ඡිතා තං පවත්තිං ආචික්ඛිත්වා, ''ගච්ඡ, නං පුන සහස්සං දත්වා ආනෙහී''ති වුත්තා තථා අකාසි. අථ නං සො ආහ

★ කාළී ගන්ත්වා (කාලි ගිහින්) සෙට්ඨිනා පුච්ඡිතා (සිටානන් විමසනලදුව) තං පවත්තිං (ඒ සිදුවිම/ ඒ පුවත) ආචික්ඛිත්වා (කියා) ''ගච්ඡ (යන්න) නං පුන (ඔහුව නැවත) සහස්සං දත්වා (දහසක් දී) ආනෙහී''ති (ගෙනඑන්න යැයි) වුත්තා (කියනලදුව) තථා අකාසි (එසේ කලාය) අථ නං (ඉක්බිති ඇයට) සො ආහ (ඔහු කීය)

☞ කාලි ගිහින්, සිටානන් විමසනලදුව ඒ සිදුවිම කියා ''යන්න, ඔහුව නැවත දහසක් දී ගෙනඑන්න'' යැයි කියනලදුව, එසේ කලාය. ඉක්බිති ඇයට ඔහු කීය.

• ''ඉදානි නං ආමකසුසානං නෙත්වා ගච්ඡන්තරෙ නිපජ්ජාපෙහි, තත්ථ සුනඛාදීහි වා ඛාදිතො, අමනුස්සෙහි වා පහටො මරිස්සති, මතාමතභාවඤ්චස්ස ජානිත්වාව ආගච්ඡෙය්‍යාසී''ති. ඉදං තං චතුත්ථවාරඡඩ්ඩනං

★ ''ඉදානි නං (දැන් මොහු) ආමකසුසානං (අමුසොහොනට) නෙත්වා (ගෙනගොස්) ගච්ඡන්තරෙ (ගස්ගොමු අතරේ) නිපජ්ජාපෙහි (නිදිකරවන්න) තත්ථ (එහිදී) [සුනඛා+ආදීහි] සුනඛාදීහි (බල්ලන් ආදීන් විසින්) වා ඛාදිතො (කනලදුව හෝ/ කෑමෙන් හෝ) අමනුස්සෙහි වා (අමුනුස්සයන් විසින් හෝ) පහටො මරිස්සති (පහරදී මැරෙන්නේය/ මැරෙයි) [මත+අමත-භාවං+ච+අස්ස] මතාමතභාවඤ්චස්ස (මැරුණු නොමුරුණු බවද ඔහුගේ) ජානිත්වාව ආගච්ඡෙය්‍යාසී''ති (දැනගෙන එන්න යැයි) ඉදං තං චතුත්ථවාරඡඩ්ඩනං (මේ ඔහුව සතරවන වරට ඉවතදැමීමයි)

☞ ''දැන් මොහු අමුසොහොනට ගෙනගොස්, ගස්ගොමු අතරේ නිදිකරවන්න, එහිදී බල්ලන් ආදීසතුන් විසින් කෑමෙන් හෝ අමුනුස්සයන් විසින් පහරදී හෝ මැරෙයි, ඔහුගේ මැරුණු නොමුරුණු බවද දැනගෙන එන්න'' යැයි කීය. මේ ඔහුව සතරවන වරට ඉවතදැමීමයි.

• සා තං නෙත්වා තත්ථ නිපජ්ජාපෙත්වා එකමන්තෙ අට්ඨාසි. තං සුනඛො වා කාකො වා අමනුස්සො වා උපසඞ්කමිතුං නාසක්ඛි. ''නනු වස්ස නෙව මාතා න පිතා න භාතිකාදීසු කොචි රක්ඛිතා නාම අත්ථි, කො තං රක්ඛතී''ති? සුනඛකාලෙ පච්චෙකබුද්ධෙ සිනෙහෙන පවත්තිතභුක්කරණමත්තමෙව තං රක්ඛති.

★ සා තං නෙත්වා (ඇය ඔහුව ගෙනගොස්) තත්ථ නිපජ්ජාපෙත්වා (එහි නිදිකරවා) එකමන්තෙ අට්ඨාසි (එක්පැත්තක/ පැත්තකටවී සිටියේය) තං (ඔහු වෙත) සුනඛො වා කාකො වා අමනුස්සො වා (බල්ලෙකුට හෝ කපුටෙකුට හෝ අමනුස්සයෙකුට හෝ) උපසඞ්කමිතුං නාසක්ඛි (ළංවීමට නොහැකිවිය) ''නනු [ච+අස්ස] වස්ස (නොවේද ඔහුගේ) නෙව මාතා (මව නොවේ) න පිතා (පියා නොව්) <u>න</u> [භාතිකා+ආදීසු] භාතිකාදීසු (සහෝදර ආදීන්ගෙන්) කොචි (කිසියම්) රක්ඛිතා නාම අත්ථි (රකින්නෙක් නම් <u>නැත</u>) කො තං රක්ඛතී''ති? (කව්ද ඔහුව රකින්නෙ ?) සුනඛකාලෙ (සුනකයෙක් වශවෙන් සිටි කාලයේ) පච්චෙකබුද්ධෙ සිනෙහෙන (පසේබුදුන් කෙරෙහි සෙනෙහසින්) [පවත්ති-තභුක්කරණ-මත්තං+එව] පවත්තිතභුක්කරණමත්තමෙව (පැවැත්වූ බිරීම් මාත්‍රය ම) තං රක්ඛති (ඔහුව රකියි)

☞ ඇය ඔහුව ගෙනගොස් එහි නිදිකරවා පැත්තකටවී සිටියේය. බල්ලෙකුට හෝ කපුටෙකුට හෝ අමනුස්සයෙකුට හෝ ළංවීමට නොහැකිවිය. ''ඔහුගේ මව හෝ පියා හෝ සහෝදර ආදීන්ගෙන් කිසිවෙක් හෝ ඔහුව නො රකින්නේ නොවේද, කව්ද ඔහුව රකින්නෙ ?'' සුනකයෙක් වශවෙන් සිටි කාලයේ පසේබුදුන් කෙරෙහි සෙනෙහසින් පැවැත්වූ බිරීම් මාත්‍රය ම ඔහුව රකියි.

• අථෙකො අජපාලකො අනෙකසහස්සා අජා ගොචරං නෙන්තො සුසානපස්සෙන ගච්ඡති. එකා අජී පණ්ණානි ඛාදමානා ගච්ඡන්තරං පවිට්ඨා දාරකං දිස්වා ජණ්ණුකෙහි ඨත්වා දාරකස්ස ථනං අදාසි, අජපාලකෙන ''හෙ හෙ''ති සද්දෙ කතෙපි න නික්ඛමි.

★ [අථ+එකො] අථෙකො (ඉක්බිති එක්) අජපාලකො (එළු පාලකයෙක්) අනෙක-සහස්සා අජා (නොයෙක් දහස්ගනන් එළුවන්) ගොචරං (ආහාර පිණිස/ තණ කැවීමට) නෙන්තො (ගෙනයමින්) සුසාන-පස්සෙන ගච්ඡති (සොහොන පැත්තෙන් යයි) එකා අජී (එක් එලිච්චියක්) පණ්ණානි ඛාදමානා (තණ කමින්) ගච්ඡන්තරං පවිට්ඨා (ගස්ගොමුව අතරට ඇතුලුවී) දාරකං දිස්වා (දරුවා දැක) ජණ්ණුකෙහි ඨත්වා (දණහිස්වලින් සිට) දාරකස්ස ථනං අදාසි (දරුවාට තනය දුන්නේය) අජපාලකෙන (එළු පාලකයා විසින්) ''හෙ හෙ''ති (හේ හේ යැයි) සද්දෙ කතෙ-පි (සද්ද කල-ත්) න නික්ඛමි (නොගියේය)

☞ ඉක්බිති එක් එළු පාලකයෙක් නොයෙක් දහස්ගනන් එළුවන් තණ කැවීමට ගෙනයමින් සොහොන පැත්තෙන් යයි. එක් එලිච්චියක් තණ කමින් ගස්ගොමුව අතරට ඇතුලුවී, දරුවා දැක දණහිස්වලින් සිට දරුවාට තනය දුන්නේය. එළු පාලකයා විසින් ''හේ හේ'' යැයි සද්ද කලත් නොගියේය.

• සො ''යට්ඨියා නං පහරිත්වා නීහරිස්සාමී''ති ගච්ඡන්තරං පවිට්ඨො ජණ්ණුකෙහි ඨත්වා දාරකං ඛීරං පායන්තිං අජීං දිස්වා දාරකෙ පුත්තසිනෙහං පටිලභිත්වා, ''පුත්තො මෙ ලද්ධො''ති ආදාය පක්කාමි.

★ සො (ඔහු) ''යට්ඨියා (කෙවිටෙන්) නං පහරිත්වා (ඌට ගසා) නීහරිස්සාමී''ති (එලියට ගන්නෙමි යැයි) ගච්ඡන්තරං පවිට්ඨො (ගස්ගොමුව අතරට ඇතුලුව) ජණ්ණුකෙහි ඨත්වා (දණහිස්වලින් සිට) දාරකං ඛීරං පායන්තිං (දරුවාට කිරි පොවන) අජීං දිස්වා (එලිච්චි දැක)

දාරකෙ (දරුවා කෙරෙහි) පුත්තසිනෙහං පටිලභිත්වා (පුත්‍ර ස්නේහය ලැබ) ''පුත්තො මෙ ලද්ධො''ති (මට පුතෙක් ලැබුනේය යැයි) ආදාය පක්කාමි (ගෙන ගියේය)

☞ ඔහු ''කෙවිටටෙන් ගසා උෆ එලියට ගන්නෙමි'' යැයි ගස්ගොමුව අතරට ඇතුලුව දණහිස්වලින් සිට දරුවාට කිරි පොවන එලිච්චි දැක දරුවා කෙරෙහි පුත්‍ර ස්නේහය ලැබ ''මට පුතෙක් ලැබුනේය'' යැයි ගෙන ගියේය.

• කාළී ගන්ත්වා සෙට්ඨිනා පුච්ඡිතා තං පවත්තිං ආචික්ඛිත්වා, ''ගච්ඡ, තං පුන සහස්සං දත්වා ආනෙහී''ති වුත්තා තථා අකාසි. අථ නං ආහ

★ කාළී ගන්ත්වා (කාලි ගිහින්) සෙට්ඨිනා පුච්ඡිතා (සිටානන් විමසනලදුව) තං පවත්තිං (ඒ සිදුවිම/ ඒ පුවත) ආචික්ඛිත්වා (කියා) ''ගච්ඡ (යන්න) නං පුන (ඔහුව නැවත) සහස්සං දත්වා (දහසක් දී) ආනෙහී''ති (ගෙනඑන්න යැයි) වුත්තා (කියනලදුව) තථා අකාසි (එසේ කලාය) අථ නං (ඉක්බිති ඇයට) සො ආහ (ඔහු කීය)

☞ කාලි ගිහින්, සිටානන් විමසනලදුව ඒ සිදුවිම කියා ''යන්න, ඔහුව නැවත දහසක් දී ගෙනඑන්න'' යැයි කියනලදුව, එසේ කලාය. ඉක්බිති ඇයට ඔහු කීය.

• ''කාළි, ඉමං ආදාය චොරපපාතපබ්බතං අභිරුහිත්වා පපාතෙ ඛිප, පබ්බතකුච්ඡියං පටිහඤ්ඤමානො ඛණ්ඩාඛණ්ඩිකො හුත්වා භූමියං පතිස්සති, මතාමතභාවඤ්චස්ස ඤත්වාව ආගච්ඡෙය්‍යාසී''ති. සා තං තත්ථ නෙත්වා පබ්බතමත්ථකෙ යත්වා ඛිපි. ඉදං තං පඤ්චමවාරඡඩ්ඩනං.

★ ''කාළි, ඉමං ආදාය (කාලි මොහුව අරගෙන) චොරපපාතපබ්බතං (සොරු හෙලන පර්වතයට) අභිරුහිත්වා (නැග) පපාතෙ ඛිප (ප්‍රපාතයට/ පල්ලමට විසිකරන්න) පබ්බත-කුච්ඡියං (පර්වත කුසෙහි) පටිහඤ්ඤමානො (වැදෙමින්) ඛණ්ඩා-ඛණ්ඩිකො හුත්වා (කෑලි කෑලි වී) භූමියං පතිස්සති (පොළොවට වැටෙන්නේය/ වැටෙයි) [මත+අමත-භාවං+ච+අස්ස] මතාමතභාවඤ්චස්ස (මැරුණු නොමැරුණුබව ද ඔහුගේ) ඤත්වා-ව (දැනගෙන ම) ආගච්ඡෙය්‍යාසී''ති (එන්න යැයි) සා තං (ඇය ඔහුව) තත්ථ නෙත්වා (එහි ගෙනගොස්) පබ්බත-මත්ථකෙ යත්වා ඛිපි (පර්වත මුදුන් සිට විසිකලේය) ඉදං තං පඤ්චමවාරඡඩ්ඩනං (මේ ඔහුව පස්වන වරට ඉවතදැමීමයි)

☞ ''කාලි මොහුව අරගෙන සොරු හෙලන පර්වතයට නැග පල්ලමට විසිකරන්න, පර්වත කුසෙහි වැදෙමින් කෑලි කෑලි වී පොළොවට වැටෙයි, ඔහුගේ මැරුණු නොමැරුණුබව ද දැනගෙන ම එන්න'' යැයි කීය. ඇය ඔහුව එහි ගෙනගොස් පර්වත මුදුන් සිට විසිකලේය. මේ ඔහුව පස්වන වරට ඉවතදැමීමයි.

• තං ඛො පන පබ්බතකුච්ඡිං නිස්සාය මහාවෙළුගුම්බො පබ්බතානුසාරෙනෙව වඩ්ඪි, තස්ස මත්ථකං ඝනජාතො ජිඤ්ජුකගුම්බො අවත්ථරි. දාරකො පතන්තො කොජවකෙ විය තස්මිං පති. තං දිවසඤ්ච නළකාරපෙට්ඨකස්ස වෙළුබලි පත්තො හොති.

★ තං ඛො පන පබ්බතකුච්ඡිං (ඒ පර්වත කුස වනාහි) නිස්සාය (ඇසුරුකරගෙන) මහා-වෙළු-ගුම්බො (විශාල උණබට ගොමුවක්) [පබ්බත+අනුසාරෙන+එව] පබ්බතානුසාරෙනෙව (පර්වතය අනුවම) වඩ්ඪි (වැඩිනි) තස්ස මත්ථකං (එහි මුදුන) ඝන-ජාතො (ඝනව වැඩුනු) ජිඤ්ජුක-ගුම්බො (ඔලිඳවැල් ගොමුවක්) අවත්ථරි (වසාගෙන තිබුණි) දාරකො පතන්තො (දරුවා වැටෙමින්/ වැටෙන) කොජවකෙ විය (මෘදු පලසකට මෙන්) තස්මිං පති (එහි/ ඒමත

වැටුනි) තං [දිවසං+ච] දිවසඤ්ච (ඒ දවසේ ද) නළකාර-ජෙට්ඨකස්ස (බටකර්මාන්තයේ යෙදෙන ප්‍රධානියාගේ) වෙළුබලි (බට බලිය/ බට පූජාව) පත්තො හොති (පැමිණියේ වේ/ යෙදීතිබිණි)

☞ ඒ පර්වත කුස ඇසුරුකරගෙන විශාල උණබට ගොමුවක් පර්වතය අනුවම වැඩීතිබුනි. එහි මුදුන සනව වැඩුනු ඔලිඳවැල් ගොමුවකින් වසාගෙන තිබුණි. වැටෙන දරුවා මෘදු පලසකට මෙන් ඒමත වැටුනි. ඒ දවසේ ද බටකර්මාන්තයේ යෙදෙන ප්‍රධානියාගේ බට පූජාව යෙදීතිබිණි.

• සො පුත්තෙන සද්ධිං ගන්ත්වා තං වෙළුගුම්බං ඡින්දිතුං ආරභි. තස්මිං චලන්තෙ දාරකො සද්දමකාසි. සො ‘‘දාරකසද්දො වියා’’ති එකෙන පස්සෙන අභිරුහිත්වා තං දිස්වා, ‘‘පුත්තො මෙ ලද්ධො’’ති තුට්ඨචිත්තො ආදාය ගතො.

★ සො පුත්තෙන සද්ධිං ගන්ත්වා (ඔහු පුතා සමග ගිහින්) තං වෙළුගුම්බං (ඒ උණබට ගොමුව) ඡින්දිතුං ආරභි (කැපීමට පටන්ගත්තේය) තස්මිං චලන්තෙ (එය සෙලවෙන කල) දාරකො (දරුවා) [සද්දං+අකාසි] සද්දමකාසි (සද්දකලේය/ හැඬීය) සො (ඔහු) ‘‘දාරකසද්දො වියා’’ති (දරුවකුගේ සද්දයක් වගේ යැයි) එකෙන පස්සෙන (එක් පැත්තකින්) අභිරුහිත්වා (නැග) තං දිස්වා (ඔහුව/ දරුවාව දැක)‘‘පුත්තො මෙ ලද්ධො’’ති (මට පුතෙක් ලැබුන යැයි) තුට්ඨ-චිත්තො ආදාය ගතො (සතුටුසිතින් ගෙනයනලදී/ ගෙනගියේය)

☞ ඔහු පුතා සමග ගිහින් ඒ උණබට ගොමුව කැපීමට පටන්ගත්තේය. එය සෙලවෙන කල දරුවා හැඬීය. ඔහු ‘‘දරුවකුගේ සද්දයක් වගේ’’ යැයි එක් පැත්තකින් නැග දරුවාව දැක, ‘‘මට පුතෙක් ලැබුන’’ යැයි සතුටුසිතින් ගෙනගියේය.

• කාළී ගන්ත්වා සෙට්ඨිනා පුච්ඡිතා තං පවත්තිං ආචික්ඛිත්වා, ‘‘ගච්ඡ, තං පුන සහස්සං දත්වා ආනෙහී’’ති වුත්තා තථා අකාසි.

★ කාළී ගන්ත්වා (කාලි ගිහින්) සෙට්ඨිනා පුච්ඡිතා (සිටානන් විමසනලදුව) තං පවත්තිං (ඒ සිදුවිම/ ඒ පුවත) ආචික්ඛිත්වා (කියා) ‘‘ගච්ඡ (යන්න) නං පුන (ඔහුව නැවත) සහස්සං දත්වා (දහසක් දී) ආනෙහී’’ති (ගෙනඑන්න යැයි) වුත්තා (කියනලදුව) තථා අකාසි (එසේ කලාය)

☞ කාලි ගිහින්, සිටානන් විමසනලදුව ඒ සිදුවිම කියා ‘‘යන්න, ඔහුව නැවත දහසක් දී ගෙනඑන්න’’ යැයි කියනලදුව, එසේ කලාය.

• සෙට්ඨිනො ඉදඤ්චිදඤ්ච කරොන්තස්සෙව දාරකො වඩ්ඪිතො ‘‘සොසකො’’ත්වෙවස්ස නාමං අහොසි. සො සෙට්ඨිනො අක්ඛිම්හි කණ්ටකො විය ඛායි, උජුකං තං ඔලොකෙතුම්පි න විසහි.

★ සෙට්ඨිනො (සිටුතුමා) ඉදඤ්චිදඤ්ච (මේ මේ දේවල්/ විවිද දේවල්) [කරොන්තස්ස+එව] කරොන්තස්සෙව (කරද්දී ම) දාරකො වඩ්ඪිතො (දරුවා වැඩුනේය) ‘‘සොසකො’’ත්වෙවස්ස (සෝසක යැයි ම ඔහුට) නාමං අහොසි (නම් විය) සො සෙට්ඨිනො අක්ඛිම්හි (ඔහු සිටුතුමාගේ ඇස්වල) කණ්ටකො විය ඛායි (කටුවක් මෙන් විය) උජුකං තං (කෙලින් ඔහුව/ ඔහුදෙස) [ඔලොකෙතුං+අපි] ඔලොකෙතුම්පි (බැලිමටව-ත්) න විසහි (අසමත්විය)

☞ සිටුතුමා මේ මේ දේවල් කරද්දී ම දරුවා වැඩුනේය. ‘‘සෝසක’’ යැයි ම ඔහුට නම් විය. ඔහු සිටුතුමාගේ ඇස්වල කටුවක් මෙන් විය. සිටුතුමා කෙලින් ඔහුදෙස බැලිමටවත් අසමත්විය.

• අථස්ස මාරණූපායං චින්තෙන්තො අත්තනො සහායකස්ස කුම්භකාරස්ස සන්තිකං ගන්ත්වා, ''කදා ත්වං ආවාපං ආලිම්පෙස්සසී''ති පුච්ඡිත්වා – ''ස්වෙ''ති වුත්තෙ, ''තෙන හි ඉදං සහස්සං ගහෙත්වා මම එකං කම්මං කරොහී''ති ආහ.

★ [අථ+අස්ස] අථස්ස (ඉක්බිති ඔහුව/ නැවතත් ඔහුව) [මාරණ+උපායං] මාරණූපායං (මරණ උපායක්) චින්තෙන්තො (සිතමින්) අත්තනො (තමාගේ) සහායකස්ස කුම්භකාරස්ස (මිත්‍ර කුඹල්කරුගේ) සන්තිකං ගන්ත්වා (ලඟට ගිහින්) ''කදා ත්වං (කවදාද ඔබ) ආවාපං ආලිම්පෙස්සසී''ති (පෝරණුව බඳින්නේ යැයි) පුච්ඡිත්වා (අසා) ''ස්වෙ''ති වුත්තෙ (හෙට යැයි කීකල) ''තෙන හි (එසේනම්/ එහෙනම්) ඉදං සහස්සං ගහෙත්වා (මේ දහස ගෙන) මම එකං කම්මං (මගේ එක වැඩක්) කරොහී''ති ආහ (කරන්න යැයි කීය)

☞ නැවතත් ඔහුව මරණ උපායක් සිතමින් තමාගේ මිත්‍ර කුඹල්කරුගේ ලඟට ගිහින් ''කවදාද ඔබ පෝරණුව බඳින්නෙ'' යැයි අසා ''හෙට'' යැයි කීකල ''එහෙනම් මේ දහස ගෙන මගේ එක වැඩක් කරන්න'' යැයි කීය.

• ''කිං, සාමී''ති? ''එකො මෙ අවජාතපුත්තො අත්ථි, තං තව සන්තිකං පෙසෙස්සාමි, අථ නං ගහෙත්වා ගබ්භං පවෙසෙත්වා තිබ්බිණාය වාසියා ඛණ්ඩාඛණ්ඩිකං ඡින්දිත්වා චාටියං පක්ඛිපිත්වා ආවාපෙ පචෙය්‍යාසි, ඉදං තෙ සහස්සං සච්චකාරසදිසං.

★''කිං, සාමී''ති? (මොකක්ද ස්වාමීණි ?) ''එකො මෙ (මගේ එක්) අවජාත-පුත්තො අත්ථි (අවජාත පුතෙක් ඉන්නව) තං (ඔහුව) තව (ඔබ) සන්තිකං පෙසෙස්සාමි (ලඟට එවන්නෙමි/ එවන්නම්) අථ (එවිට) නං ගහෙත්වා (ඔහුව ගෙන) ගබ්භං පවෙසෙත්වා (කාඹරයට ඇලුකර) තිබ්බිණාය වාසියා (තියුණු වෑයෙන්) ඛණ්ඩාඛණ්ඩිකං (කෑලි කෑලිවලට) ඡින්දිත්වා (කපා) චාටියං පක්ඛිපිත්වා (වළඳට/ හැලියට දමා) ආවාපෙ පචෙය්‍යාසි (පෝරණුවේ දවන්න) ඉදං තෙ සහස්සං (මේ ඔබට දහස) සච්චකාර-සදිසං (ඇපයක්වගේ/ අත්තිකරම්ක් වගේ)

☞ ''මොකක්ද ස්වාමීණි ?'' ''මගේ එක අවජාත පුතෙක් ඉන්නව, ඔහුව ඔබ ලඟට එවන්නම්, එවිට ඔහුව ගෙන කාඹරයට ඇලුකර, තියුණු වෑයෙන් කෑලි කෑලිවලට කපා, හැලියට දමා පෝරණුවේ දවන්න, මේ දහස ඔබට අත්තිකරම්ක් වගේ,

• උත්තරිං පන තෙ කත්තබ්බයුත්තකං පච්ඡා කරිස්සාමී''ති. කුම්භකාරො ''සාධූ''ති සම්පටිච්ඡි. සෙට්ඨී පුනදිවසෙ සොසකං පක්කොසිත්වා, ''භියෝ‍ා මයා කුම්භකාරො එකං කම්මං ආණත්තො, එහි, ත්වං තස්ස සන්තිකං ගන්ත්වා එවං වදෙහි

★ උත්තරිං පන තෙ (තවත් ඔබට) කත්තබ්බයුත්තකං (කලයුත්තක්) පච්ඡා කරිස්සාමී''ති (පසුව කරන්නෙමි/ පස්සෙ කරන්නන් යැයි) කුම්භකාරො (කුඹල්කරු) ''සාධූ''ති සම්පටිච්ඡි (හොඳි යැයි පිළිගත්තේය) සෙට්ඨී පුනදිවසෙ (සිටුතුමා දෙවනදිනයේ/ ඊලඟදවසේ) සොසකං පක්කොසිත්වා (සෝසක කැඳවා) ''භියෝ‍ා මයා (ඊයේ මා විසින්/ මං) කුම්භකාරො (කුඹල්කරුව) එකං කම්මං (එක වැඩක) ආණත්තො (යෙදෙව්ව/ අණකෙරුවේය) එහි (එන්න) ත්වං (ඔබ) තස්ස සන්තිකං ගන්ත්වා (ඔහු ලඟට ගිහින්) එවං වදෙහි (මෙසේ/ මෙහෙම කියන්න)

☞ තවත් ඔබට කලයුත්තක් පස්සෙ කරන්නන්'' යැයි. කුඹල්කරු ''හොඳි'' යැයි පිළිගත්තේය. සිටුතුමා දෙවනදිනයේ සෝසක කැඳවා ''ඊයේ මං කුඹල්කරුට එක වැඩක් කිව්ව'' එන්න, ඔබ ඔහු ලඟට ගිහින් මෙහෙම කියන්න,

• ‘හියෝ‍ා කිර මෙ පිතරා ආණත්තං කම්මං නිප්ඵාදෙහී’’’ති පහිණි. සො ‘‘සාධූ’’ති අගමාසි. ඉදං තං ඡට්ඨමවාරඡඩ්ඩනං. තං තත්ථ ගච්ඡන්තං ඉතරො සෙට්ඨීනො පුත්තො දාරකෙහි සද්ධිං ගුළං කීළන්තො දිස්වා තං පක්කොසිත්වා, ‘‘කුහිං ගච්ඡසි භාතිකා’’ති පුච්ඡිත්වා ‘‘පිතු සාසනං ගහෙත්වා කුම්භකාරස්ස සන්තික’’න්ති වුත්තෙ

★ ‘හියෝ‍ා කිර මෙ පිතරා (ඊයේ මගේ පියා විසින්) ආණත්තං කම්මං (අණකෙරුව වැඩේ/ කිව්ව වැඩේ) නිප්ඵාදෙහී’’’ති (කරන්න යැයි) පහිණි (යැවීය) සො ‘‘සාධූ’’ති (ඔහු හොඳයි යැයි) අගමාසි (ගියේය) ඉදං තං ඡට්ඨමවාරඡඩ්ඩනං (මේ ඔහුව සයවන වරට ඉවතදැමීමයි) තං තත්ථ (ඔහු එහි) ගච්ඡන්තං (යන අතරේ) ඉතරො සෙට්ඨීනො පුත්තො (අනිත් සිටුතුමාගේ පුතා) දාරකෙහි සද්ධිං (ළමයින් සමග) ගුළං කීළන්තො (බෝල සෙල්ලම් කරන) දිස්වා (දැක) තං පක්කොසිත්වා (ඔහුව කැඳවා/ ඔහුට අඬගසා) ‘‘කුහිං ගච්ඡසි භාතිකා’’ති (කොහෙද යන්නෙ සොහොයුර යැයි) පුච්ඡිත්වා (අසා) ‘‘පිතු සාසනං ගහෙත්වා (පියාගේ පණිවිඩයක්/ හසුනක් ගෙන) කුම්භකාරස්ස (කුඹල්කරු) [සන්තිකං+ඉති] සන්තික’’න්ති (ලඟට යැයි) වුත්තෙ (කීකල)

☞ ඊයේ මගේ පියා විසින් කිව්ව වැඩේ කරන්න’’ යැයි කියා යැවීය. ඔහු ‘‘හොඳයි’’ යැයි කියා ගියේය. මේ ඔහුව සයවන වරට ඉවතදැමීමයි. ඔහු එහි යන අතරේ, ළමයින් සමග බෝල සෙල්ලම් කරන සිටුතුමාගේ අනිත් පුතා ඔහුව දැක, ඔහුට අඬගසා, ‘‘සොහොයුර, කොහෙද යන්නෙ’’ යැයි අසා, ‘‘පියාගේ පණිවිඩයක් ගෙන කුඹල්කරු ලඟට’’ යැයි කීකල,

• ‘‘අහං තත්ථ ගමිස්සාමි. ඉමෙ මං දාරකා බහුං ලක්ඛං ජිනිංසු, තං මෙ පටිජිනිත්වා දෙහී’’ති ආහ. ‘‘අහං පිතු භායාමී’’ති. ‘‘මා භායි, භාතික, අහං තං සාසනං හරිස්සාමි. බහූහි ජිතො, යාවාහං ආගච්ඡාමි, තාව මෙ ලක්ඛං පටිජිනා’’ති.

★ ‘‘අහං තත්ථ ගමිස්සාමි (මම එහි යන්නෙමි/ යන්නම්) ඉමෙ <u>මං</u> දාරකා (මේ ළමයි <u>**මාව**</u>) බහුං ලක්ඛං ජිනිංසු (බොහෝ/ ගොඩක් ලකුණුවලින් දිනූහ/ දිනුව) තං මෙ (එය මට) පටිජිනිත්වා (නැවත දිනා) දෙහී’’ති ආහ (දෙන්න යැයි කීය) ‘‘අහං පිතු භායාමී’’ති (මම පියාට බයයි) ‘‘මා භායි (බයවෙන්න එපා) භාතික (සොහොයුර) අහං තං සාසනං (මම ඒ හසුන/ පණිවිඩය) හරිස්සාමි (ගෙනයන්නෙමි/ ගෙනයන්නම්) බහූහි ජිතො (බොහොමයකින් දිනන්න/ ගොඩකින් දිනන්න) [මෙහි **“යාව”** හා **“තාව”** එක්වී **“තුරු”** යන අර්ථය දේ] [යාව+අහං] යාවාහං ආගච්ඡාමි, තාව (මම එනතුරු) මෙ ලක්ඛං (මගේ ලකුණු) පටිජිනා’’ති (නැවත දිනන්න)

☞ ‘‘මම එහි යන්නම්, මේ ළමයි මාව බොහෝ ලකුණුවලින් දිනුව, එය මට නැවත දිනා දෙන්න’’ යැයි කීය. ‘‘මම පියාට බයයි’’ ‘‘බයවෙන්න එපා, සොහොයුර, මම ඒ පණිවිඩය ගෙනයන්නම්, බොහොමයකින් දිනන්න, මම එනතුරු මගේ ලකුණු නැවත දිනන්න’’

• සොසකො කිර ගුළකීළාය ඡෙකො, තෙන නං එවං නිබන්ධි. සොපි තං ‘‘තෙන හි ගන්ත්වා කුම්භකාරං වදෙහි – ‘පිතරා කිර මෙ හියෝ‍ා එකං කම්මං ආණත්තං, තං නිප්ඵාදෙහී’’’ති වත්වා උයෝ‍ාජෙසි.

★ සොසකො කිර ගුළකීළාය ඡෙකො (සෝසක නම් බෝල ක්‍රීඩාවේ දක්ෂය) තෙන (එබැවින්) නං(ඔහුට) එවං නිබන්ධි (මෙසේ ඇවිටිලිකලේය/ පෙරැත්තකලේය) සො-පි (ඔහුද/ සෝසකත්) තං(ඔහුට) ‘‘තෙන හි (එහෙනම්) ගන්ත්වා (ගිහින්) කුම්භකාරං වදෙහි (කුඹල්කරුට කියන්න)

‘හියෝ කිර මෙ පිතරා (ඊයේ මගේ පියා විසින්) ආණත්තං කම්මං (අණකෙරුව වැඩේ/ කිව්ව වැඩේ) නිප්ඵාදෙහී’’’ති (කරන්න යැයි) වත්වා උයෝජෙසි (කියා යැවීය)

☞ සෝසක නම් බෝල ක්‍රීඩාවේ දක්ෂය, එබැවින් ඔහුට මෙසේ ඇවිටිලිකලේය. සෝසකත් ඔහුට ‘‘එහෙනම් ගිහින් කුඹල්කරුට කියන්න, ඊයේ මගේ පියා විසින් කිව්ව වැඩේ කරන්න’’ යැයි කියා යැවීය.

• සො තස්ස සන්තිකං ගන්ත්වා තථා අවච. අථ නං කුම්භකාරො සෙට්ඨිනා වුත්තනියාමෙනෙව මාරෙත්වා ආවාපෙ ඛිපි. සොසකොපි දිවසභාගං කීළිත්වා සායන්හසමයෙ ගෙහං ගන්ත්වා ‘‘කිං, තාත, න ගතොසී’’ති වුත්තෙ අත්තනො අගතකාරණඤ්ච කනිට්ඨස්ස ගතකාරණඤ්ච ආරොචෙසි.

★ සො(ඔහු) තස්ස(ඔහුගේ/ කුඹල්කරුගේ) සන්තිකං ගන්ත්වා (ලඟට ගිහින්) තථා අවච (එලෙස කීය) අථ(ඉක්බිති) නං(ඔහුව) කුම්භකාරො (කුඹල්කරු) සෙට්ඨිනා (සිටුතුමා විසින්) වුත්ත-නියාමෙනෙ-ව (කියූ ආකාරයට ම) මාරෙත්වා (මරා) ආවාපෙ ඛිපි (පෝරණුවට දැම්මේය) සොසකො-පි (සෝසක ත්) දිවසභාගං (දවල් කාලයේ) කීළිත්වා (ක්‍රීඩාකර/ සෙල්ලම්කර) සායන්හසමයෙ (සවස්වරුවේ) ගෙහං ගන්ත්වා (ගෙදරට ගිහින්) ‘‘කිං, තාත (මොකද පුතේ) න ගතොසී’’ති (නොගියේද/ ගියේ නැද්ද යැයි) වුත්තෙ (ඇසූකල) අත්තනො (තමා) [අගත-කාරණං+ච] අගතකාරණඤ්ච (නොගිය කාරණාව ද/ නොයෑමට හේතුවත්) කනිට්ඨස්ස (බාල සොහොයුරාගේ/ මල්ලිගේ) [ගත-කාරණං+ච] ගතකාරණඤ්ච (ගිය කාරණාව ද/ යැමට හේතුවත්) ආරොචෙසි (කීවේය)

☞ ඔහු කුඹල්කරුගේ ලඟට ගිහින් එලෙස කීය. ඉක්බිති කුඹල්කරු ඔහුව සිටුතුමා විසින් කියූ ආකාරයට ම මරා පෝරණුවට දැම්මේය. සෝසකත් දවල් කාලයේ ක්‍රීඩාකර සවස්වරුවේ ගෙදරට ගිහින් ‘‘මොකද පුතේ, ගියේ නැද්ද’’ යැයි ඇසූකල තමා නොයෑමට හේතුවත් මල්ලිගේ යැමට හේතුවත් කීවේය.

• තං සුත්වා සෙට්ඨී ‘‘අහං ඨී’’ති මහාවිරවං විරවිත්වා සකලසරීරෙ පක්කුථිතලොහිතො විය හුත්වා, ‘‘අම්භො, කුම්භකාර, මා මං නාසයි, මා මං නාසයී’’ති බාහා පග්ගය්හ කන්දන්තො තස්ස සන්තිකං අගමාසි.

★ තං සුත්වා සෙට්ඨී (එය අසා සිටුතුමා) ‘‘අහං ඨී’’ති (මට නින්දාවේවා යැයි) මහාවිරවං විරවිත්වා (මහඬින් කෑගසා) සකල-සරීරෙ (මුලු ඇඟේ/ මුලු සිරුරෙහි) පක්කුථිත-ලොහිතො (උණුවූ ලේඇත්තෙක්) විය හුත්වා (මෙන් වී) (ලේ උණුවී) ‘‘අම්භො, කුම්භකාර (අනේ කුඹල්කරුව) මා මං නාසයි (මාව විනාශකරන්න එපා) මා මං නාසයී’’ති (මාව විනාශකරන්න එපා යැයි) බාහා පග්ගය්හ (අත් ඔසවාගෙන) කන්දන්තො (හඬමින්) තස්ස සන්තිකං අගමාසි (ඔහු ලඟට ගියේය)

☞ එය අසා සිටුතුමා ‘‘මට නින්දාවේවා’’ යැයි මහඬින් කෑගසා, මුලු ඇඟේම ලේ උණුවී, ‘‘අනේ කුඹල්කරුව, මාව විනාශකරන්න එපා, මාව විනාශකරන්න එපා’’ යැයි අත් ඔසවාගෙන හඬමින් ඔහු ලඟට ගියේය.

• කුම්භකාරො තං තථා ආගච්ඡන්තං දිස්වා, ‘‘සාමි, මා සද්දං කරි, කම්මං තෙ නිප්ඵන්න’’න්ති ආහ. සො පබ්බතෙන විය මහන්තෙන සොකෙන අවත්ථටො හුත්වා අනප්පකං දොමනස්සං පටිසංවෙදෙසි. යථා තං අප්පදුට්ඨස්ස පදුස්සමානො. තෙනාහ භගවා

★ කුම්භකාරො (කුඹල්කරු) තං (ඔහු) තථා(එසේ) ආගච්ඡන්තං (එන) දිස්වා (දැක), ''සාමි (ස්වාමීණි) මා සද්දං කරි (සද්දකරන්න එපා) කම්මං තෙ (ඔබේ වැඩේ/ කාර්යය) [නිප්ඵන්නං+ඉති] නිප්ඵන්න''න්ති (ඉෂ්ඨවිය / අවසන්විය යැයි) ආහ (කීය) සො (ඔහු) පබ්බතෙන විය මහන්තෙන (පර්වතයක් මෙන් මහත්වූ) සොකෙන (සෝකයෙන්) අවත්ථටො හුත්වා (යටවූවෙක් ව/ මැඩුනෙක්ව) අනප්පකං දොමනස්සං (අප්‍රමාණ දොම්නසක්/ දුක්ඛ දෝමනස්සයක්) පටිසංවෙදෙසි (වින්දේය) යථා තං (යම්සේ ඒ) අප්පදුට්ඨස්ස (ද්වේෂ නැත්තෙකුට/ නිවැරදිකෙනෙකුට) පදුස්සමානො (ද්වේෂකිරීමෙන්) [තෙන+ආහ] තෙනාහ භගවා (එබැවින් භාග්‍යවතුන් වහන්සේ කීය/ දේශනාකලේය)

☞ කුඹල්කරු එසේ එන ඔහු දැක ''ස්වාමීණි, සද්දකරන්න එපා ඔබේ වැඩේ අවසන්විය'' යැයි කීය. ඔහු පර්වතයක් මෙන් මහත්වූ සෝකයෙන් යටවූවෙක් ව අප්‍රමාණ දුක්ඛ දෝමනස්සයක් වින්දේය. යම්සේ ඒ නිවැරදිකෙනෙකුට ද්වේෂකිරීමෙන්. එබැවින් භාග්‍යවතුන් වහන්සේ දේශනාකලේය.

''යො දණ්ඩෙන අදණ්ඩෙසු, අප්පදුට්ඨෙසු දුස්සති;
දසන්නමඤ්ඤතරං ඨානං, ඛිප්පමෙව නිගච්ඡති.

යො දණ්ඩෙන අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු දුස්සති, [සො] දසන්නමඤ්ඤතරං ඨානං ඛිප්පමෙව නිගච්ඡති.

★ යො (යමෙක්) දණ්ඩෙන (දඩුවමින්) අදණ්ඩෙසු අප්පදුට්ඨෙසු (හිංසාවක් නැති නිරපරාද අයකෙරෙහි) දුස්සති (කිපේද/ ද්වේෂකරයි ද) [සො (ඔහු)] [දසන්නං+අඤ්ඤතරං] දසන්නමඤ්ඤතරං ඨානං (කාරණා දහයකින් එකකට) [ඛිප්පං+එව] ඛිප්පමෙව නිගච්ඡති (වහාම පැමිණෙයි/ පත්වෙයි)

☞ යමෙක් දඩුවමින් හිංසාවක් නැති නිරපරාද අයකෙරෙහි ද්වේෂකරයි ද ඔහු මේ ජීවිතයේම දුක්දෙන කාරණා දහයකින් එකකට වහාම පත්වෙයි

වෙදනං ඵරුසං ජානිං, සරීරස්ස ච භෙදනං;
ගරුකං වාපි ආබාධං, චිත්තක්ඛෙපඤ්ච පාපුණෙ.

ඵරුසං වෙදනං ජානිං, සරීරස්ස ච භෙදනං,ගරුකං වාපි ආබාධං, චිත්තක්ඛෙපඤ්ච පාපුණෙ.

★ ඵරුසං වෙදනං (දරුණු රෝගවේදනා) ජානිං (ධනහානි) සරීරස්ස ච භෙදනං (ශරීරය බිඳියාම් ද) ගරුකං වාපි ආබාධං (දරුණු ආබාද ද) [චිත්තක්ඛෙපං+ච] චිත්තක්ඛෙපඤ්ච (සිතේ වික්සිප්තබවට ද/ පිස්සු රෝගයට ද) පාපුණෙ (පැමිණේ)

රාජතො වා උපසග්ගං, අබ්භක්ඛානඤ්ච දාරුණං;
පරික්ඛයඤ්ච ඤාතීනං, භොගානඤ්ච පභඞ්ගුරං.

රාජතො වා උපසග්ගං, අබ්භක්ඛානඤ්ච දාරුණං,පරික්ඛයඤ්ච ඤාතීනං, භොගානඤ්ච පභඞ්ගුරං.

★ රාජතො වා උපසග්ගං (රාජ බයට/ රාජුගෙන් වන හානියන්ට හෝ) [අබ්භක්ඛානං+ච] අබ්භක්ඛානඤ්ච දාරුණං (දරුණු චෝදනාවලට හෝ)

[පරික්ඛයං+ච] පරික්ඛයඤ්ච ඤාතීනං (ඤාතීන්ගෙන් පිරිහීයාමට හෝ) [භොගානං+ච] භොගානඤ්ච පභඞ්ගුරං (සම්පත්වල බිඳීයාමට /පිරිහීයාමට හෝ)

අථ වාස්ස අගාරානි, අග්ගි ඩහති පාවකො;
කායස්ස භෙදා දුප්පඤ්ඤො, නිරයං සොපපජ්ජති''ති.

අථ වාස්ස අගාරානි පාවකො අග්ගි ඩහති, දුප්පඤ්ඤො කායස්ස භෙදා නිරයං සොපපජ්ජති''ති.

★ අථ [වා+අස්ස] වාස්ස (නැතහොත් ඔහුගේ) අගාරානි (ගෙවල්) පාවකො අග්ගි ඩහති (ලැව්ගිනි හෝ දවයි) දුප්පඤ්ඤො (නුවණහීනයා) කායස්ස භෙදා (මරණයෙන් පසු) නිරයං සොපපජ්ජති''ති (නිරයෙහි උපදියි යැයි)

• එවං සන්තෙපි පුන නං සෙට්ඨී උජුකං ඔලොකෙතුං න සක්කොති. ''කින්ති නං මාරෙය්‍ය''න්ති චින්තෙන්තො, ''මම ගාමසතෙ ආයුත්තකස්ස සන්තිකං පෙසෙත්වා මාරෙස්සාමී''ති උපායං දිස්වා,

★ එවං සන්තෙපි (මෙසේ ඇතිකල්හි ද/ මෙසේ තිබුණත්) පුන නං (නැවත ඔහුව/ ඔහුදෙස) සෙට්ඨී (සිටුතුමා) උජුකං ඔලොකෙතුං (කෙලින් බැලීමට) න සක්කොති (නොහැකිවෙයි) ''කින්ති නං (කෙසේ ඔහුව) [මාරෙය්‍යං+ඉති] මාරෙය්‍ය''න්ති (මරන්නේද යැයි) චින්තෙන්තො (සිතමින්) ''මම ගාමසතෙ (මගේ ගම් සියයේ) ආයුත්තකස්ස සන්තිකං (ලේකම් ලඟට) පෙසෙත්වා (යවා) මාරෙස්සාමී''ති (මරන්නෙමි යැයි) උපායං දිස්වා (උපායක් දැක)

☞ මෙසේ තිබුණත් නැවත සිටුතුමා ඔහුදෙස කෙලින් නොබලයි. ''කෙසේ මොහුව මරන්නේද'' යැයි සිතමින් ''මගේ ගම් සියයේ ලේකම් ලඟට යවා මරන්නෙමි'' යැයි උපායක් දැක

• ''අයං මෙ අවජාතපුත්තො, ඉමං මාරෙත්වා වච්චකූපෙ ඛිපතු, එවං කතෙ අහං මාතුලස්ස කත්තබ්බයුත්තකං පච්ඡා ජානිස්සාමී''ති තස්ස පණ්ණං ලිඛිත්වා, ''තාත සොසක, අම්හාකං ගාමසතෙ ආයුත්තකො අත්ථි, ඉමං පණ්ණං හරිත්වා තස්ස දෙහී''ති වත්වා පණ්ණං තස්ස දුස්සන්තෙ බන්ධි. ඉදං තං සත්තමවාරඡඩ්ඩනං.

★ ''අයං මෙ (මේ මගේ) අවජාතපුත්තො (අවජාතක පුතෙක්) ඉමං මාරෙත්වා (මොහු මරා) වච්චකූපෙ ඛිපතු (වැසිකිලි වලට දමන්න) එවං කතෙ (මෙසේ කෙරුකල) අහං මාතුලස්ස (මම මාමාට) කත්තබ්බයුත්තකං (කලයුත්ත) පච්ඡා ජානිස්සාමී''ති (පසුව දැනගන්නෙමි/ කරන්නෙමි යැයි) තස්ස (ඔහුට/ ලේකම්ට) පණ්ණං ලිඛිත්වා (ලියමනක් ලියා) ''තාත සොසක (පුතේ සෝසක) අම්හාකං ගාමසතෙ (අපේ ගම් සියයේ) ආයුත්තකො අත්ථි (කලමනාකරුවෙක්/ ලේකම්කෙනෙක් ඇත/ ඉන්නව) ඉමං පණ්ණං හරිත්වා (මේ ලියුම ගෙනගිහි) තස්ස දෙහී''ති (ඔහුට දෙන් යැයි) වත්වා (කියා) පණ්ණං (ලිවිම) තස්ස [දුස්ස+අන්තෙ] දුස්සන්තෙ බන්ධි (ඔහුගේ සලුව කෙලවර බැන්දේය) ඉදං තං සත්තමවාරඡඩ්ඩනං (මේ ඔහුව සත්වන වරට ඉවතදැමීමයි)

☞ ''මේ මගේ අවජාතක පුතෙක්, මොහු මරා වැසිකිලි වලට දමන්න, මෙසේ කෙරුකල මම මාමාට කලයුත්ත පසුව කරන්නෙමි'' යැයි ලේකම්ට ලියමනක් ලියා ''පුතේ සෝසක, අපේ

ගම් සියයේ ලේකම්කෙනෙක් ඉන්නව, මේ ලියුම ගෙනගිහින් ඔහුට දෙන්'' යැයි කියා, ලිව්ම ඔහුගේ සලුව කෙලවර බැන්දේය. මේ ඔහුව සත්වන වරට ඉවතදැමීමයි.

• සො පන අක්ඛරසමයං න ජානාති. දහරකාලතො පට්ඨාය හි නං මාරාපෙන්තොව සෙට්ඨී මාරෙතුං නාසක්ඛි, කිං අක්ඛරසමයං සික්ඛාපෙස්සති? ඉති සො අත්තනො මාරාපනපණ්ණමෙව දුස්සන්තෙ බන්ධිත්වා නික්ඛමන්තො ආහ

★ සො පන අක්ඛරසමයං (ඔහු වනාහි අකුරු ශාස්ත්‍රය) න ජානාති (නො දනියි) දහරකාලතො පට්ඨාය හි (ළමාකාලයේ පටන් වනාහි) නං (ඔහුව) මාරාපෙන්තො-ව (මරවමින් ම/ මැරීමට උත්සහකරන ම) සෙට්ඨී මාරෙතුං නාසක්ඛි (සිටුතුමාට මැරීමට නො හැකිවිය) කිං අක්ඛරසමයං (මොන අකුරු ශාස්ත්‍රයක්) සික්ඛාපෙස්සති? (උගන්වන්නේද?/ ඉගැන්වීමක්ද?) ඉති සො (මෙසේ ඔහු) අත්තනො (තමාව) [මාරාපන-පණ්ණං+එව] මාරාපනපණ්ණමෙව (මරවන ලියමන ම) දුස්සන්තෙ බන්ධිත්වා (සලුව කෙලවර බැඳගෙන) නික්ඛමන්තො ආහ (නික්මෙනගමන් කීය)

☞ ඔහු වනාහි අකුරු ශාස්ත්‍රය නො දනියි. ළමාකාලයේ පටන් ඔහුව මැරීමට ම උත්සහකරන සිටුතුමාට මැරීමට නො හැකිවිය. මොන අකුරු ශාස්ත්‍ර ඉගැන්වීමක්ද? මෙසේ ඔහු තමාව ම මරවන ලියමන සලුව කෙලවර බැඳගෙන නික්මෙනගමන් කීය.

• ''පාථෙය්‍යං මෙ, තාත, නත්ථී''ති. ''පාථෙය්‍යෙන තෙ කම්මං නත්ථී, අන්තරාමග්ගෙ 'අසුකගාමෙ නාම මමසහායකො සෙට්ඨී අත්ථී, තස්ස ඝරෙ පාතරාසං කත්වා පුරතො ගච්ඡාහී'''ති.

★ ''පාථෙය්‍යං මෙ (මගවියදම් මට) තාත, නත්ථී''ති (තාත්තෙ නැන/නෑ යැයි) ''පාථෙය්‍යෙන (මගවියදම් වලින්) තෙ කම්මං නත්ථී (ඔබට වැඩක් නෑ) අන්තරාමග්ගෙ (අතරමග) 'අසුක-ගාමෙ නාම (අසවල් ගමෙහි නම්) මම සහායකො (මගේ මිත්‍ර) සෙට්ඨී අත්ථී (සිටුතුමා ඇත/ ඉන්නව) තස්ස ඝරෙ (ඔහුගේ ගෙදර) පාතරාසං කත්වා (උදෑසන ආහාරගෙන) පුරතො ගච්ඡාහී'''ති (ඉදිරියට යන්න)

☞ ''තාත්තෙ, මට මගවියදම් නෑ'' ''මගවියදම් වලින් ඔබට වැඩක් නෑ, අතරමග අසවල් නමඇති ගමෙහි, මගේ මිත්‍ර සිටුතුමා ඉන්නව, ඔහුගේ ගෙදර උදෑසන ආහාරගෙන ඉදිරියට යන්න''

• සො ''සාධූ''ති පිතරං වන්දිත්වා නික්ඛන්තො තං ගාමං පත්වා සෙට්ඨිස්ස ඝරං පුච්ඡිත්වා ගන්ත්වා සෙට්ඨිජායං පස්සි. ''ත්වං කුතො ආගතොසී''ති ච වුත්තෙ, ''අන්තොනගරතො''ති ආහ.

★ සො ''සාධූ''ති (ඔහු හොඳයි යැයි) පිතරං වන්දිත්වා (පියාට වැඳ) නික්ඛන්තො (පිටත්වයන අතරේ) තං ගාමං පත්වා (ඒ ගමට පැමිණ) සෙට්ඨිස්ස ඝරං පුච්ඡිත්වා (සිටුතුමාගේ ගෙදර අසා) ගන්ත්වා (ගිහින්) සෙට්ඨිජායං පස්සි (සිටුබිරිඳ දුටුවේය/ හමුවිය) ''ත්වං කුතො ආගතොසී''ති (ඔබ කොහිසිට එන්නේද යැයි) වුත්තෙ (ඇසූකල) ''අන්තො-නගරතො''ති ආහ (ඇතුල් නගරයෙන් යැයි කීය)

☞ ඔහු ''හොඳයි'' යැයි පියාට වැඳ පිටත්වයන අතරේ ඒ ගමට පැමිණ සිටුතුමාගේ ගෙදර අසා ගිහින් සිටුබිරිඳ හමුවිය. ''ඔබ කොහිසිට එන්නේද?'' යැයි ඇසූකල ''ඇතුල් නගරයෙන්'' යැයි කීය

• ''කස්ස පුත්තොසී''ති? ''තුම්හාකං සහායකසෙට්ඨිනො, අම්මා''ති. ''ත්වංසි සොසකො නාමා''ති? ''ආම, අම්මා''ති. තස්සා සහ දස්සනෙනෙව තස්මිං පුත්තසිනෙහො උප්පජ්ජි.

★ ''කස්ස පුත්තොසී''ති? (කාගෙ පුතෙක්ද ?) ''තුම්හාකං සහායක-සෙට්ඨිනො අම්මා''ති (නුඹලාගේ මිත්‍ර සිටුතුමාගේ අම්මෙ) ''[ත්වං+අසි] ත්වංසි (ඔබ වෙයිද) සොසකො නාමා''ති? (සෝසක නම්) (ඔබේ නම සෝසක ද?) ''ආම, අම්මා''ති (ඔව් අම්මෙ) තස්සා (ඇයට) සහ [දස්සනෙන+එව] දස්සනෙනෙව (දැකීමත් සමග ම) තස්මිං (ඔහු කෙරෙහි) පුත්තසිනෙහො උප්පජ්ජි (පුත්‍ර ස්නේහය උපන්නේය/ දරු සෙනෙහස උපන්නේය)

☞ ''කාගෙ පුතෙක්ද ?'' ''නුඹලාගේ මිත්‍ර සිටුතුමාගේ, අම්මෙ'' ''ඔබේ නම සෝසක ද?'' ''ඔව් අම්මෙ'' ඇයට දැකීමත් සමග ම ඔහු කෙරෙහි දරු සෙනෙහස උපන්නේය.

• සෙට්ඨිනො පනෙකා ධීතා අත්ථි පන්නරසසොළසවස්සුද්දෙසිකා අභිරූපා පාසාදිකා, තං රක්ඛිතුං එකමෙව පෙසනකාරිකං දාසිං දත්වා සත්තභූමිකස්ස පාසාදස්ස උපරිමතලෙ සිරිගබ්භෙ වසාපෙන්ති.

★ සෙට්ඨිනො [පන+එකා] පනෙකා (සිටුතුමාට වනිහි එක්) ධීතා අත්ථි (දුවක් ඇත) [පන්නරස-සොළස-වස්ස+උද්දෙසිකා] පන්නරසසොළසවස්සුද්දෙසිකා (වයසින් පහලොව දාසය හැවිරිදි වියේය) අභිරූපා පාසාදිකා (මනා රූ ඇති ප්‍රසාදජනක තැනැත්තියකි) තං රක්ඛිතුං (ඇව රැකීමට) [එකං+එව] එකමෙව (එකම) පෙසනකාරිකං (මෙහෙකාර) දාසිං දත්වා (දාසියක් දී) සත්ත-භූමිකස්ස පාසාදස්ස (සත්මහල් ප්‍රාසාදයේ) උපරිම-තලෙ (ඉහලම තලයේ/ උඩම තට්ටුවේ) සිරිගබ්භෙ වසාපෙන්ති (නිදන කාඹරයක වාසයකරවති)

☞ සිටුතුමාට වනිහි එක් දුවක් ඇත. ඇය වයසින් පහලොව දාසය හැවිරිදි වියේය මනා රූ ඇති ප්‍රසාදජනක තැනැත්තියකි. ඇව රැකීමට එකම මෙහෙකාර දාසියක් දී සත්මහල් ප්‍රාසාදයේ උඩම තට්ටුවේ නිදන කාඹරයක වාසයකරවති.

• සෙට්ඨිධීතා තස්මිං ඛණෙ තං දාසිං අන්තරාපණං පෙසෙසි. අථ නං සෙට්ඨිජායා දිස්වා, ''කුහිං ගච්ඡසී''ති පුච්ඡිත්වා, ''අය්‍යධීතාය පෙසනෙනා''ති වුත්තෙ ''ඉතො තාව එහි, තිට්ඨතු පෙසනං, පුත්තස්ස මෙ පීඨකං අත්ථරිත්වා පාදෙ ධොවිත්වා තෙලං මක්ඛිත්වා සයනං අත්ථරිත්වා දෙහි, පච්ඡා පෙසනං කරිස්සසී''ති ආහ. සා තථා අකාසි.

★ සෙට්ඨි-ධීතා (සිටුදුව) තස්මිං ඛණෙ (ඒ මොහොතේ/ ඒ වෙලාවේ) තං දාසිං (ඒ දාසිය) අන්තරාපණං පෙසෙසි (කඩයට යැවිය) අථ (එවිට) නං (ඇයව) සෙට්ඨිජායා දිස්වා (සිටුබිරිඳ දැක) ''කුහිං ගච්ඡසී''ති පුච්ඡිත්වා (කොහෙ යන්නේද යැයි අසා) ''අය්‍යධීතාය පෙසනෙනා''ති වුත්තෙ (ස්වාමිදුව විසින් යවනලද්දේය යැයි කීකල) ''ඉතො තාව එහි (මෙහෙ පළමුකොට එන්න) තිට්ඨතු පෙසනං (යැවීම තිබේවා/ ඒ වැඩේ තිබේවා) පුත්තස්ස මෙ (මගේ පුතාට) පීඨකං අත්ථරිත්වා (පුටුවක් සූදානම්කර) පාදෙ ධොවිත්වා (පාද දොවා) තෙලං මක්ඛිත්වා (තෙල් ගා) සයනං අත්ථරිත්වා දෙහි (ඇඳක් සූදානම්කර දෙන්න) පච්ඡා (පසුව/ පස්සෙ) පෙසනං කරිස්සසී''ති ආහ (යවපු වැඩේ කරන්න යැයි කීය) සා තථා අකාසි (ඈ එසේ කලාය)

☞ සිටුදුව ඒ වෙලාවේ ඒ දාසිය කඩයට යැවිය. එවිට ඇයව සිටුබිරිඳ දැක ''කොහෙ යන්නේද?'' යැයි අසා ''ස්වාමිදුව විසින් වැඩකට යවනලද්දේය'' යැයි කීකල

‘‘ඉස්සෙල්ල මෙහෙ එන්න, ඒ වැඩේ තිබෙවා, මගේ පුතාට පුටුවක් සූදානම්කර පාද දොවා තෙල් ගා ඇඳක් සූදානම්කර දෙන්න, පස්සෙ යවපු වැඩේ කරන්න’’ යැයි කීය. ඈ එසේ කලාය.

• අථ නං චිරෙනාගතං සෙට්ඨිධීතා සන්තජ්ජෙසි. අථ නං සා ආහ – ‘‘මා මෙ කුජ්ඣි, සෙට්ඨිපුත්තො සොසකො ආගතො, තස්ස ඉදඤ්චිදඤ්ච කත්වා තත්ථ ගන්ත්වා ආගතාම්හී’’ති. සෙට්ඨිධීතාය ‘‘සෙට්ඨිපුත්තො සොසකො’’ති නාමං සුත්වාව පෙමං ඡවියාදීනි ඡින්දිත්වා අට්ඨිමිඤ්ජං ආහච්ච ඨිතං.

★ අථ (ඉක්බිති) නං (ඇයට) [චිරෙන+ආගතං] චිරෙනාගතං (කල්ගතවි ආව/ පරක්කුවී ආව) සෙට්ඨිධීතා සන්තජ්ජෙසි (සිටුදුව තර්ජනය කලාය) අථ (එවිට) නං(ඇයට/ සිටුදුවට) සා(ඇය/ දාසිය) ආහ (කීය) ‘‘මා මෙ කුජ්ඣි (මට කිපෙන්න එපා/ මාත්එක්ක තරහවෙන්න එපා) සෙට්ඨිපුත්තො සොසකො ආගතො (සිටුපුත්‍ර සෝසක ආව) තස්ස (ඔහුට) ඉදඤ්චිදඤ්ච කත්වා (මේ මේ දේවල් කර) තත්ථ ගන්ත්වා (එහි ගොස්) [ආගතාම්හ+ඉති] ආගතාම්හී’’ති (ආවෙමි යැයි) සෙට්ඨිධීතාය (සිටුදුව විසින්) ‘‘සෙට්ඨිපුත්තො සොසකො’’ති (සිටුපුත් සෝසක යැයි) නාමං සුත්වා-ව (නම ඇසීමෙන් ම) පෙමං (ප්‍රේමය) [ඡවියා+ආදීනි] ඡවියාදීනි ඡින්දිත්වා (සිවි ආදිය සිඳගෙන) අට්ඨිමිඤ්ජං ආහච්ච ඨිතං (ඇටමිදුලුවල වැදී සිටියේය)

☞ ඉක්බිති පරක්කුවී ආව ඇයට සිටුදුව තර්ජනය කලාය. එවිට දාසිය සිටුදුවට කීය ‘‘මාත්එක්ක තරහවෙන්න එපා, සිටුපුත්‍ර සෝසක ආව, ඔහුට මේ මේ දේවල් කර, එහි ගොස් ආවෙමි’’ යැයි. සිටුදුව විසින් ‘‘සිටුපුත් සෝසක යැයි’’ නම ඇසීමෙන් ම ප්‍රේමය සිවි ආදිය සිඳගෙන ඇටමිදුලුවල වැදී සිටියේය.

• කොතූහලකාලස්මිඤ්හි සා තස්ස පජාපතී හුත්වා නාළිකොදනං පච්චෙකබුද්ධස්ස අදාසි, තස්සානුභාවෙනාගන්ත්වා ඉමස්මිං සෙට්ඨිකුලෙ නිබ්බත්තා. ඉති තං සො පුබ්බසිනෙහො අවත්ථරිත්වා ගණ්හි. තෙනාහ භගවා

★ [කොතූහල-කාලස්මිං+හි] කොතූහලකාලස්මිඤ්හි (කොතූහලික කාලයේ දී) සා තස්ස (ඇය ඔහුගේ) පජාපතී හුත්වා (බිරිඳ ව) [නාළික+ඔදනං] නාළිකොදනං (නැලියක බත්) පච්චෙකබුද්ධස්ස අදාසි (පසේබුදුන්ට දුන්නේය) [තස්ස+ආනුභාවෙන+ආගන්ත්වා] තස්සානුභාවෙනාගන්ත්වා (එහි ආනුභාවයෙන් පැමිණ) ඉමස්මිං සෙට්ඨිකුලෙ (මේ සිටුකුලයෙහි/ මේ සිටුගෙදර) නිබ්බත්තා (උපන්නාය) ඉති තං (මෙසේ ඇයව) සො පුබ්බ-සිනෙහො (ඒ පෙර සෙනෙහස) අවත්ථරිත්වා ගණ්හි (වසාගෙන ගත්තේය) [තෙන+ආහ] තෙනාහ භගවා (එබැවින් භාග්‍යවතුන් වහන්සේ කිය/ දේශනාකලේය)

☞ කොතූහලික කාලයේ දී ඇය ඔහුගේ බිරිඳ ව නැලියක බත් පසේබුදුන්ට දුන්නේය. එහි ආනුභාවයෙන් පැමිණ මේ සිටුගෙදර උපන්නාය. මෙසේ ඒ පෙර සෙනෙහස ඇයව වසාගෙන ගත්තේය. එබැවින් භාග්‍යවතුන් වහන්සේ දේශනාකලේය.


• එවං මෙ සුතං – එකං සමයං භගවා සාවත්ථියං විහරති ජෙතවනෙ අනාථපිණ්ඩිකස්ස ආරාමෙ. තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි – ‘‘භික්ඛවොා’’ති. ‘‘භදන්තෙ’’ති තෙ භික්ඛූ භගවතො පච්චස්සොසුං. භගවා එතදවොච:

★ එවං (මෙසේ) මෙ (මා විසින්) සුතං (අසනලදී) එකං සමයං (එක සමයක/ එක් කාලයක) භගවා (භාග්‍යවතුන් වහන්සේ) සාවත්ථියං (සැවැත්නුවරට සමීපයේ) විහරති (වාසයකරයි/ වැඩවාසයකරයි) ජෙතවනෙ (ජේතවනයෙහි) අනාථපිණ්ඩිකස්ස ආරාමෙ (අනාථපිණ්ඩික සිටුතුමාගේ ආරාමයේ) තත්‍ර (එහිදී) ඛො භගවා (භාග්‍යවතුන් වහන්සේ වනාහි) භික්ඛූ ආමන්තෙසි (භික්ෂූන් වහන්සේලාට ආමන්ත්‍රණය කලේය/ ඇමතීය) ‘‘භික්ඛවොා’’ති (මහණෙනි! කියා) ‘‘භදන්තෙ’’ති (ස්වාමීනි කියා) තෙ භික්ඛූ (ඒ භික්ෂූන්) භගවතො (භාග්‍යවතුන් වහන්සේට) පච්චස්සොසුං (ප්‍රතිවදන් දුන්හ/ පිළිවදන් දුන්හ) භගවා (භාග්‍යවතුන් වහන්සේ) [එතං+අවොච] එතදවොච (මෙය කීය/ මෙසේ දේශනාකලේය)

☞ මා විසින් මෙසේ අසනලදී - එක් කාලයක භාග්‍යවතුන් වහන්සේ සැවැත්නුවරට සමීපයේ අනාථපිණ්ඩික සිටුතුමාගේ ජේතවන ආරාමයේ වැඩවාසයකරයි. එහිදී භාග්‍යවතුන් වහන්සේ භික්ෂූන් වහන්සේලාට “මහණෙනි!” කියා ආමන්ත්‍රණය කලේය. ඒ භික්ෂූන් “ස්වාමීනි!” කියා භාග්‍යවතුන් වහන්සේට ප්‍රතිවදන් දුන්හ. භාග්‍යවතුන් වහන්සේ මෙසේ දේශනාකලේය.

• ඉධෙව, භික්ඛවෙ, සමණොා, ඉධ දුතියොා සමණොා, ඉධ තතියොා සමණොා, ඉධ චතුත්ථොා සමණොා; සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ”ති. එවමෙව භික්ඛවෙ, සම්මා සීහනාදං නදථ.

★ [ඉධ+එව] ඉධෙව (මෙහි ම/ මේ ශාසනයෙහි ම) භික්ඛවෙ (මහණෙනි) සමණොා (ශ්‍රමණයා/ සෝවාන් තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) දුතියොා සමණොා (දෙවන ශ්‍රමණයා/ සකදාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) තතියොා සමණොා (තුන්වන ශ්‍රමණයා/ අනාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) චතුත්ථොා සමණොා (සතරවන ශ්‍රමණයා/ අරහත් තැනැත්තා) සුඤ්ඤා (හිස්ය/ සුණ්‍යය) [පර+පවාදා] පරප්පවාදා (අන්‍ය වාදකරුවන්ගේ/ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන්) සමණෙහි (ශ්‍රමණයන්ගෙන්) අඤ්ඤෙ’ති (වෙනත්/ මේ ශාසනයෙන් බාහිරවූ) එවමෙව (මෙසේම/ මේආකාරයෙන්ම) භික්ඛවෙ (මහණෙනි) සම්මා (මනාලෙස/ නිවැරදිලෙස) සීහනාදං නදථ (සිංහනාද කරන්න/ කරව්)(මේ ශ්‍රේෂ්ඨ කිමන කියව්)

☞ මහණෙනි! සෝවාන් තැනැත්තා මේ ශාසනයෙහි මය, දෙවන සකදාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, තුන්වන අනාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, සතරවන අරහත් තැනැත්තා මේ ශාසනයෙහිය. මේ ශාසනයෙන් බාහිරවූ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන් (මාර්ගඵල ලාබී) ශ්‍රමණයන්ගෙන් හිස්ය. මේ ආකාරයෙන්ම නිවැරදිලෙස සිංහනාද කරන්න/ කරව්.

• ‘‘ඨානං ඛො පනෙතං, භික්ඛවෙ, විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං – ‘කො පනායස්මන්තානං අස්සාසොා?, කිං බලං?, යෙන තුම්හෙ ආයස්මන්තොා එවං වදෙථ – ඉධෙව සමණොා, ඉධ දුතියොා සමණොා, ඉධ තතියොා සමණොා, ඉධ චතුත්ථොා සමණොා; සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ’ති?

★ ‘‘ඨානං ඛො පනෙතං (මේ කාරණාව/ මේ සිද්ධිය) භික්ඛවෙ (මහණෙනි!) විජ්ජති (විද්‍යාමානවේ/ දක්නටලැබේ) යං (යම්හෙයකින්) අඤ්ඤතිත්ථියා (අන්‍යය ආගමික)

පරිබ්බාජකා (පැවිද්දන්) එවං වදෙයාුං (මෙසේ කියයිනම්/ මෙසේ ද කිවහැක) 'කො (කුමක්ද/ මොකක්ද/ කවරක්ද?) [පන+ආයස්මන්තානං] පනායස්මන්තානං (අයුෂ්මතුන්ලාගේ) අස්සාසො? (අස්වැසිල්ල/ පිහිට) කිං බලං? (කුමක්ද/ මොකක්ද බලය?) (මොකක්ද පදනම?) යෙන (යමකින්/ යම්කරුණක් නිසා) තුම්හෙ (නුඹලා) ආයස්මන්තො (ආයුෂ්මත්) එවං වදෙථ (මෙසේ කියත්ද ?) [ඉධ+එව] ඉධෙව (මෙහි ම/ මේ ශාසනයෙහි ම) සමණො (ශ්‍රමණයා/ සෝවාන් තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) දුතියො සමණො (දෙවන ශ්‍රමණයා/ සකදාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) තතියො සමණො (තුන්වන ශ්‍රමණයා/ අනාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) චතුත්ථො සමණො (සතරවන ශ්‍රමණයා/ අරහත් තැනැත්තා) සුඤ්ඤා (හිස්ය/ සුණ්‍යය) [පර+පවාදා] පරප්පවාදා (අන්‍ය වාදකරුවන්ගේ/ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන්) සමණෙහි (ශ්‍රමණයන්ගෙන්) අඤ්ඤෙ'ති (වෙනත්/ මේ ශාසනයෙන් බාහිරවූ)

☞ මහණෙනි! මේහි කාරණාව දක්නටලැබේ, යම්හෙයකින් අන්‍යය ආගමික පැවිද්දන් මෙසේ ද කිවහැක, "කවරක්ද? අයුෂ්මතුන්ලාගේ පිහිට, මොකක්ද බලය? මොකක්ද පදනම? යම්කරුණක් නිසා ආයුෂ්මත් නුඹලා, 'සෝවාන් තැනැත්තා මේ ශාසනයෙහි මය, දෙවන සකදාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, තුන්වන අනාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, සතරවන අරහත් තැනැත්තා මේ ශාසනයෙහිය. මේ ශාසනයෙන් බාහිරවූ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන් (මාර්ගඵල ලාබී) ශ්‍රමණයන්ගෙන් හිස්ය'යැයි කීමට ?"
[ආයුෂ්මත් නුඹලා, මොකක් පදනම්කරගෙන ද 'සෝවාන් තැනැත්තා මේ ශාසනයෙහි මය . . . . . ශ්‍රමණයන්ගෙන් හිස්ය'යැයි කියන්නෙ ?]

• එවංවාදිනො, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා – 'අත්ථි ඛො නො, ආවුසො, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මා අක්ඛාතා යෙ මයං අත්තනි සම්පස්සමානා එවං වදෙම – ඉධෙව සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො; සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ'ති.

★ එවං-වාදිනො (මෙසේ කියන්නාවූ) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (වෙනත් ආගමික පැවිද්දන්ට) එවමස්සු වචනීයා (මෙසේ කිවයුතුය) 'අත්ථි ඛො (ඇත්තේය) නො (අපගේ), ආවුසො (ඇවැත්නි) තෙන භගවතා (ඒ භාග්‍යවත්වූ) ජානතා (සියල්ල දන්නාවූ) පස්සතා (සියල්ල දක්නාවූ) අරහතා (අරිහත්වූ) සම්මාසම්බුද්ධෙන (සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින්) චත්තාරො ධම්මා (සතර ධර්මයක්) අක්ඛාතා (කියනලද) යෙ (යම්/ යම් ධර්මයක්/ ඒ කියනලද ධර්මය) මයං (අපි) අත්තනි (තමාකෙරෙහි/ අපකෙරෙහි) සම්පස්සමානා (දකිමින්) එවං වදෙම (මෙසේ කියන්නෙමු) [ඉධ+එව] ඉධෙව (මෙහි ම/ මේ ශාසනයෙහි ම) සමණො (ශ්‍රමණයා/ සෝවාන් තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) දුතියො සමණො (දෙවන ශ්‍රමණයා/ සකදාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) තතියො සමණො (තුන්වන ශ්‍රමණයා/ අනාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) චතුත්ථො සමණො (සතරවන ශ්‍රමණයා/ අරහත් තැනැත්තා) සුඤ්ඤා (හිස්ය/ සුණ්‍යය) [පර+පවාදා] පරප්පවාදා (අන්‍ය වාදකරුවන්ගේ/ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන්) සමණෙහි (ශ්‍රමණයන්ගෙන්) අඤ්ඤෙ'ති (වෙනත්/ මේ ශාසනයෙන් බාහිරවූ)

☞ මහණෙනි! මෙසේ කියන්නාවූ වෙනත් ආගමික පැවිද්දන්ට මෙසේ කිවයුතුය - ඇවැත්නි! අපගේ ඒ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ භාග්‍යවත්වූ අරිහත්වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් සතර ධර්මයක් කියනලදුව ඇත්තේය. ඒ කියනලද ධර්මය අපි අපකෙරෙහි දකිමින් මෙසේ කියන්නෙමු. සෝවාන් තැනැත්තා මේ ශාසනයෙහි මය, දෙවන සකදාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, තුන්වන අනාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය,

සතරවන අරහත් තැනැත්තා මේ ශාසනයෙහිය. මේ ශාසනයෙන් බාහිරවූ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන් (මාර්ගඵල ලාබී) ශ්‍රමණයන්ගෙන් හිස්ය.

• කතමෙ චත්තාරො? අත්ථි ඛො නො, ආවුසො, සත්ථරි පසාදො, අත්ථි ධම්මෙ පසාදො, අත්ථි සීලෙසු පරිපූරකාරිතා; සහධම්මිකා ඛො පන පියා මනාපා – ගහට්ඨා චෙව පබ්බජිතා ච.

★ කතමෙ චත්තාරො? (කවර සතරක්ද?/ මොනවද ඒ සතර?) අත්ථි ඛො නො (ඇත්තේය අපගේ) ආවුසො (ඇවැත්නි) සත්ථරි පසාදො (ශාස්තෘන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය/ පැහැදීම) අත්ථි ධම්මෙ පසාදො (ධර්මයකෙරෙහි ප්‍රසාදය ඇත) අත්ථි සීලෙසු පරිපූරකාරිතා (සිල්පුරණබව ඇත්තේය) සහධම්මිකා (එක් ධර්මයක් පිළිගන්නාවුන්) ඛො පන (වනාහි)[එකිනෙකාට] පියා මනාපා (ප්‍රිය මනාපය) ගහට්ඨා චෙව පබ්බජිතා ච (ගිහියෝ මෙන්ම පැවිද්දෝ ද)

☞ මොනවද ඒ සතර? ඇවැත්නි! ශාස්තෘන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය අපගේ ඇත්තේය, ධර්මයකෙරෙහි ප්‍රසාදය ඇත්තේය, සිල්පුරණබව ඇත්තේය, එක් ධර්මයක් පිළිගන්නාවූ ගිහියෝ මෙන්ම පැවිද්දෝ ද එකිනෙකාට ප්‍රිය මනාපය.

• ඉමෙ ඛො නො, ආවුසො, තෙන භගවතා ජානතා පස්සතා අරහතා සම්මාසම්බුද්ධෙන චත්තාරො ධම්මා අක්ඛාතා යෙ මයං අත්තනි සම්පස්සමානා එවං වදෙම – ඉධෙව සමණො, ඉධ දුතියො සමණො, ඉධ තතියො සමණො, ඉධ චතුත්ථො සමණො; සුඤ්ඤා පරප්පවාදා සමණෙහි අඤ්ඤෙ'ති.

★ ඉමෙ ඛො (මේ වනාහි) නො (අපගේ), ආවුසො (ඇවැත්නි) තෙන භගවතා (ඒ භාග්‍යවත්වූ) ජානතා (සියල්ල දන්නාවූ) පස්සතා (සියල්ල දක්නාවූ) අරහතා (අරිහත්වූ) සම්මාසම්බුද්ධෙන (සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින්) චත්තාරො ධම්මා (සතර ධර්මයන්) අක්ඛාතා (කියනලදී/ දේශනාකරනලදී) යෙ (යම්/ යම් ධර්මයක්/ ඒ කියනලද ධර්මය) මයං (අපි) අත්තනි (තමාකෙරෙහි/ අපකෙරෙහි) සම්පස්සමානා (දකිමින්) එවං වදෙම (මෙසේ කියන්නෙමු) [ඉධ+එව] ඉධෙව (මෙහි ම/ මේ ශාසනයෙහි ම) සමණො (ශ්‍රමණයා/ සෝවාන් තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) දුතියො සමණො (දෙවන ශ්‍රමණයා/ සකදාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) තතියො සමණො (තුන්වන ශ්‍රමණයා/ අනාගාමී තැනැත්තා) ඉධ (මෙහි/ මේ ශාසනයෙහි) චතුත්ථො සමණො (සතරවන ශ්‍රමණයා/ අරහත් තැනැත්තා) සුඤ්ඤා (හිස්ය/ සුණ්‍යය) [පර+පවාදා] පරප්පවාදා (අන්‍ය වාදකරුවන්ගේ/ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන්) සමණෙහි (ශ්‍රමණයන්ගෙන්) අඤ්ඤෙ'ති (වෙනත්/ මේ ශාසනයෙන් බාහිරවූ)

☞ ඇවැත්නි! අපගේ ඒ සියල්ල දන්නාවූ සියල්ල දක්නාවූ භාග්‍යවත්වූ අරිහත්වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේ විසින් මේ සතර ධර්මයන් දේශනාකරනලදී. ඒ කියනලද ධර්මය අපි අපකෙරෙහි දකිමින් මෙසේ කියන්නෙමු. සෝවාන් තැනැත්තා මේ ශාසනයෙහි මය, දෙවන සකදාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, තුන්වන අනාගාමී තැනැත්තා මේ ශාසනයෙහිය, සතරවන අරහත් තැනැත්තා මේ ශාසනයෙහිය. මේ ශාසනයෙන් බාහිරවූ අන්‍ය ආගමිකයන්ගේ ශාසනයන් (මාර්ගඵල ලාබී) ශ්‍රමණයන්ගෙන් හිස්ය.

• ''ඨානං ඛො පනෙතං, භික්ඛවෙ, විජ්ජති යං අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං වදෙය්‍යුං – 'අම්හාකම්පි ඛො, ආවුසො, අත්ථි සත්ථරි පසාදො යො අම්හාකං සත්ථා, අම්හාකම්පි අත්ථි ධම්මෙ පසාදො යො අම්හාකං ධම්මො,

★ ''යානං ඛො පනෙතං (මේ කාරණාව/ මේ සිද්ධිය) භික්ඛවෙ (මහණෙනි!) විජ්ජති (විද්‍යාමානවේ/ දක්නටලැබේ) යං (යම්සේ) අඤ්ඤතිත්ථියා (අන්‍යය ආගමික) පරිබ්බාජකා (පැවිද්දන්) එවං වදෙය්‍යුං (මෙසේ කියයිනම්/ මෙසේ ද කිවහැක) – [අම්හාකං+අපි] අම්හාකම්පි (අපගේ ද) ඛො, ආවුසො (ඇවැත්නි) අත්ථි සත්ථරි පසාදො (ශාස්තෘන් වහන්සේ කෙරෙහි ප්‍රසාදය/ පැහැදීම ඇත්තේය) යො අම්හාකං (යම් අපගේ) සත්ථා (ශාස්තෘන් වහන්සේ කෙනෙක් වේද), [අම්හාකං+අපි] අම්හාකම්පි (අපගේ ද) අත්ථි ධම්මෙ පසාදො (ධර්මයකෙරෙහි ප්‍රසාදය ඇත්තේය) යො අම්හාකං (යම් අපගේ) ධම්මො (ධර්මයක් වේද)

☞ මහණෙනි! මේහි කාරණාව දක්නටලැබේ, යම්සේ අන්‍යය ආගමික පැවිද්දන් මෙසේ ද කිවහැක - ඇවැත්නි යම් අපගේ ශාස්තෘන් වහන්සේ කෙනෙක් වේද, අපගේ ද ඒ ශාස්තෘන් වහන්සේ කෙරෙහි පැහැදීම ඇත්තේය, යම් අපගේ ධර්මයක් වේද, අපගේ ද ඒ ධර්මයකෙරෙහි ප්‍රසාදය ඇත්තේය.

• මයම්පි සීලෙසු පරිපූරකාරිනො යානි අම්හාකං සීලානි, අම්හාකම්පි සහධම්මිකා පියා මනාපා – ගහට්ඨා වෙව පබ්බජිතා ච. ඉධ නො, ආවුසො, කො විසෙසො කො අධිප්පායො කිං නානාකරණං යදිදං තුම්හාකඤ්ඤෙව අම්හාකඤ්ඤා'ති?

★ [මයං+අපි] මයම්පි (අපි-ත්) සීලෙසු පරිපූරකාරිනො (සිල්පුරණ්නෝය) යානි අම්හාකං සීලානි (යම් අපගේ සීලයක් වේද) [අම්හාකං+අපි] අම්හාකම්පි (අපගේ ද) සහධම්මිකා (එක් ධර්මයක් පිළිගන්නාවුන්) පියා මනාපා (ප්‍රිය මනාපය) ගහට්ඨා වෙව පබ්බජිතා ච (ගිහියෝ මෙන්ම පැවිද්දෝ ද) ඉධ නො (මෙහි අපගේ/ මෙහි අපි දෙපාර්ශවයේ) ආවුසො (ඇවැත්නි) කො විසෙසො (මොකක්ද විශේෂය/ විශේෂය කවරේද) කො අධිප්පායො (මොකක්ද අදහස/ අදහස්වල වෙනස මොකක්ද) කිං නානාකරණං (මොකක්ද වෙනස්වීමට කාරණාව/ වෙනස්වීමට කාරණාව කුමක්ද) යදිදං (යම් මේ) [තුම්හාකං+වෙව] තුම්හාකඤ්ඤෙව (නුඹලගෙ-ත්) [අම්හාකං+ච+ඉති] අම්හාකඤ්ඤා'ති? (අපගෙ-ත්?)

☞ යම් අපගේ සීලයක් වේද, අපිත් ඒ සීලය පුරණ්නෝය. අපගේ ද එක් ධර්මයක් පිළිගන්නාවූ ගිහියෝ මෙන්ම පැවිද්දෝ ද ප්‍රිය මනාපය. මෙහි අපි දෙපාර්ශවයේ මොකක්ද විශේෂය ? අදහස්වල වෙනස මොකක්ද ? යම් මේ නුඹලගෙත් අපගෙත් වෙනස්වීමට කාරණාව කුමක්ද ?

• ''එවංවාදිනො, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවමස්සු වචනීයා – 'කිම්පනාවුසො, එකා නිට්ඨා, උදාහු පුථු නිට්ඨා'ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙය්‍යුං – 'එකාවුසො, නිට්ඨා, න පුථු නිට්ඨා'ති.

★ එවං-වාදිනො (මෙසේ කියන්නාවූ) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (වෙනත් ආගමික පැවිද්දන්ට) එවමස්සු වචනීයා (මෙසේ කිවයුතුය) [කිං+පන+ආවුසො] කිම්පනාවුසො (කිමෙක්ද ඇවැත්නි) එකා නිට්ඨා (එක් අවසානයක්ද) උදාහු (නැතහොත්) පුථු නිට්ඨා'ති? (බොහෝ අවසානයන් වේද,) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙය්‍යුං (මෙසේ පිළිතුරුදෙති) [එකා+ආවුසො] එකාවුසො, නිට්ඨා (ඇවැත්නි එක් අවසානයකි) න පුථු නිට්ඨා'ති (බොහෝ අවසානයන් නැත)

☞ මහණෙනි! මෙසේ කියන්නාවූ වෙනත් ආගමික පැවිද්දන්ට මෙසේ කිවයුතුය - කිමෙක්ද ඇවැත්නි එක් අවසානයක්ද නැතහොත් බොහෝ අවසානයන් වේද? මහණෙනි! නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති ''ඇවැත්නි එක් අවසානයකි බොහෝ අවසානයන් නැත''

☞ මෙහි මෙසේ දැනගතයුතුය :

• තස්මිං සමයෙ නිට්ඨං අපඤ්ඤපෙන්තො නාම නත්ථි, බ්‍රාහ්මණානඤ්හි බ්‍රහ්මලොකො නිට්ඨා, මහාතාපසානං ආභස්සරා, පරිබ්බාජකානං සුභකිණ්හා, ආජීවකානං ''අනන්තමානසො''ති එවං පරිකප්පිතො අසඤ්ඤීභවො. ඉමස්මිං සාසනෙ පන අරහත්තං නිට්ඨා.

★ තස්මිං සමයෙ (ඒ කාලයේ) නිට්ඨං (අවසානයක්) අපඤ්ඤපෙන්තො නාම නත්ථි (නොපනවන්නෝ නම් නැත) [බ්‍රාහ්මණානං+හි] බ්‍රාහ්මණානඤ්හි (බ්‍රාහ්මණයන්ගේ වනාහි) බ්‍රහ්මලොකො නිට්ඨා (බ්‍රහ්මලෝකය අවසානයයි) තාපසානං ආභස්සරා (තාපසයන්ගේ ආභස්සර බඹලොවයි) පරිබ්බාජකානං සුභකිණ්හා (පරිබ්‍රාජකයන්ගේ සුභකිණ්හක බඹලොවයි) ආජීවකානං (ආජීවකයන්ගේ) ''අනන්තමානසො''ති (අනන්ත මනස යැයි) පරිකප්පිතො (සිතාගන්නාලද) අසඤ්ඤීභවො (අසඤ්ඤ භවයයි) ඉමස්මිං සාසනෙ පන (මේ ශාසනයේ වනාහි) අරහත්තං නිට්ඨා (රහත්බව අවසානයයි)

• සබ්බෙව චෙතෙ අරහත්තමෙව නිට්ඨාති වදන්ති. දිට්ඨිවසෙන පන බ්‍රහ්මලොකාදීනි පඤ්ඤපෙන්ති. තස්මා අත්තනො අත්තනො ලද්ධිවසෙන එකමෙව නිට්ඨං පඤ්ඤපෙන්ති, තං දස්සෙතුං භගවා **සම්මා බ්‍යාකරමානාති** ආදිමාහ.

★ සබ්බෙ-ව (සියල්ලම) [ච+එතෙ] චෙතෙ (ඔවුන්) [අරහත්තං+එව] අරහත්තමෙව (රහතිබව ම) නිට්ඨා-ති වදන්ති (අවසානය යැයි කියති) දිට්ඨිවසෙන පන (දිට්ඨිය වශයෙන් වනාහි) බ්‍රහ්මලොකාදීනි (බ්‍රක්මලෝකාදිය) පඤ්ඤපෙන්ති (පනවති) තස්මා (එබැවින්) අත්තනො අත්තනො (තම තමාගේ) ලද්ධි-වසෙන (විශ්වාසය-පිළිගැනීම වශයෙන්) එකමෙව (එකම) නිට්ඨං පඤ්ඤපෙන්ති (අවසානයක් පනවති) තං දස්සෙතුං භගවා (එය දැක්වීමට භාග්‍යවතුන් වහන්සේ) **සම්මා බ්‍යාකරමානාති** (''**සම්මා බ්‍යාකරමානා**'' යැයි) [ආදිං+ආහ] ආදිමාහ (මුලින්ම කීය)

• ''සා පනාවුසො, නිට්ඨා සරාගස්ස උදාහු වීතරාගස්සා'ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙය්‍යුං – 'වීතරාගස්සාවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා සරාගස්සා'ති.

★ ''සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) සරාගස්ස (රාගය ඇත්තාටද) උදාහු (නැතහොත්) වීතරාගස්සා'ති? (රාගය නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙය්‍යුං (මෙසේ පිළිතුරුදෙති) [වීතරාගස්ස+ආවුසො] වීතරාගස්සාවුසො (ඇවැත්නි රාගය නැත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා සරාගස්සා'ති (ඒ අවසානය රාගය ඇත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය රාගය ඇත්තාටද නැතහොත් රාගය නැත්තාටද? 'මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති'. 'ඇවැත්නි ඒ අවසානය රාගය නැත්තාටය, ඒ අවසානය රාගය ඇත්තාට නොවේය' කියා

• ''සා පනාවුසො, නිට්ඨා සදොසස්ස උදාහු වීතදොසස්සා'ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙයුං – 'වීතදොසස්සාවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා සදොසස්සා'ති.

★ ''සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) සදොසස්ස (ද්වේෂය ඇත්තාටද) උදාහු (නැතහොත්) වීතදොසස්සා'ති? (ද්වේෂය නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙයුං (මෙසේ පිළිතුරුදෙති) [වීතදොසස්ස+ආවුසො] වීතදොසස්සාවුසො (ඇවැත්නි ද්වේෂය නැත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා සදොසස්සා'ති. (ඒ අවසානය ද්වේෂය ඇත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය ද්වේෂය ඇත්තාටද නැතහොත් ද්වේෂය නැත්තාටද? 'මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති'. 'ඇවැත්නි ඒ අවසානය ද්වේෂය නැත්තාටය, ඒ අවසානය ද්වේෂය ඇත්තාට නොවේය' කියා

• ''සා පනාවුසො, නිට්ඨා සමොහස්ස උදාහු වීතමොහස්සා'ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙයුං – 'වීතමොහස්සාවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා සමොහස්සා'ති.

★ ''සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) සමොහස්ස (මෝහය ඇත්තාටද) උදාහු (නැතහොත්) වීතමොහස්සා'ති? (මෝහය නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙයුං (මෙසේ පිළිතුරුදෙති) [වීතමොහස්ස+ආවුසො] වීතමොහස්සාවුසො (ඇවැත්නි මෝහය නැත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා සමොහස්සා'ති. (ඒ අවසානය මෝහය ඇත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය මෝහය ඇත්තාටද නැතහොත් මෝහය නැත්තාටද? 'මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති'. 'ඇවැත්නි ඒ අවසානය මෝහය නැත්තාටය, ඒ අවසානය මෝහය ඇත්තාට නොවේය' කියා

• ''සා පනාවුසො, නිට්ඨා සතණ්හස්ස උදාහු වීතතණ්හස්සා'ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙයුං – 'වීතතණ්හස්සාවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා සතණ්හස්සා'ති.

★ ''සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) සතණ්හස්ස (තණ්හාව ඇත්තාටද) උදාහු (නැතහොත්) වීතතණ්හස්සා'ති? (තණ්හාව නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙයුං (මෙසේ පිළිතුරුදෙති) [වීතතණ්හස්ස+ආවුසො] වීතතණ්හස්සාවුසො (ඇවැත්නි තණ්හාව නැත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා සතණ්හස්සා'ති. (ඒ අවසානය තණ්හාව ඇත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය තණ්හාව ඇත්තාටද නැතහොත් තණ්හාව නැත්තාටද? ‘මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති’. ‘ඇවැත්නි ඒ අවසානය තණ්හාව නැත්තාටය, ඒ අවසානය තණ්හාව ඇත්තාට නොවේය’ කියා

• ‘‘සා පනාවුසො, නිට්ඨා සඋපාදානස්ස උදාහු අනුපාදානස්සා’ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙයුං – ‘අනුපාදානස්සාවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා සඋපාදානස්සා’ති.

★ ‘‘සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) සඋපාදානස්ස (උපාදාන ඇත්තාටද) උදාහු (නැතහොත්) අනුපාදානස්සා’ති? (උපාදාන නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙයුං (මෙසේ පිළිතුරුදෙති) [අනුපාදානස්ස+ආවුසො] අනුපාදානස්සාවුසො (ඇවැත්නි උපාදාන නැත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා සඋපාදානස්සා’ති. (ඒ අවසානය උපාදාන ඇත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය උපාදාන ඇත්තාටද නැතහොත් උපාදාන නැත්තාටද? ‘මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති’. ‘ඇවැත්නි ඒ අවසානය උපාදාන නැත්තාටය, ඒ අවසානය උපාදාන ඇත්තාට නොවේය’ කියා

• ‘‘සා පනාවුසො, නිට්ඨා විද්දසුනො උදාහු අවිද්දසුනො’ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙයුං – ‘විද්දසුනො, ආවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා අවිද්දසුනො’ති.

★ ‘‘සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) විද්දසුනො (පණ්ඩිතයාටද/ නුවණ ඇත්තාටද) උදාහු (නැතහොත්) අවිද්දසුනො’ති? (නුවණ නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙයුං (මෙසේ පිළිතුරුදෙති) විද්දසුනො ආවුසො (ඇවැත්නි නුවණ ඇත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා අවිද්දසුනො’ති. (ඒ අවසානය නුවණ නැත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය නුවණ ඇත්තාටද නැතහොත් නුවණ නැත්තාටද? ‘මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති’. ‘ඇවැත්නි ඒ අවසානය නුවණ ඇත්තාටය, ඒ අවසානය නුවණ නැත්තාට නොවේය’ කියා

• ‘‘සා පනාවුසො, නිට්ඨා අනුරුද්ධප්පටිවිරුද්ධස්ස උදාහු අනනුරුද්ධඅප්පටිවිරුද්ධස්සා’ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙයුං – ‘අනනුරුද්ධඅප්පටිවිරුද්ධස්සාවුසො, සා නිට්ඨා, න සා නිට්ඨා අනුරුද්ධප්පටිවිරුද්ධස්සා’ති.

★ ‘‘සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) අනුරුද්ධ-පටිවිරුද්ධස්ස (ඇලීම් ගැටීම් ඇත්තාටද) උදාහු (නැතහොත්) අනනුරුද්ධ-අප්පටිවිරුද්ධස්සා’ති? (ඇලීම් ගැටීම් නැත්තාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙයුං (මෙසේ පිළිතුරුදෙති) [අනනුරුද්ධ-අප්පටිවිරුද්ධස්ස+ආවුසො] අනනුරුද්ධ-අප්පටිවිරුද්ධස්සාවුසො (ඇවැත්නි ඇලීම් ගැටීම් නැත්තාටය) සා නිට්ඨා (ඒ අවසානය) න සා නිට්ඨා අනුරුද්ධ-පටිවිරුද්ධස්සා’ති. (ඒ අවසානය ඇලීම් ගැටීම් ඇත්තාට නොවේය කියා)

☞ ඇවැත්නි ඒ අවසානය ඇලීම් ගැටීම් ඇත්තාටද නැතහොත් ඇලීම් ගැටීම් නැත්තාටද? ‘මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති’. ‘ඇවැත්නි ඒ අවසානය ඇලීම් ගැටීම් නැත්තාටය, ඒ අවසානය ඇලීම් ගැටීම් ඇත්තාට නොවේය’ කියා

• ‘‘සා පනාවුසො, නිට්ඨා පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො උදාහු නිප්පපඤ්චාරාමස්ස නිප්පපඤ්චරතිනො’ති? සම්මා බ්‍යාකරමානා, භික්ඛවෙ, අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා එවං බ්‍යාකරෙය්‍යුං – ‘නිප්පපඤ්චාරාමස්සාවුසො, සා නිට්ඨා නිප්පපඤ්චරතිනො, න සා නිට්ඨා පපඤ්චාරාමස්ස පපඤ්චරතිනො’ති.

★ ‘‘සා (ඒ) [පන+ආවුසො] පනාවුසො (ඇවැත්නි) නිට්ඨා (අවසානය) [පපඤ්ච+රාමස්ස] පපඤ්චාරාමස්ස (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට කැමති) පපඤ්ච-රතිනො (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී සිටින්නාටද) උදාහු (නැතහොත්) [නිපපඤ්ච+රාමස්ස] නිප්පපඤ්චාරාමස්ස (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට නො කැමති) නිප්පපඤ්චරතිනො’ති? (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී නො සිටින්නාටද?) සම්මා බ්‍යාකරමානා (නිවැරදිලෙස පිළිතුරුදෙමින්) භික්ඛවෙ (මහණෙනි!) අඤ්ඤතිත්ථියා පරිබ්බාජකා (අන්‍ය ආගමික පැවිද්දන්) එවං බ්‍යාකරෙය්‍යුං (මෙසේ පිළිතුරුදෙති) [නිප්පපඤ්ච+රාමස්ස+ආවුසො] නිප්පපඤ්චාරාමස්සාවුසො (ඇවැත්නි! ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට නො කැමති) සා නිට්ඨා නිප්පපඤ්ච-රතිනො (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී නො සිටින්නාටය ඒ අවසානය) න සා නිට්ඨා (ඒ අවසානය) [පපඤ්ච+රාමස්ස] පපඤ්චාරාමස්ස (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට කැමති) පපඤ්ච-රතිනො (ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී සිටින්නාට නොවේය, කියා)

☞ ඇවැත්නි! ඒ අවසානය ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට කැමති ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී සිටින්නාටද නැතහොත්, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට නො කැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී නො සිටින්නාටද? ‘මහණෙනි! අන්‍ය ආගමික පැවිද්දන් නිවැරදිලෙස පිළිතුරුදෙමින් මෙසේ පිළිතුරුදෙති’. ‘ඇවැත්නි! ඒ අවසානය ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට නො කැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී නො සිටින්නාටය. ඒ අවසානය ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට කැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී සිටින්නාට නොවේය, කියා

• ‘‘ද්වෙමා, භික්ඛවෙ, දිට්ඨියො – භවදිට්ඨි ච විභවදිට්ඨි ච. යෙ හි කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා භවදිට්ඨිං අල්ලීනා භවදිට්ඨිං උපගතා භවදිට්ඨිං අජ්ඣොසිතා, විභවදිට්ඨියා තෙ පටිවිරුද්ධා.

★ [ද්වෙ+ඉමෙ] ද්වෙමා භික්ඛවෙ, දිට්ඨියො (මහණෙනි! මේ දෘෂ්ටි දෙකකි) භවදිට්ඨි ච විභවදිට්ඨි ච (භව දෘෂ්ටිය ද විභව දෘෂ්ටි ද) යෙ හි කෙචි (යම්කිසි) භික්ඛවෙ (මහණෙනි!) සමණා වා බ්‍රාහ්මණා වා (ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ) භවදිට්ඨිං අල්ලීනා (භව දෘෂ්ටියෙහි ඇලුනේද) භවදිට්ඨිං උපගතා (භව දෘෂ්ටියට පැමිණියේ ද) භවදිට්ඨිං අජ්ඣොසිතා (භව දෘෂ්ටියෙහි බැසගත්තේ ද) විභවදිට්ඨියා (විභව දෘෂ්ටියට) තෙ පටිවිරුද්ධා (ඔවුන් විරුද්ධය)

☞ මහණෙනි! මේ භව දෘෂ්ඨිය හා විභව දෘෂ්ටි ලෙස දෘෂ්ටි දෙකකි. මහණෙනි! යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ භව දෘෂ්ටියෙහි ඇලුනේද භව දෘෂ්ටියට පැමිණියේ ද භව දෘෂ්ටියෙහි බැසගත්තේ ද ඔවුන් විභව දෘෂ්ටියට විරුද්ධය.

• යෙ හි කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා විභවදිට්ඨිං අල්ලීනා විභවදිට්ඨිං උපගතා විභවදිට්ඨිං අජ්ඣොසිතා, භවදිට්ඨියා තෙ පටිවිරුද්ධා.

★ යෙ හි කෙචි (යම්කිසි) භික්ඛවෙ (මහණෙනි!) සමණා වා බ්‍රාහ්මණා වා (ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ) විභවදිට්ඨිං අල්ලීනා (විභව දෘෂ්ටියෙහි ඇලුනේද) විභවදිට්ඨිං උපගතා (විභව දෘෂ්ටියට පැමිණියේ ද) විභවදිට්ඨිං අජ්ඣොසිතා (විභව දෘෂ්ටියෙහි බැසගත්තේ ද) භවදිට්ඨියා (භව දෘෂ්ටියට) තෙ පටිවිරුද්ධා (ඔවුන් විරුද්ධය)

☞ මහණෙනි! යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ විභව දෘෂ්ඨියෙහි ඇලුනේද විභව දෘෂ්ටියට පැමිණියේ ද විභව දෘෂ්ටියෙහි බැසගත්තේ ද ඔවුන් භව දෘෂ්ටියට විරුද්ධය.

• යෙ හි කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං ද්වින්නං දිට්ඨීනං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං නප්පජානන්ති, ‘තෙ සරාගා තෙ සදොසා තෙ සමොහා තෙ සතණ්හා තෙ සඋපාදානා තෙ අවිද්දසුනො තෙ අනුරුද්ධපටිවිරුද්ධා තෙ පපඤ්චාරාමා පපඤ්චරතිනො;

★ යෙ හි කෙචි (යම්කිසි) භික්ඛවෙ (මහණෙනි!) සමණා වා බ්‍රාහ්මණා වා (ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ) ඉමාසං ද්වින්නං දිට්ඨීනං (මේ දෘෂ්ටින් දෙකෙහි) [සමුදයං+ච] සමුදයඤ්ච (හටගැනිම ද/ ඇතිවිම ද) [අත්ථඞ්ගමං+ච] අත්ථඞ්ගමඤ්ච (නිරෝදය ද/ අවසන්විම ද) [අස්සාදං+ච] අස්සාදඤ්ච (ආස්වාදය ද) [ආදීනවං+ච] ආදීනවඤ්ච (ආදීනවය ද) [නිස්සරණං+ච] නිස්සරණඤ්ච (නික්මයාම ද/ එයින් මිදීම ද) යථාභූතං (සත්‍යය ආකාරයෙන්ම/ ඇතිසැටියට) නප්පජානන්ති (නො දනිත් ද) ‘තෙ සරාගා (ඔවුන් රාගය ඇත්තෝය) තෙ සදොසා (ඔවුන් ද්වේෂය ඇත්තෝය) තෙ සමොහා (ඔවුන් මෝහය ඇත්තෝය) තෙ සතණ්හා (ඔවුන් තණ්හාව ඇත්තෝය) තෙ සඋපාදානා (ඔවුන් උපාදාන ඇත්තෝය) තෙ අවිද්දසුනො (ඔවුන් නුවණ නැත්තෝය) තෙ අනුරුද්ධ-පටිවිරුද්ධා (ඔවුන් ඇලීම් ගැටීම් ඇත්තෝය) තෙ පපඤ්චාරාමා පපඤ්චරතිනො (ඔවුන් ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට කැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී සිටින්නෝය)

☞ මහණෙනි! යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ දෘෂ්ටින් දෙකෙහි හටගැනිම ද අවසන්විම ද ආස්වාදය ද ආදීනවය ද එයින් මිදීම ද සත්‍යය ආකාරයෙන්ම නො දනිත් ද, ඔවුන් රාගය ඇත්තෝය, ඔවුන් ද්වේෂය ඇත්තෝය, ඔවුන් මෝහය ඇත්තෝය, ඔවුන් තණ්හාව ඇත්තෝය, ඔවුන් උපාදාන ඇත්තෝය, ඔවුන් නුවණ නැත්තෝය, ඔවුන් ඇලීම් ගැටීම් ඇත්තෝය, ඔවුන් ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට කැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී සිටින්නෝය.

• තෙ න පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි; න පරිමුච්චන්ති දුක්ඛස්මා’ති වදාමි.

★ තෙ (ඔවුන්) න පරිමුච්චන්ති (නො මිදෙති) ජාතියා (ජාතියෙන්/ ඉපදීමෙන්) ජරාය (ජරාවෙන්/ වයසටයෑමෙන්) මරණෙන (මරණයෙන්) සොකෙහි (ශෝක කිරීමෙන්) පරිදෙවෙහි (හැඬීම්වලින්) දුක්ඛෙහි (දුක්කයන්ගෙන්) දොමනස්සෙහි (දෝමනස්සයන්ගෙන්) උපායාසෙහි (දැඩි දුකනිසා සිතට ඇතිවන වෙහෙසින්) න පරිමුච්චන්ති (නො මිදෙති) [දුක්ඛස්මා+ඉති] දුක්ඛස්මා’ති වදාමි (දුකෙන් යැයි කියමි)

☞ ඔවුන් ඉපදීමෙන්, වයසටයෑමෙන්, මරණයෙන්, සෝක කිරීමෙන්, හැඬීම්-වැලපීම් වලින්, දුක්කයන්ගෙන්, දෝමනස්සයන්ගෙන්, දැඩි දුකනිසා සිතට ඇතිවන වෙහෙසින්, නො මිදෙති. ඔවුන් දුකෙන් නො මිදෙති යැයි කියමි.

• යෙ ච ඛො කෙචි, භික්ඛවෙ, සමණා වා බ්‍රාහ්මණා වා ඉමාසං ද්වින්නං දිට්ඨීනං සමුදයඤ්ච අත්ථඞ්ගමඤ්ච අස්සාදඤ්ච ආදීනවඤ්ච නිස්සරණඤ්ච යථාභූතං පජානන්ති, ‘තෙ වීතරාගා තෙ වීතදොසා තෙ වීතමොහා තෙ වීතතණ්හා තෙ අනුපාදානා තෙ විද්දසුනො තෙ අනනුරුද්ධඅප්පටිවිරුද්ධා තෙ නිප්පපඤ්චාරාමා නිප්පපඤ්චරතිනො;

★ යෙ ච ඛො කෙචි (යම්කිසි) භික්ඛවෙ (මහණෙනි!) සමණා වා බ්‍රාහ්මණා වා (ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ) ඉමාසං ද්වින්නං දිට්ඨීනං (මේ දෘෂ්ටින් දෙකෙහි) [සමුදයං+ච] සමුදයඤ්ච (හටගැනිම ද/ ඇතිවිම ද) [අත්ථඞ්ගමං+ච] අත්ථඞ්ගමඤ්ච (නිරෝදය ද/ අවසන්විම ද) [අස්සාදං+ච] අස්සාදඤ්ච (ආස්වාදය ද) [ආදීනවං+ච] ආදීනවඤ්ච (ආදීනවය ද) [නිස්සරණං+ච] නිස්සරණඤ්ච (නික්මයාම ද/ එයින් මිදීම ද) යථාභූතං (සත්‍යය ආකාරයෙන්ම/ ඇතිසැටියට) පජානන්ති (දනිත් ද) ‘තෙ වීතසරාගා (ඔවුන් රාගය නැත්තෝය) තෙ වීතසදොසා (ඔවුන් ද්වේෂය නැත්තෝය) තෙ වීතසමොහා (ඔවුන් මෝහය නැත්තෝය) තෙ වීතතණ්හා (ඔවුන් තණ්හාව නැත්තෝය) තෙ අනුපාදානා (ඔවුන් උපාදාන නැත්තෝය) තෙ විද්දසුනො (ඔවුන් නුවණ ඇත්තෝය) තෙ අනනුරුද්ධ-අප්පටිවිරුද්ධා (ඔවුන් ඇලීම් ගැටීම් නැත්තෝය) තෙ නිප්පපඤ්චාරාමා නිප්පපඤ්චරතිනො (ඔවුන් ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට අකැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී නො සිටින්නෝය)

☞ මහණෙනි! යම්කිසි ශ්‍රමණයෙක් හෝ බ්‍රාහ්මණයෙක් හෝ මේ දෘෂ්ටින් දෙකෙහි හටගැනිම ද අවසන්විම ද ආස්වාදය ද ආදීනවය ද එයින් මිදීම ද සත්‍යය ආකාරයෙන්ම දනිත් ද, ඔවුන් රාගය නැත්තෝය, ඔවුන් ද්වේෂය නැත්තෝය, ඔවුන් මෝහය නැත්තෝය, ඔවුන් තණ්හාව නැත්තෝය, ඔවුන් උපාදාන නැත්තෝය, ඔවුන් නුවණ ඇත්තෝය, ඔවුන් ඇලීම් ගැටීම් නැත්තෝය, ඔවුන් ප්‍රමාදයට හේතුවන කෙලෙස්වලට අකැමති, ප්‍රමාදයට හේතුවන කෙලෙස්වල ඇලීගැලී නො සිටින්නෝය.

• තෙ පරිමුච්චන්ති ජාතියා ජරාය මරණෙන සොකෙහි පරිදෙවෙහි දුක්ඛෙහි දොමනස්සෙහි උපායාසෙහි; පරිමුච්චන්ති දුක්ඛස්මා’ති වදාමි.

★ තෙ (ඔවුන්) පරිමුච්චන්ති (මිදෙති) ජාතියා (ජාතියෙන්/ ඉපදීමෙන්) ජරාය (ජරාවෙන්/ වයසටයෑමෙන්) මරණෙන (මරණයෙන්) සොකෙහි (සෝක කිරීමෙන්) පරිදෙවෙහි (හැඬීම්වලින්) දුක්ඛෙහි (දුක්කයන්ගෙන්) දොමනස්සෙහි (දෝමනස්සයන්ගෙන්) උපායාසෙහි (දැඩි දුකනිසා සිතට ඇතිවන වෙහෙසින්) පරිමුච්චන්ති (මිදෙති) [දුක්ඛස්මා+ඉති] දුක්ඛස්මා’ති වදාමි (දුකෙන් යැයි කියමි)

☞ ඔවුන් ඉපදීමෙන්, වයසටයෑමෙන්, මරණයෙන්, සෝක කිරීමෙන්, හැඬීම්-වැලපීම් වලින්, දුක්කයන්ගෙන්, දෝමනස්සයන්ගෙන්, දැඩි දුකනිසා සිතට ඇතිවන වෙහෙසින්, මිදෙති. ඔවුන් දුකෙන් මිදෙති යැයි කියමි.

• ‘‘චත්තාරිමානි, භික්ඛවෙ, උපාදානානි. කතමානි චත්තාරි? කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්තවාදුපාදානං. සන්ති, භික්ඛවෙ, එකෙ සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා, තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති

★ [චත්තාරි+ඉමානි] චත්තාරිමානි (මේ සතරකි) භික්ඛවෙ (මහණෙනි!) උපාදානානි (උපාදානයන්) කතමානි චත්තාරි? (කවර සතරදෙනෙක් ද?/ මොනවද ඒ සතර) කාමුපාදානං, දිට්ඨුපාදානං, සීලබ්බතුපාදානං, අත්තවාදුපාදානං (කාමඋපාදානය, දිට්ටි උපාදානය, සීලබ්බත උපාදානය, අත්තවාද උපාදානය) සන්ති (ඇත්තාහ) භික්ඛවෙ (මහණෙනි!) එකෙ (ඇතැම්) සමණබ්‍රාහ්මණා (ශ්‍රමණබ්‍රාහ්මණයන්) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදා (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානා (ප්‍රතිඥාකලත්) තෙ (ඔවුන්) <u>න</u> සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙන්ති (<u>නො</u> පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති)

☞ මහණෙනි! මේ උපාදානයන් සතරකි. කවර සතරදෙනෙක් ද? කාමඋපාදානය, දිට්ටි උපාදානය, සීලබ්බත උපාදානය, අත්තවාද උපාදානය. මහණෙනි! සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ ඇතැම් ශ්‍රමණබ්‍රාහ්මණයන් ඇත්තාහ. ඔවුන් එසේ ප්‍රතිඥාකලත් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය නො කියති.

• කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතු? ඉමානි හි තෙ හොන්තො සමණබ්‍රාහ්මණා තීණි ඨානානි යථාභූතං නප්පජානන්ති.

★ කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (කාම උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) න දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) තං කිස්ස හෙතු? (එයට හේතුව කුමක්ද?) ඉමානි හි (මේ ඒකාන්තයෙන්) තෙ හොන්තො සමණබ්‍රාහ්මණා (ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්) තීණි ඨානානි (තුන් තැන/ කරුණු තුනක්) යථාභූතං (සත්‍යය ආකාරයෙන්ම පවතින අයුරු) නප්පජානන්ති (නො දනිති)

☞ කාම උපාදානයාගේ ප්‍රහාණය කියති, දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය නො කියති, සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො කියති, අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො කියති, එයට හේතුව කුමක්ද? ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඒකාන්තයෙන් මේ කරුණු තුන සත්‍යය ආකාරයෙන්ම පවතින අයුරු නො දනිති.

• තස්මා තෙ හොන්තො සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා; තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති – කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති.

★ තස්මා (එබැවින්) තෙ හොන්තො (ඒ පින්වත්) සමණබ්‍රාහ්මණා (ශ්‍රමණබ්‍රාහ්මණයන්) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදා (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානා (ප්‍රතිඥාකලත්) තෙ (ඔවුන්) <u>න</u> සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙන්ති (<u>නො</u> පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (කාම උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති)

න දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති)

☞ එබැවින් සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ ඒ පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයන් එසේ ප්‍රතිඤ්ඤාකලත් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය නො කියති. කාම උපාදානයාගේ ප්‍රහාණය කියති, දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය නො කියති, සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො කියති, අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො කියති.

• සන්ති, භික්ඛවෙ, එකෙ සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා, තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති

★ සන්ති (ඇත්තාහ) භික්ඛවෙ (මහණෙනි!) එකෙ (ඇතැම්) සමණබ්‍රාහ්මණා (ශ්‍රමණබ්‍රාහ්මණයන්) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදා (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානා (ප්‍රතිඤ්ඤාකලත්) තෙ (ඔවුන්) <u>න</u> සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙන්ති (<u>නො</u> පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති)

☞ මහණෙනි! සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ ඇතැම් ශ්‍රමණබ්‍රාහ්මණයන් ඇත්තාහ. ඔවුන් එසේ ප්‍රතිඤ්ඤාකලත් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය නො කියති.

• කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතු? ඉමානි හි තෙ හොන්තො සමණබ්‍රාහ්මණා ද්වේ ඨානානි යථාභූතං නප්පජානන්ති.

★ කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (කාම උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) තං කිස්ස හෙතු? (එයට හේතුව කුමක්ද?) ඉමානි හි (මේ ඒකාන්තයෙන්) තෙ හොන්තො සමණබ්‍රාහ්මණා (ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්) දවේ ඨානානි (දෙ තැනක්/ කරුණු දෙකක්) යථාභූතං (සත්‍යය ආකාරයෙන්ම පවතින අයුරු) නප්පජානන්ති (නො දනිති)

☞ කාම උපාදානයාගේ ප්‍රහාණය කියති, දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය කියති, සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො කියති, අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො කියති, එයට හේතුව කුමක්ද? ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඒකාන්තයෙන් මේ කරුණු දෙක සත්‍යය ආකාරයෙන්ම පවතින අයුරු නො දනිති.

• තස්මා තෙ හොන්තො සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා; තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති – කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති.

★ තස්මා (එබැවින්) තෙ හොන්තො (ඒ පින්වත්) සමණබ්‍රාහ්මණා (ශ්‍රමණබ්‍රාහ්මණයන්) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදා (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානා (ප්‍රතිඤ්ඤාකලත්) තෙ (ඔවුන්) <u>න</u> සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙන්ති (<u>නො</u> පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (කාම උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (දිට්ඨි උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) න සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති)

☞ එබැවින් සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ ඒ පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයන් එසේ ප්‍රතිඤ්ඤාකලත් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය නො කියති. කාම උපාදානයාගේ ප්‍රහාණය කියති, දිට්ඨි උපාදානයාගේ ප්‍රහාණය කියති, සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය නො කියති, අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො කියති.

• සන්ති, භික්ඛවෙ, එකෙ සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා, තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති

★ සන්ති (ඇත්තාහ) භික්ඛවෙ (මහණෙනි!) එකෙ (ඇතැම්) සමණබ්‍රාහ්මණා (ශ්‍රමණබ්‍රාහ්මණයන්) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදා (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානා (ප්‍රතිඤ්ඤාකලත්) තෙ (ඔවුන්) <u>න</u> සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙන්ති (<u>නො</u> පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති)

☞ මහණෙනි! සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ ඇතැම් ශ්‍රමණබ්‍රාහ්මණයන් ඇත්තාහ. ඔවුන් එසේ ප්‍රතිඤ්ඤාකලත් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය නො කියති.

• කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති. තං කිස්ස හෙතු? ඉමං හි තෙ හොන්තො සමණබ්‍රාහ්මණා එකං ඨානං යථාභූතං නප්පජානන්ති.

★ කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (කාම උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (දිට්ඨි උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) තං කිස්ස හෙතු? (එයට හේතුව කුමක්ද?) ඉමං හි (මේ ඒකාන්තයෙන්) තෙ හොන්තො සමණබ්‍රාහ්මණා (ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන්) එකං ඨානං (එක් තැනක්/ එක් කරුණක්) යථාභූතං (සත්‍යය ආකාරයෙන්ම පවතින අයුරු) නප්පජානන්ති (නො දනිති)

☞ කාම උපාදානයාගේ ප්‍රහාණය කියති, දිට්ඨි උපාදානයාගේ ප්‍රහාණය කියති, සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය කියති, අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො කියති, එයට හේතුව කුමක්ද? ඒ පින්වත් ශ්‍රමණ බ්‍රාහ්මණයන් ඒකාන්තයෙන් මෙහි එක් කරුණක් සත්‍යය ආකාරයෙන්ම පවතින අයුරු නො දනිති.

• තස්මා තෙ හොන්තො සමණබ්‍රාහ්මණා සබ්බුපාදානපරිඤ්ඤාවාදා පටිජානමානා; තෙ න සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙන්ති – කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති, න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති.

★ තස්මා (එබැවින්) තෙ හොන්තො (ඒ පින්වත්) සමණබ්‍රාහ්මණා (ශ්‍රමණබ්‍රාහ්මණයන්) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදා (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානා (ප්‍රතිඤ්ඤාකලත්) තෙ (ඔවුන්) <u>න</u> සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙන්ති (<u>නො</u> පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති) කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (කාම උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය පනවති/ කියති/ ප්‍රකාශකරති) න අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙන්ති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො පනවති/ නො කියති/ ප්‍රකාශනොකරති)

☞ එබැවින් සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ ඒ පින්වත් ශ්‍රමණබ්‍රාහ්මණයන් එසේ ප්‍රතිඤ්ඤාකලත් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය නො කියති. කාම උපාදානයාගේ ප්‍රහාණය කියති, දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය කියති, සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය කියති, අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය නො කියති.

• ‘‘එවරූපෙ ඛො, භික්ඛවෙ, ධම්මවිනයෙ යො සත්ථරි පසාදො සො න සම්මග්ගතො අක්ඛායති; යො ධම්මෙ පසාදො සො න සම්මග්ගතො අක්ඛායති; යා සීලෙසු පරිපූරකාරිතා සා න සම්මග්ගතා අක්ඛායති; යා සහධම්මිකෙසු පියමනාපතා සා න සම්මග්ගතා අක්ඛායති.

★ ‘‘එවරූපෙ (මෙවැනිවූ/ මෙබඳුවූ) ඛො, භික්ඛවෙ (මහණෙනි!) ධම්මවිනයෙ (ධර්මවිනයෙහි/ ශාසනයෙහි) යො (යම්) සත්ථරි (ශාස්තෘන් කෙරෙහි) පසාදො (ප්‍රසාදයක්-පැහැදීමක් වේද) සො (එය) න සම්මග්ගතො අක්ඛායති (යහපත්-බවටපත් පැහැදීමක් යැයි කියනු නො ලැබේ / නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ) යො ධම්මෙ පසාදො (යම් ධර්මය කෙරෙහි ප්‍රසාදයක්-පැහැදීමක් වේද) සො න සම්මග්ගතො අක්ඛායති (එය යහපත්-බවටපත් පැහැදීමක් යැයි කියනු නො ලැබේ /එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ) යා සීලෙසු පරිපූරකාරිතා (යම් සිල්පරිපූරණය කිරීමක් වේද) සා න සම්මග්ගතා අක්ඛායති (එය යහපත්-බවටපත් පැහැදීමක් යැයි කියනු නො ලැබේ /එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ) යා සහධම්මිකෙසු (යම් එකමධර්මයක් පිළිගන්නාවුන් කෙරෙහි) පියමනාපතා (ප්‍රියමනාප බවක් වේද) සා න සම්මග්ගතා අක්ඛායති (එය යහපත්-බවටපත් පැහැදීමක් යැයි කියනු නො ලැබේ /එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ)

☞ මහණෙනි! මෙබඳුවූ ශාසනයන්හි ශාස්තෘන් කෙරෙහි යම් ප්‍රසාදයක්-පැහැදීමක් වේද, එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ. ධර්මය කෙරෙහි යම් ප්‍රසාදයක්-පැහැදීමක් වේද, එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ. යම් සිල්පරිපූරණය කිරීමක් වේද, එය නිවනට ගෙනයන්නාවූ සිල්පරිපූරණය කිරීමක් යැයි කියනු නො ලැබේ. එකමධර්මයක් පිළිගන්නාවුන් කෙරෙහි යම් ප්‍රියමනාප බවක් වේද, එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු නො ලැබේ.

• තං කිස්ස හෙතු? එවං හෙතං, භික්ඛවෙ, හොති යථා තං දුරක්ඛාතෙ ධම්මවිනයෙ දුප්පවෙදිතෙ අනියාානිකෙ අනුපසමසංවත්තනිකෙ අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

★ තං කිස්ස හෙතු? (එයට හේතුව කුමක්ද?) එවං (මෙසේ) [හි+එතං] හෙතං (මෙය/ මේ කාරණය) භික්ඛවෙ (මහණෙනි!) හොති (වේ) යථා තං (යම්සේ එය) [දු+අක්ඛාතෙ] දුරක්ඛාතෙ (වැරදිලෙස කියනලද) ධම්මවිනයෙ (ධර්මවිනයෙහි/ ශාසනයෙහි) [දු+පවෙදිතෙ] දුප්පවෙදිතෙ (වැරදිලෙස ප්‍රකාශලක/ වැරදිලෙස දැනුම්දුන්) අනියාානිකෙ (මාර්ගඵල වෙත ගෙන නොයන්නාවූ) [න+උපසම-සංවත්තනිකෙ] අනුපසමසංවත්තනිකෙ (සංසිඳීම පිණිස නො පවත්නාවූ) [අසම්මා-සම්බුද්ධ+පවෙදිතෙ] අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ (සම්ම සම්බුදුවරයෙක් නොවූවෙක් විසින් කියනලද්දක් බැවිනි)

☞ එයට හේතුව කුමක්ද? මහණෙනි! මෙසේ මේ කාරණය වේ. යම්සේ එය වැරදිලෙස කියනලද, වැරදිලෙස ප්‍රකාශලක, මාර්ගඵල වෙත ගෙන නොයන්නාවූ, සංසිඳීම පිණිස නො පවත්නාවූ, සම්ම සම්බුදුවරයෙක් නොවූවෙක් විසින් කියනලද ධර්මවිනයක් බැවිනි.

• ‘‘තථාගතො ච ඛො, භික්ඛවෙ, අරහං සම්මාසම්බුද්ධො සබ්බුපාදානපරිඤ්ඤාවාදො පටිජානමානො සම්මා සබ්බුපාදානපරිඤ්ඤං පඤ්ඤපෙති – කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති, දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති, සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති, අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති.

★ ‘‘තථාගතො ච (තථාගතයන් වහන්සේ ද) ඛො, භික්ඛවෙ (මහණෙනි!) අරහං සම්මාසම්බුද්ධො (අරිහත් සම්මාසම්බුද්ධවූ) [සබ්බ+උපාදාන-පරිඤ්ඤා-වාදා] සබ්බුපාදානපරිඤ්ඤාවාදො (සියලු උපාදානයන්ගේ ප්‍රහානය කියන්නාවූ) පටිජානමානො (ප්‍රතිඤ්ඤාකරමින්) සම්මා (මනාලෙස) [සබ්බ+උපාදාන-පරිඤ්ඤං] සබ්බුපාදානපරිඤ්ඤං (සියලු උපාදානයන්ගේ ප්‍රහානය) පඤ්ඤපෙති (කියයි/ පනවයි/ ප්‍රකාශකරයි/ දේශනාකරයි) කාමුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති (කාම උපාදානයාගේ ප්‍රහාණය කියයි/ පනවයි/ ප්‍රකාශකරයි/ දේශනාකරයි) දිට්ඨුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති, (දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය කියයි/ පනවයි/ ප්‍රකාශකරයි/ දේශනාකරයි) සීලබ්බතුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති (සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය කියයි/ පනවයි/ ප්‍රකාශකරයි/ දේශනාකරයි) අත්තවාදුපාදානස්ස පරිඤ්ඤං පඤ්ඤපෙති (අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය කියයි/ පනවයි/ ප්‍රකාශකරයි/ දේශනාකරයි)

☞ මහණෙනි! අරිහත් සම්මාසම්බුද්ධවූ තථාගතයන් වහන්සේ ද සියලු උපාදානයන්ගේ ප්‍රහානය ප්‍රකාශකරන්නෙමි යැයි ප්‍රතිඤ්ඤාකරමින් මනාලෙස සියලු උපාදානයන්ගේ ප්‍රහානය දේශනාකරයි. කාම උපාදානයාගේ ප්‍රහාණය දේශනාකරයි. දිට්ටි උපාදානයාගේ ප්‍රහාණය දේශනාකරයි. සීලබ්බත උපාදානයාගේ ප්‍රහාණය දේශනාකරයි. අත්තවාද උපාදානයාගේ ප්‍රහාණය දේශනාකරයි.

• එවරූපෙ ඛො, භික්ඛවෙ, ධම්මවිනයෙ යො සත්ථරි පසාදො සො සම්මග්ගතො අක්ඛායති; යො ධම්මෙ පසාදො සො සම්මග්ගතො අක්ඛායති; යා සීලෙසු පරිපූරකාරිතා සා සම්මග්ගතා අක්ඛායති; යා සහධම්මිකෙසු පියමනාපතා සා සම්මග්ගතා අක්ඛායති.

★ ‘‘එවරූපෙ (මෙවැනිවූ/ මෙබඳුවූ) ඛො, භික්ඛවෙ (මහණෙනි!) ධම්මවිනයෙ (ධර්මවිනයෙහි/ ශාසනයෙහි) යො (යම්) සත්ථරි (ශාස්තෘන් කෙරෙහි) පසාදො (ප්‍රසාදයක්-පැහැදීමක් වේද) සො (එය) සම්මග්ගතො අක්ඛායති (යහපත්-ඔවටපත් පැහැදීමක් යැයි කියනු නො ලැබේ / නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ)

යො ධම්මෙ පසාදො (යම් ධර්මය කෙරෙහි ප්‍රසාදයක්-පැහැදීමක් වේද) සො සම්මග්ගතො අක්ඛායති (එය යහපත්-ඛවටපත් පැහැදීමක් යැයි කියනු ලැබේ /එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ) යා සීලෙසු පරිපූරකාරිතා (යම් සිල්පරිපූරණය කිරීමක් වේද) සා සම්මග්ගතා අක්ඛායති (එය යහපත්-ඛවටපත් පැහැදීමක් යැයි කියනු ලැබේ /එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ) යා සහධම්මිකෙසු (යම් එකමධර්මයක් පිළිගන්නාවුන් කෙරෙහි) පියමනාපතා (ප්‍රියමනාප බවක් වේද) සා සම්මග්ගතා අක්ඛායති (එය යහපත්-ඛවටපත් පැහැදීමක් යැයි කියනු ලැබේ /එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ)

☞ මහණෙනි! මෙඛදුවූ ශාසනයන්හි ශාස්තෘන් කෙරෙහි යම් ප්‍රසාදයක්-පැහැදීමක් වේද, එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ. ධර්මය කෙරෙහි යම් ප්‍රසාදයක්-පැහැදීමක් වේද, එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ. යම් සිල්පරිපූරණය කිරීමක් වේද, එය නිවනට ගෙනයන්නාවූ සිල්පරිපූරණය කිරීමක් යැයි කියනු ලැබේ. එකම ධර්මයක් පිළිගන්නාවුන් කෙරෙහි යම් ප්‍රියමනාප බවක් වේද, එය නිවනට ගෙනයන්නාවූ පැහැදීමක් යැයි කියනු ලැබේ.

• තං කිස්ස හෙතු? එවං හෙතං, භික්ඛවෙ, හොති යථා තං ස්වාක්ඛාතෙ ධම්මවිනයෙ සුප්පවෙදිතෙ නියාානිකෙ උපසමසංවත්තනිකෙ සම්මාසම්බුද්ධප්පවෙදිතෙ.

★ තං කිස්ස හෙතු? (එයට හේතුව කුමක්ද?) එවං (මෙසේ) [හි+එතං] හෙතං (මෙය/ මේ කාරණය) භික්ඛවෙ (මහණෙනි!) හොති (වේ) යථා තං (යම්සේ එය) [සු+අක්ඛාතෙ] ස්වාක්ඛාතෙ (නිවැරදිලෙස කියනලද) ධම්මවිනයෙ (ධර්මවිනයෙහි/ ශාසනයෙහි) [සු+පවෙදිතෙ] සුප්පවෙදිතෙ (නිවැරදිලෙස ප්‍රකාශලක/ නිවැරදිලෙස දැනුම්දුන්) නියාානිකෙ (මාර්ගඵල වෙත ගෙන යන්නාවූ) [උපසම-සංවත්තනිකෙ] උපසමසංවත්තනිකෙ (සංසිඳීම පිණිස පවත්නාවූ) [සම්මා-සම්බුද්ධ+පවෙදිතෙ] අසම්මාසම්බුද්ධප්පවෙදිතෙ (සම්ම සම්බුදුවරයෙක් විසින් කියනලද්දක් බැවිනි)

☞ එයට හේතුව කුමක්ද? මහණෙනි! මෙසේ මේ කාරණය වේ. යම්සේ එය නිවැරදිලෙස කියනලද, නිවැරදිලෙස ප්‍රකාශලක, මාර්ගඵල වෙත ගෙන යන්නාවූ, සංසිඳීම පිණිස පවත්නාවූ, සම්ම සම්බුදුවරයන් විසින් කියනලද ධර්මවිනයක් බැවිනි.

• ‘‘ඉමෙ ච, භික්ඛවෙ, චත්තාරො උපාදානා. කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිංපභවා? ඉමෙ චත්තාරො උපාදානා තණ්හානිදානා තණ්හාසමුදයා තණ්හාජාතිකා තණ්හාපභවා.

★ ‘‘ඉමෙ ච (මේ) භික්ඛවෙ (මහණෙනි!) චත්තාරො උපාදානා (සතර උපාදානයන්) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) ඉමෙ චත්තාරො උපාදානා (මේ සතර උපාදානයන්) තණ්හානිදානා (තණ්හාව මූලකාරනය කරගෙන ඇත්තේය) තණ්හාසමුදයා (තණ්හාව නිසා හටගන්නේය) තණ්හාජාතිකා (තණ්හාවෙන් උපදින්නේය) තණ්හාපභවා (තණ්හාව නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ සතර උපාදානයන් කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? මේ සතර උපාදානයන් තණ්හාව මූලකාරනය කරගෙන ඇත්තේය. තණ්හාව නිසා හටගන්නේය. තණ්හාවෙන් උපදින්නේය. තණ්හාව නිසා වර්ධනයවන්නේය.

• තණ්හා චායං, භික්ඛවෙ, කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිංපභවා? තණ්හා වෙදනානිදානා වෙදනාසමුදයා වෙදනාජාතිකා වෙදනාපභවා.

★ තණ්හා [ච+අයං] චායං (මේ තණ්හාව) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) තණ්හා (තණ්හාව) වෙදනානිදානා (වේදනාව මූලකාරනය කරගෙන ඇත්තේය) වෙදනාසමුදයා (වේදනාව නිසා හටගන්නේය) වෙදනාජාතිකා (වේදනාවෙන් උපදින්නේය) වෙදනාපභවා (වේදනාව නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ තණ්හාව කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? තණ්හාව, වේදනාව මූලකාරනය කරගෙන ඇත්තේය. වේදනාව නිසා හටගන්නේය. වේදනාවෙන් උපදින්නේය. වේදනාව නිසා වර්ධනයවන්නේය.

• වෙදනා චායං, භික්ඛවෙ, කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිංපභවා? වෙදනා ඵස්සනිදානා ඵස්සසමුදයා ඵස්සජාතිකා ඵස්සපභවා.

★ වෙදනා [ච+අයං] චායං (මේ වේදනාව) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) වෙදනා (වේදනාව) ඵස්සනිදානා (ස්පර්ශය මූලකාරනය කරගෙන ඇත්තේය) ඵස්සසමුදයා (ස්පර්ශය නිසා හටගන්නේය) ඵස්සජාතිකා (ස්පර්ශයෙන් උපදින්නේය) ඵස්සපභවා (ස්පර්ශය නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ වේදනාව කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? වේදනාව, ස්පර්ශය මූලකාරනය කරගෙන ඇත්තේය. ස්පර්ශය නිසා හටගන්නේය. ස්පර්ශයෙන් උපදින්නේය. ස්පර්ශය නිසා වර්ධනයවන්නේය.

• ඵස්සො චායං, භික්ඛවෙ, කිංනිදානො කිංසමුදයො කිංජාතිකො කිංපභවො? ඵස්සො සළායතනනිදානො සළායතනසමුදයො සළායතනජාතිකො සළායතනපභවො.

★ ඵස්සො [ච+අයං] චායං (මේ ස්පර්ශය) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) ඵස්සො (ස්පර්ශය) සළායතනනිදානො (ආයතනහය මූලකාරනය කරගෙන ඇත්තේය) සළායතනසමුදයො (ආයතනහය නිසා හටගන්නේය) සළායතනජාතිකො (ආයතනහයෙන් උපදින්නේය) සළායතනපභවො (ආයතනහය නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ ස්පර්ශය කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? ස්පර්ශය, ආයතනහය මූලකාරනය කරගෙන ඇත්තේය. ආයතනහය නිසා හටගන්නේය. ආයතනහයෙන් උපදින්නේය. ආයතනහය නිසා වර්ධනයවන්නේය.

•.සළායතනඤ්චිදං, භික්ඛවෙ, කිංනිදානං කිංසමුදයං කිංජාතිකං කිංපභවං? සළායතනං නාමරූපනිදානං නාමරූපසමුදයං නාමරූපජාතිකං නාමරූපපභවං.

★ [සළායතනං+ච+ඉදං] සළායතනඤ්චිදං (මේ ආයතනභයද) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) සළායතනං (ආයතනභය) නාමරූපනිදානං (නාමරූප මූලකාරනය කරගෙන ඇත්තේය) නාමරූපසමුදයං (නාමරූප නිසා හටගන්නේය) නාමරූපජාතිකං (නාමරූපයන්ගෙන් උපදින්නේය) නාමරූපපභවං (නාමරූප නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ ආයතනභය කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? ආයතනභය, නාමරූප මූලකාරනය කරගෙන ඇත්තේය. නාමරූප නිසා හටගන්නේය. නාමරූපයන්ගෙන් උපදින්නේය. නාමරූප නිසා වර්ධනයවන්නේය.

• නාමරූපඤ්චිදං, භික්ඛවෙ, කිංනිදානං කිංසමුදයං කිංජාතිකං කිංපභවං? නාමරූපං විඤ්ඤාණනිදානං විඤ්ඤාණසමුදයං විඤ්ඤාණජාතිකං විඤ්ඤාණපභවං.

★ නාමරූපඤ්චිදං, භික්ඛවෙ, කිංනිදානං කිංසමුදයං කිංජාතිකං කිංපභවං?
★ [නාමරූපං+ච+ඉදං] නාමරූපඤ්චිදං (මේ නාමරූපද) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) නාමරූපං (නාමරූප) විඤ්ඤාණනිදානං (විඤ්ඤාණය මූලකාරනය කරගෙන ඇත්තේය) විඤ්ඤාණසමුදයං (විඤ්ඤාණය නිසා හටගන්නේය) විඤ්ඤාණජාතිකං (විඤ්ඤාණයෙන් උපදින්නේය) විඤ්ඤාණපභවං. (විඤ්ඤාණය නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ නාමරූප කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? නාමරූප, විඤ්ඤාණය මූලකාරනය කරගෙන ඇත්තේය. විඤ්ඤාණය නිසා හටගන්නේය. විඤ්ඤාණයෙන් උපදින්නේය. විඤ්ඤාණය නිසා වර්ධනයවන්නේය.

• විඤ්ඤාණඤ්චිදං, භික්ඛවෙ, කිංනිදානං කිංසමුදයං කිංජාතිකං කිංපභවං? විඤ්ඤාණං සඞ්ඛාරනිදානං සඞ්ඛාරසමුදයං සඞ්ඛාරජාතිකං සඞ්ඛාරපභවං

★ [විඤ්ඤාණං+ච+ඉදං] විඤ්ඤාණඤ්චිදං (මේ විඤ්ඤාණය ද) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) විඤ්ඤාණං (විඤ්ඤාණය) සඞ්ඛාරනිදානං (සඞ්ඛාර මූලකාරනය කරගෙන ඇත්තේය) සඞ්ඛාරසමුදයං (සඞ්ඛාර නිසා හටගන්නේය) සඞ්ඛාරජාතිකං (සඞ්ඛාරයන්ගෙන් උපදින්නේය) සඞ්ඛාරපභවං (සඞ්ඛාර නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ විඤ්ඤාණය කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? විඤ්ඤාණය, සඞ්ඛාර මූලකාරනය කරගෙන ඇත්තේය. සඞ්ඛාර නිසා හටගන්නේය. සඞ්ඛාරයන්ගෙන් උපදින්නේය. සඞ්ඛාර නිසා වර්ධනයවන්නේය.

• සඞ්ඛාරා චිමෙ, භික්ඛවෙ, කිංනිදානා කිංසමුදයා කිංජාතිකා කිංපභවා? සඞ්ඛාරා අවිජ්ජානිදානා අවිජ්ජාසමුදයා අවිජ්ජාජාතිකා අවිජ්ජාපභවා.

★ සඞ්ඛාරා [ච+ඉමෙ] චිමෙ (මේ සංස්කාරයන්) භික්ඛවෙ (මහණෙනි!) කිංනිදානා? (කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද?) කිංසමුදයා? (කුමක් නිසා හටගන්නේද?) කිංජාතිකා? (කුමකින් උපදින්නේද?) කිංපභවා? (කුමක් නිසා වර්ධනයවන්නේද?) සඞ්ඛාරා (සංස්කාරයන්) අවිජ්ජානිදානා (අවිද්‍යාව මූලකාරනය කරගෙන ඇත්තේය) අවිජ්ජාසමුදයා (අවිද්‍යාව නිසා හටගන්නේය) අවිජ්ජාජාතිකා (අවිද්‍යාවෙන් උපදින්නේය) අවිජ්ජාපභවා (අවිද්‍යාව නිසා වර්ධනයවන්නේය)

☞ මහණෙනි! මේ සංස්කාරයන් කුමක් මූලකාරනය කරගෙන ඇත්තේද? කුමක් නිසා හටගන්නේද? කුමකින් උපදින්නේද? කුමක් නිසා වර්ධනයවන්නේද? සංස්කාරයන්, අවිද්‍යාව මූලකාරනය කරගෙන ඇත්තේය. අවිද්‍යාව නිසා හටගන්නේය. අවිද්‍යාවෙන් උපදින්නේය. අවිද්‍යාව නිසා වර්ධනයවන්නේය.

• ‘‘යතො ච ඛො, භික්ඛවෙ, භික්ඛුනො අවිජ්ජා පහීනා හොති විජ්ජා උප්පන්නා, සො අවිජ්ජාවිරාගා විජ්ජුප්පාදා නෙව කාමුපාදානං උපාදියති, න දිට්ඨුපාදානං උපාදියති, න සීලබ්බතුපාදානං උපාදියති, න අත්තවාදුපාදානං උපාදියති. අනුපාදියං න පරිතස්සති, අපරිතස්සං පච්චත්තංයෙව පරිනිබ්බායති. ‘ඛීණා ජාති, වුසිතං බ්‍රහ්මචරියං, කතං කරණීයං, නාපරං ඉත්ථත්තායා’ති පජානාතී’’ති.

★ ‘‘යතො ච ඛො (යම් කාලයක/ යම් වෙලාවක) භික්ඛවෙ (මහණෙනි!) භික්ඛුනො (භික්ෂුවගේ) අවිජ්ජා පහීනා හොති (අවිද්‍යාව ප්‍රහීණ වෙයිද/ සසර ගෙනයන අවිද්‍යාව ප්‍රහීණ වෙයිද) විජ්ජා උප්පන්නා (විද්‍යාව උපදින්නේද/ අරිහත් මාර්ගය නම් විද්‍යාව උපදින්නේද) සො (ඔහු) අවිජ්ජාවිරාගා (අවිද්‍යාව දුරුවූබැවින්) [විජ්ජා+උප්පාදා] විජ්ජුප්පාදා (විද්‍යාව උපන්බැවින්) නෙව (නොවේමය) කාමුපාදානං උපාදියති (කාම උපාදානයන් උපාදානකරන්නෙ) න දිට්ඨුපාදානං උපාදියති (දිට්ටි උපාදානයන් උපාදාන නොකරයි) න සීලබ්බතුපාදානං උපාදියති (සීලබ්බත උපාදානයන් උපාදාන නොකරයි) න අත්තවාදුපාදානං උපාදියති (අත්තවාද උපාදානයන් උපාදාන නොකරයි) අනුපාදියං (උපාදාන නොකරන්නා) න පරිතස්සති (තණ්හාවෙන් පීඩාවට පත්නොවේ) අපරිතස්සං (තණ්හාවෙන් පීඩාවට පත්නොවන්නා) පච්චත්තං-යෙව (තමා-ම) පරිනිබ්බායති (කෙලෙස් සිඳලීම නම් පරිනිර්වානයෙන් පිරිනිවෙයි) ‘ඛීණා ජාති (ජාතිය/ නැවත ඉපදීම අවසන්විය) වුසිතං බ්‍රහ්මචරියං (බ්‍රක්මචරියාව අවසන්කලේය/ බ්‍රක්මචරියාව රැකීමෙන් ලබාගතයුතු අවසන් ඵලය ලැබුවේය) කතං කරණීයං (නිවීම සඳහා කලයුතු සියල්ල කර අවසන්කලේය) [න+අපරං] නාපරං ඉත්ථත්තායා’ති (මේ රහත්බව සඳහා කලයුතු වෙනකිසිවක් නැත්තේය යැයි) පජානාතී’’ති (දැනගනියි)

☞ මහණෙනි! යම් වෙලාවක භික්ෂුවගේ සසර ගෙනයන අවිද්‍යාව ප්‍රහීණ වෙයිද, අරිහත් මාර්ගය නම් විද්‍යාව උපදින්නේද, ඔහු අවිද්‍යාව දුරුව විද්‍යාව උපන්බැවින් කාම උපාදානයන් උපාදාන නොකරයි, දිට්ටි උපාදානයන් උපාදාන නොකරයි, සීලබ්බත උපාදානයන් උපාදාන නොකරයි , අත්තවාද උපාදානයන් උපාදාන නොකරයි. උපාදාන නොකරන්නා තණ්හාවෙන් පීඩාවට පත්නොවේ. තණ්හාවෙන් පීඩාවට පත්නොවන්නා කෙලෙස් සිඳලීම නම් පරිනිර්වානයෙන් පිරිනිවෙයි. නැවත ඉපදීම අවසන්විය. බ්‍රක්මචරියාව රැකීමෙන් ලබාගතයුතු අවසන් ඵලය ලැබුවේය. නිවීම සඳහා කලයුතු සියල්ල කර අවසන්කලේය. මේ රහත්බව සඳහා කලයුතු වෙනකිසිවක් නැත්තේය. යැයි දැනගනියි.

• ඉදමවොච භගවා. අත්තමනා තෙ භික්ඛූ භගවතො භාසිතං අභිනන්දුන්ති.

★ [ඉදං+අවොච] ඉදමවොච භගවා (භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනාකලේය) අත්තමනා (සතුටටපත්/ තෘප්තියටපත්) තෙ භික්ඛූ (ඒ භික්ෂූන්) භගවතො භාසිතං (භාග්‍යවතුන් වහන්සේගේ භාසිතයට/ දේශනාවට) අභිනන්දුන්ති (සතුටුවුහ/ සතුටින් පිළිගත්හ)

☞ භාග්‍යවතුන් වහන්සේ මෙය දේශනාකලේය. සතුටටපත් ඒ භික්ෂූන් භාග්‍යවතුන් වහන්සේගේ දේශනාව සතුටින් පිළිගත්හ.

චූළසීහනාදසුත්තං නිට්ඨිතං (චූළසීහනාද සූත්‍රය නිමියේය.)

13. මිලිඳු නාගසේන පැන විසඳුම්

01.

• **රාජා ආහ** ''භන්තෙ නාගසෙන, කෙන කාරණෙන මනුස්සා න සබ්බෙ සමකා, අඤ්ඤෙ අප්පායුකා, අඤ්ඤෙ දීඝායුකා, අඤ්ඤෙ බහ්වාබාධා අඤ්ඤෙ අප්පාබාධා, අඤ්ඤෙ දුබ්බණ්ණා, අඤ්ඤෙ වණ්ණවන්තො, අඤ්ඤෙ අප්පෙසක්ඛා, අඤ්ඤෙ මහෙසක්ඛා, අඤ්ඤෙ අප්පභොගා, අඤ්ඤෙ මහාභොගා, අඤ්ඤෙ නීචකුලීනා, අඤ්ඤෙ මහාකුලීනා, අඤ්ඤෙ දුප්පඤ්ඤා, අඤ්ඤෙ පඤ්ඤවන්තො''ති?

★ **රාජා ආහ** (රජු ඇසීය) ''භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) කෙන කාරණෙන (කිනම් කරුණක් නිසා) මනුස්සා <u>න</u> සබ්බෙ සමකා (සියලු මිනිසුන් සමාන <u>නොවන්නෙ</u>) අඤ්ඤෙ අප්පායුකා (කෙනෙක් අඩු ආයුෂ ඇත්තේය) අඤ්ඤෙ දීඝායුකා (කෙනෙක් දීර්ඝ ආයුෂ ඇත්තේය) අඤ්ඤෙ බහ්වාබාධා (කෙනෙක් බොහෝ ආබාධ/ ලෙඩ ඇත්තේය) අඤ්ඤෙ අප්පාබාධා (කෙනෙක් අල්ප ආබාධ/ ලෙඩ ඇත්තේය) අඤ්ඤෙ දුබ්බණ්ණා (කෙනෙක් පැහැපත්නැත) අඤ්ඤෙ වණ්ණවන්තො (කෙනෙක් පැහැපත්ය) අඤ්ඤෙ අප්පෙසක්ඛා (කෙනෙක් දුබලය) අඤ්ඤෙ මහෙසක්ඛා (කෙනෙක් ප්‍රබලය) අඤ්ඤෙ අප්පභොගා (කෙනෙක් අඩු සම්පත් ඇත්තේය) අඤ්ඤෙ මහාභොගා (කෙනෙක් බොහෝ සම්පත් ඇත්තේය) අඤ්ඤෙ නීචකුලීනා (කෙනෙක් පහත් කුල ඇත්තේය) අඤ්ඤෙ මහාකුලීනා (කෙනෙක් ඉහල කුල ඇත්තේය) අඤ්ඤෙ දුප්පඤ්ඤා (කෙනෙක් නුවණ නැත්තේය) අඤ්ඤෙ පඤ්ඤවන්තො''ති? (කෙනෙක් ප්‍රඤ්ඤාවන්තය ?)

☞ රජු ඇසීය, ස්වාමීණි නාගසේන, කිනම් කරුණක් නිසාද සියලු මිනිසුන් සමාන නොවනනෙ, කෙනෙක් අඩු ආයුෂ ඇත්තේය, කෙනෙක් දීර්ඝ ආයුෂ ඇත්තේය, කෙනෙක් බොහෝ ලෙඩ-ආබාධ ඇත්තේය, කෙනෙක් අල්ප ලෙඩ-ආබාධ ඇත්තේය, කෙනෙක් පැහැපත්නැත, කෙනෙක් පැහැපත්ය, කෙනෙක් දුබලය, කෙනෙක් ප්‍රබලය, කෙනෙක් අඩු සම්පත් ඇත්තේය, කෙනෙක් බොහෝ සම්පත් ඇත්තේය, කෙනෙක් පහත් කුල ඇත්තේය, කෙනෙක් ඉහල කුල ඇත්තේය, කෙනෙක් නුවණ නැත්තේය, කෙනෙක් ප්‍රඤ්ඤාවන්තය ?

• **ථෙරො ආහ** ''කිස්ස පන, මහාරාජ, රුක්ඛා න සබ්බෙ සමකා, අඤ්ඤෙ අම්බිලා, අඤ්ඤෙ ලවණා, අඤ්ඤෙ තිත්තකා, අඤ්ඤෙ කටුකා, අඤ්ඤෙ කසාවා, අඤ්ඤෙ මධුරා''ති? ''මඤ්ඤාමි, භන්තෙ, බීජානං නානාකරණෙනා''ති. ''එවමෙව ඛො, මහාරාජ, කම්මානං නානාකරණෙන මනුස්සා න සබ්බෙ සමකා,

★ **ථෙරො ආහ** (තෙරුන්වහන්සේ කීය) ''කිස්ස පන, මහාරාජ (කුමක් හෙයින්ද මහරජ) රුක්ඛා <u>න</u> සබ්බෙ සමකා (සියලු ගස් සමාන <u>නොවන්නෙ</u>) අඤ්ඤෙ අම්බිලා (අනෙකක් ඇඹුල්ය) අඤ්ඤෙ ලවණා (අනෙකක් ලුණුරසය) අඤ්ඤෙ තිත්තකා (අනෙකක් තිත්තය) අඤ්ඤෙ කටුකා (අනෙකක් කටුකරසය) අඤ්ඤෙ කසාවා (අනෙකක් කහටරසය) අඤ්ඤෙ මධුරා''ති? (අනෙකක් මිහිරිය) ''මඤ්ඤාමි, භන්තෙ (සිතමි ස්වාමීණි) බීජානං නානාකරණෙනා''ති (බීජයන්ගේ විවිදත්වය නිසා යැයි) ''එවමෙව ඛො, මහාරාජ (එලෙසම මහරජ) කම්මානං නානාකරණෙන (කර්මයාගේ විවිධත්වය නිසා) මනුස්සා න සබ්බෙ සමකා (සියලු මිනිසුන් සමාන නොවේ)

☞ තෙරුන්වහන්සේ කීය, ''කුමක් හෙයින්ද මහරජ සියලු ගස් සමාන නොවන්නෙ? අනෙකක් ඇඹුල්ය, අනෙකක් ලුණුරසය, අනෙකක් තිත්තය, අනෙකක් කටුකරසය, අනෙකක් කහටරසය, අනෙකක් මිහිරිය'' ''සිතමි, ස්වාමීණි, බීජයන්ගේ විවිදත්වය නිසා යැයි'' ''එලෙසම මහරජ කර්මයාගේ විවිධත්වය නිසා සියලු මිනිසුන් සමාන නොවේ''

• භාසිතම්පෙතං මහාරාජ භගවතා – ‘කම්මස්සකා, මාණව, සත්තා කම්මදායාදා කම්මයොනී කම්මබන්ධූ කම්මප්පටිසරණා, කම්මං සත්තෙ විභජති යදිදං හීනප්පණීතතායා’’’ති. ‘‘කල්ලොසි, භන්තෙ නාගසෙනා’’ති.

★ [භාසිතං+අපි+එතං] භාසිතම්පෙතං (මෙය දේශනාකරණලදී) මහාරාජ භගවතා (මහරජ භාග්‍යවතුන් වහන්සේ විසින්) ‘කම්මස්සකා (කර්මය අයිති කරගෙන ඇත්තාහ) මාණව (මානවකය/ තරුණය) සත්තා (සත්ත්වයෝ) කම්මදායාදා (කර්මය දායාදය කරගෙන ඇත්තාහ) කම්මයොනී (කර්මය උප්පත්තියට කාරණාව කරගෙන ඇත්තාහ) කම්මබන්ධූ (කර්මය ඤාතියා කරගෙන ඇත්තාහ) කම්මප්පටිසරණා (කර්මය පිළිසරණ/ පිහිට කරගෙන ඇත්තාහ) කම්මං සත්තෙ විභජති (කර්මය සත්ත්වයන් බෙදාලයි) යදිදං (යම් මේ) හීනප්පණීතතායා’’’ති (හීන ප්‍රණීත තාවයට/ උස් පහත් බවට) ‘‘[කල්ලො+අසි] කල්ලොසි (ගැලපෙනව/ හොඳයි/ සුදුසුයි) භන්තෙ නාගසෙනා’’ති (ස්වාමීණි නාගසේන).

☞ මහරජ භාග්‍යවතුන් වහන්සේ විසින් මෙය දේශනාකරණලදී - “මානවකය සත්ත්වයෝ කර්මය අයිති කරගෙන ඇත්තාහ, කර්මය දායාදය කරගෙන ඇත්තාහ, කර්මය උප්පත්තියට කාරණාව කරගෙන ඇත්තාහ, කර්මය ඤාතියා කරගෙන ඇත්තාහ, කර්මය පිහිට පිළිසරණ කරගෙන ඇත්තාහ, කර්මය සත්ත්වයන් උස් පහත් බවට බෙදාලයි” “හොඳයි ස්වාමීණි නාගසේන”

02

• **රාජා ආහ** ‘‘භන්තෙ නාගසෙන, තුම්හෙ භණථ ‘කින්ති ඉමං දුක්ඛං නිරුජ්ඣෙය්‍ය, අඤ්ඤඤ්ච දුක්ඛං න උපජ්ජෙය්‍යා’ති. එතදත්ථා, මහාරාජ, අම්හාකං පබ්බජ්ජා’’ති. ‘‘කිං පටිගච්චෙව වායමිතෙන, නනු සම්පත්තෙ කාලෙ වායමිතබ්බ’’න්ති?

★ **රාජා ආහ** (රජු ඇසීය) ‘‘භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) තුම්හෙ භණථ (නුඹලා මෙසේ කියති) ‘කින්ති ඉමං දුක්ඛං (කෙසේ මේ දුක) නිරුජ්ඣෙය්‍ය (නිරුද්දවන්නේද) [අඤ්ඤං+ච] අඤ්ඤඤ්ච දුක්ඛං (අන්වූ ද දුකක්) න උපජ්ජෙය්‍යා’ති (නූපදින්නේද) [එතං+අත්ථා] එතදත්ථා (මේ සඳහාය) මහාරාජ, අම්හාකං පබ්බජ්ජා’’ති (මහරජ අපගේ පැවිද්ද යැයි) ‘‘කිං (ඇයි/ මොකක් නිසාද) පටිගච්චෙව වායමිතෙන (කල්ඇතිවම උත්සහකරන්නෙ) නනු (නොවේද) සම්පත්තෙ කාලෙ (පැමිනි කාලයේ) [වායමිතබ්බං+ඉති] වායමිතබ්බ’’න්ති? (උත්සහකලයුත්තේ?)

☞ රජු ඇසීය “ස්වාමීණි නාගසේන, නුඹලා මෙසේ කියති. ‘කෙසේ මේ දුක නිරුද්ද වන්නේද, අන්වූ ද දුකක් නූපදින්නේද, මේ සඳහාය මහරජ අපගේ පැවිද්ද’ යැයි, ඇයි කල්ඇතිවම උත්සහකරන්නෙ, දුක පැමිනි කාලයේ උත්සහකලයුත්තේ නොවේද ?

• ථෙරො ආහ ‘‘සම්පත්තෙ කාලෙ, මහාරාජ, වායාමො අකිච්චකරො භවති, පටිගච්චෙව වායාමො කිච්චකරො භවතී’’ති.

★ ථෙරො ආහ (තෙරුන්වහන්සේ කීය) ‘‘සම්පත්තෙ කාලෙ (පැමිණි කාලයේ) මහාරාජ වායාමො (මහරජ උත්සහකිරීම) අකිච්චකරො භවති (නිස්ඵලවෙයි/ ප්‍රයෝජනයක් නැතිවෙයි) පටිගච්චෙව වායාමො (කලින්ම උත්සහකිරීම) කිච්චකරො භවතී’’ති (සඵලවෙයි/ ප්‍රයෝජනවත් වෙයි)

☞ තෙරුන්වහන්සේ කීය “මහරජ දුක පැමිණි කාලයේ උත්සහකිරීම නිස්ඵලවෙයි, කලින්ම උත්සහකිරීම ප්‍රයෝජනවත් වෙයි”.

• ‘‘ඔපම්මං කරොහී’’ති. ‘‘තං කිං මඤ්ඤසි, මහාරාජ, යදා ත්වං පිපාසිතො භවෙය්‍යාසි, තදා ත්වං උදපානං ඛණාපෙය්‍යාසි, තළාකං ඛණාපෙය්‍යාසි ‘පානීයං පිවිස්සාමී’ති? ‘‘න හි, භන්තෙ’’ති.

★ ‘‘ඔපම්මං කරොහී’’ති (උපමාවක් කරන්න/ කියන්න) ‘‘තං කිං මඤ්ඤසි මහාරාජ (ඔබ මේගැන මොකක්ද හිතන්නෙ මහරජ) යදා ත්වං පිපාසිතො භවෙය්‍යාසි (යම් දවසක ඔබට පිපාසිත වෙයි) තදා ත්වං උදපානං ඛණාපෙය්‍යාසි (එකල ඔබ ළිඳක් කප්පවනවද) තළාකං ඛණාපෙය්‍යාසි (විලක් කප්පවනවද) ‘පානීයං පිවිස්සාමී’ති? (වතුර බොන්නෙමි යැයි) ‘‘න හි, භන්තෙ’’ති (නැත ස්වාමීණි)

☞ “උපමාවක් කියන්න” “ඔබ මේගැන මොකක්ද හිතන්නෙ මහරජ, ඔබ “වතුර බොන්නෙමි” යැයි ළිඳක් හෝ විලක් කප්පවන්නේ වතුර තිබහ හැදුනහමද ?” “නැත ස්වාමීණි”

• ‘‘එවමෙව ඛො, මහාරාජ සම්පත්තෙ කාලෙ වායාමො අකිච්චකරො භවති, පටිකච්චෙව වායාමො කිච්චකරො භවතී’’ති.

★ එවමෙව ඛො, මහාරාජ, (එලෙසම මහරජ) සම්පත්තෙ කාලෙ (පැමිණි කාලයේ) වායාමො (උත්සහකිරීම) අකිච්චකරො භවති (නිස්ඵලවෙයි/ ප්‍රයෝජනයක් නැතිවෙයි) පටිගච්චෙව වායාමො (කලින්ම උත්සහකිරීම) කිච්චකරො භවතී’’ති (සඵලවෙයි/ ප්‍රයෝජනවත් වෙයි)

☞ එලෙසම මහරජ දුක පැමිණි කාලයේ උත්සහකිරීම නිස්ඵලවෙයි, කලින්ම උත්සහකිරීම ප්‍රයෝජනවත් වෙයි”.

• ‘‘භියොා ඔපම්මං කරොහී’’ති. ‘‘තං කිං මඤ්ඤසි, මහාරාජ, යදා ත්වං බුභුක්ඛිතො භවෙය්‍යාසි, තදා ත්වං ඛෙත්තං කසාපෙය්‍යාසි, සාලිං රොපාපෙය්‍යාසි, ධඤ්ඤං අතිහරාපෙය්‍යාසි ‘භත්තං භුඤ්ජිස්සාමී’ති? ‘‘න හි, භන්තෙ’’ති.

★ ‘‘භියොා ඔපම්මං කරොහී’’ති (තවත් උපමාවක් කරන්න/ කියන්න) ‘‘තං කිං මඤ්ඤසි, මහාරාජ (ඔබ මේගැන මොකක්ද හිතන්නෙ මහරජ) යදා ත්වං බුභුක්ඛිතො භවෙය්‍යාසි (යම්වෙලාවක ඔබට බඩගිනි වෙයි) තදා ත්වං ඛෙත්තං කසාපෙය්‍යාසි (ඒවෙලාවේ ඔබ කුඹුරක් හාවවනවද) සාලිං රොපාපෙය්‍යාසි (වී හිටවවනවද) ධඤ්ඤං අතිහරාපෙය්‍යාසි (ධාන්‍ය ගෙන්නවනවද) ‘භත්තං භුඤ්ජිස්සාමී’ති? (බත් කන්නෙමි යැයි) ‘‘න හි, භන්තෙ’’ති (නැත ස්වාමීණි)

☞ “තවත් උපමාවක් කියන්න” “මහරජ ඔබ මේගැන මොකක්ද හිතන්නෙ, ඔබ “බත් කන්නෙමි” යැයි කුඹුරක් හාවවන්නෙ, වී හිටවවන්නෙ, ධාන්‍ය ගෙන්නවන්නෙ, ඔබට බඩගිනි හැදුනමද?” “නැත ස්වාමීණි”

•‘‘එවමෙව ඛො, මහාරාජ, සම්පත්තෙ කාලෙ වායාමො අකිච්චකරො භවති, පටිකච්චෙව වායාමො කිච්චකරො භවතීති.

★ එවමෙව ඛො, මහාරාජ, (එලෙසම මහරජ) සම්පත්තෙ කාලෙ (පැමිණි කාලයේ) වායාමො (උත්සහකිරීම) අකිච්චකරො භවති (නිස්ඵලවෙයි/ ප්‍රයෝජනයක් නැතිවෙයි) පටිගච්චෙව වායාමො (කලින්ම උත්සහකිරීම) කිච්චකරො භවතී’’ති (සඵලවෙයි/ ප්‍රයෝජනවත් වෙයි)

☞ එලෙසම මහරජ දුක පැමිණි කාලයේ උත්සහකිරීම නිස්ඵලවෙයි, කලින්ම උත්සහකිරීම ප්‍රයෝජනවත් වෙයි".

• ''භියෝ ඔපම්මං කරොහී''ති. ''තං කිං මඤ්ඤසි, මහාරාජ, යදා තෙ සඞ්ගාමෝ පච්චුපට්ඨිතෝ භවෙය්‍ය, තදා ත්වං පරිඛං ඛණාපෙය්‍යාසි, පාකාරං කාරාපෙය්‍යාසි, ගොපුරං කාරාපෙය්‍යාසි, අට්ටාලකං කාරාපෙය්‍යාසි, ධඤ්ඤං අතිහරාපෙය්‍යාසි, තදා ත්වං හත්ථිස්මිං සික්ඛෙය්‍යාසි, අස්සස්මිං සික්ඛෙය්‍යාසි, රථස්මිං සික්ඛෙය්‍යාසි, ධනුස්මිං සික්ඛෙය්‍යාසි, ථරුස්මිං සික්ඛෙය්‍යාසී''ති? ''න හි, භන්තෙ''ති.

★ භියෝ ඔපම්මං කරොහී''ති. (තවත් උපමාවක් කරන්න/ කියන්න) ''තං කිං මඤ්ඤසි, මහාරාජ (ඔබ මේගැන මොකක්ද හිතන්නෙ මහරජ) යදා තෙ (යම්දවසක ඔබට) සඞ්ගාමෝ පච්චුපට්ඨිතෝ භවෙය්‍ය (යුද්ධයකට මුහුණදීමට සිදුවෙයි) තදා ත්වං (එකල ඔබ) පරිඛං ඛණාපෙය්‍යාසි (දියඅගල් කප්පවනවද) පාකාරං කාරාපෙය්‍යාසි (ප්‍රාකාර සාදවනවද) ගොපුරං කාරාපෙය්‍යාසි (දොරටුගෙය සාදවනවද) අට්ටාලකං කාරාපෙය්‍යාසි (අට්ටාල සාදවනවද) ධඤ්ඤං අතිහරාපෙය්‍යාසි (ධාන්‍ය රැස්කරවනවද) තදා ත්වං (එකල ඔබ) හත්ථිස්මිං සික්ඛෙය්‍යාසි (ඇත්ශිල්ප පුහුනුවෙනවද) අස්සස්මිං සික්ඛෙය්‍යාසි (අස්ශිල්ප පුහුනුවෙනවද) රථස්මිං සික්ඛෙය්‍යාසි (රථ ශිල්ප පුහුනුවෙනවද) ධනුස්මිං සික්ඛෙය්‍යාසි (දුනු ශිල්ප පුහුනුවෙනවද) ථරුස්මිං සික්ඛෙය්‍යාසී''ති? (කඩුශිල්ප පුහුනුවෙනවද) ''න හි, භන්තෙ''ති (නැත ස්වාමීණි)

☞ ''තවත් උපමාවක් කියන්න'' ''මහරජ ඔබ මේගැන මොකක්ද හිතන්නෙ, යම්දවසක ඔබට යුද්ධයකට මුහුණදීමට සිදුවෙයි, එකල ඔබ දියඅගල් කප්පවනවද, ප්‍රාකාර සාදවනවද, දොරටුගෙය සාදවනවද, අට්ටාල සාදවනවද, ධාන්‍ය රැස්කරවනවද, එකල ඔබ ඇත්ශිල්ප පුහුනුවෙනවද, අස්ශිල්ප පුහුනුවෙනවද, රථ ශිල්ප පුහුනුවෙනවද, දුනු ශිල්ප පුහුනුවෙනවද, කඩුශිල්ප පුහුනුවෙනවද ?'' ''නැත ස්වාමීණි''

• ''එවමෙව ඛො, මහාරාජ, සම්පත්තෙ කාලෙ වායාමො අකිච්චකරො භවති, පටිකච්චෙව වායාමො කිච්චකරො භවති. ''කල්ලොසි, භන්තෙ නාගසෙනා''ති.

★ එවමෙව ඛො, මහාරාජ, (එලෙසම මහරජ) සම්පත්තෙ කාලෙ (පැමිණි කාලයේ) වායාමො (උත්සහකිරීම) අකිච්චකරො භවති (නිස්ඵලවෙයි/ ප්‍රයෝජනයක් නැතිවෙයි) පටිගච්චෙව වායාමො (කලින්ම උත්සහකිරීම) කිච්චකරො භවති''ති (සඵලවෙයි/ ප්‍රයෝජනවත් වෙයි) ''[කල්ලො+අසි] කල්ලොසි (ගැලපෙනව/ හොඳයි/ සුදුසුයි) භන්තෙ නාගසෙනා''ති (ස්වාමීණි නාගසේන).

☞ එලෙසම මහරජ දුක පැමිණි කාලයේ උත්සහකිරීම නිස්ඵලවෙයි, කලින්ම උත්සහකිරීම ප්‍රයෝජනවත් වෙයි". ''හොඳයි ස්වාමීණි නාගසේන''

03

• **රාජා ආහ** ''භන්තෙ නාගසෙන, අත්ථි කොචි සත්තො යො ඉමම්හා කායා අඤ්ඤං කායං සඞ්කමතී''ති? ''න හි, මහාරාජා''ති.

★ **රාජා ආහ** (රජු ඇසීය) ''භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) අත්ථි (ඇත්ද/ ඉන්නවද) කොචි (කිසි) සත්තො (සත්ත්වයෙක්) යො (යම්) ඉමම්හා කායා (මේ කයෙන්) අඤ්ඤං කායං (අන් කයකට) සඞ්කමතී''ති? (සංක්‍රමණයවන) ''න හි, මහාරාජා''ති (නැත මහරජ)

☞ රජු ඇසීය ‘‘ස්වාමීණි නාගසේන, යම් කිසි සත්ත්වයෙක් ඉන්නවද, මේ කයෙන් අන් කයකට සංක්‍රමණයවන’’ ‘‘නැත මහරජ’’

• ‘‘යදි, භන්තෙ නාගසෙන, ඉමම්හා කායා අඤ්ඤං කායං සඞ්කමන්තො නත්ථි, නනු මුත්තො භවිස්සති පාපකෙහි කම්මෙහී’’ති?

★ ‘‘යදි, භන්තෙ නාගසෙන (ඉදින් ස්වාමීණි නාගසේන) ඉමම්හා කායා (මේ කයෙන්) අඤ්ඤං කායං (අන් කයකට) සඞ්කමන්තො නත්ථි (සංක්‍රමණයවන්නෙක් නැත්තම්) නනු (නොවේද) මුත්තො භවිස්සති (මිදුනා වන්නේ) පාපකෙහි කම්මෙහී’’ති? (පාපා ක්‍රියාවන් ගෙන් ?)

☞ ඉදින් ස්වාමීණි නාගසේන, මේ කයෙන් අන් කයකට සංක්‍රමණයවන්නෙක් නැත්තම්, පාපා ක්‍රියාවන් ගෙන් මිදුනා වන්නේ නොවේද?

•‘‘ආම, මහාරාජ, යදි න පටිසන්දහෙය්‍ය, මුත්තො භවිස්සති පාපකෙහි කම්මෙහීති, යස්මා ච ඛො, මහාරාජ, පටිසන්දහති, තස්මා න පරිමුත්තො පාපකෙහි කම්මෙහී’’ති.

★ ආම, මහාරාජ (ඔව් මහරජ) යදි න පටිසන්දහෙය්‍ය (ඉදින් එකින්එක අතර සම්බන්දයක් ඇති නොවන්නේනම් / ඉදින් පරම්පරා සම්බන්දයක් - ජීවිතයක් ජීවිතයක් අතර සම්බන්දයක් ඇතිනොවන්නේ නම්) මුත්තො භවිස්සති (මිදුනා වන්නේය) පාපකෙහි කම්මෙහීති (පාපා ක්‍රියාවන්ගෙන්) **["යස්මා" හා "තස්මා" එක්ව "බැවින්" යන අර්ථය දේ]** යස්මා ච ඛො, මහාරාජ පටිසන්දහති තස්මා (මහරජ එකින්එක අතර සම්බන්දයක් ඇතිවන බැවින් / මහරජ පරම්පරා සම්බන්දයක් - ජීවිතයක් ජීවිතයක් අතර සම්බන්දයක් ඇතිවන බැවින්) න පරිමුත්තො (නො මිදුනේය) පාපකෙහි කම්මෙහී’’ති (පාපා ක්‍රියාවන්ගෙන්)

☞ ‘‘ඔව් මහරජ, ඉදින් එකින්එක අතර සම්බන්දයක් ඇති නොවන්නේනම් [ඉදින් පරම්පරා සම්බන්දයක් - ජීවිතයක් ජීවිතයක් අතර සම්බන්දයක් ඇතිනොවන්නේ නම්], පාපා ක්‍රියාවන්ගෙන් මිදුනා වන්නේය, මහරජ, එකින්එක අතර සම්බන්දයක් ඇතිවන බැවින් [මහරජ පරම්පරා සම්බන්දයක් - ජීවිතයක් ජීවිතයක් අතර සම්බන්දයක් ඇතිවන බැවින්] පාපා ක්‍රියාවන්ගෙන් නො මිදුනේය.

• ‘‘ඔපම්මං කරොහී’’ති. ‘‘යථා, මහාරාජ, කොචිදෙව පුරිසො අඤ්ඤතරස්ස පුරිසස්ස අම්බං අවහරෙය්‍ය, කිං සො දණ්ඩප්පත්තො භවෙය්‍යා’’ති?

★ ‘‘ඔපම්මං කරොහී’’ති (උපමාවක් කරන්න/ කියන්න) ‘‘යථා, මහාරාජ (යම්සේ මහරජ) කොචිදෙව පුරිසො (යම්කිසි පුරුෂයෙක්) අඤ්ඤතරස්ස පුරිසස්ස (එකතරා පුරුෂයකුගේ) අම්බං අවහරෙය්‍ය (අඹ හොරකම් කරයිනම්) කිං සො (කිමෙක්ද ඔහු) දණ්ඩප්පත්තො භවෙය්‍යා’’ති? (දඬුවමට පැමිණියේ වේද?/ දඬුවම් දීමට සුදුසුද?)

☞ ‘‘උපමාවක් කියන්න’’ ‘‘යම්සේ මහරජ, යම්කිසි පුරුෂයෙක් එකතරා පුරුෂයකුගේ අඹ හොරකම් කරයිනම්, කිමෙක්ද ඔහු දඬුවම් දීමට සුදුසුද?

• ‘‘ආම, භන්තෙ, දණ්ඩප්පත්තො භවෙය්‍යා’’ති. ‘‘න ඛො සො, මහාරාජ, තානි අම්බානි අවහරි, යානි තෙන රොපිතානි, කස්මා දණ්ඩප්පත්තො භවෙය්‍යා’’ති? ‘‘තානි, භන්තෙ, අම්බානි නිස්සාය ජාතානි, තස්මා දණ්ඩප්පත්තො භවෙය්‍යා’’ති.

★ ''ආම, භන්තෙ (ඔව් ස්වාමීණි) දණ්ඩප්පත්තො හවෙය්‍යා''ති (දඬුවමට පැමිණියේය/ දඬුවම් දීමට සුදුසුය) ''<u>නු</u> ඛො සො(ඔහු) මහාරාජ (මහරජ) තානි අම්බානි (ඒ අඹයන්) අවහරි (සොරකම් <u>නොකලේය</u>) යානි (යම්/ යම් අඹයන්) තෙන (ඔහු විසින්/ අඹ අයිතිකරු විසින්) රොපිතානි (සිටුවනලද) කස්මා (කුමක් හෙයින්/ ඇයි) දණ්ඩප්පත්තො හවෙය්‍යා''ති? (දඬුවමට පැමිණියේ ද?/ දඬුවම් දීමට සුදුසුවූවේද?) ''තානි, භන්තෙ, අම්බානි (ස්වාමීණි ඒ අඹ) නිස්සාය (නිසා/ සිටවපු අඹ නිසා) ජාතානි (උපන්නාය/ හටගත්තාය) තස්මා (එබැවින්) දණ්ඩප්පත්තො හවෙය්‍යා''ති (දඬුවමට පැමිණියේ වේ/ දඬුවම් දීමට සුදුසුවේ)

☞ ''ඔව් ස්වාමීණි, දඬුවම් දීමට සුදුසුය'' ''මහරජ, ඔහු අඹ අයිතිකරු විසින් සිටුවනලද ඒ අඹයන් සොරකම් නොකලේය, ඇයි දඬුවම් දීමට සුදුසු වන්නෙ?'' ''ස්වාමීණි, ඒ අඹ සිටවපු අඹ නිසා හටගත්තා, එබැවින් දඬුවම් දීමට සුදුසුවේ.''

•''එවමෙව ඛො, මහාරාජ, ඉමිනා නාමරූපෙන කම්මං කරොති සොභනං වා අසොභනං වා, තෙන කම්මෙන අඤ්ඤං නාමරූපං පටිසන්දහති, තස්මා න පරිමුත්තො පාපකෙහි කම්මෙහී''ති. ''කල්ලොසි, භන්තෙ නාගසෙනා''ති.

★ එවමෙව ඛො, මහාරාජ (එලෙසම මහරජ) ඉමිනා නාමරූපෙන (මේ නාමරූපයෙන්) කම්මං කරොති (කර්ම කරයි) සොභනං වා අසොභනං වා (සෝභන හෝ අසෝභන හෝ/ හොඳ හෝ නරක හෝ) තෙන කම්මෙන (ඒ කර්මයෙන්) අඤ්ඤං නාමරූපං (වෙනත් නාමරූපයක්) පටිසන්දහති (උපදියි/ එකින්එක අතර සම්බන්දයක් ඇතිකරමින් උපදියි) තස්මා න පරිමුත්තො (එබැවින නො මිදුනේය) පාපකෙහි කම්මෙහී''ති (පාපා ක්‍රියාවන්ගෙන්) 'කල්ලොසි, (ගැලපෙනව/ හොදයි/ සුදුසුයි) භන්තෙ නාගසෙනා''ති (ස්වාමීණි නාගසේන).

☞ ''එලෙසම මහරජ, මේ නාමරූපයෙන් කර්ම කරයි, හොඳ හෝ නරක හෝ, ඒ කර්මයෙන් වෙනත් නාමරූපයක් එකින්එක අතර සම්බන්දයක් ඇතිකරමින් උපදියි, එබැවින පාපා ක්‍රියාවන්ගෙන් නො මිදුනේය.'' ''හොදයි, ස්වාමීණි නාගසේන''

04

• කථං අනුභූතතො සති උප්පජ්ජති? දිට්ඨත්තා රූපං සරති, සුතත්තා සද්දං සරති, ඝායිතත්තා ගන්ධං සරති, සායිතත්තා රසං සරති, ඵුට්ඨත්තා ඵොට්ඨබ්බං සරති, විඤ්ඤාතත්තා ධම්මං සරති, එවං අනුභූතතො සති උප්පජ්ජති. ''කල්ලොසි, භන්තෙ නාගසෙනා''ති.

★ ''කථං (කෙසේ) අනුභූතතො (විඳිදෙයින්) සති උප්පජ්ජති? (සිහිය උපදියිද?) දිට්ඨත්තා රූපං සරති (දුටුබැවින් රූප සිහිකරයි) සුතත්තා සද්දං සරති (ඇසුබැවින් සද්ද සිහිකරයි) ඝායිතත්තා ගන්ධං සරති (ගඳ දැනගත්බැවින් ගඳ සිහිකරයි) සායිතත්තා රසං සරති (රස දැනගත්බැවින් රස සිහිකරයි) ඵුට්ඨත්තා ඵොට්ඨබ්බං සරති (ස්ඵර්ශය දැනගත්බැවින් ස්ඵර්ශය සිහිකරයි) විඤ්ඤාතත්තා ධම්මං සරති (දැනගත්බැවින් ධර්මයන් සිහිකරයි) එවං (මෙසේ) අනුභූතතො (විඳිදෙයින්) සති උප්පජ්ජති (සිහිය උපදියි) ''කල්ලොසි, (ගැලපෙනව/ හොදයි/ සුදුසුයි) භන්තෙ නාගසෙනා''ති (ස්වාමීණි නාගසේන)

☞ ''කෙසේ විඳිදෙයින් සිහිය උපදියිද?'' ''දුටුබැවින් රූප සිහිකරයි, ඇසුබැවින් සද්ද සිහිකරයි, ගඳ දැනගත්බැවින් ගඳ සිහිකරයි, රස දැනගත්බැවින් රස සිහිකරයි, ස්ඵර්ශය දැනගත්බැවින් ස්ඵර්ශය සිහිකරයි, දැනගත්බැවින් ධර්මයන් සිහිකරයි, මෙසේ විඳිදෙයින් සිහිය උපදියි'' ''හොදයි, ස්වාමීණි නාගසේන''

05

• ‘‘භන්තෙ නාගසෙන, යදා බොධිසත්තො දුක්කරකාරිකං අකාසි, නෙතාදිසො අඤ්ඤත්‍ර ආරම්භො අහොසි නික්කමො කිලෙසයුද්ධං මච්චුසෙනං විධමනං ආහාරපරිග්ගහො දුක්කරකාරිකා, එවරූපෙ පරක්කමෙ කිඤ්චි අස්සාදං අලභිත්වා තමෙව චිත්තං පරිභාපෙත්වා එවමවොච

★ ‘‘භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) යදා (යම්කලක) බොධිසත්තො (මහබෝසතුන්) දුක්කරකාරිකං අකාසි (දුෂ්කරක් ක්‍රියා කලේද) [නු+තාදිසො] නෙතාදිසො (එබඳුවූ/ එලෙස) අඤ්ඤත්‍ර (අන්තැනක) ආරම්භො අහොසි (ඇරඹීමක් නොවූවේය) නික්කමො (උත්සහයක්) කිලෙසයුද්ධං (කෙලෙස් යුද්ධයක්) මච්චුසෙනං විධමනං (මාරසේනාව විනාශකිරීමක්) ආහාරපරිග්ගහො (උපවාසකිරීමක්) දුක්කරකාරිකා (දුෂ්කරක් ක්‍රියාවක්) එවරූපෙ පරක්කමෙ (මෙබඳුවූ උත්සහයකින්) කිඤ්චි අස්සාදං (කිසිදු සැනසිල්ලක්/ ආස්වැසිල්ලක්) අලභිත්වා (නොලැබ) [තං+එව] තමෙව චිත්තං (ඒම සිත) පරිභාපෙත්වා (දුර්වලකරගෙන) [එවං+අවොච] එවමවොච (මෙසේ කීය)

☞ ‘‘ස්වාමීණි නාගසේන, යම්කලක මහබෝසතුන් දුෂ්කරක් ක්‍රියා කලේද, එබඳුවූ ඇරඹීමක්, උත්සහයක්, කෙලෙස් යුද්ධයක්, මාරසේනාව විනාශකිරීමක්, උපවාසකිරීමක්, දුෂ්කර ක්‍රියාවක්, අන්තැනක නොවූවේය. මෙබඳුවූ උත්සහයකින් කිසිදු සැනසිල්ලක් නොලැබ, එම සිත දුර්වලකරගෙන මෙසේ කීය.

• ‘න බො පනාහං ඉමාය කටුකාය දුක්කරකාරිකාය අධිගච්ඡාමි උත්තරිමනුස්සධම්මං අලමරියඤාණදස්සනවිසෙසං, සියා නු බො අඤ්ඤොපා මග්ගො බොධායා’ති, තතො නිබ්බින්දිත්වා අඤ්ඤෙන මගෙන සබ්බඤ්ඤුතං පත්තො, පුන තාය පටිපදාය සාවකෙ අනුසාසති සමාදපෙති.

★ ‘නු බො [පන+අහං] පනාහං (මම වනාහි) ඉමාය කටුකාය (මේ කටුකවූ) දුක්කරකාරිකාය (දුෂ්කර ක්‍රියාවෙන්) අධිගච්ඡාමි (අවබෝධ නොකරමි/ නො ලබමි) උත්තරි-මනුස්සධම්මං (සාමාන්‍ය මිනිස් හැකියාවට වඩා ශ්‍රේෂ්ඨවූ) [අලං+අරියඤාණ-දස්සන-විසෙසං] අලමරියඤාණදස්සනවිසෙසං (විශේෂ ආර්ය ඤාණදර්ශනයට ප්‍රමානවත්වූ) සියා නු බො (තිබේද/ වන්නේද) අඤ්ඤොපා මග්ගො (අන් මගක්/ අන් ක්‍රමයක්) බොධායා’ති (අවබෝධය පිණිස යැයි) තතො නිබ්බින්දිත්වා (එයින් කලකිරී) අඤ්ඤෙන මගෙන (අන් මගකින්) සබ්බඤ්ඤුතං පත්තො (බුදුබවට පත්විය) පුන තාය පටිපදාය (නැවත ඒ ප්‍රතිපදාවෙන්/ ක්‍රමයෙනන්) සාවකෙ අනුසාසති සමාදපෙති (ශ්‍රාවකයන්ට අනුශාසනාකරයි සමාදන්කරවයි)

☞ ‘‘මම වනාහි මේ කටුකවූ දුෂ්කර ක්‍රියාවෙන්, විශේෂ ආර්ය ඤාණදර්ශනයට ප්‍රමානවත්වූ සාමාන්‍ය මිනිස් හැකියාවට වඩා ශ්‍රේෂ්ඨවූ ධර්මයක් අවබෝධ නොකරමි, තිබේද අන් ක්‍රමයක් අවබෝධය පිණිස, යැයි’’ එයින් කලකිරී අන් මගකින් බුදුබවට පත්විය. නැවත ඒ ප්‍රතිපදාවෙන් ශ්‍රාවකයන්ට අනුශාසනාකරයි සමාදන්කරවයි.

‘ආරභථ නික්ඛමථ, යුඤ්ජථ බුද්ධසාසනෙ;
ධුනාථ මච්චුනො සෙනං, නළාගාරංව කුඤ්ජරො’ති

ආරභථ, නික්ඛමථ, බුද්ධසාසනෙ යුඤ්ජථ, කුඤ්ජරො නළාගාරංව මච්චුනො සෙනං ධුනාථ,

★ ආරභථ (අරඹව්/ කෙලෙස් සටන අරඹව්) නික්ඛමථ (නික්මෙව්/ සටනෙහි ඉදිරියටම යව්) බුද්ධසාසනෙ යුඤ්ජථ (බුද්ධශාසනයෙහි යෙදෙව්/ බුද්ධශාසනයේ ගුණදම් පිරීමෙහි යෙදෙව්)

කුඤ්ජරො (ඇතෙක්) නළාගාරං-ව (බටගෙයක් මෙන්/ බටගෙයක් පොඩිකරන්නාක් මෙන්) මච්චුනො සෙනං ධුනාථ (මාරයාගේ සේනාව විනාශකරව්)

• ''කෙන නු ඛො, භන්තෙ නාගසෙන, කාරණෙන තථාගතො යාය පටිපදාය අත්තනා නිබ්බින්නො විරත්තරූපො, තත්ථ සාවකෙ අනුසාසති සමාදපෙතී''ති?

★ ''කෙන නු ඛො (කුමන) භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) කාරණෙන (කරණයක් නිසා) තථාගතො (තථාගතයන් වහන්සේ) යාය පටිපදාය (යම් ප්‍රතිපදාවකින්) අත්තනා නිබ්බින්නො (තමා කලකිරී) විරත්තරූපො (කලකිරුණු ස්වභාවය ඇතිව) තත්ථ සාවකෙ (එහි ශ්‍රාවකයන්ට) අනුසාසති සමාදපෙතී''ති? (අනුශාසනාකරයිද? සමාදන්කරවයිද?)

☞ ''ස්වාමීණි නාගසේන, තථාගතයන් වහන්සේ යම් ප්‍රතිපදාවකින් තමා කලකිරී, කලකිරුණු ස්වභාවය ඇතිව, කුමන කරණයක් නිසා එම ප්‍රතිපදාවේ යෙදීමට ශ්‍රාවකයන්ට අනුශාසනාකරයිද? සමාදන්කරවයිද?

• ''තදාපි, මහාරාජ, එතරහිපි සා යෙව පටිපදා, තං යෙව පටිපදං පටිපජ්ජිත්වා බොධිසත්තො සබ්බඤ්ඤුතං පත්තො. අපි ච, මහාරාජ, බොධිසත්තො අතිවීරියං කරොන්තො නිරවසෙසතො ආහාරං උපරුන්ධි. තස්ස ආහාරූපරොධෙන චිත්තදුබ්බල්‍යං උප්පජ්ජි.

★ ''තදා-පි (එකලද/ එකලත්) මහාරාජ (මහරජ) එතරහි-පි (දැන්ද/ දැනුත්) සා යෙව පටිපදා (එයමයි ප්‍රතිපදාව/ පිළිවෙල) තං යෙව පටිපදං (ඒ ම ප්‍රතිපදාව) පටිපජ්ජිත්වා (පිළිපැද) බොධිසත්තො (මහබෝසතුන්) සබ්බඤ්ඤුතං පත්තො (බුදුබවට පත්විය) අපි ච (නමුත්) මහාරාජ (මහරජ) බොධිසත්තො (මහබෝසතුන්) අතිවීරියං කරොන්තො (අතිශයින් වීර්යකරමින්) නිරවසෙසතො (සම්පූරණයෙන්ම) ආහාරං උපරුන්ධි (ආහාර නැවැත්විය/ වැළැක්විය) තස්ස (ඔහුට) [ආහාර+උපරොධෙන] ආහාරූපරොධෙන (ආහාර නැවැත්වීමෙන්) චිත්ත-දුබ්බල්‍යං උප්පජ්ජි (සිතේ දුබලබව ඉපදිනි/ ඇතිවිය)

☞ මහරජ, එකලත් දැනුත් එයමයි ප්‍රතිපදාව පිළිවෙල, ඒ ම ප්‍රතිපදාව පිළිපැද මහබෝසතුන් බුදුබවට පත්විය. නමුත් මහරජ, මහබෝසතුන් අතිශයින් වීර්යකරමින් සම්පූරණයෙන්ම ආහාර නැවැත්විය, ඔහුට ආහාර නැවැත්වීමෙන් සිතේ දුබලබව ඇතිවිය.

• සො තෙන දුබ්බල්‍යෙන නාසක්ඛි සබ්බඤ්ඤුතං පාපුණිතුං, සො මත්තමත්තං කබළීකාරාහාරං සෙවන්තො තායෙව පටිපදාය නචිරස්සෙව සබ්බඤ්ඤුතං පාපුණි. සා යෙව, මහාරාජ, පටිපදා සබ්බෙසං තථාගතානං සබ්බඤ්ඤුතඤාණප්පටිලාභාය.

★ සො තෙන දුබ්බල්‍යෙන (ඔහුට ඒ දුබලබවින්) නාසක්ඛි (නොහැකිවිය) සබ්බඤ්ඤුතං පාපුණිතුං (බුදුබවට පත්වීමට) සො (ඔහු/උන්වහන්සේ) මත්ත-මත්තං (පොඩ්ඩ පොඩ්ඩ/ ටික ටික) කබළීකාරාහාරං (ඝන ආහාර / සාමාන්‍ය ආකාරයට ආහාර) සෙවන්තො (ගනිමින්) තායෙව (එමම) පටිපදාය (ප්‍රතිපදාවෙන්) න-චිරස්සෙ-ව (කෙටිකලකිලන් ම) සබ්බඤ්ඤුතං පාපුණි (බුදුබවට පත්විය) සා යෙව (එය මයි) මහාරාජ, පටිපදා (මහරජ ප්‍රතිපදාව) සබ්බෙසං තථාගතානං (සියලු තථාගතයන් වහන්සේලාගේ) [සබ්බඤ්ඤුත-ඤාණ+පටිලාභාය] සබ්බඤ්ඤුතඤාණප්පටිලාභාය. (සර්වඥතා ඥාණ ප්‍රතිලාබය පිණිස/ ලැබීම සඳහා පවතින)

☞ ඔහුට ඒ දුබලබවින් බුදුබවට පත්වීමට නොහැකිවිය. උන්වහන්සේ ටික ටික සාමාන්‍ය ආකාරයට ආහාර ගනිමින්, එමම ප්‍රතිපදාවෙන් කෙටිකලකිලන් ම බුදුබවට පත්විය.

මහරජ, සියලු තථාගතයන් වහන්සේලාගේ සර්වඤ්ඤතා ඤාණ ලැබීම සඳහා පවතින ප්‍රතිපදාව එයමයි.

• ''යථා, මහාරාජ, සබ්බෙසං සත්තානං ආහාරෝ උපත්ථම්භෝ, ආහාරූපනිස්සිතා සබ්බෙ සත්තා සුඛං අනුභවන්ති, එවමෙව ඛො, මහාරාජ, සා යෙව පටිපදා සබ්බෙසං තථාගතානං සබ්බඤ්ඤුතඤාණප්පටිලාභාය,

★ යථා, මහාරාජ (යම්සේ මහරජ) සබ්බෙසං සත්තානං (සියලු සත්ත්වයන්ට) ආහාරෝ උපත්ථම්භෝ (ආහාරය රුකුල්දෙයි) [ආහාර+උපනිස්සිතා] ආහාරූපනිස්සිතා (ආහාරයේ උපනිශ්‍රය ලැබූ/ ආහාරයෙන් ශක්තියලැබූ) සබ්බෙ සත්තා (සියලු සත්ත්වයන්) සුඛං අනුභවන්ති (සැප විඳිති) එවමෙව ඛො, මහාරාජ (එලෙසම මහරජ) සා යෙව පටිපදා (එයමයි ප්‍රතිපදාව/ පිළිවෙල/ ක්‍රමය) සබ්බෙසං තථාගතානං (සියලු තථාගතයන් වහන්සේලාගේ) [සබ්බඤ්ඤුත-ඤාණ+පටිලාභාය] සබ්බඤ්ඤුතඤාණප්පටිලාභාය. (සර්වඤ්ඤතා ඤාණ ප්‍රතිලාබය පිණිස/ ලැබීම සඳහා පවතින)

☞ මහරජ, යම්සේ සියලු සත්ත්වයන්ට ආහාරය රුකුල් දෙයි, ආහාරයෙන් ශක්තිය ලැබූ සියලු සත්ත්වයන් සැප විඳිති. එලෙසම මහරජ, සියලු තථාගතයන් වහන්සේලාගේ සර්වඤ්ඤතා ඤාණ ලැබීම සඳහා පවතින ප්‍රතිපදාව එයමයි.

• නෙසො, මහාරාජ, දොසො ආරම්භස්ස, න නික්කමස්ස, න කිලෙසයුද්ධස්ස, යෙන තථාගතො තස්මිං සමයෙ න පාපුණි සබ්බඤ්ඤුතඤාණං, අථ ඛො ආහාරූපරොධස්සෙවෙසො දොසො, සදා පටියත්තා යෙවෙසා පටිපදා.

★ [<u>න</u>+එසො] නෙසො, මහාරාජ, දොසො (මහරජ ඒ දෝසය) ආරම්භස්ස (ඇරඹීමේ වීර්යයේ <u>නොවේ</u>) න නික්කමස්ස (ඉදිරියට වීර්යකිරීමේ නොවේ) න කිලෙසයුද්ධස්ස (කෙලෙස් යුදුධයේ නොවේ) යෙන (යම්කරුණක් නිසා) තථාගතො (තථාගතයන් වහන්සේ) තස්මිං සමයෙ (ඒ සමයේ/ ඒ කාලයේ) න පාපුණි සබ්බඤ්ඤුතඤාණං (සර්වඤ්ඤතා ඤාණයට නොපැමිණියේ) අථ ඛො (තවද) [ආහාර+උපරොධස්ස+එව+එසො] ආහාරූපරොධස්සෙවෙසො දොසො (ආහාර වර්ජනයකිරීමේ මය ඒ දෝසය) සදා (සැමදා) පටියත්තා [යෙව+එසා] යෙවෙසා පටිපදා (සූදානමකර ඇත්තේමය මේ ප්‍රතිපදාව)

☞ මහරජ, තථාගතයන් වහන්සේ යම්කරුණක් නිසා ඒ සමයේ සර්වඤ්ඤතා ඤාණයට නොපැමිණියේ ද, ඒ දෝසය ඇරඹීමේ වීර්යයේ නොවේ, ඉදිරියට වීර්යකිරීමේ නොවේ, කෙලෙස් යුදුධයේ නොවේ, ඒ දෝසය ආහාර වර්ජනයකිරීමේ මය. සැමදා මේ ප්‍රතිපදාව සූදානමකර ඇත්තේමය.

• යථා, මහාරාජ, පුරිසො අද්ධානං අතිවෙගෙන ගච්ඡෙය්‍ය, තෙන සො පක්ඛහතො වා භවෙය්‍ය පීඨසප්පී වා අසඤ්චරො පඨවිතලෙ. අපි නු ඛො, මහාරාජ, මහාපඨවියා දොසො අත්ථි, යෙන සො පුරිසො පක්ඛහතො අහොසී''ති?

• ''යථා, මහාරාජ (යම්සේ මහරජ) පුරිසො අද්ධානං (පුරුෂයෙක් දුරක්/ දුරගමනක්) අතිවෙගෙන ගච්ඡෙය්‍ය (අතිවේගයෙන් යන්නේය) තෙන සො (එයින් ඔහු) පක්ඛහතො වා භවෙය්‍ය (අංසබාග රෝගියෙක් හෝ වන්නේය) පීඨසප්පී වා (අත්පා කොරවූවෙක් හෝ වන්නේය) අසඤ්චරො (ගමන්කල නොහැකි) පඨවිතලෙ (පොළොවෙහි) <u>**අපි නු ඛො**</u> මහාරාජ (මහරජ) මහාපඨවියා දොසො අත්ථි (පොළොවෙහි දෝසයක් ඇත්තේ <u>**ද?**</u>)

යෙන (යම් කරුණක්නිසා) සො පුරිසො (ඒ පුරුෂයා) පක්ඛහතො අහොසී''ති? (අතපය වාරු නැත්තෙක් වීමෙහි)

☞ යම්සේ මහරජ, පුරුෂයෙක් දුරගමනක් අතිවේගයෙන් යන්නේය, එයින් ඔහු අංසබාග රෝගියෙක් හෝ වන්නේය, පොළොවෙහි ගමන්කල නොහැකි අත්පා කොරවූවෙක් හෝ වන්නේය. මහරජ යම් කරුණක්නිසා ඒ පුරුෂයා අතපය වාරු නැත්තෙක් වූවේද, ඒ දෝසයක් ඇත්තේ පොළොවෙහි ද? [මහරජ ඒ මිනිසා අතපය වාරුනැත්තෙක් වූවේ පොළොවෙ දෝසයෙන් ද?]

• ''න හි, භන්තෙ; සදා පටියත්තා, භන්තෙ, මහාපඨවී, කුතො තස්සා දොසො? වායාමස්සෙවෙසො දොසො, යෙන සො පුරිසො පක්ඛහතො අහොසී''ති.

★ න හි, භන්තෙ (නැත ස්වාමීණි) සදා පටියත්තා (සැමදා සුදානම් [සැමදා ගමන්කිරීමට සුදානම්]) භන්තෙ, මහාපඨවී (ස්වාමීණි මහපොළොව) කුතො තස්සා දොසො? (කොහෙන්ද ඇගේ දෝසයක්) [වායාමස්ස+එව+එසො] වායාමස්සෙවෙසො දොසො (උත්සහකල ආකාරයේමයි ඒ දෝසය) යෙන සො පුරිසො (යමක්නිසා ඒ පුරුෂයා) පක්ඛහතො අහොසී''ති (අංසබාගියෙක්/ අතපය වාරු නැත්තෙක් වූවේද)

☞ නැත ස්වාමීණි, සැමදා මහපොළොව ගමන්කිරීමට සුදානම්, ඇගේ කොහෙන්ද දෝසයක්. ඒ පුරුෂයා අතපය වාරු නැත්තෙක් වූවේ උත්සහකල ආකාරයේම දෝසයෙන්.

•''එවමෙව ඛො, මහාරාජ, නෙසො දොසො ආරම්භස්ස, න නික්කමස්ස, න කිලෙසයුද්ධස්ස, යෙන තථාගතො තස්මිං සමයෙ න පාපුණි සබ්බඤ්ඤුතඤාණං, අථ ඛො ආහාරූපරොධස්සෙවෙසො දොසො සදා පටියත්තා යෙවෙසා පටිපදා.

★ එවමෙව ඛො මහාරාජ (එලෙසම මහරජ) [<u>න</u>+එසො] නෙසො, දොසො (මහරජ ඒ දෝසය) ආරම්භස්ස (ඇරඹීමේ වීර්යයේ <u>නොවේ</u>) න නික්කමස්ස (ඉදිරියට වීර්යකිරීමේ නොවේ) න කිලෙසයුද්ධස්ස (කෙලෙස් යුදුධයේ නොවේ) යෙන (යම්කරුණක් නිසා) තථාගතො (තථාගතයන් වහන්සේ) තස්මිං සමයෙ (ඒ සමයේ/ ඒ කාලයේ) න පාපුණි සබ්බඤ්ඤුතඤාණං (සර්වඤ්ඤතා ඤාණයට නොපැමිණියේ) අථ ඛො (තවද) [ආහාර+උපරොධස්ස+එව+එසො] ආහාරූපරොධස්සෙවෙසො දොසො (ආහාර වර්ජනයකිරීමේ මය ඒ දෝසය) සදා (සැමදා) පටියත්තා [යෙව+එසා] යෙවෙසා පටිපදා (සූදානමකර ඇත්තේමය මේ ප්‍රතිපදාව)

☞ එලෙසම මහරජ, තථාගතයන් වහන්සේ යම්කරුණක් නිසා ඒ සමයේ සර්වඤ්ඤතා ඤාණයට නොපැමිණියේ ද, ඒ දෝසය ඇරඹීමේ වීර්යයේ නොවේ, ඉදිරියට වීර්යකිරීමේ නොවේ, කෙලෙස් යුදුධයේ නොවේ, ඒ දෝසය ආහාර වර්ජනයකිරීමේ මය. සැමදා මේ ප්‍රතිපදාව සූදානමකර ඇත්තේමය.

• යථා වා පන, මහාරාජ, පුරිසො කිලිට්ඨං සාටකං නිවාසෙය්‍ය, න සො තං ධොවාපෙය්‍ය, නෙසො දොසො උදකස්ස, සදා පටියත්තං උදකං. පුරිසස්සෙවෙසො දොසො.

★''යථා වා පන, මහාරාජ (යම්සේ මහරජ) පුරිසො (පුරුෂයෙක්) කිලිට්ඨං සාටකං (කිලුටු රෙද්දක්) නිවාසෙය්‍ය (ඇඳගන්නේය) <u>න</u> සො තං (ඔහු එය) ධොවාපෙය්‍ය (<u>නො</u> සෝදයි) [න+එසො] නෙසො දොසො උදකස්ස (ඒ දෝෂය වතුරේ නොවේ) සදා පටියත්තං උදකං (සැමදා වතුර සූදානම් [සැමදා වතුර සේදීමට සූදානම්]) [පුරිසස්ස+එව+එසො] පුරිසස්සෙවෙසො දොසො (පුරුෂයාගේ මය ඒ දෝෂය)

☞ මහහරජ, යම් පුරුෂයෙක් කිලුටු රෙද්දක් ඇඳගන්නේය. ඔහු එය නො සෝදයි. ඒ දෝෂය වතුරේ නොවේ. සැමදා වතුර සේදීමට සූදානම්, පුරුෂයාගේ මය ඒ දෝෂය.

•''එවමෙව ඛො, මහාරාජ, නෙසො දොසො ආරම්භස්ස, න නික්කමස්ස, න කිලෙසයුද්ධස්ස, යෙන තථාගතො තස්මිං සමයෙ න පාපුණි සබ්බඤ්ඤුතඤාණං, අථ ඛො ආහාරූපරොධස්සෙවෙසො දොසො සදා පටියත්තා යෙවෙසා පටිපදා.

★ එවමෙව ඛො මහාරාජ (එලෙසම මහරජ) [නු+එසො] නෙසො, දොසො (මහරජ ඒ දෝසය) ආරම්භස්ස (ඇරඹීමේ වීර්යයේ **නොවේ**) න නික්කමස්ස (ඉදිරියට වීර්යකිරීමේ නොවේ) න කිලෙසයුද්ධස්ස (කෙලෙස් යුදුධයේ නොවේ) යෙන (යම්කරුණක් නිසා) තථාගතො (තථාගතයන් වහන්සේ) තස්මිං සමයෙ (ඒ සමයේ/ ඒ කාලයේ) න පාපුණි සබ්බඤ්ඤුතඤාණං (සර්වඤ්ඤතා ඤාණයට නොපැමිණියේ) අථ ඛො (තවද) [ආහාර+උපරොධස්ස+එව+එසො] ආහාරූපරොධස්සෙවෙසො දොසො (ආහාර වර්ජනයකිරීමේ මය ඒ දෝසය) සදා (සැමදා) පටියත්තා [යෙව+එසා] යෙවෙසා පටිපදා (සූදානමකර ඇත්තේමය මේ ප්‍රතිපදාව)

☞ එලෙසම මහරජ, තථාගතයන් වහන්සේ යම්කරුණක් නිසා ඒ සමයේ සර්වඤ්ඤතා ඤාණයට නොපැමිණියේ ද, ඒ දෝසය ඇරඹීමේ වීර්යයේ නොවේ, ඉදිරියට වීර්යකිරීමේ නොවේ, කෙලෙස් යුදුධයේ නොවේ, ඒ දෝසය ආහාර වර්ජනයකිරීමේ මය. සැමදා මේ ප්‍රතිපදාව සූදානමකර ඇත්තේමය.

• තස්මා තථාගතො තායෙව පටිපදාය සාවකෙ අනුසාසති සමාදපෙති, එවං ඛො, මහාරාජ, සදා පටියත්තා අනවජ්ජා සා පටිපදා''ති. ''සාධු, භන්තෙ නාගසෙන, එවමෙතං තථා සම්පටිච්ඡාමී''ති.

★ තස්මා තථාගතො (එබැවින් තථාගතයන් වහන්සේ) තායෙව (එමම) පටිපදාය (ප්‍රතිපදාවෙන්) සාවකෙ අනුසාසති සමාදපෙති (ශ්‍රාවකයන්ට අනුශාසනාකරයි සමාදන්කරවයි) එවං ඛො, මහාරාජ (මෙසේ මහරජ) සදා පටියත්තා (සැමදා සූදානමය/ නිවනකරා ගෙනයැමට සැමදා සූදානමය) අනවජ්ජා (නිවැරදිය) සා පටිපදා''ති (ඒ ප්‍රතිපදාව) ''සාධු, භන්තෙ නාගසෙන (හොදයි ස්වාමීණි නාගසේන) එවමෙතං (මෙසේ මෙය) තථා සම්පටිච්ඡාමී''ති (මේආකාරයට පිළිගන්නෙමි)

☞ එබැවින් තථාගතයන් වහන්සේ එමම ප්‍රතිපදාවෙන් ශ්‍රාවකයන්ට අනුශාසනාකරයි සමාදන්කරවයි, මෙසේ මහරජ, නිවැරදි ඒ ප්‍රතිපදාව නිවනකරා ගෙනයැමට සැමදා සූදානමය. ''හොදයි ස්වාමීණි නාගසේන, මෙසේ මෙය මේආකාරයට ම පිළිගන්නෙමි''

07

• භන්තෙ නාගසෙන, තුම්හෙ භණථ 'අරහා එකං දුක්ඛං වෙදනං වෙදයති කායිකං, න චෙතසික'න්ති. කිං නු ඛො, භන්තෙ නාගසෙන, අරහතො චිත්තං යං කායං නිස්සාය පවත්තති, තත්ථ අරහා අනිස්සරො අස්සාමී අවසවත්තී''ති?

★ ''භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) තුම්හෙ භණථ (නුඹලා කියති) 'අරහා (රහතන්වහන්සේ) එකං දුක්ඛං වෙදනං (එක් දුක් වේදනාවක්) වෙදයති කායිකං (විඳියි කායිකවූ) න චෙතසික'න්ති [චෙතසිකං+ඉති] (මානසික්ව නොවේ යැයි/ සිතින් නොවිඳියි යැයි) කිං නු ඛො (කිමෙක්ද) භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) අරහතො චිත්තං (රහතන්වහන්සේගේ සිත) යං කායං (යම් කයක්) නිස්සාය (නිසා/ ඇසුරුකරගෙන)

පවත්තති (පවතියි ද) තත්ථ (එහි/ ඒ කයෙහි) අරහා (රහතන්වහන්සේ) අනිස්සරො (ස්වාමියා නොවේද) අස්සාමී (අයිතිකාරයා නොවේද) අවසවත්තී''ති? (තමාගේ කැමැත්තපරිදි තබාගත නොහැකිද)

☞ ''ස්වාමීණි නාගසේන, නුඹලා 'රහතන්වහන්සේ කායිකවූ එක් දුක් වේදනාවක් විඳියි, සිතින් දුක් වේදනාවක් නොවිඳියි' යැයි කියති. කිමෙක්ද ස්වාමීණි නාගසේන, රහතන්වහන්සේගේ සිත, යම් කයක් ඇසුරුකරගෙන පවතියි ද, ඒ කයෙහි රහතන්වහන්සේ ස්වාමියා නොවේද? අයිතිකාරයා නොවේද? තමාගේ කැමැත්තපරිදි තබාගත නොහැකිද?

• ''ආම, මහාරාජා''ති. ''න ඛො, භන්තෙ නාගසෙන, යුත්තමෙතං, යං සො සකචිත්තස්ස පවත්තමානෙ කායෙ අනිස්සරො හොති අස්සාමී අවසවත්තී; සකුණොපි තාව, භන්තෙ, යස්මිං කුලාවකෙ පටිවසති, තත්ථ සො ඉස්සරො හොති සාමී වසවත්තී''ති.

★ ආම, මහාරාජා''ති (ඔව් මහරජ) ''<u>න ඛො</u>, භන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේන) [යුත්තං+එතං] යුත්තමෙතං (මෙය සුදුසු <u>**නොවේ**</u>) යං සො (යම්සේ ඔහු) සක-චිත්තස්ස (තමාගේ සිත) පවත්තමානෙ කායෙ (පවත්වන කයෙහි) අනිස්සරො හොති (ස්වාමියා නොවීම) අස්සාමී (අයිතිකාරයා නොවීම) අවසවත්තී (තමාගේ කැමැත්තපරිදි තබාගත නොහැකිවීම) සකුණො-පි තාව (කුරුල්ලා-ත් වනාහි) භන්තෙ (ස්වාමීණි) යස්මිං කුලාවකෙ පටිවසති (යම් කූඩුවක වාසයකරයිද) තත්ථ සො (එහි ඔහු/ ඌ) ඉස්සරො හොති (ස්වාමියා වේ) සාමී (අයිතිකාරයා වේ) වසවත්තී''ති. (තමාගේ කැමැත්තපරිදි තබාගනියි)

☞ ''ඔව් මහරජ'' ''ස්වාමීණි නාගසේන, මෙය සුදුසු නොවේ, යම්සේ ඔහු තමාගේ සිත පවත්වන කයෙහි ස්වාමියා නොවීම, අයිතිකාරයා නොවීම, තමාගේ කැමැත්තපරිදි තබාගත නොහැකිවීම, ස්වාමීණි, කුරුල්ලාත් යම් කූඩුවක වාසයකරයිද, ඌ එහි ස්වාමියා වේ, අයිතිකාරයා වේ, තමාගේ කැමැත්තපරිදි තබාගනියි.

• ''දසයිමෙ, මහාරාජ, කායානුගතා ධම්මා භවෙ භවෙ කායං අනුධාවන්ති අනුපරිවත්තන්ති. කතමෙ දස? සීතං උණ්හං ජිඝච්ඡා පිපාසා උච්චාරො පස්සාවො මිද්ධං ජරා බ්‍යාධි මරණං. ඉමෙ ඛො, මහාරාජ, දස කායානුගතා ධම්මා භවෙ භවෙ කායං අනුධාවන්ති අනුපරිවත්තන්ති, තත්ථ අරහා අනිස්සරො අස්සාමී අවසවත්තී''ති.

★ [දස+ඉමෙ] දසයිමෙ, මහාරාජ (මහරජ මේ දහය) [කාය+අනුගතා] කායානුගතා (කයට අනුගතවූ/ කයත් එක්ක පවතින) ධම්මා (ධර්මයෝ) භවෙ භවෙ (භවයෙන් භවයට) කායං අනුධාවන්ති (කය අනුව දුවති) අනුපරිවත්තන්ති (අනුව පෙරලෙති) කතමෙ දස? (මොනවද ඒ දහය) සීතං උණ්හං (සීතල උෂ්ණය) ජිඝච්ඡා පිපාසා (බඩගින්න පිපාසය) උච්චාරො (මළ) පස්සාවො (මුත්‍රා) මිද්ධං (නිදිමත) ජරා (වයසට යෑම) බ්‍යාධි මරණං (ලෙඩවීම මරණය) ඉමෙ ඛො (මේ වනාහි) මහාරාජ (මහරජ) දස (දහයක්වූ) [කාය+අනුගතා] කායානුගතා (කයට අනුගතවූ/ කයත් එක්ක පවතින) ධම්මා (ධර්මයෝ) භවෙ භවෙ (භවයෙන් භවයට) කායං අනුධාවන්ති (කය අනුව දුවති) අනුපරිවත්තන්ති (අනුව පෙරලෙති), තත්ථ (එහි/ ඒ කයෙහි) අරහා (රහතන්වහන්සේ) අනිස්සරො (ස්වාමියා නොවේ) අස්සාමී (අයිතිකාරයා නොවේ) අවසවත්තී''ති? (තමාගේ කැමැත්තපරිදි තබාගත නොහැකියි)

☞ මහරජ!, මේ කයත් එක්ක පවතින ධර්මයෝ දහයකි, ඒවා භවයෙන් භවයට කය අනුව දුවති - කය අනුව යති, කය අනුව පෙරලෙති, මොනවද ඒ දහය: සීතල උෂ්ණය, බඩගින්න, පිපාසය, මළ, මුත්‍රා, නිදිමත, වයසට යෑම, ලෙඩවීම, මරණය. මහරජ! මේ කයත් එක්ක පවතින ධර්මයෝ දහය භවයෙන් භවයට කය අනුව දුවති, කය අනුව පෙරලෙති,

එහි රහතන්වහන්සේ ස්වාමියා නොවේ, අයිතිකාරයා නොවේ, තමාගේ කැමැත්තපරිදි තබාගත නොහැකියි.

• ''හන්තෙ නාගසෙන, කෙන කාරණෙන අරහතො කායෙ ආණා නප්පවත්තති ඉස්සරියං වා, තත්ථ මෙ කාරණං බ්‍රූහී''ති?

★ හන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේනයන් වහන්ස) කෙන කාරණෙන (කුමන කරුණක් නිසාද) අරහතො (රහතන්වහන්සේ) කායෙ ආණා (කයෙහි අණසක) නප්පවත්තති (නො පවත්වන්නේ) ඉස්සරියං වා (ස්වාමිබව හෝ) තත්ථ මෙ (එහි මට) කාරණං බ්‍රූහී''ති? (කරුණ කියන්න)

☞ ස්වාමීණි නාගසේනයන් වහන්ස! රහතන්වහන්සේ කයෙහි අණසක නො පවත්වන්නේ ස්වාමිබව හෝ නො පවත්වන්නේ කුමන කරුණක් නිසාද? එහි මට කරුණ කියන්න.

• ''යථා, මහාරාජ, යෙ කෙචි පථවිනිස්සිතා සත්තා, සබ්බෙ තෙ පථවිං නිස්සාය චරන්ති විහරන්ති වුත්තිං කප්පෙන්ති, අපි නු ඛො, මහාරාජ, තෙසං පථවියා ආණා පවත්තති ඉස්සරියං වා''ති? ''න හි, හන්තෙ''ති. ''එවමෙව ඛො, මහාරාජ, අරහතො චිත්තං කායං නිස්සාය පවත්තති, න ච පන අරහතො කායෙ ආණා පවත්තති ඉස්සරියං වා''ති.

★ 'යථා, මහාරාජ (යම්සේ මහරජ) යෙ කෙචි (යම්කිසි) පථවි-නිස්සිතා සත්තා (පොළොව ඇසුරුකරන සත්ත්වයන් වේද) සබ්බෙ තෙ (ඔවුන් සියල්ල) පථවිං නිස්සාය (පොළොව නිසා) චරන්ති (සැරිසරති) විහරන්ති (වාසයකරති) වුත්තිං කප්පෙන්ති (ඉරියව් පවත්වති) **<u>අපි නු ඛො,</u>** මහාරාජ (මහරජ) තෙසං (ඔවුන්ගේ) පථවියා (පොළොව කෙරෙහි) ආණා පවත්තති (අණසක පවතියි **<u>ද?</u>**) ඉස්සරියං වා''ති? (ස්වාමිබව හෝ) ''න හි, හන්තෙ''ති (නැත ස්වාමීණි) ''එවමෙව ඛො, මහාරාජ (එලෙසම මහරජ) අරහතො (රහතන්වහන්සේගේ) චිත්තං (සිත) කායං නිස්සාය (කය ඇසුරුකරගෙන) පවත්තති (පවතියි) **<u>න</u>** ච පන (නමුත්) අරහතො (රහතන්වහන්සේගේ) කායෙ (කයෙහි) ආණා පවත්තති (අණසක **<u>නො</u>** පවත්වයි) ඉස්සරියං වා''ති (ස්වාමිබව හෝ)

☞ මහරජ, යම්කිසි පොළොව ඇසුරුකරන සත්ත්වයන් වේද, ඔවුන් සියල්ල පොළොව නිසා සැරිසරති, වාසයකරති, ඉරියව් පවත්වති, මහරජ, ඔවුන්ගේ පොළොව කෙරෙහි අණසක පවතියි ද? ස්වාමිබව හෝ පවතියි ද? "නැත ස්වාමීණි" එලෙසම මහරජ, රහතන්වහන්සේගේ සිත කය ඇසුරුකරගෙන පවතියි, නමුත් රහතන්වහන්සේ කයෙහි අණසක නො පවත්වයි ස්වාමිබව හෝ නො පවත්වයි.

• ''හන්තෙ නාගසෙන, කෙන කාරණෙන පුථුජ්ජනො කායිකම්පි චෙතසිකම්පි දුක්ඛං වෙදනං වෙදයතී''ති?

★ ''හන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේනයන් වහන්ස) කෙන කාරණෙන (කුමන කරුණක් නිසාද) පුථුජ්ජනො (සාමාන්‍යය ජනයා) [කායිකං+අපි] කායිකම්පි [චෙතසිකං+අපි] චෙතසිකම්පි (කායිකවූ ද චේතසිකවූ ද/ සිතින් ද කයින් ද) දුක්ඛං වෙදනං වෙදයතී''ති? (දුක්වේදනා විඳින්නේ ?)

☞ ස්වාමීණි නාගසේනයන් වහන්ස, සාමාන්‍යය ජනයා සිතින් ද කයින් ද දුක්වේදනා විඳින්නේ කුමන කරුණක් නිසාද?

• ''අභාවිතත්තා, මහාරාජ, චිත්තස්ස පුථුජ්ජනො කායිකම්පි චෙතසිකම්පි දුක්ඛං වෙදනං වෙදයති. යථා, මහාරාජ, ගොණො ඡාතො පරිතසිතො අබලදුබ්බලපරිත්තකතිණෙසු වා ලතාය වා උපනිබද්ධො අස්ස, යදා සො ගොණො පරිකුපිතො හොති, තදා සහ උපනිබන්ධනෙන පක්කමති.

★ අභාවිතත්තා (නොවැඩුබැවින්) මහාරාජ, චිත්තස්ස (මහරජ සිතේ) පුථුජ්ජනො (සාමාන්‍යය ජනයා) [කායිකං+අපි] කායිකම්පි [චෙතසිකං+අපි] චෙතසිකම්පි (කායිකවූ ද චේතසිකවූ ද/ සිතින් ද කයින් ද) දුක්ඛං වෙදනං වෙදයති (දුක්වේදනා විඳියි). යථා, මහාරාජ (යම්සේ මහරජ) ගොණො (ගොණෙක්) ඡාතො (බඩගිනිවූ) පරිතසිතො (අතිශයිනක් පිපාසතවූ) අබල-දුබ්බල-පරිත්තක-තිණෙසු වා (දුර්වල පොඩි තණකොලවල හෝ) ලතාය වා (වැලක හෝ) උපනිබද්ධො අස්ස (ලංකරබැඳ ඇත්තේනම්) යදා සො ගොණො (යම්වේලාවක ඒ ගොණා) පරිකුපිතො හොති (අතිශයින් කුපිතවේද) තදා (එකල) සහ උපනිබන්ධනෙන (බැන්ද දේවලුත් සමග) පක්කමති (යයි)

☞ මහරජ, සිත නොවැඩුබැවින් සාමාන්‍යය ජනයා සිතින් ද කයින් ද දුක්වේදනා විඳියි. යම්සේ මහරජ, බඩගිනිවූ ද අතිශයිනක් පිපාසතවූ ද ගොණෙක් දුර්වල පොඩි තණකොලවල හෝ වැලක හෝ ලංකරබැඳ ඇත්තේනම්, යම්වේලාවක ඒ ගොණා අතිශයින් කුපිතවේද එකල බැන්ද දේවලුත් සමග යයි.

• එවමෙව ඛො, මහාරාජ, අභාවිතචිත්තස්ස දුක්ඛා වෙදනා උප්පජ්ජිත්වා චිත්තං පරිකොපෙති, චිත්තං පරිකුපිතං කායං ආහුජති නිබ්භුජති සම්පරිවත්තකං කරොති. අථ ඛො සො අභාවිතචිත්තො තසති රවති හෙරවරාවමභිරවති, ඉදමෙත්ථ, මහාරාජ, කාරණං, යෙන කාරණෙන පුථුජ්ජනො කායිකම්පි චෙතසිකම්පි දුක්ඛං වෙදනං වෙදයති''ති.

★ එවමෙව ඛො, මහාරාජ (එලෙසම මහරජ) අභාවිත-චිත්තස්ස (නොවැඩූ සිත්ඇත්තාගේ) දුක්ඛා වෙදනා උප්පජ්ජිත්වා (දුක්වේදනා ඉපිද) චිත්තං පරිකොපෙති (සිත අතිශයින් කෝපකරවයි) චිත්තං පරිකුපිතං (අතිශයින් කෝපවූ සිත) කායං ආහුජති (කය හකුලුවයි) නිබ්භුජති (අඹරයි) සම්පරිවත්තකං කරොති (එහෙට මෙහෙට කැරකවීම කරවයි) අථ ඛො සො (එවිට ඒ) අභාවිත-චිත්තො (නොවැඩූ සිත්ඇත්තා) තසති (තැතිගනියි) රවති (කෑගසයි) [හෙරව-රාවං+අභිරවති] හෙරවරාවමභිරවති (බයානක හඬකින් හයියෙන් කෑගසයි) [ඉදං+එත්ථ] ඉදමෙත්ථ (මෙයයි මෙහි) මහාරාජ, කාරණං (මහරජ කාරණාව) යෙන කාරණෙන (යම් කරුණක් නිසා) පුථුජ්ජනො (සාමාන්‍යය ජනයා) [කායිකං+අපි] කායිකම්පි [චෙතසිකං+අපි] චෙතසිකම්පි (කායිකවූ ද චේතසිකවූ ද/ සිතින් ද කයින් ද) දුක්ඛං වෙදනං වෙදයති''ති (දුක්වේදනා විඳියි/ විඳීමට)

☞ එලෙසම මහරජ, නොවැඩූ සිත්ඇත්තාගේ දුක්වේදනා ඉපිද, සිත අතිශයින් කෝපකරවයි, අතිශයින් කෝපවූ සිත කය හකුලුවයි, අඹරයි, එහෙට මෙහෙට කැරකවීම කරවයි, එවිට ඒ නොවැඩූ සිත්ඇත්තා තැතිගනියි, කෑගසයි, බයානක හඬකින් හයියෙන් කෑගසයි. මහරජ, මෙයයි මෙහි කාරණාව සාමාන්‍යය ජනයා සිතින් ද කයින් ද දුක්වේදනා විඳීමට.

• ''කිං පන තං භන්තෙ කාරණං, යෙන කාරණෙන අරහා එකං දුක්ඛං වෙදනං වෙදයති කායිකං, න චෙතසික''න්ති?

★ කිං පන තං භන්තෙ කාරණං (කුමක්ද/ මොකක්ද ඒ කාරණාව ස්වාමීණි) යෙන කාරණෙන (යම් කරුණක් නිසා) අරහා (රහතන්වහන්සේ) එකං දුක්ඛං වෙදනං (එක් දුක් වේදනාවක්) වෙදයති කායිකං (විඳියි කායිකවූ) න [චෙතසිකං+ඉති] චෙතසික''න්ති? (සිතින් නොවේ)

☞ ස්වාමීණි, රහතන්වහන්සේ කායිකවූ දුක් වේදනා විඳීමටත් සිතින් දුක් වේදනා නොවිඳීමටත් කාරණාව මොකක්ද?

• ''අරහතො, මහාරාජ, චිත්තං භාවිතං හොති සුභාවිතං දන්තං සුදන්තං අස්සවං වචනකරං, සො දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො 'අනිච්ච'න්ති දළ්හං ගණ්හාති, සමාධිථම්භෙ චිත්තං උපනිබන්ධති,

★ ''අරහතො, මහාරාජ චිත්තං (මහරජ රහතන්වහන්සේගේ සිත) භාවිතං හොති (වඩනලද්දේය) සුභාවිතං (මනාලෙස වඩනලද්දේය) දන්තං (දමනය කරනලද්දේය) සුදන්තං (මනාලෙස දමනය කරනලද්දේය) අස්සවං (කීකරුය) වචනකරං (කියනදේ කරන්නේය) සො (ඔහු/ ඔහුට) දුක්ඛාය වෙදනාය (දුක්වේදනාවක්) ඵුට්ඨො සමානො (ස්ඵර්ශවූකල/ ඇතිවූකල) [අනිච්චං+ඉති] අනිච්ච'න්ති (අනිත්‍ය යැයි) දළ්හං ගණ්හාති (දැඩිලෙස ගනියි) සමාධි-ථම්භෙ (සමාධි ස්ථම්භයේ) චිත්තං උපනිබන්ධති (සිත ළංකර බඳියි)

☞ මහරජ, රහතන්වහන්සේගේ සිත වඩනලද්දේය, මනාලෙස වඩනලද්දේය, දමනය කරනලද්දේය, මනාලෙස දමනය කරනලද්දේය, කීකරුය, කියනදේ කරන්නේය. ඔහුට දුක්වේදනාවක් ඇතිවූකල ''අනිත්‍ය'' යැයි දැඩිලෙස සිතින් ගනියි. සමාධි ස්ථම්භයේ සිත ළංකර බඳියි.

• තස්ස තං චිත්තං සමාධිථම්භෙ උපනිබන්ධනං න වෙධති න චලති, ඨිතං හොති අවික්ඛිත්තං, තස්ස වෙදනාවිකාරවිප්ඵාරෙන කායො ආභුජති නිබ්භුජති සම්පරිවත්තති, ඉදමෙත්ථ, මහාරාජ, කාරණං, යෙන කාරණෙන අරහා එකං වෙදනං වෙදයති කායිකං, න චෙතසික''න්ති.

★ තස්ස තං චිත්තං (ඔහුගේ ඒ සිත) සමාධි-ථම්භෙ (සමාධි ස්ථම්භයේ) උපනිබන්ධනං (ළංකර බඳිනලද) න වෙධති (කම්පානොවේ) න චලති (නොසැලෙයි) ඨිතං හොති (පිහිටියාවේ) අවික්ඛිත්තං (විසිර නොයයි) තස්ස (ඔහුගේ/ උන්වහන්සේගේ) වෙදනා-විකාර-විප්ඵාරෙන (වෙනස්වූ වේදනාව පැතිරයාමෙන්/ දුක් වේදනාව පැතිරයාමෙන්) කායො ආභුජති (කය හැකිලෙයි) නිබ්භුජති (ඇඹරෙයි) සම්පරිවත්තති (එහෙමෙහෙ කැරකෙයි) [ඉදං+එත්ථ] ඉදමෙත්ථ (මෙයයි මෙහි) මහාරාජ, කාරණං (මහරජ කාරණාව) යෙන කාරණෙන (යම් කරුණක් නිසා) අරහා (රහතන්වහන්සේ) එකං දුක්ඛං වෙදනං (එක් දුක් වේදනාවක්) වෙදයති කායිකං (විඳියි කායිකවූ) න [චෙතසිකං+ඉති] චෙතසික''න්ති (සිතින් නොවේ)

☞ ඔහුගේ සමාධි ස්ථම්භයේ ළංකර බඳිනලද ඒ සිත කම්පානොවේ, නොසැලෙයි, පිහිටියාවේ. විසිර නොයයි. දුක් වේදනාව පැතිරයාමෙන් උන්වහන්සේගේ කය හැකිලෙයි, ඇඹරෙයි, එහෙමෙහෙ කැරකෙයි. එහෙත් උන්වහන්සේ එනිසා සිතින් දුක් නො විඳියි. මහරජ, රහතන්වහන්සේ කායිකවූ දුක් වේදනා විඳීමටත් සිතින් දුක් වේදනා නොවිඳීමටත් මෙහි කාරණාව මෙයයි.

• ''හන්තෙ නාගසෙන, තං නාම ලොකෙ අච්ඡරියං යං කායෙ වලමානෙ චිත්තං න චලති, තත්ථ මෙ කාරණං බ්‍රූහී''ති.

★ හන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේනයන්වහන්ස) තං නාම ලොකෙ (එය නම් ලොවෙහි) අච්ඡරියං (ආස්චර්යකි/ ආස්චර්යවත් දෙයකි) යං කායෙ වලමානෙ (කය සැලෙන විට) චිත්තං න චලති (සිත නොසැලෙයි/ නොසැලීම) තත්ථ (එහි/ එයට/ එසේවීමට) මෙ කාරණං බ්‍රූහී''ති (මට කාරණය කියන්න)

☞ ස්වාමීණි නාගසේනයන්වහන්ස, එය නම් ලොවෙහි ආස්චර්යවත් දෙයකි, කය සැලෙන විට සිත නොසැලීම. මට එසේවීමට කාරණය කියන්න.

• ''යථා, මහාරාජ, මහතිමහාරුක්ඛෙ ඛන්ධසාඛාපලාසසම්පන්නෙ අනිලබලසමාහතෙ සාඛා වලති, අපි නු තස්ස ඛන්ධොපි වලතී''ති? ''න හි, හන්තෙ''ති.

★ යථා, මහාරාජ (යම්සේ මහරජ) මහති-මහා-රුක්ඛෙ (අතිවිශාල මහා ගසක) ඛන්ධ-සාඛා-පලාස-සම්පන්නෙ (කඳ අතු කොල සම්පන්නවූ/ වලින් යුකුතවූ) අනිල-බල-සමාහතෙ (සුලං බලයෙන් පහරලදකල) සාඛා වලති (අතු සෙලවෙයි) අපි නු තස්ස (ඔහුගේ/ ගසේ) ඛන්ධො-පි (කඳ-ත්) වලතී''ති? (සෙලවේද?) ''න හි, හන්තෙ''ති (නැත ස්වාමීණි)

☞ යම්සේ මහරජ, කඳ අතු කොල වලින් යුකුතවූ අතිවිශාල මහා ගසක් සුලං බලයෙන් පහරලදකල අතු සෙලවෙයි, ගසේ කඳත් සෙලවේද? නැත ස්වාමීණි.

• ''එවමෙව ඛො, මහාරාජ, අරහා දුක්ඛාය වෙදනාය ඵුට්ඨො සමානො 'අනිච්ච'න්ති දළ්හං ගණ්හාති, සමාධිථම්භෙ චිත්තං උපනිබන්ධති, තස්ස තං චිත්තං සමාධිථම්භෙ උපනිබන්ධනං න වෙධති න වලති, ඨිතං හොති අවික්ඛිත්තං,

★ එවමෙව ඛො, මහාරාජ (එලෙසම මහරජ) අරහා (රහතන්වහන්සේ) දුක්ඛාය වෙදනාය (දුක්වේදනාවක්) ඵුට්ඨො සමානො (ස්ඵර්ශවූකල/ ඇතිවූකල) [අනිච්ච+ඉති] අනිච්ච'න්ති (අනිත්‍ය යැයි) දළ්හං ගණ්හාති (දැඩිලෙස ගනියි) සමාධි-ථම්භෙ (සමාධි ස්ථම්භයේ) චිත්තං උපනිබන්ධති (සිත ළංකර බඳියි) තස්ස තං චිත්තං (ඔහුගේ ඒ සිත) සමාධි-ථම්භෙ (සමාධි ස්ථම්භයේ) උපනිබන්ධනං (ළංකර බඳිනලද) න වෙධති (කම්පානොවේ) න වලති (නොසැලෙයි) ඨිතං හොති (පිහිටියාවේ) අවික්ඛිත්තං (විසිර නොයයි)

☞ එලෙසම මහරජ, රහතන්වහන්සේ දුක්වේදනාවක් ඇතිවූකල ''අනිත්‍ය'' යැයි දැඩිලෙස සිතින් ගනියි. සමාධි ස්ථම්භයේ සිත ළංකර බඳියි. ඔහුගේ සමාධි ස්ථම්භයේ ළංකර බඳිනලද ඒ සිත කම්පානොවේ, නොසැලෙයි, පිහිටියාවේ. විසිර නොයයි.

• තස්ස වෙදනාවිකාරවිප්ඵාරෙන කායො ආභුජති නිබ්භුජති සම්පරිවත්තති, චිත්තං පන තස්ස න වෙධති න වලති ඛන්ධො විය මහාරුක්ඛස්සා''ති.

★ තස්ස (ඔහුගේ/ උන්වහන්සේගේ) වෙදනා-විකාර-විප්ඵාරෙන (වෙනස්වූ වේදනාව පැතිරයාමෙන්/ දුක් වේදනාව පැතිරයාමෙන්) කායො ආභුජති (කය හැකිලෙයි) නිබ්භුජති (ඇඹරෙයි) සම්පරිවත්තති (එහෙමෙහෙ කැරකෙයි/ එහෙමෙහෙ පෙරලෙයි) චිත්තං පන තස්ස (සිත වනාහි ඔහුගේ) න වෙධති (කම්පානොවේ) න වලති (නොසැලෙයි) ඛන්ධො විය (කඳක් මෙන්) මහාරුක්ඛස්සා''ති (මහාගසක)

☞ දුක් වේදනාව පැතිරයාමෙන් උන්වහන්සේගේ කය හැකිලෙයි, ඇඹරෙයි, එහෙමෙහෙ කැරකෙයි. එහෙමෙහෙ පෙරලෙයි. එහෙත් උන්වහන්සේගේ සිත මහාගසක කඳක් මෙන් කම්පානොවේ නොසැලේ.

• ''අච්ඡරියං, හන්තෙ නාගසෙන, අබ්භුතං, හන්තෙ නාගසෙන, න මෙ එවරූපො සබ්බකාලිකො ධම්මපදීපො දිට්ඨපුබ්බො''ති.

★ ''අච්ඡරියං (ආස්චර්යවත්ය) හන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේනයන්වහන්ස) අබ්භුතං (අද්භූතය) හන්තෙ නාගසෙන (ස්වාමීණි නාගසේනයන්වහන්ස) <u>නු</u> මෙ එවරූපො (මා විසින් මෙවැනිවූ) සබ්බ-කාලිකො (සර්වකාලික/ සැමදා පවත්නා) ධම්ම-පදීපො (ධර්මපහනක්) දිට්ඨ-පුබ්බො''ති (පරෙ <u>නොදුටුවේය</u>)

☞ ස්වාමීණි නාගසේනයන්වහන්ස ආස්චර්යවත්ය, ස්වාමීණි නාගසේනයන්වහන්ස අද්භූතය, මා විසින් මෙවැනිවූ සර්වකාලික ධර්මපහනක් පරෙ නො දුටුවේය නො ඇසුවේය.

ධර්මකාමී ජනයාගේ පාලි හා ධර්ම දැණුම වැඩිදියුණුව සදහා මේ කරනලද උත්සහයෙන් ජනිතවූ සියලු පුණ්‍ය සම්භාරය සියලු සත්ත්වයනට සාදු සිතින් අනුමෝදන් කරමු, අනුමෝදන්වෙත්වා !!! අනුමෝදන්ව මෙලොව පරලොව නිවන්සැප ලබත්වා !!!

ශ්‍රී සම්බුද්ධ ශාසනය ලොවතුල බොහෝකාලයක් බබළත්වා !!!

සියලු සත්ත්වයෝ සුවපත් වෙත්වා !!!